# 01

# ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය



## හැඳින්වීම

ඉතිහාසය හඳුනා ගැනීම, ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන, මූලාශ්‍රය හඳුනා ගැනීම හා ඉතිහාසය ඉගෙනීමට මූලාශ්‍රයවල ඇති වැදගත්කම ද මූලාශ්‍රය වර්ගීකරණය පිළිබඳව ද විස්තර මෙහි ඇතුළත් වේ. මෙය අධ්‍යයනය කිරීමෙන් අතීතය පිළිගත හැකි ලෙස අවබෝධ කර ගැනීමටත් ජාතික අනන්‍යතාව හඳුනා ගැනීමටත් හැකිවනු ඇත.

## 1.1 ඉතිහාසය යනු කුමක් ද?

ඉතිහාසය යනු කුමක් ද යන්න විවිධ ආකාරයෙන් විග්‍රහ කොට තිබේ. ඉන් කිහිපයක් මෙසේය:

- ඉතිහාසය යන වචනයෙහි තේරුම මෙසේ මෙහි සිදුවිය යන්න යි. අතීතය හා වර්තමානය අතර නිරතුරු පවතින සංවාදය මත අනාගතය ගොඩනගනු ලබන ප්‍රධාන සාධකය ඉතිහාසය යි. මේ නිසා ඉතිහාසය යනු හේතුඵල වාදය යැයි ඊ. එච්. කාර් ප්‍රකාශ කළේ ය.
- ඉතිහාසය යනු වර්තමානය අවබෝධ කර ගැනීමට ඇති මාර්ගය යි
- ඉතිහාසය අධ්‍යයනය යනු විෂය සමූහයක් අධ්‍යයනය කිරීම යැයි ජී. එම්. ට්‍රැවිලියන් ප්‍රකාශ කළේ ය. මේ නිසා ඉතිහාසය යනු සමස්ත මානව සමාජයේ ම අතීතය අධ්‍යයනය කිරීම යි.

## 1.2 ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන

- තමන් ජීවත්වන සමාජය, තම රට හා ලෝකය පිළිබඳව අධ්‍යයනය කළ හැකි වීම.
- දේශපාලන සිදුවීම් හා බලවේග පිළිබඳව අවබෝධ කරගත හැකි වීම.
- ජාතික අනන්‍යතාව හඳුනාගත හැකි වීම.
- විවිධ මත ඉවසීමට හුරුවීම.
- අතීත මානව ක්‍රියාකාරකම් හැදෑරීම් තුළින් වර්තමානය අවබෝධ කරගෙන අනාගතය ගොඩනගා ගැනීමට හැකිවීම.
- අතීත පාලකයන්ගේ පාලන ක්‍රම අධ්‍යයනය කළ හැකි වීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට හුරු වීම
- ජාතික සමගිය ඇති කරවීම
- විද්‍යාත්මක චින්තනයට හුරු කරවීම
- පුද්ගල පෞරුෂය ගොඩනගා ගැනීමට අවස්ථාව උදා වීම

## 1.3. ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය

අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා මූලාශ්‍රය මෙසේ වර්ග කර ඇත.

- සාහිත්‍ය මූලාශ්‍රය
- පුරාවිද්‍යා මූලාශ්‍රය

### 1.3.1 සාහිත්‍ය මූලාශ්‍රය

ලේඛන හා ග්‍රන්ථ සාහිත්‍යය මූලාශ්‍රය ලෙස හැඳින්වේ. ඒ ඒ ලේඛන හා ග්‍රන්ථ ලියා ඇති කාලය, ඒවා ලිවීමේ දී තොරතුරු ලබා ගත් තැන්, මූලාශ්‍රය රචනා වූ කාලයත් මූලාශ්‍රයේ අඩංගු තොරතුරුවල කාලයත් අතර සමකාලීන බවක් හෝ පරතරයක් තිබේ ද යනාදිය ගැන විමසිලිමත් විය යුතු වේ. ඒ ඒ තොරතුරු පෙළ ගැස්වූ ආකාරය කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. සාහිත්‍යය මූලාශ්‍රය,

- දේශීය සාහිත්‍ය මූලාශ්‍රය
- විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය යනුවෙන් කොටස් දෙකකට බෙදේ.

### 1.3.2 දේශීය සාහිත්‍ය මූලාශ්‍රය

ලංකා ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන දීපවංසය, මහාවංසය, දඨාවංසය, බෝධිවංසය වැනි මූලාශ්‍රය වංසකතා සාහිත්‍ය ලෙස ද නම් කර ඇත. මීට අමතරව ඒ ඒ කාල වකවානුවල දී රචිත වෙනත් බොහෝ සාහිත්‍ය කෘතිවල ද ඉතිහාසය අධ්‍යයනය කිරීමට අදාළ තොරතුරු ඇතුළත් වී ඇත. පූජාවලිය, හත්ථවනගල්ල විහාරවංසය, නිකාය සංග්‍රහය, සද්ධර්මරත්නාකරය, සන්දේශ කෘති ආදී ගද්‍ය පද්‍ය ග්‍රන්ථවල දේශපාලන, ආර්ථික, සමාජයීය හා සංස්කෘතික තොරතුරු ඇතුළත් වේ.

❖ දීපවංසය

පැරණිතම වංසකථාව ලෙස සලකන්නේ දීපවංසය යි. ක්‍රි. ව. හතරවන හා පස්වන සියවස් අතර රචනා වන්නට ඇතැයි සැලකෙන මේ කෘතිය මහසෙන් රජ සමය අවසානය තෙක් මෙරට ඓතිහාසික තොරතුරු හා ශාසනික තොරතුරු සම්බන්ධ පුවත් විස්තර කරයි. පාලි භාෂාවෙන් රචිත මේ කෘතිය භික්ෂුණීන් වහන්සේලා විසින් රචනා කරන්නට ඇතැයි ද මතයක් පවතී. පරිච්ඡේද විසිදෙකක් දීපවංසයේ දක්නට ලැබෙන අතර එහි පුනරුක්ත දෝෂ ද පවතියි.



1.1 රූපය

**ඓතිහාසික තොරතුරු ලිය වී ඇති පුස්කොළ පොත්**

උදාහරණ වශයෙන්,

- තුන්වන ධර්ම සංගායනාව පිළිබඳව ද
- මහාථූපය හෙවත් රුවන්වැලිසෑය ගොඩනැංවීම පිළිබඳව ද අවස්ථා දෙකක දී විස්තර වී ඇත.

මෙවැනි පුනරුක්ත දෝෂ දීපවංසයේ ඇතුළත් වී ඇත්තේ, විවිධ ආචාර්ය පරම්පරා විසින් පවත්වා ගෙන එන ලද ශාසනික හා රාජවංස පිළිබඳ තොරතුරු සංස්කරණයකින් තොරව එයට ඇතුළත් කර ඇති නිසා ය.

තවද මහාවංසයේ සඳහන් නොවන ඇතැම් තොරතුරු දීපවංසයේ සඳහන් වී ඇත. ඒ අතර,

- ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගී වූ භික්ෂූන් වහන්සේ ධර්මය පිටක වශයෙන් සංග්‍රහ කිරීමෙන් කළ සේවය.
- සංඝමිත්තා මෙහෙණින් වහන්සේ සමඟ පැමිණි අනෙක් භික්ෂුණීන් වහන්සේලාගේ නම් හා කාර්ය සංසිද්ධීන් පිළිබඳ ව තොරතුරු ඇතුළත් වීම ඒ අතර වේ.

දීපවංසය පිරිස් මධ්‍යයේ කියවන ලද බවටත් එසේ කියවීමේ දී ඇතැම් විස්තර දේශකයා ම පැහැදිලි කර දෙන ලද බවටත් තොරතුරු රැසක් විස්තර වේ. එහි ප්‍රථම පරිච්ඡේදයේ මුල් ගාථා දෙක ම අවසන් වන්නේ "**සුනාථ මෙ...**" (මට සවන් දෙන්න) යනුවෙනි. අන්තර්ගතය අතින් සාර්ථක නිර්මාණයක් වූ දීපවංසයේ රචනා ශෛලිය හා සංස්කරණය පිළිබඳ අඩුපාඩු තිබේ.

❖ **මහාවංසය**

ලංකා ඉතිහාසය ඉගෙනීමේ දී ප්‍රධානතම මෙන් ම ශ්‍රේෂ්ඨතම සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ මහාවංසය යි. කොටස් කිහිපයක් වශයෙන් රචනා වී ඇති මෙය දිවයින පිළිබඳ තොරතුරු අඛණ්ඩ ව වාර්තා කරන එක ම මූලාශ්‍රය වේ. ලංකා ඉතිහාසය ගොඩනැගීමට පමණක් නොව ඉන්දියානු ඉතිහාසය ගොඩනැගීමට ද ප්‍රයෝජනවත් දත්ත මෙම ග්‍රන්ථයේ මුල් කොටසින් ලැබේ. කෙසේ වුවත් මහාවංසය පැරණි ලංකාවේ සියලු ම තොරතුරු අඩංගු කරමින් ලියා ඇති ග්‍රන්ථයක් නොවන බව අප සිහිතබා ගත යුතුය. එයින් මගහැරී ගිය කරුණු රාශියක් ඇත. අභයගිරි විහාරවාසී භික්ෂූන් වහන්සේලා පිළිබඳව හා සාමාන්‍ය ජනතාව පිළිබඳව මෙහි ඉතා අල්ප වශයෙන් සඳහන්වීම මෙහිදී සැලකිය යුතු වේ.

මෙහි මුල් කොටසේ බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනයේ සිට මහසෙන් රාජ්‍ය කාලය අවසානය දක්වා තොරතුරු ඇතුළත් වන අතර, ඒ කොටස රචනා කරන ලද්දේ අනුරාධපුර දික්සඳ සෙනෙවියා පිරිවෙණේ විසූ මහානාම නම් තෙරුන් වහන්සේ විසිනි. උන්වහන්සේ මහාවංසයේ මේ කොටස ධාතුසේන රාජ්‍ය සමයේ දී ආරම්භ කොට මුගලන් රාජ්‍ය සමයේ දී ලියා අවසන් කරන්නට ඇතැයි සිතනු ලැබේ. එම කෘතිය රචනා කිරීමේ දී ඊට පෙර රචනා කර තිබූ සීහලට්ඨකථා මහාවංසය ප්‍රධාන වශයෙන් ම පරිශීලනය කරන ලද අතර දීපවංසය, උත්තර විහාරට්ඨකථා, විනයට්ඨ කථා ආදී සිංහලෙන් ලියවී තිබූ මුල් ග්‍රන්ථවල ආභාසය ලබා ඇත. මේ ලිඛිත මූලාශ්‍රය හැරුණු විට වාචෝද්ගත මාර්ගයෙන් පරම්පරාගත ව පැවත ආ ප්‍රවාද හා වෘත්තාන්ත ද උපයෝගී කරගන්නට ඇත. ආරම්භයේ දී හෙළ බසින් පැවති තොරතුරු මහානාම හිමියන් විසින් සංස්කරණය කොට පාලි පද්‍යයට නගා ඇත්තේ ඒවා ධාරණයෙන් පවත්වා ගෙන යාමට ඇති පහසුව සඳහා ය. පාලි භාෂාව භාවිත කළේ ථේරවාද බෞද්ධ ලෝකයේ ශාස්ත්‍රීය හා ජාත්‍යන්තර භාෂාව ලෙස එය වර්ධනය වෙමින් පැවති නිසා විය යුතු ය.

මහාවංසයේ එන තොරතුරු ප්‍රධාන තේමා කිහිපයක් යටතේ විස්තර කළ හැකි ය. ඒ අනුව,

**දේශපාලන අංශය**

- රාජවංස කිහිපයක අඛණ්ඩ පැවැත්ම හා ඒ ඒ වංශවල රජුන්ගේ කටයුතු
- විදේශීය ආක්‍රමණ හා අභ්‍යන්තර කැරලිවලින් රට හා රටවැසියා මුදගැනීමට පාලකයන් කටයුතු කිරීම
- රාජ්‍ය පාලකයන්ගේ විදේශීය ප්‍රතිපත්ති හා දේශීය රාජ්‍ය පාලන සංවිධානය
- රටේ නීතිය හා සාමය රැක ගැනීමට පාලකයන් ගත් ක්‍රියාමාර්ග

**ආර්ථික අංශය**

- ප්‍රධාන ජීවනෝපායන මාර්ගය වූ කෘෂිකර්මයට මූලාධාර වූ වාරි සම්පාදනය සඳහා පාලකයන්ගෙන් ඉටු වූ සේවය

**සංස්කෘතික අංශය**

- ශාසනයේ අභිවෘද්ධිය සඳහා රජවරුන් ගත් ක්‍රියා මාර්ග
- මහජන සුභසාධනය සඳහා රජවරුන් ගත් ක්‍රියා මාර්ග
- කලාව, ගෘහ නිර්මාණ ශිල්පය හා සාහිත්‍යය යන අංග දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග

යනා දී වශයෙන් පුළුල් වූ තේමාවන් ඔස්සේ ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය ලිය වී ඇති කෘතියක් ලෙස මහාවංසයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

වසර 2500ක පමණ අඛණ්ඩ ලිඛිත ඉතිහාසයක් ඉදිරිපත් කරන මහාවංසය දෙවෙනි වන්නේ චීන මූලාශ්‍රයවලට පමණි.

මහාවංස කතුවරයා තුළ පමණක් නොව අනෙකුත් වංසකතා කතුවරුන් තුළ ද දැඩි ලෙස දක්නට ලැබුණේ ශ්‍රී ලංකාව මිථ්‍යාදෘෂ්ටීන්ගේ ආගම් සහ බලය ස්ථාපිත නොවන බුද්ධාගම හා බෞද්ධ බලය වැජඹෙන රටක් ය යන අදහස යි. මේ නිසා බුද්ධ පරිනිර්වාණයත් විජයාගමනයත් එකම දිනක සිදු වී යයි විශ්වාස කිරීමට තරම් තොරතුරු ඉදිරිපත් කිරීමට ඔවුන් උත්සාහ දරා ඇත.

දේවානම්පියතිස්ස (ක්‍රි. පූ. 250 210) රජුට පසුව මහාවංසයේ දැක්වෙන රාජාවලිය අතිශයින් ම නිවැරදි බව සෙල්ලිපි තොරතුරුවලින් සනාථ වේ. සේන ගුත්තික හා එළාර වැනි ආක්‍රමණිකයන් හැර අන් බොහෝ රජවරුන්ගේ සෙල්ලිපි දිවයිනේ විවිධ ප්‍රදේශවලින්

හමු වී ඇත. මීට අමතර ව විවිධ රජවරුන් විසින් කරවන ලද බවට වංසකථාවල සඳහන් දගැබ්, වැව්, ඇළ මාර්ග, සීගිරිය වැනි නගර පිළිබඳ ව තොරතුරු යනාදිය පුරාවිද්‍යා සාධක මගින් තහවුරු වී තිබේ. දුටුගැමුණු රජුගේ දස මහ යෝධයන් අතරින් නන්දිමිත්‍ර, ඵුස්සදේව, වේළුසුමන ආදීන් පිළිබඳ ව තොරතුරු සිතුල්පව්ව, වැල්එල්ලූගොඩකන්ද සෙල්ලිපි මගින් සනාථ වේ.

ලංකා ඉතිහාසය ගොඩනැගීමට පමණක් නොව ඉන්දියානු ඉතිහාසය ගොඩනැගීමට ද වැදගත් වන දත්ත මහාවංසයෙන් ලැබේ.

තවද මහාවංසයේ සඳහන් ධර්මදූත කණ්ඩායම් පිළිබඳ විස්තර සාංචි ස්තූපයෙන් ලැබුණ ධාතු කරඬුවලින් සනාථ වේ. එසේම කැලණි රජ පරපුරත් රුහුණේ කාවන්තිස්ස පරපුරත් එකට සම්බන්ධ වූ අයුරු විස්තර කෙරෙන මහාවංස පුවත සෙල්ලිපියකින් තහවුරු වේ.

❖ **විල්හෙල්ම් ගයිගර්** පඬිවරයා පවසන්නේ විජයගේ සිට දේවානම්පියතිස්ස දක්වා සිටි රජුන්ගේ රාජ්‍ය කාල මහාවංස කතුවරයා විසින් කෘතිම ලෙස දක්වා තිබීම වැනි අඩුපාඩු ඇතත් මහාවංසය විශ්වසනීය මූලාශ්‍රයක් වන බවයි.

## වංසත්ථප්පකාසිනී ( මහාවංසටීකාව )

මහාවංස ගාථාවන්ගේ සමහර පදවල අර්ථ විග්‍රහයක් මින් ඉදිරිපත් කෙරේ. සීහලට්ඨකථා මහාවංසය මීට ප්‍රධාන මූලාශ්‍රය වී ඇත. වෙනත් මූලාශ්‍රයවලින් නොලැබෙන තොරතුරු රැසක් මේ මූලාශ්‍රයෙන් ලැබේ.

ජී. පී. මලලසේකර මහතා මෙහි කර්තෘ ද මහාවංසය රචනා කළ මහානාම හිමියන්ගෙන් පැවත එන පරපුරේ ම වෙනත් මහානාම නම් භික්ෂූන් වහන්සේ නමක් යැයි අනුමාන කරයි. රචනා වූ කාලය පිළිබඳව ද නිශ්චිත තොරතුරක් නැතත් ක්‍රි. ව. 8-11 අතර කාලයක රචනා වී ඇතැයි ද එතුමා පෙන්වා දෙයි.

මෙම ග්‍රන්ථය මූලාශ්‍රයක් ලෙස වැදගත් වන්නේ මහාවංසයේ එන ඇතැම් තොරතුරු සවිස්තර ව ඉදිරිපත් කර තිබීමත් එහි සඳහන් බොහෝ විස්තර මෙය රචනා කිරීමට මූලාශ්‍රය වූ ග්‍රන්ථවල සඳහන් වන ආකාරයත් පෙන්වා දී තිබීමත් නිසා ය.

අභයගිරි විහාර හා මහාවිහාර යන ආයතන දෙකේ තිබුණේ සුළු සුළු වෙනස්කම් පමණක් බව මෙහි පැහැදිලි කොට ඇත. මෙවැනි කරුණු නිසා අපේ ඉතිහාසය හැදෑරීමේ දී උපකාරී වන මූලාශ්‍රය ග්‍රන්ථ අතර වංසත්ථප්පකාසිනී ග්‍රන්ථයට විශේෂ ස්ථානයක් හිමි වේ.

| යුගය | ග්‍රන්ථය (මූලාශ්‍රය) |
| --- | --- |
| අනුරාධපුර යුගය | ධම්පියාඅටුවා ගැටපදය, සිඛවළඳ හා සිඛවළඳ විනිස, සීහලවත්ථුප්පකරණ, සහස්සවත්ථුප්පකරණ, |
| පොළොන්නරු යුගය | මුවදෙව්දවත, සසදවත, රසවාහිනී, දීපවංස, ධර්මප්‍රදීපිකාව, අමාවතුර, දාඨාවංස |
| දඹදෙණි යුගය | සද්ධර්මරත්නාවලිය, පූජාවලිය. බුත්සරණ, කව්සිළුමිණ |
| කුරුණෑගල යුගය | ජාතක කතා පොත, සිංහල ථූපවංශය, දළඳා සිරිත |
| කෝට්ටේ යුගය | සන්දේශ කෘති, ගුත්තිල කාව්‍යය, පැරකුම්බා සිරිත, කාව්‍යශේඛරය |

### 1.3.2 විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය


ඈත අතීතයේ සිට ම ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සබඳතා පැවතිණ. ඒ නිසා ම ඉන්දියාවේ ඇතැම් මූලාශ්‍රයවල ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් වේ.

**ඩිමුන්ඩෝ** - ග්‍රීක ජාතික ඇරිස්ටෝටල් විසින් රචිත මේ ග්‍රන්ථයේ ලංකාව හා වයඹ දිග ඉන්දියාව අතර පැවති වෙළඳ සබඳතා විස්තර කෙරේ.

**ඉන්ඩිකා** - ග්‍රීක ජාතික මෙගස්තිනිස් ලියූ මේ ග්‍රන්ථයෙන් ලංකාවත් ග්‍රීසියත් අතර පැවති වෙළඳ සබඳතාවල තොරතුරු සනාථ කරගත හැකි ය.

**නැචුරාලිස් හිස්ටෝරියා** රෝම ජාතික ප්ලිනි විසින් රචිත මේ කෘතියෙහි ලංකාවේ ආර්ථික තොරතුරු ඇතුළත් වේ.

**භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය** ටොලමි විසින් රචිත මේ කෘතියෙහි ලංකාවේ ස්ථාන නාම, ඒවායේ පිහිටීම, ලංකාවේ හැඩය පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.




**1.2 රූපය**
**ටොලමිගේ සිතියම**

| | |
|---|---|
| **පර්සියානු යුද්ධය** | රෝම ඉතිහාසඥයකු වූ ප්‍රොකෝපියස් සම්පාදනය කොට ඇත. මෙහි ලංකාව සුප්‍රසිද්ධ වෙළඳ මධ්‍යස්ථානයක් බව පවසා ඇත. |
| **ටොපෝග්‍රැපියා ක්‍රිස්ටියානා** | රෝම ජාතික කොස්මස් රචනා කොට ඇත. එහි ලංකාව ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයක් වූ බව සඳහන් වේ. |
| **අරාබි මූලාශ්‍රය** | ඉබ්න් බතූතාගේ දේශාටන වාර්තා, සුලෙයිමාන්ගේ වාර්තා, අබුසෙයිද්ගේ සිල්සිලාත් අල්ත්වාරිං |
| **චීන මූලාශ්‍රය** | ෆාහියන්ගේ හා හියුසියැංගේ දේශාටන වාර්තා දෙක |

දකුණු ඉන්දියාවේ රචිත සීලප්පදිකාරම්, මණිමේකලෙයි, පදිර්රුපත්තු වැනි දෙමළ ග්‍රන්ථ, විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතර වැදගත් ය.

**පෘතුගීසි මූලාශ්‍රය** රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය

**ඕලන්ද මූලාශ්‍රය** - ෆිලිප්පස් බැල්ඩියස්ගේ කෘතිය
(බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය)

**ඉංග්‍රීසි මූලාශ්‍රය** රොබට් නොක්ස්ගේ කෘතිය (එදා හෙළදිව)

ඉහත මූලාශ්‍රයන් ලියා ඇත්තේ ඒ ඒ කතුවරු ලංකාවට පැමිණ ලබා ගත් තොරතුරු මත හෝ වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත ය.

**සාහිත්‍ය මූලාශ්‍රයවල වැදගත්කම**

- ❖ දිවයිනේ අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනැගීමට අවශ්‍ය දත්ත ලබා ගත හැකිවීම
- ❖ ඒ ඒ අවධිවල රටේ දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික තොරතුරු ලබා ගත හැකි වීම.
- ❖ සිද්ධි ඒ ඒ කාල අනුපිළිවෙළට සකසා ගත හැකි වීම.
- ❖ අදාළ තොරතුරු වෙනත් සාහිත්‍ය මූලාශ්‍රය සමග සසඳා ගත හැකි වීම.
- ❖ රටේ විදේශීය සම්බන්ධතා අධ්‍යයනය කිරීමට අවස්ථාව ලැබීම.

ඇතැම් සාහිත්‍ය මූලාශ්‍රය ලිය වී ඇත්තේ අදාළ සිදුවීම්වලින් වසර ගණනාවකට පසුව නිසා ඒ තොරතුරු ඉතිහාසය ගොඩනැගීමට යොදා ගැනීමේ දී,


- ❖ අදාළ මූලාශ්‍රය රචනා වූ කාලය
- ❖ කතුවරයාගේ අරමුණු
- ❖ මූලාශ්‍රයේ කතුවරයා
- ❖ මූලාශ්‍රයට තොරතුරු සපයාගත් ආකාරය ආදිය කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

**ක්‍රියාකාරකම**

ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති දේශීය හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය පිළිබඳ ව වගුවක් පිළියෙල කරන්න.

පුරාවිද්‍යා මූලාශ්‍රය

අභිලේඛන, නටබුන්, කාසි, චිත්‍ර හා මූර්ති, පුරාකෘති වශයෙන් වර්ග කළ හැකි ය. එය පහත සටහනින් වඩාත් පැහැදිලි වනු ඇත.



## අභිලේඛන

අභිලේඛන යනු ගල් (ශිලා) මැටි පුවරු, බිත්ති, තඹ තහඩු, රන් තහඩු, දැව හා විවිධ භාජන ආදියෙහි ලියා ඇති පැරණි ලේඛන යි. ඉතිහාසය ඉගෙනීමේදී අභිලේඛනවලට ද විශේෂ ස්ථානයක් හිමි වේ.

## ලෙන් ලිපි

ක්‍රි. පූ. 03 වන සියවසේ සිට දීර්ඝ කාලපරිච්ඡේදයකට අයත් ලෙන් ලිපි ශ්‍රී ලංකා ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධාන මූලාශ්‍රයක් වේ. මෙතෙක් සොයා ගෙන ඇති වැඩිම ලිපි සංඛ්‍යාවක් එනම් 1250ක් පමණ අයත් වන්නේ ලෙන් ලිපි ගණයට ය.

මේවා රචනා කොට ඇත්තේ අශෝක අක්ෂර හෙවත් බ්‍රාහ්මී අක්ෂර භාවිත කිරීමෙනි. ක්‍රි. පූ. 03 වන සහ ක්‍රි. ව. 01 වන සියවස අතර කාලයට මේ ලිපි අයත් ය. එකල භික්ෂූන් වහන්සේලා වාසය කළ ගල් ලෙන්වල කටාරමට යටින් මේවා කොටා තිබේ. ලෙන් ලිපි වැඩි සංඛ්‍යාවක් හමු වී ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මිහින්තලය, වෙස්සගිරිය, රිටිගල ආදී ස්ථානවලින් හා හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් සිතුල්පව්ව, තිස්සමහාරාමය, කොට්ටදෑමූහෙල ආදී ස්ථානවලිනි.

**අගත අනගත චතුදිශ ශගශ දිනෙ** යනු බහුල ව දක්නට ලැබෙන පාඨයකි.

මෙයින් කියවෙන්නේ කිසියම් පුද්ගලයෙකු විසින් සිවු දිගින් පැමිණි හා නොපැමිණි සංඝයා වහන්සේට ඒ ඒ ගල් ලෙන් පූජා කළ බව යි.

**පිතමහරඣහ බඩකරික පරුමක ශුමන පුත පරුමක චෙමශ ලෙණ රඣ තිශහ රඣියශි නියතෙ අගත අනගත චතුදිශ ශගශ... .''**

(තිස්ස රජුගේ රාජ්‍ය කාලයේ දී පිත මහරජුගේ බඩගරික ප්‍රධානී සුමනගේ පුත් ප්‍රධානී චෙමශගේ ලෙණ ඔහු විසින් සිවු දිගින් පැමිණි හා නොපැමිණි සංඝයා වහන්සේට පූජා කරන ලදී.)

සෑම ලෙන් ලිපියක ම වාගේ ඇති මෙම පාඨයෙන් කියැවෙන්නේ සිවු දිගින් පැමිණි හා නොපැමිණි සංඝයා වහන්සේට අදාළ ගල් ලෙන පූජා කළ බව යි.

මෙම ලිපිවල එන තොරතුරුවලට අනුව එද ලෙන් පූජා කළ අය අතර රජවරු, උපරජවරු වැනි රාජ්‍ය නායකයෝ ද භොජක, රටික, ගමික වැනි ප්‍රාදේශික පාලකයෝ ද මහාමාත්‍ය, සේනාපති, බඩගරික, ගණක, අදෙක (අධ්‍යක්ෂ) වැනි රාජ්‍ය නිලධාරීහු ද භික්ෂු භික්ෂුණීන් වහන්සේලා ද උපාසක උපාසිකාවෝ ද විවිධ රැකියාවල නියුක්තවූවෝ ද ධනවත්හු ද වූහ.

**ගිරි ලිපි (පර්වත ලිපි)**

විශාල ගල් පර්වත හා ගල්තලා මත ලියා ඇති ලිපි.

මිහිඳු මාහිමි ගැන කියැවෙන අම්පාරේ රජගල ලිපිය.

**යෙ ඉම දීප පටමය ඉදිය**
**අගත ඉඩික තෙර මහිද තෙරහ තුබ**

මෙහි තේරුම් දෙකක් ඇත.

» මෙම ද්වීපය සමෘද්ධිමත් කිරීම සඳහා ආ ඉට්ඨිය ස්ථවිර හා මහින්ද ස්ථවිරයන්ගේ ස්තූපය යි.

» මෙම ද්වීපයට පළමුව ඉර්දියෙන් ආ ඉට්ඨිය ස්ථවිර හා මහින්ද ස්ථවිරයන්ගේ ස්තූපය යි.

**ක්‍රි. පූ. දෙවන සියවස**

ශවෙර (විහාර මහා දේවිය) ගේ පරපුර ගැන කියැවෙන කොට්ටදඹූහෙල ලිපිය.

**දමරඣ පුත මහතිශ අයහ ඣිත අබි ශවෙර**
(දමරජ පුත් මහතිශ කුමරුගේ දියණිය වූ ශවෙර කුමරිය යි.)

**ක්‍රි. ව. පළමුවන සියවස**

හබැස්ස ලිපිය

**වහබ මහරජහ මරුමනෙකෙ උතර මහරජහ පුතෙ උවරජනකෙ දිනෙ**
(වසභ මහ රජුගේ මුනුබුරු වූ ද උත්තර මහ රජුගේ පුත්‍ර වූ ද යුවරජ නාග විසින් දෙන ලදී.)

## පුවරු ලිපි

සකස් කර ගත් ගල් පුවරු මත ලියා ඇති ලිපි.

උදා
- මිහින්තලා පුවරු ලිපිය
- සෝමාවතී දාගැබ් පුවරු ලිපිය
- පොළොන්නරුව ගල්පොත ලිපිය




1.3 රූපය-මිහින්තලා පුවරු ලිපිය



1.4 රූපය-පොළොන්නරුව ගල්පොත ලිපිය

## වල්ලිපුරම් රන් සන්නස



1.5 රූපය-වල්ලිපුරම් රන් සන්නස

**සිධ මහරජ වහයහ රජහි අමෙතෙ**
**ඉසිගිරයෙ නකදිව බුජමෙනි**
**බදකර අතනහි පිය ගුකතිස විහර කරිතෙ**

(යහපතක් වේවා ; මහ රජු වසභගේ රජයේ ඇමති ඉසිගිරි නාගදීපය පාලනය කරමින් බදකර අතන නම් ස්ථානයේ පියගුක තිස්ස නම් වූ විහාරය කළේ ය.)

**පනාකඩුව තඹ සන්නස**



**1.6 රූපය-පනාකඩුව තඹ සන්නස**

**සිරිසඟබෝ විජයබාහු රජ පා වහන්සේ සිය වික්මෙන් දෙමෙළ බළ මුළු අඳුරු දුරැලා ලක්දිව් එක්සේසත්,** පළමුවන විජයබාහු රජුගේ ළමා කාලය පිළිබඳ ව තොරතුරු ඇතුළත් වී තිබීම.

## ටැම් ලිපි

සකස් කරගත් ගල් කණුවල ලියා ඇත.

උදාහරණ

- කටුගහගල්ගේ ලිපිය,
- ගොඩවාය ටැම් ලිපිය
- බදුලු ටැම් ලිපිය (සොරබොරවැව ටැම් ලිපිය) වෙළඳපොළ පාලන නීති රීති ඇතුළත් වේ.

❖ **ලංකාවේ වැදගත් ශිලා ලේඛන**

01 සිතුල්පව්ව හා සංඛපාල විහාරවල ඇති සෙල්ලිපි, දසමහ යෝධයන් ගැන මහාවංසයේ එන පුවත මේවායෙන් සනාථ වේ.

02 මිහින්තලා පුවරු ලිපිය, අභයගිරි සංස්කෘත ලිපිය, කළුදිය පොකුණ ලිපිය ආරාම පාලනය පිළිබඳ තොරතුරු සපයයි.

03 මහා විජයබාහුගේ අඹගමුව ලිපිය සිරිපා වන්දනාවේ යන පහත් කුලවල බැතිමතුන් සඳහා පහළ මළුවක් තැනවීම පිළිබඳ තොරතුරු සපයයි.

04 වේළයික්කාර සෙල්ලිපිය පළමුවන විජයබාහු රජු නිකාය තුනට තුලාභාර තුනක් දුන් බව වාර්තා කරයි.

05 තෝනිගල සෙල්ලිපිය ධන ධාන්‍ය තැන්පත් කිරීමේ දී පොලී ක්‍රමයක් පැවති බවත් අකලහස, මදහස, පිටදඬහස ලෙස වී වගා කළ කන්න තුන සඳහන් වේ. (ක්‍රි. ව. 04වන සියවස කිත්සිරිමෙවන් රජු දවස)

06 දෙවනගල සෙල්ලිපිය මහා පරාක්‍රමබාහු රජු රාමඤ්ඤ දේශය ජය ගත් කිත්නුවරගල් සෙනෙවියාට මලබටුව නම් ගම්වරක් ප්‍රදානය කළ බව වාර්තා කරයි.

## බිත්ති ලිපි

උදා - සීගිරි කුරුටු ගී

සීගිරි කුරුටු ගීවලින් වැඩි සංඛ්‍යාවක් ක්‍රි. ව. වර්ෂ 8 සිට 11 දක්වා කාල පරිච්ඡේදයට අයත් වේ. විවිධ තරාතිරම්වලට අයත් පුද්ගලයන් විසින් මේ ගී ලියා ඇත. මේ ගී අතුරින් ගී 685ක් පරණවිතාන සූරීන් විසින් කියවා පළ කර ඇත. සුවිශේෂ ලක්ෂණයක් වන්නේ මේ පද්‍යය ආගමික තේමාවලින් පරිබාහිර ව ලියා තිබීම යි. රීතිය හා සෞන්දර්යාත්මක අගය අතින් දේශීයත්වය පිළිබිඹු කරන අනන්‍යතාවෙන් යුත් උසස් ම පද්‍ය ලෙස පරණවිතාන සූරීහු සලකති. සීගිරි ගීවල මූලික තේමාව වූයේ සීගිරි ලලනාවන් වුව ද සීගිරි පරිසරය, සීගිරියේ අවශේෂ නිර්මාණ, ඒ නිර්මාණ බැලීමට පැමිණි අයගේ අත්දැකීම් හා බැඳුණු හැඟීම් ද විස්තර ඒවායේ තිබේ. සීගිරියේ අසිරියට ප්‍රධාන වන සිංහ රූපය සහ නිලුපුල් ඇස් ඇති කාන්තාවන් පිළිබඳ සරල සිව් පද එළිසම සහිත පද්‍යයකි මේ.



උපමා, රූපක, උත්ප්‍රේක්ෂා, අර්ථාන්තර, න්‍යාය, විරෝධ, ආක්ෂේප සහ අතිශයෝක්ති ද මේ නිර්මාණ අතර දැකිය හැකි ය. විරෝධාලංකාරයට නිදසුනක් ලෙස මේ පද්‍ය ඉදිරිපත් කළ හැකි ය.

**කොමුළ් අමඩිලෙඩි ලි නසී**
**එ බොන් ද මියුර් යහ බැසී**
**එ කපල්දල වන් දිගැසී**
**මන ජලවයි සිත් නො මුසී**

ඇය ලූ කොමළ සිනා කොමඩු ගෙඩියක ඇට පෙළ මෙනි. මියුරු තෙපළ කොමඩු ගෙඩියේ මදය මෙනි. ඇගේ දිගු ඇස කොමඩු ගෙඩියේ පොත්ත මෙන් දෙකෙළවර දෙසට කෙමෙන් සිහින්ව යයි. මගේ සිත දවාලයි. අත් නොහරියි. මෙහි කොමඩු වැනි සිසිල් දෙයකින් සිත දවාලයි. මේ පද්‍යය ද කවිත්වයෙන් පිරිපුන් ය.

**කාසි (නාණක මූලාශ්‍රය)**

ඒ ඒ යුගවල ආර්ථික දියුණුව මෙන් ම තාක්ෂණික දියුණුව පිළිබඳ තොරතුරු දැනගත හැකි ය. කාසි පිළිබඳ අධ්‍යයනය කරන විද්‍යාව නාණක විද්‍යාව ලෙස හැඳින්වේ. ක්‍රි. පූ. 250 දී පමණ කාසි භාවිතය ආරම්භ වී ඇත.

කාසි
- ★ දේශීය හා විදේශීය කාසි ලෙස වර්ග කළ හැකි ය.
- ★ කාසි නිකුත් කිරීමේ දී රන්, රිදී, තඹ ආදී ලෝහ භාවිතයට ගෙන ඇත.

උදා :- හස්එබූ කාසි, කහවණු හෝ කහාපණ ලෙස මූලාශ්‍රයවල සඳහන්ව ඇත. අලියෙකුගේ හා ස්වස්තිකයක රූප ඇති කාසි මුල් යුගයේ භාවිත කර ඇත.



1.7 රූපය-මධ්‍යකාලීන රන් කහවණුව



1.8 රූපය-V.O.C කාසි

රෝම කාසි, චීන කාසි, අරාබි කාසි, ලංකාවෙන් හමුවීම පිළිබඳ මාහැඟි සාධකයන් වේ. එය ලංකාවේ පැවති විදේශ වෙළඳාම වේ.

උදා:- සීගිරිය, මාතොට වරාය, ගොඩවාය වරාය වැනි ස්ථානවලින් හමුවී ඇත.

ලන්දේසි වෙළඳ සමාගමට අයත් V.O.C කාසි ද හමු වී ඇත.

බ්‍රිතාන්‍ය කාසි ද මෙරට භාවිත කරන ලදී.

## නටබුන්

පැරණි ගොඩනැගිලිවල ශේෂ වී ගිය කොටස්, දගැබ්, වැව් පොකුණු, ගල් කණු, ගල් ආයුධ, මැටි බඳුන්, ලෝහ භාණ්ඩ, චිත්‍ර, මූර්ති, කැටයම් මේ අතර වේ.



1.9 රූපය-යාපහුවේ පියගැට පෙළ



1.10 රූපය-කුට්ටම් පොකුණ



1.11 රූපය-අනුරාධපුරය ගල් පාලම

අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය ආදී රාජධානිවල පැවති ගොඩනැගිලිවල නටබුන් වූ කොටස් මෙන් ම ඒ ඒ රාජධානිවල පැවති වැව්, පොකුණු හා බෞද්ධ, හින්දු ආදී ආගමික නිර්මාණවල නටබුන් මීට අයත් ය.

## චිත්‍ර, මූර්ති හා කැටයම්

අපේ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කෙරෙන ජීවමාන සාක්ෂි අතර චිත්‍ර, මූර්ති හා කැටයම් වැදගත් ය. ආගමික විශ්වාස, අතීත ජනතාවගේ කලා කුසලතා, වර්ණ භාවිතය, ඇඳුම් පැළඳුම්, ආභරණ පරිහරණය ආදිය පිළිබඳ වැදගත් තොරතුරු මේවායෙන් ලබා ගත හැකි ය. සීගිරි චිත්‍ර පැරණි කාන්තාවන්ගේ රූපලාවන්‍ය පිළිබඳ තොරතුරු සපයයි. හිඳගල ලෙන් විහාර චිත්‍ර, තිවංක පිළිම ගේ බිතු සිතුවම්, කැලණි විහාරයේ බිතු සිතුවම් ද චිත්‍ර අතර වැදගත් ය.



1.12 රූපය-සීගිරි චිත්‍ර



1.13 රූපය-ශ්‍රී මහා බෝධිය වැඩම වීම
(කැලණි රජ මහා විහාරය)

## පුරාවිද්‍යා මූලාශ්‍රයවල වැදගත්කම

- සෙල්ලිපිවල අඩංගු තොරතුරු සමකාලීන වේ.
- සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් බොහෝ තොරතුරු තහවුරු කර ගැනීමට හැකිවීම, නිවැරදි කර ගැනීමට හැකිවීම, අමතර කරුණු ලබා ගත හැකිවීම.
- රජවරුන්ගේ නම්, රාජකීය විරුදනාම, ප්‍රාදේශීය නායකයන් පිළිබඳ තොරතුරු ලබා ගත හැකිවීම.
- රාජ්‍ය නිලධාරීන් පිළිබඳ තොරතුරු හා ඒ ඒ තනතුරුවල කාර්යභාරය හඳුනා ගැනීම
- එකල පැවති අභ්‍යන්තර හා බාහිර වෙළඳාම පිළිබඳ තොරතුරු ලබා ගැනීම
- රැකී රක්ෂා, බදු ක්‍රම, කිරුම් මිනුම් ක්‍රම ආදී තොරතුරු ලබා ගත හැකිවීම
- එකල පැවති බෞද්ධ හින්දු ආදී ආගමික පුද පූජා, ඇදහිලි, විශ්වාස ආදිය පිළිබඳ තොරතුරු සොයා ගත හැකිවීම
- අධිකරණ පිළිබඳ තොරතුරු ලබා ගත හැකිවීම
- පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව හා පැරණි කර්මාන්ත පිළිබඳ, තාක්ෂණය භාවිතය පිළිබඳ තොරතුරු ලබා ගත හැකිවීම
- ජල තාක්ෂණය, ගොඩනැගිලි තාක්ෂණය, පරිසර සංරක්ෂණය ආදී අංශ පිළිබඳ තොරතුරු රැස් කර ගත හැකිවීම
- අක්ෂර විකාශනය, සංකේත, වියරණ, වර්ණ සංයෝජනය ආදී අංශ පිළිබඳ තොරතුරු සොයා ගත හැකිවීම

## ඉතිහාසය ඉගෙනීමට ඇති මූලාශ්‍රය මාර්ග ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම

රට තුළ වර්තමානයේ දක්නට ලැබෙන ජනගහන ව්‍යාප්තිය, සීඝ්‍ර නාගරීකරණය, මංමාවත් ඉදිකිරීම, ගොඩනැගිලි ඉදිකිරීම, කෘෂිකාර්මික කටයුතු ආදී ක්‍රියා නිසා, ඉතා අගනා පුරාවස්තු මෙන් ම නටබුන් විනාශය වෙමින් පවතී.

බොහෝ විට ස්මාරක සංරක්ෂණය නොකිරීමත් නිවැරදි සංරක්ෂණයකට නොයාමත් දක්නා ලැබේ. මේ මූලාශ්‍රය මාර්ග අද අපට දැකගත හැකි වන්නේ අපේ අතීත පරම්පරා ඒවා මැනවින් ආරක්ෂා කළ නිසා ය. මේ මූලාශ්‍රයවල වටිනාකම පාසල් අධ්‍යාපනය තුළ පමණක් ම නොව සෑම අවස්ථාවකදී ම ජනතාවට කියා දිය යුතු ය. ඒවා විනාශ කරන්නන් සඳහා දැඩි දඬුවම් නියම කර ක්‍රියාත්මක කිරීමට පාලනාධිකාරී ආයතන වග බලා ගත යුතු ය. අප සියලු දෙනා ම මූලාශ්‍රය රැකගැනීමට හැකි සෑම අවස්ථාවක ම ක්‍රියා කළ යුතු බවට අදිටන් කර ගනිමු.

## ක්‍රියාකාරකම

ලංකා ඉතිහාසය හැදෑරීමට උපයෝගීකර ගත හැකි පුරාවිද්‍යා මූලාශ්‍රය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සෙල්ලිපි | කාසි | නටබුන් |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

# 02

# ලංකාවේ භූගෝලීය පිහිටීම එහි ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය



**හැඳින්වීම**

ලංකාව අක්ෂාංශ හා දේශාංශ වශයෙන් පිහිටා ඇති ආකාරයත් ඉන්දියාවට ආසන්නව පිහිටීම හා ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම, අභ්‍යන්තර භූ විෂමතා, ගංගා, කඳු හා පර්වත, වරාය තොටුපල හා කාලගුණික තත්වය කුමන ආකාරයෙන් එහි ඉතිහාසයට බලපෑවේ ද යන්නත් මේ පාඩමෙන් විස්තර වේ.

## 2.1 ලංකාවේ භූගෝලීය පිහිටීම





ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම

දකුණු ආසියාවේ ඇති විශාලතම දූපත වන ලංකාව උතුරු අක්ෂාංශ $5^0$ $55^0$ - $9^0$ $51^0$ ත් සහ නැගෙනහිර දේශාංශ $79^0$ $42^0$ - $81^0$ $52^0$ අතර ඉන්දියානු අර්ධද්වීපයට දකුණින්, ඉන්දියන් සාගරයෙහි කේන්ද්‍රස්ථානයක පිහිටා ඇත. එය ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන්නේ කිලෝමීටර් 32 ක් පමණ වූ පටු මුහුදු තීරයකිනි. එය පෝක් සමුද්‍ර සන්ධි ලෙස හඳුන්වයි. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 65, 610ක් පමණ වේ. ශ්‍රී ලංකාවේ දිග පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා කි. මී. 447 කි. ශ්‍රී ලංකාවේ පළල කොළඹ සිට සංගමන් කන්ද තුඩුව දක්වා කි. මී 219 කි.

ශ්‍රී ලංකාවේ වෙරළබඩ තීරය මන්නාරම, කල්පිටිය, කොළඹ, බේරුවල, ගාල්ල, වැලිගම, දෙවිනුවර, හම්බන්තොට, මඩකලපුව, ත්‍රිකුණාමලය ආදී වූ වරායන් කිහිපයකිනුත් මීගමුව, කොග්ගල ආදී වූ කලපු කිහිපයකිනුත් සමන්විත වේ.

- ❖ පර්වත — සීගිරිය, දඹුල්ල, යාපහුව, කුරුණෑගල
- ❖ කඳු — පිදුරුතලාගල, නමුණුකුල, කිරිගල්පොත්ත
- ❖ කපොලු — බලන, හපුතලේ, කඩුගන්නාව
- ❖ ගංගා — මහවැලි, කළු, කැලණි, වලවේ ආදිය ද, ඔයවල් ද රට තුළ අභ්‍යන්තර භූ විෂමතා වේ.

මේ හැරෙන්නට ශ්‍රී ලංකාව ස්වභාවික සම්පත්වලින් ආඪ්‍ය වූ රටකි. මුතු මැණික්, මිනිරන්, ගස්වැල්, කුළුබඩු ආදිය මෙයට උදාහරණ ලෙස දැක්විය හැක.




2.1 සිතියම

### 2.1.1 ශ්‍රී ලංකාවේ පිහිටීම

- ඉන්දියාවට ආසන්නව පිහිටීම
- ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම
- මුහුදු මාර්ග සන්ධිස්ථානයක පිහිටීම
- අභ්‍යන්තර භූ විෂමතා යන හේතු නොයෙක් ඓතිහාසික සිදුවීම් සම්බන්ධයෙන් බලපෑ කරුණු වේ.

### ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ඇති වූ බලපෑම

- ඉන්දියාවේ රජවරු අනුගමනය කළ රාජාභිෂේක ක්‍රමය ලංකාවට ද හඳුන්වා දීම.
- අතීතයේ දී ශ්‍රී ලංකාවේ සේනාව සකස් වූයේ ඉන්දියාවේ සිව්රඟ සේනාව අනුව සකස්වීම
- ගම්, නියම්ගම්, රාජධානි, නගර ලංකාවේ බිහි වූයේ ඉන්දියානු ක්‍රමයට ය
- දකුණු ඉන්දියානු ආක්‍රමණ ඇති වීම
- ලංකාවේ රජවරු දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීම
- ඇතැම් ඉන්දීය රජවරු ලාංකික රජවරුන්ගෙන් යුද්ධ ආධාර ලබා ගැනීම
- ලංකාවේ පරිපාලන කටයුතු සඳහා ඉන්දියානු නිලධාරීන් යොදා ගැනීම
- ඉන්දියාව සමග විවාහ සම්බන්ධතා ඇතිවීම
- ඉන්දියානු විවිධ සිරිත් විරිත් ආගමික ඇදහිලි, විශ්වාස ආදිය ලංකාවේ තිබීම

### ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම නිසා හටගත් බලපෑම

- ස්වාධීන රාජ්‍යයක් වශයෙන් වර්ධනය වීම
- ඉන්දියාවේ රාජාණ්ඩු ක්‍රමයක් හා පාලන තන්ත්‍රයක් මෙරට බිහි වුව ද කල් යාමේ දී මෙරටට ආවේණික වූ පාලන තන්ත්‍රයක් ඇති වීම.
- ඉන්දියාවේ සිටි පුරෝහිතයන් වෙනුවට භික්ෂූන් වහන්සේලා ලාංකික පාලකයාගේ අනුශාසකයින් ලෙස කටයුතු කිරීම
- බුදුසමය ඉන්දියාවෙන් අතුරුදහන් වුවත් ලංකාවේ සුරක්ෂිත වීම
- සිංහල භාෂාවේ ප්‍රභවය සහ වර්ධනය වීම
- අඛණ්ඩ ලේඛන සම්ප්‍රදායක් පවත්වාගෙන යාම
- ස්වාධීන වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස පැවතීම

## මුහුදුමාර්ග සන්ධිස්ථානයක පිහිටීම

ශ්‍රී ලංකාව ප්‍රධාන මුහුදු මාර්ගයේ සන්ධිස්ථානයක පිහිටීම, දේශපාලනික, ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් විවිධ වෙනස්කම්වලට හේතු විය. උදා- විවිධ ආක්‍රමණ එල්ල වීම, දේශපාලනික අවුල් වියවුල් තොරතුරු ආසන්න රාජ්‍යවලට දැන ගන්නට ලැබීම.

❖ **අභ්‍යන්තර භූ විෂමතා**

❖ ගංගා ආශ්‍රිතව ජනාවාස බිහි වීම

මල්වතු ඔය නිම්නයේ අනුරාධගාම
කලා ඔය නිම්නයේ උරුවෙල ගාම
කැලණි ගංගා නිම්නයේ කල්‍යාණිගාම

**කඳු හෙල් රාජධානි බිහි වීමට වැදගත් වීම**

| | | |
|---|---|---|
| දඹදෙණිය | කුරුණෑගල | කන්ද උඩරට |
| යාපහුව | ගම්පොළ | |

**2.1.2 ඛණිජ සම්පත හා ජෛව විවිධත්වය ඉතිහාසයට බලපෑ ආකාරය**


❖ විවිධ මැණික් වර්ග සහ මුතු

උදා - වෛදූර්ය ආදී සප්ත රත්න, කකුධ පල ආදී මුතු වර්ග අට
ආදිය නිසා අපනයන වෙළඳාම දියුණුවීම

විවිධ ඖෂධ වර්ග සහ පැළෑටි නිසා ජෛව විවිධත්වයක් ඇතිවීමෙන් සංචාරකයන් පැමිණීම.

❖ විවිධ සතුන්

උදා - ඇතුන් නිසා වෙළඳාම දියුණුවීම
වෙළඳාම හා කලා ශිල්ප බිහිවීම




2.2 සිතියම-පැරණි වෙළෙඳ නගර සහ වරායයන්

**ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම විස්තර කරන්න.
2. පහත සඳහන් භූ විෂමතා සඳහා උදාහරණ දෙන්න.
   පර්වත, කපොලු, කඳු, ගංගා, ඔයවල්
3. ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ඇති වූ බලපෑම් 03ක් ලියන්න.
4. ලංකාව ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම නිසා ඇති වූ බලපෑම් 03ක් ලියන්න.
5. ලංකාවේ පවතින අභ්‍යන්තර භූ විෂමතා ලක්ෂණ මොනවාද?

### 2.1.3 ගංගා

රටේ අභ්‍යන්තරයෙන් පටන්ගෙන සිව් දිශාවට ගලන ගංගා හා ඇළදොළ රාශියක් ලංකාවේ ඇත. ඒවා දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා සමාජීය අංශවලට බලපා ඇත. උදා- සමන්ත කූටයෙන් ආරම්භවන සිව්මහා ගංගා වන මහවැලි, කැලණි, කළු, වලවේ රාජධානි බිහිවීම සඳහා බලපා ඇත. මේ නිසා,

රජරට
මායා රට
දක්ෂිණ දේශය
රුහුණු රට ආදී පාලන ඒකක බිහි විය.

කෘෂිකර්මාන්ත සංවර්ධනයට හා ජනාවාස ව්‍යාප්තියට ද ගංගා බලපා ඇත.

මීට අමතරව පහත සඳහන් ප්‍රාදේශීය බෙදීම්වලට ද බලපා ඇත්තේ ගංගාවන් ය.

| | |
|---|---|
| දොළොස් දහස් රට | වලවේ ගඟ, බෙන්තර ගඟ |
| අටදහස් රට | වලවේ ගඟ, මහවැලි ගඟ |

ගංගාවන් රාජ්‍යයේ දේශසීමා ලෙස භාවිත කොට තිබේ

- ❖ ''කාවන්තිස්ස රජු සොළීන් වළකනු පිණිස, මහවැලි ගඟ සියලු තොට හැම කල්හි ආරක්ෂා කරවී'' යනුවෙන් මහාවංසයේ සඳහන් ව තිබීම.
- ❖ රුහුණේ මානාභරණ රජු රජරට ආක්‍රමණය කිරීම වළක්වනු සඳහා මහවැලි ගඟ ඉවුරේ රැකවල් ලූ බව වංසකතාවේ සඳහන් වේ.
- ❖ පළමුවන පරාක්‍රමබාහු රජු විල්ගම්තොට සිට ත්‍රිකුණාමලය දක්වා තොටක් පාසා මහවැලි ගඟ ඉවුරේ රැකවල් දැමී ය.
- ❖ අවසාන සිංහල රාජධානිය වූ සෙංකඩගල, යුරෝපා ජාතීන් විසින් උඩරට රාජ්‍යයට එල්ල කළ ආක්‍රමණ අසාර්ථක වීමට එම රාජ්‍යය කඳුකරයේ පිහිටා තිබීම වැදගත් විය.


මෙරටට දකුණු ඉන්දියානු ආක්‍රමණ එල්ල වී සිංහල රජවරුන්ට පරාජය අත් වූ බොහෝ අවස්ථාවල ඔවුන් ආරක්ෂාව පතා පලා ගොස් ඇත්තේ මධ්‍යම කඳුකරයට යි. එකල මලය රට හෙවත් මලය දේශයට පලාගිය රජවරු අතර, වලගම්බා රජු (අවු.14 මාස 07) වැදගත් වේ.

## 2.1.4 වරාය හා තොටුපල

දිවයින වටා තොටුපලවල් හා වරායන් රාශියක් පිහිටා තිබේ. මා තොට, ගෝකණ්ණ, ඌරාතොට, ගොඩවාය ආදී මෙම වරායන් ඈත අතීතයේ සිට ම භාවිත කොට තිබේ. එම වරායන් ආශ්‍රය කරගෙන ජනාවාස ගොඩනගාගෙන තිබේ.

උදා - මහාතිත්ථ, ත්‍රිකුණාමලය, ඌරාතොට, පුත්තලම, ගොඩවාය

ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම සඳහා තොටුපලවල් හා වරායන් භාවිත කොට තිබේ. සංචාරක වෙළඳුන්ගෙන් පිරී පැවති මෙම වරායන් පටුන් ගම් වශයෙන් හඳුනාගෙන තිබේ. එහි අදහස පටුනක් හෙවත් වරායක් ආශ්‍රිත ගම යන්නයි. මහාතිත්තය විශාල වෙළඳ නගරයක් ලෙස වර්ධනය වී තිබුණි. එම නගරයේ නටබුන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පාදාගෙන තිබේ.


අභ්‍යන්තර තැනිතලා කලාපය - ශේෂ කඳු
වැද්දාකන්ද
මිහින්තලේ
කදුරු කන්ද
රිටිගල
සීගිරිය
යාපහුව
දිඹුලාගල
කුරුණෑගල
බතලේගල
කතරගම කන්ද

2.3 සිතියම

### 2.1.5 කාලගුණික තත්ත්වය හා එය කෘෂිකර්මාන්තයට බලපෑ අන්දම

ලංකාවට වැසි ලැබෙන ප්‍රධාන ක්‍රම දෙකකි.

1. ඊසාන දිග මෝසම් සුළඟ
2. නිරිත දිග මෝසම් සුළඟ

මෙම ක්‍රම දෙක යටතේ ලැබෙන වර්ෂා ජලය ක්‍රම දෙකකට ගොවිතැන් කටයුතු සඳහා යොදා ගෙන ඇත. ඉන් එකක් නම් වර්ෂා ජලය කෙළින්ම ගොවිතැන් කටයුතු සඳහා උපයෝගී කර ගැනීමයි. දෙවැන්න එම වැසි ජලය ගබඩා කර තබා වැව් ජලය කෘෂිකර්මය සඳහා යොදා ගැනීමයි.


**ක්‍රියාකාරකම්**

1. පහත සඳහන් ගංගා ආශ්‍රිතව පිහිටි ප්‍රදේශ මොනවාද?
   මල්වතු ඔය, මහවැලි ගඟ, කලා ඔය, කැලණි ගඟ
2. දකුණු ඉන්දියානු ආක්‍රමණවල දී ආරක්ෂාව පතා මධ්‍යම කඳුකරයට පලාගිය රජෙකු ගැන විස්තරයක් කරන්න.
3. දිවයිනේ ප්‍රධාන වරායන් දෙකක් පිළිබඳ විස්තරයක් ලියන්න.
4. ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ප්‍රධාන ක්‍රම දෙක නම්කරන්න.

## 2.2 ලංකාවේ ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික යුගය

මෙහිදී පූර්ව ඓතිහාසික යුගය යනුවෙන් හඳුන්වන්නේ ඓතිහාසික යුගයේ ආරම්භවීමට පෙර පැවති යුගය යි. ඓතිහාසික යුගය ආරම්භ වන්නේ ක්‍රි. පූ. තුන්වන සියවසේ රාජ්‍යයට පත් දෙවනපෑතිස් රජ දවස ය. එතුමාගේ කාලයට පෙර ඉතිහාසය ඊට අනුව පූර්ව ඓතිහාසික යුගය යනුවෙන් හැඳින්වේ. මෙයට රාවණ පිළිබඳ ජනප්‍රවාද ද ඇතුළත් වේ. මෙම ජනප්‍රවාද තහවුරු වී නැති නිසා ඓතිහාසික සත්‍ය හැටියට පිළිගනු ලබන්නේ නැත.

බුදුරජාණන් වහන්සේ තෙවරක් දිවයිනට වැඩමවීම පිළිබඳ තොරතුරු ද වංස කථාවල සඳහන් වේ.




2.4 සිතියම-දැනට ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථානයන් සියයකට වැඩි ප්‍රමාණයක් හමුවී ඇති අතර ඒවායේ ප්‍රධාන කීපයක් සිතියමේ ලකුණු කොට ඇත. (A) අර්ධ ශුෂ්ක කලාපය (B) පහතරට වියළි කලාපය (C) පහතරට අතරමැදි වියළි කලාපය (D) තෙත් කලාපය (E) කඳුකර වියළි අතරමැදි කලාපය (F) ශුෂ්ක කලාපය

මෙම යුගයේ ජීවන රටාව හා වෙනත් තොරතුරු

මෙම යුගයේ පැවති ආර්ථිකයේ මූලික ක්ෂේත්‍ර ලෙස,

- ❖ සංවිධානාත්මක දඩයම
- ❖ සීමිත කෘෂිකර්මාන්තය
- ❖ සත්ත්ව පාලනය
- ❖ සීමිත ධීවර කර්මාන්තය
- ❖ ශිල්පීය භාණ්ඩ නිෂ්පාදනය

ඒ අනුව කෘෂිකාර්මික හා සත්ව පාලන කටයුතු සඳහා වියළි දේශගුණයක් වෙරළබඩ ප්‍රදේශ තෝරා ගැනීමට ද ඛණිජ සම්පත් හා කුළුබඩු අවශ්‍යතා සපුරා ගැනීම පිණිස කඳුකර ප්‍රදේශය කරා යොමුවීමට ද මෙම අවධියේ ජනතාවට සිදුවී තිබේ.

ලංකාවේ මහාශිලා (මෙගලිතික) ජනාවාස පිළිබඳ සාක්ෂි ප්‍රදේශ අනුව,

**1. වියළි කලාපීය තැනිතලා ප්‍රදේශය**

මාමඩුව, ගුරුගල්හින්න, මාච්චගම, අනුරාධපුර, ඉබ්බන්කට්ටුව, කතරගම

**2. වෙරළාශ්‍රිත ප්‍රදේශ**

පොම්පරිප්පු, මාකේවිට, යාල, මාන්තායි, තෙක්කම්, කරෙයිනගර්

**3. කඳුකර තෙත් කලාප**

රුවන්වැල්ල, අස්මඩල, පදවිගම්පොළ, ඇළහැර, නාඋල

මෙම ස්ථාන ආශ්‍රිතව මහාශිලා සුසාන භූමි වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර ඇතැම් ස්ථානවලින් ප්‍රධාන වශයෙන් හමුවී ඇත්තේ ජනාවාස පැවති බවට සාක්ෂි සැපයෙන කාලරක්ත මැටි බඳුන් පිළිබඳව ය. යාපනය, අනුරාධපුරය, කන්තරෝදෙයි, කැලණිය, පිලපිටිය, රාජාංගනය වැනි ප්‍රදේශ මේ සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂි හමුවී තිබෙන ස්ථානයන් ය. කුඹුක්කන් ඔය, මැණික් ගඟ, කිරිඳි ඔය, වළවේ ගඟ, ආශ්‍රිත ස්ථාන වලින් ද කළු රතු මැටි බඳුන් අවශේෂ සහිත ජනාවාස භූමි හමුවී තිබේ.

පොළොවේ සිටුවන ලද ගල් පතුරු හතරකින් සෑදෙන ගල් පෙට්ටිය මධ්‍යයේ ශාරීරික කොටස් හා පාරිභෝගික ද්‍රව්‍ය තැන්පත් කර ගල් පියනකින් වසා ගොඩනගන ලද සුසාන, ශිලා සුසාන හෙවත් ගල් පෙට්ටි සුසාන ලෙස හැඳින්වේ.

උදා- ඉබ්බන්කටුව, පිං වැව, ගල්සොහොන් කනත්ත

විශාල මැටි බරණියක මළ සිරුර හා ඔවුන් පරිහරණය කළ කොටස් හෝ මිය ගිය පුද්ගලයාගේ අවශේෂ දමා අනතුරුව භූමියේ කපන ලද ගැඹුරැති වළක එය තැන්පත් කිරීමෙන් ගල් පියනක් දමා වසාලීමෙන් බරණි සුසාන නිර්මාණය කර තිබේ.

උදා පොම්පරිප්පුව



**2.1 රූපය-දඹුල්ලට නුදුරු ඉබ්බන්කටුව සුසාන භූමියෙන් හමු වූ ශිලා මංජුසා වර්ගයේ සොහොනකි. මෙම සුසාන ගර්භය තුළ මිනිස් භෂ්මාවශේෂ සහිත මැටි බඳුන් තැන්පත් කොට තිබේ.**

ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ ස්ථාන



2.2 රූපය-කිතුල්ගල බෙලිලෙන



2.3 රූපය-පාහියංගල


## 2.3 ජනාවාස හා භාරතීය ජන සංක්‍රමණ ව්‍යාප්තිය

දිවයිනේ ප්‍රථම ඓතිහාසික ජනාවාස ආරම්භ කරන ලද පුද්ගලයා ලෙස සඳහන්ව ඇත්තේ විජය යි. ඉන්දියාවේ වයඹදිග ප්‍රදේශයෙන් ඔහු පැමිණියේ යැයි අනුමාන කරනු ලැබේ. බුදුන්වහන්සේ පිරිනිවන් පෑ දිනයේ දී ඔහු පැමිණි බව ද සඳහන්ව තිබේ. බුදුන් වහන්සේ පිරිනිවන් පෑවේ ක්‍රි. පූ. හයවන සියවසේ දී යැයි සලකන බැවින් පළමුවන සිංහල ජනාවාසය ආරම්භ වූයේ එම කාලයේ දී යැයි ඒ අනුව සිතනු ලැබේ. එම ගම් ආරම්භ වීම ඓතිහාසික ජනාවාස ආරම්භ වීමේ පළමුවන අදියර හැටියට ද සැළකේ.

විජයගේ අගනුවර හැටියට සලකනු ලබන්නේ පුත්තලමට උතුරින් පිහිටා ඇති තම්මැන්නාව ය. ඔහුගේ ඇමතිවරු අනුරාධ, උපතිස්ස ආදී ගම් ඉදිකරන ලද බව ද සඳහන්ව තිබේ. මේවා ඉදි කර ඇත්තේ ගංගා ආශ්‍රිතව ය.

ඉන් පසුව පණ්ඩුවාසදේව සහ භද්දකච්චානාගෙන් ඊළඟ ජනාවාස බිහිවීම සම්බන්ධ දෙවන අදියර වේ. මහාවංසයේ දැක්වෙන පරිදි භද්දකච්චානාගේ සොහොයුරන් සමග පැමිණ ශාක්‍යවංශික කුමාරවරු උදේනි ගාම, උරුවෙල ගාම, විජිත ගාම ආදී ජනාවාස පිහිටුවා ගත්හ.

මෙම ජනාවාස ඉන් අනතුරුව රාජ්‍යයට පත් පණ්ඩුකාභය හා මුටසිව රජවරුන්ගේ කාලවල දී ව්‍යාප්ත විය. මෙම ජනාවාස ව්‍යාප්තියෙහි සැහෙන ජන සංක්‍රමණයක් ඉන්දියාවෙන් සිදු වූ බව ද වාර්තා වී තිබේ. එම ජන සංක්‍රමණ ව්‍යාප්තියේ ඉතා වැදගත් අවස්ථාවක් වන්නේ සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ සමඟ පවුල් රාශියක් දිවයිනට පැමිණීම යි.


ඓතිහාසික ජනාවාස ව්‍යාප්තිය
ජම්බුකෝල පට්ටන
මහා තිත්ථ
කදම්බ නදී
උපතිස්සගාම
ගෝකණ්ණ
අනුරාධපුරය
චේතියගිරි
කලා ඔය
මහවැලි ගඟ
මහියංගණය
දීඝවාපි
කල්‍යාණි
කැලණි ගඟ
වලවෙ ගඟ
කුඹුක්කන් නදී
මැණික් ගඟ
කිරිඳි ඔය
චිත්තල පබ්බත
මහාගාම

**2.5 සිතියම**

### ක්‍රියාකාරකම්

1. ජනාවාස ආරම්භවීමේ අදියර දෙක මොනවාද?
2. ලංකාවේ පළමු අගනුවර වශයෙන් සළකනු ලබන්නේ කුමන නගරය ද?
3. මුල්ම ජනාවාස ආරම්භ වූ ගංගා මිටියාවතක් නම් කරන්න.

**විජයගෙන් පසු ලංකාවට පැමිණි ජන කණ්ඩායම්**

1. පාණ්ඩ්‍ය කුමාරිකාව සමඟ පැමිණි පිරිස
2. පණ්ඩුවාසදේව සමඟ පැමිණි පිරිස
3. භද්දකච්චානා සොහොයුරන් ඇතුළු පිරිස
4. මිහිඳු මහරහතන් වහන්සේ වැඩමවීම
5. සංඝමිත්තා තෙරණිය සමග බෝධාහර කුලවල පැමිණීම

## 2.4 අනුරාධපුර රාජධානිය බිහිවීම කෙරෙහි බලපෑ භූගෝලීය සාධක

❖ සිංහල ශිෂ්ටාචාරයේ තොටිල්ල යනුවෙන් හඳුන්වන්නේ රජරට වියළි කලාපය යි. මෙම වියළි කලාපයේ තැනිතලා බිමක් අනුරාධපුරය පිහිටා තිබීම නිසා ගොඩනැගිලි නිර්මාණය කිරීම හා ජල පරිපාලනය පහසු විය.

❖ ජනාවාස පිහිටුවීමේදී සැලකිල්ලට ගත් ප්‍රධාන කරුණක් වූයේ ජලය යි. ඒ ඒ ජලාශ්‍රිත ප්‍රදේශ ඇසුරු කර ගනිමින් ජනාවාස පිහිටුවාගත් බව වංසකථාවල සඳහන් වන්නේ ඒ නිසාය. මීට අනුව මල්වතු ඔය නිම්නයේ ගමක් පිහිටුවීම දූරදක්නා නුවනින් කරන ලද කාර්යයක් ලෙස සැලකිය හැකිය. මෙම ඔය ලංකාවේ ප්‍රධාන වරාය නගරය වන මහාතිත්ථය දෙසට ගමන් කිරීම වැදගත්ය. අනුරාධපුරය හා එම වරාය අතර සම්බන්ධතා පැවැත්වීමට මල්වතු ඔය බෙහෙවින් උපකාරී විය.

❖ කෘෂිකර්මයට අවශ්‍ය වර්ෂාව අනුරාධපුරයට නියම කලට පැරණි කාලයේදී ලැබුණු බව පෙනී යයි. මෙම හිතකර දේශගුණික තත්වය අනුරාධපුර ග්‍රාමය රාජධානියක් බවට පත් කිරීමට බලපෑ තව සාධකයක් වූ බව පෙනී යයි.

❖ භූමියේ පිහිටීම හා වර්ෂාපතනය අනුව වාරිමාර්ග හා වාරි තාක්ෂණය දියුණු කිරීමට මෙය ඉතා සුදුසු භූමි භාගයක් විය. අභය වැව, තිසා වැව, නුවර වැව, පුලියන් කුලම, බුලන් කුලම, මහවැව් හා කුඩා වැව් අනුරාධපුරයේ ඉදි කළ හැකි වූයේ මේ නිසාය. එසේම පොකුණු සඳහා ඉතා වැදගත් නිදසුන් වන ඇත් පොකුණ හා කුට්ටම් පොකුණ පිහිටා ඇත්තේ ද මෙහිය.

❖ අභ්‍යන්තර සහ බාහිර වෙළඳ කටයුතු දියුණු කිරීම සඳහා ප්‍රධාන වරායන් සමග අනුරාධපුරයේ සිට සම්බන්ධතා පැවැත්විය හැකි විය.

**අනුරාධපුර රාජධානිය බිහිවීම කෙරෙහි බලපෑ භූගෝලීය සාධක පහත සඳහන් පරිදි සාරාංශ කළ හැකිය.**

❖ වියළි තැනිතලා බිමක් වීම.
❖ මල්වතු ඔය ආශ්‍රය කරගෙන පිහිටුවීම
❖ කෘෂිකර්මාන්තයට හිතකර දේශගුණික තත්වය
❖ වාරි නිර්මාණ වැව්, අමුණු හා ඇළ මාර්ග පහසුවෙන් සකස් කර ගත හැකි වීම.
❖ ප්‍රධාන වරායන් වන මාතොට, ගෝකණ්ණ, දඹකොළ පටුන දක්වා කෙටි ඇළ මාර්ග හරහා ප්‍රවාහන කටයුතු සිදු කිරීමට හැකි වීම.


**ක්‍රියාකාරකම්**

1. අනුරාධපුර රාජධානිය තෝරා ගැනීමේ දී බලපෑ භූගෝලීය සාධක තුනක් ලියන්න.
2. පහත සඳහන් ස්ථාන ලංකා සිතියමක ලකුණු කර නම්කරන්න.

දඹකොල පටුන, මහාතිත්ථ, ගෝකණ්ණ, චෛතියගිරි, චිත්තල පබ්බත අනුරාධපුරය, කදම්බ නදී, දීඝවාපි, කල්‍යාණි නදී, තම්මැන්නාව.

# 03

# අශෝක රජුගේ ධර්මදූත සේවය හා එහි බලපෑම විමර්ශනය කිරීම



**හැඳින්වීම**

දේවානම්පියතිස්ස-අශෝක රාජ්‍ය සමය ශාසනික ඉතිහාසයේ සුවිශේෂ වකවානුවක් වේ. මෙම සමයේදී පවත්වන ලද තුන්වන ධර්ම සංගායනාවේ හා ශාසනශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස ථෙරවාදී බුදුසමය රටවල් නවයක ප්‍රචාරය විය. ඉන් එක් රටක් වූයේ ලංකාව යි. දෙවන පෑතිස් රජු හා අශෝක අධිරාජයා අතර පැවැති සම්බන්ධය නිසා එය ලංකාවේ සීග්‍රයෙන් පැතිර ගියේ ය. එසේ පැතිර ගිය ආකාරය සහ බුදුදහම ලාංකික සංස්කෘතියේ විවිධ අංශ කෙරෙහි බලපෑ ආකාරය මෙන් ම එය නිසා ලාංකික සමාජයේ ඇති වූ ප්‍රගමණය ද මෙම පාඩමෙන් ඔබට ඉගෙනගත හැකිය.

## 3.1 ප්‍රාග් මහින්ද යුගයේ ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස

බුදුසමය දිවයිනට පැමිණීමට පෙර දිවයිනේ පැවති ඇදහිලි හා විශ්වාස පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම ප්‍රයෝජනවත් වේ. මේවා පිළිබඳව තොරතුරු ලබා ගත හැක්කේ ප්‍රධාන වශයෙන් ම පණ්ඩුකාභය රජු පිළිබඳව මහාවංසයේ එන විස්තරවලිනි. (මේ විස්තර උපයෝගී කර ගනිමින් ශ්‍රේෂ්ඨ ඉතිහාසඥයකු වූ මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා අගනා විවරණයක් කර ඇත.)

### යක්ෂ වන්දනාව

යක්ෂ ගෝත්‍රික කාන්තාවක වූ කුවේණිය භූත විද්‍යාවන්හි නිපුණ තැනැත්තියක සේ සැලකීමට කරුණු මහාවංසයෙන් ලැබේ. පණ්ඩුකාභය රජතුමා විසින් චිත්‍රරාජ, කාලවේල, චේතිය හා මහේජ යන යක්ෂ-යක්ෂණීන් සඳහා වාසස්ථාන සාදවා තිබේ. මොවුන් පණ්ඩුකාභයට රජවීමට උදව් කළ අයයි. ඔවුන්ට කෘත ගුණ සැලකීමක් වශයෙන් අභාවයෙන් පසු ඔවුන් සඳහා දේවාල තැනූ බව මහාවංසයෙහි සඳහන් වේ. මෙයින් පැහැදිලි වන්නේ ප්‍රාග් මහින්ද ලංකාවේ මළවුන් ඇදහීම ප්‍රචලිතව පැවති බව යි.

### වෘක්ෂ වන්දනාව

පණ්ඩුකාභය රජු වෙස්සවණ දෙවියාගේ වාසය සඳහා නුග ගසක් ද ව්‍යාධ දෙවියාගේ වාසයට තල් ගසක් ද වෙන්කොට දී ඇත. මෙයින් පැහැදිලි වන්නේ වෘක්ෂවලට අධිපති අධි මානසික බලවේග ඇතැයි විශ්වාසයක් මෙරට පැවති බව යි.

### දේව වන්දනාව

ව්‍යාධදේව යනු දඩයම් කරුවාගේ දෙවියා වන අතර කම්මකාරදේව යනු කර්මාන්ත කරුවාගේ දෙවියා යි. මේ අනුව එක් එක් වෘත්තීන්ට අධිගෘහිත දෙවියන්ට පුද පූජා පැවැත්වීමේ සිරිතක් තිබූ බව පැහැදිලි ය.

### ජෛන ආගම

ඉන්දියාවේ පැවැති සංවිධානාත්මක ආගමක් ලෙස මෙම ආගම හැඳින්විය හැක. පණ්ඩුකාභය රජු ජෝතිය, කුම්භාණ්ඩ හා ගිරි යන නිගණ්ඨ පූජකයන්ට ආරාම සාදවා දී තිබේ.

**ආජීවක හා පරිබ්‍රාජක ආගම්**

පණ්ඩුකාභය රජු පරිබ්‍රාජකයන්ට, ආජීවකයන්ට හා තාපසයන්ට ආරාම සකස් කොට පූජා කළ බව මහාවංසයේ සඳහන් වේ.

**බ්‍රාහ්මණ ආගම**

පණ්ඩුකාභය රජු සිවිකාසාලා හා සොත්ථිසාලා නම් ගොඩනැගිලි විශේෂ ඉදි කළ බව සඳහන් වේ. මේවා බ්‍රාහ්මණයන්ගේ යාගහෝම පැවැත්වීමට පාවිච්චි කරන ලදැයි අනුමානයක් පවතී. මෙයට අමතරව ඉර, හඳ, තාරකා, අග්නි හා සුළඟ ආදී විවිධ ස්වභාවික වස්තූන් ඇදහිලි හා විශ්වාස ප්‍රාග් මහින්ද යුගයේ පැවතුණි.

**බුදුසමය**

- මහින්දාගමනයට පෙර මෙරට වැසියන් බුදුදහම පිළිබඳ ව දැන සිටි බවට බොහෝ සාධක ඇත. බුදුන් වහන්සේ තෙවරක් ලක්දිවට වැඩම කළ අවස්ථාවල දී මෙරට පිරිස බුදුදහම වැළඳ ගන්නට ඇතැයි සිතිය හැක.

- බුදුන් මහියංගණයට වැඩම කළ දවස සුමන සමන් දෙවියන් සෝවාන් ඵලයට එළඹ බුදුන් වහන්සේගේ කේශධාතු ලබාගෙන මහියංගණ දාගැබ තුළ තැන්පත් කළ බව සඳහන්ව තිබීම.

- බුදුන් වහන්සේ ජීවමාන අවධියේ කේශධාතු ලබා ගත් තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන් ඒවා ත්‍රිකුණාමලය අසල තිරියාය චෛත්‍යයෙහි නිදන් කළ බව ද පැවසේ.

- බුද්ධ පරිනිර්වාණයේ දී සරභූ මහරහතන් වහන්සේ බුදුරදුන්ගේ ග්‍රීවා ධාතුව ලබාගෙන මහියංගණ දාගැබ තුළ තැන්පත් කළ බව ද පැවසේ.

- මෙරටට පැමිණි භද්දකච්චානා ඇතුලු පිරිස බෞද්ධ අය බව සැලකේ.

- මෙරටට පැමිණි වෙළෙඳ කණ්ඩායම්වලින් ද මෙරට වැසියා බුදුදහම පිළිබඳ යම් තරමක අවබෝධයක් ලබා සිටින්නට ඇතැයි ද සිතිය හැකිය.

## 3.2 දෙවනපෑතිස් රජු (ක්‍රි. පූ. 250 - 210)

මුටසීව රජුගේ ඇවෑමෙන් ඔහු පුත් තිස්ස කුමරු රාජ්‍යයට පත් විය. මුල් ඓතිහාසික යුගය අවසන් වී ඓතිහාසික යුගය ආරම්භ වන්නේ මෙම රජතුමාගෙනි. ඔහුගේ රාජ්‍ය කාලය පහත සඳහන් කරුණු නිසා වැදගත් වේ.

- ❖ මෙතුමාගේ රාජ්‍ය කාලයේ සිට ලංකා ඉතිහාසයේ පිළිගත හැකි කාලනිර්ණයක් ඉදිරිපත් කළ හැකිවීම.
- ❖ ඉන්දියාවේ මෞර්ය රාජධානිය සමඟ සමීප සුහද සබඳතා පැවැත්වීම.
- ❖ මෞර්ය අභිෂේක ක්‍රමය මෙරට ක්‍රියාත්මක වීම හා ''දෙවනපිය'' විරුදය දිවයිනේ පාලකයාට ලැබීම.
- ❖ තුන්වන ධර්ම සංගායනාවේ දී ගත් තීරණය අනුව ලංකාවට බුදුදහම හඳුන්වා දීම.
- ❖ මිහිඳු හිමියන්ගේ ආගමනය
- ❖ සංඝමිත්තාවගේ හා විවිධ ශිල්ප ශ්‍රේණිවල ආගමනය
- ❖ ශ්‍රී මහාබෝධිය වැඩම වීම.
- ❖ ථූපාරාමය ඇතුළු මහාවිහාරය සැලසුම් කිරීම

සාරාංශ වශයෙන් දක්වන ලද මේවායෙන් සමහරක් පහත විස්තර වේ. දෙවනපෑතිස් රජු විසින් කර වූ ආගමික නිර්මාණ අතර, මහා විහාරය, සෑ ගිරිය, ථූපාරාමය, මහා සෑ පිහිටන තැන ගල් ටැඹ පිහිටුවීම, ඉසුරුමුණි විහාරය, පඨමක චේතිය, වෙස්සගිරි විහාරය, උපාසක වෙහෙර, හත්ථාල්හක මෙහෙනවර, මහාපාළි දානසාලාව, දඹකොළ විහාරය, තිස්සමහා විහාරය හා පාචීනාරාමය වැදගත් වේ.



3.1 රූපය-තිසාවැව

මේ කාලයේදී තිසාවැව හා වලස්වැව යන වැව් දෙකක් ඉදි කොට ඇත. ලංකාවේ දඹකොළ පටුන වරාය උපයෝගී කරගනිමින් ඉන්දියාවේ තාම්‍රලිප්ති වරාය සමඟ වෙළෙඳ සම්බන්ධතා පවත්වන්නට ඇතැයි සිතිය හැකි ය.

මහාවංසයේ සඳහන් තොරතුරුවලට අනුව ප්‍රථම අභිෂේකයත් සමඟ මුතු මැණික් වැනි වටිනා වස්තූන් පහළ වී ඇත. රජු එම වස්තු සමඟ අරිට්ඨ කුමරු ප්‍රධාන කොට බමුණු, ඇමති, ගණක යන අයගෙන් සමන්විත දූත පිරිසක් අශෝක රජු වෙත යැවී ය. අශෝක රජු ඔවුන්ට සත්කාර කොට අරිට්ඨ කුමරුට සේනාපති තනතුර ද බමුණාට පුරෝහිත තනතුර ද ඇමතිවරයාට දණ්ඩනායක තනතුර ද ගණකට සිටු තනතුරු ද ප්‍රදානය කර ඇත. මෙය ලංකාවේ රාජ්‍ය පාලනය හා සම්බන්ධ තනතුරු පිහිටුවීම සම්බන්ධයෙන් වැදගත් වේ. එසේ ම අශෝක රජු තිස්ස රජුගේ අභිෂේකයට අවශ්‍ය උපකරණ සමග පහත සඳහන් දහම් පණිවිඩය ද එවූ බව මහාවංසයේ සඳහන් වේ.

**''මම බුදුන්, දහම්, සඟුන් සරණ ගොස් ශාක්‍යපුත්‍රයන්**
**වහන්සේගේ ශාසනයෙහි උපාසක භාවය පළ කළෙමි.**
**නරෝත්තමය නුඹ ද සිත පහදවා තෙරුවන් සරණ යව.''**

අශෝක රජු විසින් එවන ලද අභිෂේක උපකරණ භාවිත කොට තිස්ස රජු මෞර්ය සම්ප්‍රදායට අනුව අභිෂේක ලැබූ බව මහාවංසයෙහි සඳහන් වන අතර අශෝක රජු භාවිත කළ ''දේවානම්පිය'' විරුද නාමය ද සිය නමට එක් කර ගන්නා ලදී. මේ විරුද නාමය සියවස් ගණනාවක් ම පසුකාලීන පාලකයන් භාවිත කළ බව සෙල්ලිපිවලින් අනාවරණය වේ. මහාවංසයට අනුව මෙය දෙවනපෑතිස් රජුගේ දෙවන අභිෂේකය යි. ඒ අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වයේ වැදගත් අංශයක් වූ අභිෂේකය හා දේවානම්පිය යන විරුද නාමය භාවිත කිරීමේ ආරම්භක අවස්ථාව මෙය වේ.



**3.2 රූපය-අභයගිරියේ සමාධි ප්‍රතිමාව**

මෞර්ය අධිරාජ්‍යය සමඟ සම්බන්ධතා ඇති කොට ගෙන එම සම්ප්‍රදායට අනුව රජු අභිෂේක ලැබීම නිසා දෙවනපෑතිස් රජුගේ නායකත්වය සමකාලීන සෙසු ප්‍රාදේශීය රජුන් විසින් පිළිගත් බව පෙනේ.

## 3.3 අශෝක ධර්මදූත සේවය හා මහින්දාගමනය


අපගේ වංසකතාවලට අනුව තුන්වන ධර්ම සංගායනාවෙන් පසු බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම අශෝක රජතුමාගේ පූර්ණ අනුග්‍රහයෙන් සිදු විය. මෙම ධර්මදූත ව්‍යාපාරයෙහි අනුශාසකත්වය හා ප්‍රධානත්වය මොග්ගලීපුත්ත තෙරණුවෝ ඉසුලූහ. මෙම ධර්ම දූත ව්‍යාපාරයෙහි දී පහත සඳහන් රටවලට භික්ෂූන් වහන්සේ යවනු ලැබූහ.

| රට | ප්‍රධානත්වය |
|---|---|
| කාශ්මීර ගන්ධාර | මජ්ඣන්තික තෙර |
| මහිස මණ්ඩලය | මහාදේව තෙර |
| වනවාස දේශය | රක්ඛිත තෙර |
| අපරන්ත දේශය | යෝනක ධම්මරක්ඛිත තෙර |
| මහාරට්ඨ | මහා ධම්මරක්ඛිත තෙර |
| යෝනක දේශය | මහා රක්ඛිත තෙර |
| ස්වර්ණ භූමිය | සෝණ හා උත්තර තෙරවරු |
| හිමවන්ත ප්‍රදේශය | මජ්ඣිම තෙර |
| තම්බපණ්ණි (ලංකාව) | මහා මහින්ද තෙර |

නව රට ධර්ම ප්‍රචාරය සඳහා පිටත්ව ගිය එක් එක් දූත පිරිසට ප්‍රධාන තෙරණුවන් ඇතුළුව පස් නමකට වැඩි උපසම්පදා භික්ෂූන් පිරිසක් සහභාගී වී ඇත.

## 3.4 මිහිඳු හිමියන් විසින් ලක්දිව බුදුසසුන් පිහිටුවීම

මහින්ද තෙරුන් මිහින්තලයේ දී දෙවනපෑතිස් රජුට මුණ ගැසීම හා රජ තිසරණ සමාදන් වීම ලක්දිව බුද්ධ ශාසනයේ ආරම්භය යි. මෙයට පෙර අවුරුද්දේ දී පාටලීපුත්‍ර අගනුවර අශෝකාරාමයේ දී තුන්වන ධර්ම සංගායනාව අවසන් විය. සංගායනාව අවසානයේ දී මොග්ගලීපුත්තතිස්ස තෙරුන්ගේ ප්‍රධානත්වයෙන් අශෝක රජුගේ අනුග්‍රහයෙන් බුදුදහම ප්‍රචාරය කිරීමට සැලසුම් කරන ලදී.



3.3 රූපය-ශ්‍රී මහා බෝධිය වැඩමවීම
(කැලණි රජමහා විහාරය)

ශ්‍රී ලංකාවට අශෝක රජු තම පුත්‍රයා හා දියණිය එවීමට තීරණය කරනු ලැබුවේ ලංකාව කෙරෙහි විශේෂ සැලකිල්ලක් තිබූ නිසා විය හැකිය. සංගායනාව අවසන් වී සෙසු දූත කණ්ඩායම් නොපමාව පිටත්ව ගිය ද ලක්දිව මුටසීව රජු මහළු හෙයින් ඔහුගේ ඇවෑමෙන් දෙවනපෑතිස් රජ වන තෙක් මහින්ද තෙරණුවන් වහන්සේ ගමන ප්‍රමාද කළ බව වංසකතාව කියයි.


ඉහත දැක්වූ ලෙස දෙවනපෑතිස් රජ වූ පසු තෑගි භෝග සහිත දූත පිරිසක් පාටලීපුත්‍රයට ළඟා වූහ. මේ කණ්ඩායමේ නායකයා වූයේ අරිට්ඨ කුමරු ය. ඔහුට බ්‍රාහ්මණයෙකු හා තවත් කිහිප දෙනෙක් එක් වූහ. මොවුහු මාස පහක් පාටලී පුත්‍රයේ නතර වී සිටියහ. එහි දී මිහිඳු හිමියන් මොවුන් සමඟ සාකච්ඡා කොට ලංකාවේ ධර්ම ප්‍රචාරක කටයුතු සැලසුම් කරන්නට ඇතැයි සිතිය හැක.

ඒ අනුව ලංකාවේ ජනයාගේ භාෂාව, ඇදහිලි-විශ්වාස, සිරිත්-විරිත් යනාදිය දූත පිරිසගෙන් අසා දැන ගන්නට ඇත.

ලංකා දූත පිරිසට පාටලීපුත්‍රයේ දී විවිධ තනතුරු පිරිනමා අශෝක රජු විසින් විශේෂ පණිවිඩයක් ද ඔවුන් අත මෙරටට එවන ලදී. එනම් තමා බුද්ධ, ධම්ම, සංඝ ත්‍රිවිධ රත්නය සරණ ගිය බවත් දෙවනපෑතිස් රජුට එසේ කරන ලෙසත් නැවත අභිෂේක ලබන ලෙසත් අභිෂේකය සඳහා අවශ්‍ය අභිෂේක උපකරණ එවූ බව ද මහාවංසයෙන් සහ අට්ඨ කථාවලින් හෙළි වේ.

මෙම හසුන් පත රැගෙන අරිට්ඨ ඇතුළු පිරිස ලක්දිවට පැමිණීමෙන් පසු මෞර්ය සම්ප්‍රදායට අනුව වෙසක් පොහොය දින තිස්ස රජු දේවානම්පියතිස්ස නමින් අභිෂේක ලැබීය. මිහිඳු හිමියන් වේදිසාගිරියට ගොස් සිය මෑණියන් වූ දේවි බිසව හා ඥාතීන් මුණ ගැසුණි. අශෝක තරුණ කාලයේ දී උදේනි නගරයේ ආදිපාද ධුරය දැරූ කල එහි සිටුවරයාගේ දියණිය සමග පෙම් සබඳතාවක් ඇති විය. ඒ දේවි කුමාරිය සමග ය. ඇයට අශෝකගෙන් ලැබුණු දරුවන් වූයේ මහින්ද හා සංඝමිත්තාවන් ය. මිහිඳු හිමියන්

වේදිසාවට ගියේ ඔවුන් දැක බලා ගැනීමට ය. අනතුරුව උන්වහන්සේ සමඟ ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල, සුමන සාමණේර සහ භණ්ඩුක උපාසක යන පිරිස පොසොන් පොහොය දවස මිහින්තලයට සැපත් වූහ. විනය කර්ම කිරීමට උපසපන් භික්ෂූන් හතර නමක් ද මෙරට ජනයාට පැවිද්ද හා උපසම්පදාව හඳුන්වාදීමට සාමණේර නමක් හා උපාසකයෙකු ද මිහිඳු හිමියන් විසින් කැඳවාගෙන ආ බව ඉන් පැහැදිලි වේ. සුමන සාමණේරයන් ගිහිකල සංඝමිත්තාවන්ගේ පුත්‍රයා ය. භණ්ඩුක උපාසක වේදිසා දේවියගේ නැගණියගේ පුත්‍රයා ය.



**3.4 රූපය-දෙවනපෑතිස් මිහිඳු හිමියන් හමුවේ**

දූත පිරිස ලක්දිවට පැමිණි දිනයේ දෙවනපෑතිස් රජු මිහින්තලයට යන ලද්දේ දූත පිරිස මෙරටට පැමිණි බව අරිට්ඨ ඇමතිගේ මාර්ගයෙන් දැනගෙන විය. මෙම සිදුවීම දෙරට අතර කතිකා කොට සැලසුම් කර ගත් බව සිතිය හැක්කකි.

මිහිඳු හිමියන් හා දෙවනපෑතිස් රජු අතර ප්‍රශ්නෝත්තර ක්‍රමයට අදහස් හුවමාරු වූ බව වංසකතාවෙන් පෙනේ. මේ දෙදෙනා කථා කළ භාෂාව මිහිඳු තෙරුන් මීට පෙර ඉගෙන ගෙන තිබෙන්නට ඇත. එසේ නොමැති නම් අරිට්ඨ ඇමති භාෂා පරිවර්තක ලෙස ක්‍රියා කරන්නට ඇතැයි සිතිය හැකි ය. මහින්ද තෙරුන් රජුට ප්‍රථම ධර්ම දේශනාව කරන ලද්දේ චුල්ලහත්ථිපදෝපම සූත්‍රයෙනි. එහි අන්තර්ගතයෙහි සාරය වන්නේ,

**'' යමෙක් බුදුදහම වැළඳගෙන භික්ෂුවක් වී සිල්වත්**
**දිවි පෙවෙතක් ගත කරමින් පියවරෙන් පියවර**
**ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගනී ''**

මෙය මෙරට වැසියන්ට පැවිද්ද පිළිබඳව දැක්මක් ඇති කිරීමට තෝරාගත් සූත්‍රයක් ලෙස දැක්විය හැක. දේශනාව අවසානයේ දී රජු තෙරුවන් සරණ ගියේ ය.

එදින සවස පිරිස බලා සිටියදී ම භණ්ඩුක උපාසක මහණ කොට උපසම්පදා කළහ. මෙය ලක්දිව ප්‍රථම විනය කර්මය යි. මහණ උපසම්පදාව හඳුන්වා දීමෙන් මෙරටට සංඝ සංස්ථාව ද හඳුන්වා දීමක් සිදු විය. රජුගේ ආරාධනාව පරිදි දෙවන දින දූත පිරිස අනුරාධපුරට වැඩම කළහ.

රජ දුන් දානය වළඳා මිහිඳු හිමියෝ පිරිසට ධර්මය දේශනා කළහ. මේ පිරිස අතර පැතිස් රජුගේ සහෝදරයාගේ බිසව වූ අනුලා දේවිය ඇතුළු පිරිස ද වූහ.

මේ පිරිසට දේශනා කිරීමට තෝරා ගත්තේ ''**විමානවත්ථු හා පෙතවත්ථු**''කථාවන් ය. මේවායෙන් පිළිවෙලින් කියැවෙන්නේ පිංකම් කොට දිව්‍ය ලෝකවල උපදින දෙවිවරු ගැනත්, පව්කම් කොට අපායේ උපදින නිරි සතුන් ගැනත් ය. දෙසුන් කෙළවර පන්සියයක් පමණ ස්ත්‍රීහු සෝතාපත්ති ඵලයෙහි පිහිටියෝ ය.

සවස් වරුවේ ධර්ම දේශනාවට සවන්දීමට බොහෝ සාමාන්‍ය වැසියෝ පැමිණියහ. එහිදී තෝරා ගත්තේ දුක සැප පිළිබඳව කියැවෙන **දේවදූත සූත්‍රයත්** කුසල අකුසල් ගැන කියැවෙන **බාල පණ්ඩිත** සූත්‍රයත් ය. එදින රාත්‍රිය ගත කිරීමට පැතිස් රජු උන්වහන්සේලාට මහමෙවුනා උයන තාවකාලිකව පිළියෙළ කර දුන්නේ ය.

රජු තෙවන දින උදයේ මිහිඳු හිමියන් බැහැ දුටුවේ ආරාම පිළිගැනීම කැප දැයි විමසීමට ය. පසුව කෙණ්ඩියෙන් අතපැන් වත් කොට මහමෙවුනා උයන බුදු සසුනට පූජා කළේ ය. ඉන් පසු රජු හා මිහිඳු හිමියන් එක් ව අනාගතයේ පිහිටුවන මහා විහාරයේ විවිධ ස්ථාන සලකුණු කළ බව වංසකථාවලින් හෙළි වේ.

උන් වහන්සේ මෙසේ දින හතක් ධර්ම දේශනා කිරීමෙන් හා අවශේෂ ආගමික කටයුතු කිරීමෙන් අනතුරුව රජුගේ බෑනා වන අරිට්ඨ හා පනස් පස් දෙනෙකු උපසම්පත්තිය ඇතුලු පැවිදි බිමට පත් කළහ. සියල්ලෝ ම කරගෙයිදී ම රහත් වූහ. අරිට්ඨ පළමුවන ශ්‍රී ලාංකික භික්ෂුව වේ. මීට අනුව වස් එළඹෙන විට රහතුන් වහන්සේලා 62 දෙනමක් වූහ. ඒ සියලු දෙනා වහන්සේ රජුගේ ඇරයුමෙන් සෑගිරියෙහි වස් එළඹියහ. මෙය අලුත් අත්දැකීමක් මෙන් ම වස් සමාදන් වීමේ උලළේ සමාරම්භය ද විය. සංඝමිත්තා තෙරණිය විසින් අනුලා බිසව පැවිදි කරවීමෙන් භික්ෂුණී ශාසනය ආරම්භ කරන ලදී. සිරිමා බෝ රෝපණයෙන් උතුම් බෞද්ධ සංස්කෘතිකාංගයක් හඳුන්වා දෙන ලදී. දකුණු අකුධාතුව නිදන් කොට ථූපාරාමය තනවා සෑ නිර්මාණය අරඹන ලදී. මේ අයුරෙන් ජනතාව තිසරණ ගැන්වීම, මාර්ගඵලවලට පත් කරවීම, බුදුසමය හා තදනුබද්ධ චාරිත්‍රවාරිත්‍ර හඳුන්වා දීම හා තුන් බෝ පිහිටු වීම ආදිය අනුසාරයෙන් දිවයිනේ බුදුසමය පිහිටුවන ලදී. ලක්දිව දෙමාපියන්ගේ පුතෙකු වූ අරිට්ඨ පැවිදිකරවා විනය උගන්වා සීමාමාලකයක දී විනය දේශනා කරවා එය මුල්බැස ගැනීමට අවශ්‍ය කටයුතු නිම කරන ලදී.

## 3.5 මහින්දාගමනය ලංකා සමාජය කෙරෙහි ඇති කළ බලපෑම්

මහින්දාගමනයත් සමඟ මෙරට සංඝ සංස්ථාව ආරම්භ වීම ලංකාවේ සාමාජික, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යනාදී විවිධ අංග කෙරෙහි බලපෑම් එල්ල කළ කරුණක් විය. තම මාලිගාව ඇතුලු සියලු රාජ්‍ය ගොඩනැගිලි ද සංඝ ආඥාවට යටත් වන සේ දෙවනපෑතිස් රජු විසින් මහාවිහාර සීමාව ලකුණු කරන ලදී. රාජ්‍ය පාලනයේ දී සංඝ සංස්ථාව විශාල මෙහෙවරක් ඉටු කළේ ය. බොහෝ විට සංඝ සංස්ථාව හා රාජ්‍ය සංස්ථාව එක්ව කටයුතු කරන ලදී. මහින්දාගමනය සමග මෙරට පාලකයන් බෝධිසත්ව වරයෙකු ලෙස කටයුතු කළ යුතු බවට මතයක් මෙරට ඇති විය.

මංගල, පරාභව, වසල, සිඟාලෝවාද, ව්‍යග්ඝපජ්ජ, අග්ගඤ්ඤ, චක්කවත්තිසීහනාද, කුටදන්ත වැනි සූත්‍ර දේශනා මගින්, මෙරට ජන ජීවිතය සාරවත් කිරීමට, සංවර කිරීමට, කුල භේදය නොසලකා හැරීමට හා බෞද්ධ ආචාර ධර්ම සමාජගත කිරීමට භික්ෂූන් වහන්සේලා හා භික්ෂුණීන් වහන්සේලා උත්සාහ ගෙන ඇත. භික්ෂුණීන් වහන්සේලා විසින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන ලදී.

ප්‍රාථමික සමාජයේ පැවැති ඇදහිලි හා විශ්වාස ඇදහූ ජනතාවට නව ආගමක් ලැබිණ. ඊට අනුව ගස්, ගල්, පර්වතවලට වැඳ වැටුණු මිනිසුන්ට ඊට වඩා ගැඹුරට සිතීමට අවස්ථාව උදා විය.

මහින්දාගමනයෙන් කෙටි කාලයක් තුළ ගම් දනව්වල විහාර ආරාම ඉදි වූ අතර ඒවා ආගමික මධ්‍යස්ථාන පමණක් නොව සංස්කෘතික හා සමාජීය කේන්ද්‍රස්ථාන බවට පත් විය. එමගින් සාමාජික ඒකාබද්ධතාවකට මඟ පෑදුණි.

බ්‍රාහ්මීය අක්ෂර මාලාව සංවර්ධනය වී මෙරට ලේඛන කලාව පෝෂණය විය. මිහිඳු හිමියන්ගේ අනුශාසනා පරිදි අරිට්ඨ තෙරුන් ඇතුළු ලාංකික භික්ෂූන් විසින් රචිත හෙළ අටුවා ග්‍රන්ථ සිංහලයේ මුල් ම සාහිත්‍ය ග්‍රන්ථ විය. එහෙයින් බුදුදහමින් සිංහල සාහිත්‍යය පෝෂණය විය. එසේ නිර්මාණය වූ ඓතිහාසික ලේඛන සම්ප්‍රදාය සිංහල සංස්කෘතියේ අනන්‍යතාව පෙන්වන සාධකයක් සේ සලකනු ලැබේ.

මහින්දාගමනයට පෙර ප්‍රාථමික අවස්ථාවක පැවති ගෘහ නිර්මාණ ශිල්පය මින් පසු වර්ධනය වන අතර ස්තූප, බෝධිඝර, පටිමාඝර, උපෝසථඝර, දානසාලා, පධානඝර වැනි වාස්තු විද්‍යා අංග ඊට එකතු විය. ඒ සමඟ බෞද්ධ ආභාසය මූර්ති, කැටයම් හා චිත්‍ර වැනි කලාවන්හි ද විද්‍යමාන විය.

**පංචශීල ප්‍රතිපදාව හා අවිහිංසාවාදී දර්ශනය**

සත්ත්ව කරුණාව, අන්සතු දෑ පැහැර නොගැනීම, කාමයෙහි වරදවා නො හැසිරීම, සත්‍යය කථා කිරීම, මද්‍යපානයෙන් තොරවීම යන සමාජ ධර්ම බුදුසමය විසින් ලාංකීය ජන සමාජයට හඳුන්වා දෙන්නේ මහින්දාගමනයත් සමඟ ය. ඒ අනුව යහපත් පුරවැසියෙකු බිහි කිරීමට අවශ්‍ය මූලික ශික්ෂණය මිහිඳු හිමියන් හඳුන්වාදෙන ලදී.

විශේෂයෙන් ම මෙරට පාලකයන් ''මාඝාත'' ආඥාව පවා ක්‍රියාත්මක කරනු ලැබුවේ බුදු සමයේ ආභාසයෙන් ය. පළමුවන පරාක්‍රමබාහු රජු එසේ මාඝාත නියෝගය පැන වූ පාලකයෙකි. විශේෂයෙන් ම සතර පොහොය දිනවල සතුන් මැරීම තහනම් කළ අතර ඇතැම් ජලචර සතුන්ට හා ගොඩබිම සතුන්ට අභයදානය දී ඇත. සිරිසඟබෝ රජතුමා සොරකම් කරන්නවුන්ට මරණ දණ්ඩනය පවා පනවා ඇත. එහෙත් ඔහු කිසි දිනක මරණ දණ්ඩනය ක්‍රියාත්මක කොට නැත. වරදකරු අල්ලාගෙන විත් අවබෝධ කරවා රහසේ ම නිදහස් කරනු ලැබීය. මත්පැන් පානය කරන්නා කිසිවකටත් නොහොබී යැයි මහනුවර රජ කළ පළමුවන විමලධර්මසූරිය රජු ප්‍රකාශ කළේ ය.

## 3.6 දින චර්යාව හා චාරිත්‍ර වාරිත්‍ර

භික්ෂුවට නියමිත දින චර්යාව හා බොහෝ සේඛියා ධර්ම ගිහියන්ට ද අදාළ වේ. මේවා තුළින් කාලය කළමනාකරණය කිරීමට හුරුවීමක් හා ආත්ම සංවරයක් ඇති වේ.

- සිහියෙන් අනුභවය
- බත පමණට ව්‍යංජන ගැනීම.
- ශබ්ද නොනැගෙන සේ අනුභවය
- පමණ දැන ආහාර ගැනීම
- ආහාර ගැනීමේ දී සංවර බව

ආදී චාරිත්‍ර මෙරට වැසියාට බුදු සමයත් සමඟ උරුම විය. තැනට උචිත ලෙස පිරිසිදු ඇඳුම් ඇඳීම, සියලු ශරීරාංග වැසෙන සේ සංවර ඇඳුම් ඇඳීම ආදිය පිළිබඳ ව ශික්ෂණයක් මෙරට ජනයාට බුදුදහමේ ආභාසයෙන් ලැබී ඇත. එසේම චාම් බව, ගිජු නොවීම, ධාර්මික වීම, උපේක්ෂාවෙන් කටයුතු කිරීම, ලද දෙයින් සතුටු වීම, පහසුවෙන් පෝෂණය කළ හැකි වීම, නිවැරදි ආවාහ-විවාහ ක්‍රම, නිවැරදි උත්සව ආදිය, නිරර්ථ සේ ධනය වැය නොකිරීම, කාලය නිකරුණේ ගත නොකිරීම ආදී චාරිත්‍ර-වාරිත්‍ර බුදු සමයෙන් උගැන්විණ.

## 3.7 පවුල් සංස්ථාව, ධාර්මික ධනෝපාර්ජනය හා පොදු කටයුතු

මව, පියා, දූ දරුවන් අතර පැවතිය යුතු වගකීම් හා යුතුකම් පද්ධතියක් සිඟාලෝවාද සූත්‍ර දේශනාව තුළින් ඉදිරිපත් කර පවුල් සංස්ථාව සුරක්ෂිත කිරීමට කටයුතු කර ඇත. එපමණක් නොව පවුල හා ගිහි පැවිදි, දැසි-දස් ආදී සියලු සංස්ථා විසින් අනුගමනය කළ යුතුකම් හා වගකීම් බුදුදහම පෙන්වා දෙයි.

දුගී-මගී යාචකයන්ට සැලකීම, විකලාංග පුද්ගලයන්ට විශේෂ සැලකිල්ලක් දැක්වීම, අනාථ වූවන්ට විශේෂ අනුග්‍රහයක් දැක්වීම, අසරණයන්ට ආහාරපාන වස්ත්‍ර ලබා දීම, රෝහල් ඉදි කිරීම, රෝගීන්ට උවටැන් කිරීම, සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීම ආදී සුභසාධන කටයුතු මෙරට ජන සමාජයට හුරුවන්නේ මහින්දාගමනයත් සමඟ ය. විහාරස්ථාන කේන්ද්‍ර කර රෝහල් ඉදි කිරීම හා භික්ෂු-භික්ෂුණීන් උපස්ථායක-උපස්ථායිකාවන් සේ කටයුතු කිරීම සැලකිය යුතු කරුණු වේ.

අතීත රජවරුන් විසින්,

- වෙහෙර විහාර ඉදි කිරීම
- දළදා පෙරහැර හා දළදා පූජෝත්සවය වැනි විවිධ උත්සව පැවැත්වීම
- වැව් පොකුණු සෑදීම
- වාරි කටයුතු සුරක්ෂිත කිරීම
- පාලම්, ඒ දඬු තැනීම
- ළිං පොකුණු සෑදීම
- සෙවණට ගස් සිටුවීම

ආදී ආගමික හා සුභසාධක කටයුතු සඳහා සූත්‍රගත න්‍යාය ධර්ම උපයෝගී කරගෙන ඇත.

මෙලෙස සියලු ක්ෂේත්‍ර කෙරෙහි ඍජුව ම බුදුදහමේ බලපෑමක් ඇති වීම මහින්දාගමනයෙන් හටගත් ප්‍රතිඵලයක් ලෙස සඳහන් කළ හැකි ය. දෙවනපෑතිස් රජ සමයේ සිට වර්තමානය දක්වා ම රජය සහ බුදු සමය අතර අවියෝජනීය බැඳීමක් පවතින අතර ඒ තුළින් රජය හා රජු ධාර්මික විය යුතුය යන අදහස මෙරට මුල් බැසගෙන ඇති බව කිව යුතු වේ.

## ක්‍රියාකාරකම්

1. ප්‍රාග් මහින්ද යුගයේ පැවැති ආගමික විශ්වාස පිළිබඳ හැඳින්වීමක් කරන්න.
2. මහින්දාගමනය නිසා මෙරට ජනයාට උරුම වූ ආගමික හා සංස්කෘතික දායාද වගුගත කරන්න.

# 04

# අනුරාධපුර යුගයේ දේශපාලන, ආර්ථික හා සමාජ ඉතිහාසය



## හැඳින්වීම

අනුරාධපුර යුගයේ විසූ කීර්තිමත් රජවරු, ඔවුන්ගේ පරිපාලන සංවිධාන ව්‍යුහය, එකල පැවති දේශපාලන, ආර්ථික හා සංස්කෘතික රටාව සහ විදේශීය සම්බන්ධතා, පැරණි ලක්දිව පැවති තාක්ෂණය, අනුරාධපුර රාජධානියේ පරිහානියට හා බිඳ වැටීමට බලපෑ හේතු සාධක යන කරුණු මෙම පාඩමෙන් ඔබට විස්තර කර දීමට අපේක්ෂා කෙරේ.

විජයාවතරණයේ සිට පස්වන මිහිඳු රජුගේ රාජ්‍ය කාලය අවසානය දක්වා කාලවකවානුව තුළ ශ්‍රේෂ්ඨ රජවරු ගණනාවක් අපේ රටේ ජීවත් වූහ. ඔවුන්ගෙන් කිහිප දෙනෙකු පිළිබඳ සටහනක් පහත දක්වේ.

| අනුරාධපුර යුගයේ පළමුවන භාගය | අනුරාධපුර යුගයේ දෙවන භාගය |
|---|---|
| පණ්ඩුකාභය රජතුමා | ධාතුසේන රජතුමා |
| දේවානම්පියතිස්ස රජතුමා | පළමුවන කාශ්‍යප රජතුමා |
| දුටුගැමුණු රජතුමා | පළමුවන අග්බෝ රජතුමා |
| වළගම්බා රජතුමා | මානවම්ම රජතුමා |
| වසභ රජතුමා | සිවුවන මිහිඳු රජතුමා |
| මහසෙන් රජතුමා | |

මේ රජවරුන් අතුරින් දේවානම්පියතිස්ස රජ සමය පිළිබඳ ව තුන්වන පරිච්ඡේදයේ විස්තර කර තිබේ. අනෙක් රජවරුන්ගේ කාර්ය සංසිද්ධි හඳුනා ගැනීමට අපි අවධානය යොමු කරමු.

## 4.1 අනුරපුර නගර නිර්මාණය ඇරඹූ පණ්ඩුකාභය රජතුමා (ක්‍රි. පූ. පස්වන සියවස පමණ)

පණ්ඩුකාභය රජතුමාගේ පියා දීඝ ගාමිණී කුමරු ය. මව චිත්‍රා කුමරිය යි. දුටුවන් උමතු කරවන රූ සපුවක් ඇයට තිබුණු නිසා උන්මාද චිත්‍රා නමින් ප්‍රසිද්ධියට පත් වූවා ය.


පණ්ඩුකාභය කුමරු ත්‍රිවේධයෙහි පරතෙරට පත් පණ්ඩුල නම් බ්‍රාහ්මණයෙකු යටතේ ශිල්ප ශාස්ත්‍ර උගත් බව මහාවංසයේ සඳහන් වේ. මේ කුමරුට ළමා කාලයේ දී බොහෝ දුක් කම්කටොලු සහ බාධක රැසකට මුහුණ දීමට සිදු විය. පණ්ඩුකාභය කුමරු රජවනු දැකීමට මාමාවරු අකමැති වූහ. කුමරු ඝාතනය කිරීමට පවා සැලසුම් කර තිබුණි. ඒ සියලු බාධක ජය ගැනීමට පණ්ඩුකාභය කුමරුට හැකි විය.

### 4.1.1 අනුරාධපුර නගරය නිර්මාණය කිරීම

මාමාවරුන් සමඟ කළ සටන් ජයගත් පණ්ඩුකාභය කුමරු විවාහ කර ගත්තේ සිය ගිරිඛණ්ඩසිව නම් වූ තම මාමාගේ දියණිය වූ පාලි කුමරිය යි. ඇය ඉතා රූමත් ය. ''ස්වර්ණපාලි'' නමින් ද ඇය ප්‍රසිද්ධියට පත් වූවා ය.

පණ්ඩුකාභය කුමරු අනුරාධපුර ග්‍රාමය අනුරාධපුර නගරය බවට පත් කළේ ය. අනුරාධ ග්‍රාමය ඉදිකර තිබුණේ අනුරාධ ඇමතිවරයා විසිනි. ''ජෝතිය'' නම් ජෛන පූජකයා අනුරධපුර නගරය නිර්මාණය කළ වාස්තු විද්‍යාඥයා ලෙස සලකනු ලැබේ.

පණ්ඩුකාභය විසින් නගරයේ දිය අගලක් ඉදි කිරීම, නගරයට ඇතුළු වීමට ප්‍රධාන දොරටු හතරක් ඉදි කිරීම, නගර අභ්‍යන්තරයෙහි රජ මාලිගය ඉදි කිරීම, නගරයේ අලංකාරයට ඇතුළත උද්‍යාන, පොකුණු ඉදි කිරීම වැනි තොරතුරු මහාවංසයේ සඳහන් වෙයි.




**4.1 සිතුවම-උපුටා ගැනීම 6 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොතෙනි**

නගරය නිර්මාණය කිරීමේ දී නගරවාසීන්ගේ පහසුව හා සනීපාරක්ෂාව ගැන ද අවධානය යොමු කර තිබේ. නගරය පිරිසිදු කිරීමට සැඩොලුන් පන්සීයක් යොදවා ඇත. මළ මිනී ඉවත් කිරීමට සැඩොලුන් 150 ක් ද සොහොන් ගොව්වන් ලෙස තවත් සැඩොලුන් පිරිසක් ද නගරයට බටහිර දෙසින් ''මහා සුසාන භූමිය'' හා ''වධකස්ථානය'' ද පිහිට වූ බව සඳහන් වෙයි. මේ හැර සැඩොලුන් සඳහා වෙන ම ගමක් වෙන් කර එම ගමට ඊසාන දෙසින් ''නීච සුසාන'' නමින් සොහොන් බිමක් ද කරවී ය. මේ ආකාරයට ඉතා ක්‍රමානුකූලව අනුරාධපුර නගරය නිර්මාණය කර ගැනීම සඳහා කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය නම් ග්‍රන්ථයෙන් මනා ආභාසයක් ලැබී ඇතැයි ද පැවසේ. එම ග්‍රන්ථය ඉන්දීය පාලකයන්ට රාජ්‍ය පාලනයට උපදෙස් දීමේ අරමුණින් රචනා කරන ලද්දකි.

### 4.1.2 පාලන සංවිධානය

අනුරාධපුර නගරය පණ්ඩුකාභය රජතුමාගේ පාලන මධ්‍යස්ථානය විය. මෙහි සිදු කළ ප්‍රථම අභිෂේක උත්සවය පණ්ඩුකාභය රජුගේ රාජාභිෂේකය යි. එහි දී ස්වර්ණපාලි කුමරිය අගමෙහෙසිය ලෙස අභිෂේක ලැබුවා ය. පණ්ඩුල බ්‍රාහ්මණයාගේ පුත් චන්ද්‍ර කුමාරයාට පුරෝහිත තනතුර ප්‍රදානය කරන ලදී.

එතුමාට උපකාර කළ හැම දෙනාට ම සුදුසු තනතුරු පිරිනැමී ය. තමාටත් තම මවටත් හිතවත් ව සිටි අභය නම් වූ මාමාට රත්තිරජ්ජ තනතුර පැවරී ය. නගර ගුත්තික නමින් තනතුරක් ද මෙකල තිබුණේ ය. ගිරිඛණ්ඩසිව මාමාට එනමින් හැඳින් වූ ප්‍රදේශයේ පාලනය පැවරී ය. රාජ්‍ය පාලනය ක්‍රමවත් කර ගැනීම සඳහා ග්‍රාම සීමා නියම කළ බව සඳහන් වේ. එමගින් මේ රටේ ගම්සභා ක්‍රමය ආරම්භ වී යැයි සැලකේ.

තම අභිෂේකයට ජලය ගත් විල ගැඹුරට හාරා එයට ජය වැව යන නම තැබී ය. **ජය ලත් කළ දිය නැහෙයින් ඒ ජය වැව නම් වී** යැයි මහාවංසයේ ඒ බව සඳහන් වේ. තම දෙටු මයිලණු අභය විසින් කුඩාවට සාද තිබුණු අභය වැව පණ්ඩුකාභය රජතුමා විසින් විශාල කරවන ලදී. වර්තමානයේ එම වැව බසවක්කුලම නමින් හැඳින්වෙයි. පණ්ඩුකාභය රජතුමා ගාමිණිවාපි නමින් තවත් වැවක් ඉදි කර වීය.

### 4.1.3 ආගමික සේවය

පණ්ඩුකාභය රජතුමා එකල ලක්දිව පැවති මිථ්‍යා ඇදහිලි හා විශ්වාස ආදියට අනුග්‍රහය දක් වූ බව මහාවංසයේ සඳහන් වෙයි. මේ නිසා එතුමා සහනශීලී ආගමික ප්‍රතිපත්තියක් අනුගමනය කළ බව පෙනේ. එම විස්තර තුන්වන පරිච්ඡේදයේ විස්තර කර තිබේ.

#### 4.1.4 පණ්ඩුකාභය රජ සමයේ ඓතිහාසික වැදගත්කම

පණ්ඩුකාභය රජු පිළිබඳ කතාන්තරය පුරාවෘත්ත හා ජනප්‍රවාද මත ගොඩනැගී ඇති නිසා එම රජතුමාගේ ඓතිහාසික වැදගත්කම අප තෝරා බේරා ගත යුත්තේ ඉතා පරිස්සමෙනි.

ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින් ලක්දිවට පැමිණි සංක්‍රමණික කණ්ඩායම් ලක්දිව වයඹදිග හා නැගෙනහිර ප්‍රදේශවල ජනපද පිහිටුවා ගත්හ. එම සංක්‍රමණ කණ්ඩායම් දෙක එක් කළ පුද්ගලයා පණ්ඩුකාභය රජතුමා වශයෙන් සැලකීමේ වරදක් නැත.

ප්‍රථමවරට ලක්දිව ක්‍රමවත් සංවිධානාත්මක පරිපාලන තන්ත්‍රයක් ගොඩනගා ගත්තේ ද පණ්ඩුකාභය රජතුමා ය. ඉහත දක්වූ පරිදි ගම් වැව් තුනක් ඉදි කර එකල ජනතාවගේ කෘෂි ආර්ථිකය නගා සිටුවා ගැනීමට ද කටයුතු කළේ ය. එතුමා ආරම්භ කළ අනුරාධපුර රාජධානිය වසර 1500 ක් තරම් ආසන්න කාලයක් පැවතිණ. සාහිත්‍ය මූලාශ්‍රයට අනුව පළමුවරට ක්‍රමවත් නගර නිර්මාණයක් කළ පාලකයා ද පණ්ඩුකාභය රජතුමා ය. පුරාවිද්‍යා කැණීම්වලින් සොයා ගත් අනුරාධපුර පැරණි නගරයේ ආරක්ෂක පවුරේ පාදම යැයි සිතිය හැකි මැටියෙන් ගොඩනැගූ බැම්මක් සොයා ගෙන ඇත. එය පණ්ඩුකාභය රජ සමයට අයත් වූවක් ලෙස අනුමාන කෙරේ. එතුමාගේ රාජ්‍ය කාලය වසර 70ක් ලෙස වංසකථාවල සඳහන් වේ.

**ක්‍රියාකාරකම**

1. පණ්ඩුකාභය රජුගේ ළමා කාලය පිළිබඳ කුඩා පොතක් සකස් කරන්න.

## 4.2 ප්‍රථමවරට රට එක්සේසත් කළ දුටුගැමුණු රජතුමා (ක්‍රි. පූ. 161 - 137)

මෙම රජු පිළිබඳව හැදෑරීමට ඇති ප්‍රධාන මූලාශ්‍රය මහාවංසය යි. එහි පරිච්ඡේද ගණනාවක් එතුමාගේ කාර්ය සංසිද්ධිය ගෙන හැර දැක්වීම සඳහා කැප කොට ඇත. මේ නිසා මහාවංසයේ වීර චරිතයක් බවට දුටුගැමුණු රජු පත් වී තිබේ.

මේ රාජ්‍ය කාලය ගැන තොරතුරු සපයා ගැනීමට ථූපවංසය, ළලාටධාතුවංසය, සද්ධර්මාලංකාරය වැනි වෙනත් ග්‍රන්ථ ද ප්‍රයෝජනවත් වේ. සාහිත්‍ය මූලාශ්‍රය මගින් හෙළිවෙන ඇතැම් තොරතුරු සමකාලීන බ්‍රාහ්මී සෙල්ලිපිවලින් තහවුරු වේ.

### 4.2.1 දුටුගැමුණු රජ පෙළපත

දේවානම්පිය තිස්ස රජුගේ සොහොයුරු යුවරාජ මහානාගගෙන් රුහුණේ මාගම රාජධානිය ආරම්භ විය. ඉන්පසු යටාලතිස්ස, ගෝඨාභය, කාවණ්තිස්ස යන අය පිළිවෙලින් මාගම රාජ්‍යයෙහි පාලකයෝ වූහ. කාවණ්තිස්ස රජතුමා කැලණි රාජ්‍යයේ තිස්ස රජුගේ දියණිය වූ විහාරමහා දේවිය සරණපාවා ගත් බව මහාවංසයේ හා ළලාටධාතුවංසයේ සඳහන් වෙයි. මෙම පුවත යටහලෙන, කොටාදමූ හෙළ යන බ්‍රාහ්මීය ශිලාලේඛන මගින් තහවුරු කර ගත හැකි බව මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීහු පවසති. කාවණ්තිස්ස හා විහාරමහා දේවියගේ වැඩිමහල් පුතා දුටුගැමුණු කුමරු ය. තිස්ස බාල පුතා ය. තිස්ස කුමරු අතිශයින් ම සැදැහැබර වූ නිසා ''සද්ධාතිස්ස'' නමින් ප්‍රසිද්ධියට පත් විය.

### 4.2.2 එළාර රජුගේ ආක්‍රමණය

අනුරපුර පාලක අසේල රජු මරා, චෝළ දේශයෙන් පැමිණි එළාර අනුරාධපුර රජු බවට පත් විය. මොහුගේ රාජ්‍ය කාලය වසර 44කි. බෞද්ධයෙකු නොවූ එළාර රජු බෞද්ධ විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය නොකළ බව මහාවංසයේ සඳහන් තොරතුරුවලින් හෙළි වේ. ඔහු සැමට සාධාරණ හා යුක්තිගරුක ලෙස රට පාලනය කළ බවට මහාවංසයේ රසවත් කථා පුවත් කිහිපයකින් ම සඳහන් වෙයි. එළාර රජතුමා සමඟ සටන් කිරීමේ අදහසක් මාගම පාලක කාවණ්තිස්ස රජතුමාට තිබුණු බවක් නොපෙනේ. එහෙත් එළාර රජුගෙන් තර්ජන රෝහණ දේශයට එල්ලවේ යැයි සිතා රෝහණ දේශයේ දේශපාලන බලය තහවුරු කර ගැනීමට දූරදර්ශීව ක්‍රියා කළ බව පෙනේ. මතු දවස තම පුත් දුටුගැමුණු කුමරුට රට දමිළාධිපත්‍යයෙන් ගලවාගෙන එක්සත් රාජ්‍යයක් බිහි කර ගැනීමට ශක්තිමත් පදනමක් දැමූ පාලකයෙකු ලෙස හඳුන්වාදිය හැකි ය. කාවණ්තිස්ස රජතුමාගේ එම දූරදර්ශී ක්‍රියා කලාපය පිළිබඳ තොරතුරු මහාවංසයේ විස්තර නොවූවත් ළලාටධාතුවංසයේ විස්තර වී තිබේ. ඒ අනුව කාවණ්තිස්ස රජතුමා දුටුගැමුණු කුමරුට රජරට දමිළාධිපත්‍යයෙන් මුදා ගැනීමට මනා පදනමක් දැමූ අභීත රජෙකු ලෙස හඳුන්වා දිය හැකි ය.

### 4.2.3 දුටුගැමුණු කුමරු රෝහණයේ රජ වීම

පිය මහරජගේ අභාවයෙන් පසුව දිගාමඬුලු ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු කරමින් සිටි තිස්ස කුමාරයා මාගම රාජධානියට පැමිණ කණ්ඩුල හස්තියා සහ සිය මව සමඟ ආපසු දීඝවාපියට ගියේ ය. කොත්මලේ ප්‍රදේශයේ සිටි දුටුගැමුණු කුමරුට පිය මහරජුගේ අභාවය අමාත්‍යවරුන් විසින් දන්වා යවන ලදී. වහාම මාගමට පැමිණි දුටුගැමුණු කුමරු මාගම රාජ්‍යය භාර ගත්තේ ය. මාගම රාජධානියේ අභිෂේක ලැබූ දුටුගැමුණු කුමරු මැණියන් සහ කඩොලැතු සමඟ මාගමට පැමිණෙන ලෙස සිය සහෝදරයාට දන්වා යැවීය.

### 4.2.4 දෙසොහොයුරන් අතර සටන් ඇති වීම

දුටුගැමුණු කුමරුගේ ඉල්ලීම තිස්ස කුමරු නොසලකා හැරී ය. සේනාව පිරිවරාගෙන දුටුගැමුණු කුමරු දීඝවාපිය බලා පිටත් විය. බුත්තල දී දෙසොහොයුරන් අතර සටනක් ඇති විය. මේ සටනේ දී දසමහා යෝධයෝ මැදහත්ව සිටියහ. මෙම සටන සිදු වූ ස්ථානය ''චූලංගනී පිට්ඨී'' යැයි මහාවංසයේ සඳහන් වේ. සටනින් පැරදුණු තිස්ස කුමරු විහාරස්ථානයක සැඟවිණි. වර්තමානයේ මේ විහාරස්ථානය හැඳින්වෙන්නේ ''දෙමටමල් විහාරය'' යන නමිනි. තිස්ස කුමරු ආපසු දීඝවාපිය බලා පිටත් විය. රුහුණේ ගෝධගත්ත තෙරුන් වහන්සේ දෙසොහොයුරන් සමගි කර වූහ. ඉන්පසු දුටුගැමුණු රජතුමා රජරට දමිළාධිපත්‍යයෙන් මුදවා ගැනීමට සේනා සංවිධාන කටයුතු කළේ ය. මේ සඳහා සිය මෑණියන්ගේ හා මහාසංඝයාගේ උපදේශකත්වය ද ලැබුණි.

### 4.2.5 විවිධ ක්ෂේත්‍රයන්හි දක්ෂතා ඇති දසමහා යෝධයෝ

කාවන්තිස්ස රජතුමා දසමහා යෝධයන්ගෙන් සමන්විත හමුදවක් සංවිධානය කර තිබීම එතුමාගේ දූරදර්ශී ක්‍රියා කලාපයට කදිම නිදසුනකි. එම හමුදාව දුටුගැමුණු රජතුමා යටතේ විය. දුටුගැමුණු රජතුමා රජරට ජයග්‍රහණය කරන ලද්දේ මෙම හමුදාව නිසාය. වංසකථාවල දසමහා යෝධයන් පිළිබඳ ව රසවත් කථාපුවත් සඳහන් වේ. දිවයිනේ විවිධ ප්‍රදේශවලින් බඳවා ගත් මේ දසමහා යෝධයන් ගැන සඳහන් ව ඇති සමකාලීන ශිලාලේඛන කීපයක් හමු වී තිබේ.

» පරුමක නදිමිත
» පරුමක වෙළශුමන
» ශෙනපති පුශදෙව

යනුවෙන් සඳහන් වන්නේ නන්දිමිත්‍ර, වේළුසුමන, ඵුස්සදේව යෝධයන්ගේ නම් ලෙසින් හඳුනාගෙන ඇත. ඒ අනුව වංසකථාවල දැක්වෙන මේ තොරතුරුවල ඓතිහාසික වටිනාකම ආනාවරණය වේ.

» **නන්දිමිත්‍ර**
» **වේළුසුමන**
» **මහා සෝණ**
» **ගෝඨයිම්බර**
» **ඵුස්සදේව**
» **ලභියවසභ**
» **ඛඤ්ජදේව**
» **ථෙරපුත්තාභය**
» **සුරනිමල**
» **භරණ**

මේ දසමහා යෝධයන් විජිතපුර සටනේ දී පෑ දස්කම් පිළිබඳ ව විචිත්‍රාකාරයෙන් මහාවංසයේ විස්තර වෙයි.

### 4.2.6 රජරට විජයග්‍රහණය

''මාගේ මේ ව්‍යායාමය රජ සැප පිණිස නොවේ; හුදෙක් සම්බුදු සසුනේ චිරස්ථිතිය සඳහා'' ය. යන සටන් පාඨය, මහ ජනයා, යුද හමුදව හා මහා සංඝ රත්නය අතර කාවද්දා සුබ නැකතින් රජරට සංග්‍රාමය දියත් කළේ ය. ගමන ආරම්භ කළේ ගුත්තහාල හෙවත් බුත්තල ප්‍රදේශයෙනි. සර්වඥධාතූන් වහන්සේලා තැන්පත් කළ රජුගේ ජයකුන්තය පෙරට තබාගෙන භික්ෂූන් වහන්සේලා පෙරටු කොටගත් යුද සේනාව මහවැලි ගඟින් එතෙර බලා ගමන් කළේ ය. එසේ යන ගමනේ දී මහියංගණ ස්තූපය ප්‍රතිසංස්කරණය කළ බව ද සඳහන් වේ. මහියංගණයේ දී එළාර රජුගේ හමුදව සමඟ දරුණු සටන්වලට මුහුණ දී ජය ලැබූ සේනාව බලපම්පන්න විජිතපුර බලකොටුව බලා පිටත් විය.


### 4.2.7 විජිතපුර සටන

සිවු මසක් පුරා සටන් කොට අවසානයේ දී බිහිසුණු සංග්‍රාමයකින් විජිතපුර බලකොටුව ජය ගත්තේ ය. මේ සටන පිළිබඳ ව දීර්ඝ විස්තරයක් මහාවංසය ගෙන එයි. විජිතපුර සටනින් පසුව තවත් සටන් කිහිපයකට මුහුණ දුන් දුටුගැමුණු කුමරු ද්වන්ධ සටනකින් එළාර රජු ඝාතනය කළේය.

### 4.2.8 එළාර රජුගේ දේහයට අවසන් ගෞරව දැක්වීම


''**වීර පුරුෂයන්ට ගෞරව දැක්වීම වීර පුරුෂයන්ගේ උතුම් ගතියකි.**'' ඒ අනුව රාජ චාරිත්‍රානුකූලව දේහයට අවසන් ගෞරව දක්වා එළාර රජු මිය ගිය ස්ථානයෙහි ස්මාරකයක් බඳවා එම ස්ථානය පසු කර යද්දී ගෞරව දැක්විය යුතු බවට ආඥවක් ද පැනවීය. එළාර රජුගේ ආදහනයෙන් දින හතකට පසුව දීඝජන්තු යෝධයාගේ බෑණා වූ භල්ලුක නම් සෙන්පති විශාල සේනාවක් රැගෙන මාතොටින් ගොඩබැස අනුරාධපුරය බලා පිටත් විය. දුටුගැමුණු රජතුමා සේනාව සමගින් පෙරමගට ගොස් මහා විහාර සීමාව සමීපයේ දී සටන් කොට ඔහු පරාජයට පත් කළේ ය.

මේ ආකාරයට දුටුගැමුණු රජතුමා පිය මහරජුගේ පූර්ව සැලසුම මත සිය මවගේ, සොහොයුරාගේ, දසමහා යෝධයින්ගේ සහායෙන් භික්ෂූන් වහන්සේලාගේ ආශිර්වාදයෙන් එළාර රජුගේ ආධිපත්‍යය බිඳ දමා රජරට ජයගෙන ලංකාව එක්සේසත් කළේ ය. මේ අනුව පළමු වරට ලංකාව එක්සේසත් කිරීමේ ගෞරවය දුටුගැමුණු රජතුමාට හිමි වේ.




**4.1 සිතියම-දුටුගැමුණු රජුගේ සටන් ව්‍යාපාරය**

**උපුටා ගැනීම: කුඩාවැල්ලේ කල්‍යාණවංශ ධීරානන්ද හිමි, ශ්‍රී ලංකාවේ ඓතිහාසික භූමි සිතුවම්.**



4.1 රූපය-රුවන්වැලි මහාසෑය (පැරණි ස්වරූපය)

### 4.2.9 දුටුගැමුණු රජතුමාගේ ශාසනික සේවා

මේ පිළිබඳ ව දීර්ඝ විස්තර සාහිත්‍ය මූලාශ්‍රයවල විස්තර අන්තර්ගත වේ. ඒ අනුව විහාර 99ක් ඉදි කර ඇත. මේ අතරින් රුවන්වැලි මහාසෑය, මිරිසවැටිය, ලෝහමහාපාය ඉතා විශිෂ්ට නිර්මාණ ලෙස සඳහන් කළ හැකි ය. රුවන්වැලිමහාසෑයේ සර්වඥධාතු නිධාන උත්සවයට ඉන්දියාව, කාශ්මීරය, ඇලෙක්සැන්ඩ්‍රියාව වැනි සමකාලීන බෞද්ධ රටවලින් භික්ෂූන් වහන්සේලා වැඩම කළහ. ලෝහමහාපාය මහා විහාරවාසී භික්ෂූන් වහන්සේලාට විනය කර්ම කිරීම සඳහා ඉදි කළ උපෝසථඝරය යි. එතුමාගේ ජය කුන්තය තැන්පත් කර මිරිසවැටිය ස්තූපය සෑදවී ය. මේ නිසා සම්බුදු සසුනේ විශාල දියුණුවක් ඇති විය.

රුවන්වැලි මහාසෑයේ ධාතු ගර්භයේ චිත්‍ර ඇඳ ඇති බව ද කියැවේ. මෙකල බෞද්ධ චිත්‍ර කලාව පැවති බවට එය ද සාධකයකි. ලෝහමහාපාය මහල් නවයකින් යුක්තව දුටුගැමුණු රජතුමා විසින් ඉදි කරන ලද බව සඳහන් වේ. එය ගින්නෙන් පිලිස්සී ගිය නිසා සද්ධාතිස්ස රජතුමා විසින් සත්මහල් කොට නැවත තනවා ලෝහ උළුවලින් සෙවිලි කරන ලද බව වංසකථාවල වාර්තා වේ. එතැන් පටන් ලෝහ පාසාදය නමින් එය හැඳින්වීය.



4.2 රූපය-ලෝවාමහාපාය

#### 4.2.10 වෙනත් සේවා

සමාජ ශුභ සිද්ධිය උදෙසා රෝහල් හා තිඹිරි ගෙවල්, ආදිය ඉදි කළ බව වාර්තා වේ. පූජාවලිය, පාලි රසවාහිනිය, සද්ධර්මාලංකාරය වැනි ග්‍රන්ථවල එතුමා වැව් අමුණු ඉදි කළ බව සඳහන් වේ. සොරබොරවැව මෙතුමාගේ කාලයේ නිර්මාණය වූවක් ලෙස සැළකේ. සද්ධාතිස්ස රජතුමා එකල දිගාමඩුල්ල ප්‍රදේශය සහලින් ස්වයංපෝෂිත කර තිබුණි. සුවිසල් වෙහෙර විහාර මෙකල ඉදි වීමෙන් රාජ්‍ය භාණ්ඩාගාරය පොහොසත් ව තිබූ බව සිතිය හැකි ය.

එතුමාගේ රාජ්‍ය කාලය වසර 24 කි. ප්‍රථමවරට දිවයින එක්සේසත් කොට පාලනය ගෙන ගිය රජතුමා වශයෙන් එතුමාට ලංකා රාජ නාමාවලියේ විශිෂ්ට ස්ථානයක් හිමි විය. එතුමාගේ ආගමික සේවාව ද ඉමහත් ය.

**ක්‍රියාකාරකම**

1. රජරට ජයග්‍රහණය කිරීම සඳහා තම පියාගෙන් දුටුගැමුණු කුමරාට ලැබුණු සහයෝගය නිදසුන් දක්වමින් විස්තර කරන්න.

## 4.3 සතුරු කරදරවලට මුහුණ දුන් වළගම්බා රජතුමා (103/89-77)

වළගම්බා රජතුමා අපේ රටේ විසූ තවත් කීර්තිමත් රජෙකි. මොහුගේ පියා සද්ධාතිස්ස රජතුමා ය. වළගම්බා රජුට ලඤ්ජිතිස්ස, ථුල්ලත්ථන හා නාග නමින් සහෝදරයන් තිදෙනෙක් සිටියහ. නාග කුමාරයා පසු කලක බල්ලාටනාග නමින් හැඳින්විණි.

මහා රත්තක සෙනෙවියා මරා වළගම්බා කුමරු අනුරපුරය අල්ලා ගත්තේ ය. තම සහෝදර බල්ලාටනාග රජුගේ පුත් මහසිළු මහතිස් කුමරුන් හදවඩා ගත් නිසා වළගම්බා රජතුමා ''පිතුරාජ'' නාමයෙන් ප්‍රකට විය. සමකාලීන සෙල්ලිපිවල ''පිතිමහරජ'' නමින් ද අටුවා කථාවල ''පිතිමහාරාජ '' නමින් ද හඳුන්වා ඇත්තේ වළගම්බා රජතුමා ය.

### 4.3.1 දේශපාලන පසුබිම

වළගම්බා රජතුමාට බොහෝ සතුරු කරදරවලට මුහුණ දීමට සිදු වී ඇති බව පෙනේ. මෙය ජෛන, බ්‍රාහ්මණ වැනි අන්‍ය ආගමික පිරිස් ඉස්මතු වූ කාලවකවානුවකි. මහාවංසටීකාවේ දැක්වෙන අන්දමට තිස්ස, අභය, උතර යන ජෛනභක්තික කුමාරවරු තිදෙනා රාජ්‍ය බලය පැහැර ගැනීමට උත්සාහ කළහ. උත්සාහය ව්‍යර්ථ විය. ගිරිනිගණ්ඨාශ්‍රමයේ දී මේ තිදෙනා ගින්නට පැන දිවි නසා ගත්හ. මේ කාලයේ දී රුහුණේ නකුල ගමේ ජීවත් වූ තිස්ස (තීය) නම් බ්‍රාහ්මණයා වළගම්බා රජුට විරුද්ධව කැරලි ගැසී ය. මේ කැරැල්ල බොහෝ කලක් පැවතුණු බව සම්මෝහ විනෝදනී අටුවා කතාවේ සඳහන් වේ. මෙසේ රට අභ්‍යන්තරයේ අවුල් වියවුල් රැසක් ඇති වී තිබුණි. රටේ පැවති මෙම අර්බුද සමග දමිළ ප්‍රධානීන් හත් දෙනෙක් මහත් බල සේනා සමගින් ලක්දිව ආක්‍රමණය කළෝ ය. දෙපැත්තකින් එල්ලවූ සතුරු තර්ජනවලට මුහුණ දීමට වළගම්බා රජතුමා උපක්‍රමශීලී විය. ඔවුනොවුන් අතර යුද්ධ කරවා සතුරන් දුර්වල කළේ ය. ''අද පටන් රාජ්‍යය තොපට භාරය. තෝ දෙමළ සතුරන් විනාශ කරව යි.'' තිස්ස බ්‍රාහ්මණයා වෙත පණිවිඩ යැවීය. තිස්ස බමුණා මහත් සේ සතුටුව ආක්‍රමණිකයන් සමඟ සටන් වැදුණි.

ජයගත් දමිළ ආක්‍රමණිකයෝ වළගම්බා රජතුමා සමඟ සටන් කළහ. වළගම්බා රජතුමා පරාජයට පත් ව පලායන අවස්ථාවේ දී ගිරි නම් නිගණ්ඨයා ''මහ කළු සිංහලයා පලා යනවෝ යැයි'' උස් හඬින් කෑ ගැසී ය. ආක්‍රමණිකයන් හත් දෙනාගෙන් එක් ආක්‍රමණිකයෙක් රථයෙන් බැස සිටි සෝමාදේවිය ද තවත් කෙනෙක් පාත්‍රා ධාතුව ද රැගෙන දකුණු ඉන්දියාවට ආපසු ගියහ.


පැරදුණු රජ පිරිස වනගත වූහ. මලය ප්‍රදේශයේ වනගතව අප්‍රසිද්ධ ජීවිතයක් ගත කළ වළගම්බා රජතුමා ඇතුලු පිරිසට කුපික්කල මහාතිස්ස හිමි, හම්බුගල්ලක මහාතිස්ස හිමි වැනි තෙරුන් වහන්සේලා ආහාර පාන ආදියෙන් සංග්‍රහ කළහ; ආරක්ෂාව සැපයූහ. රජු හා සෙනෙවියන් අතර සමගිය පවත්වාගෙන යාම සඳහා කටයුතු කළහ.

වළගම්බා රජතුමාට වසර දහහතරකුත් මාස හතක් මලය දේශයේ සැඟ වී සිටීමට සිදු විය. මේ කාලය තුළ ආක්‍රමණිකයන් පස් දෙනා එනම් පුලහත්ථ, බාහිය, පණයමාර, පිළයමාර. දඨිය එකිනෙකා මරමින් රජකමට පත් වූහ. මෙකල ඉතා දරුණු දුර්භික්ෂයක් ද තිබුණි. එය වසර දොළොසක කාලයක් පුරා පැවතුණි. බැමිණිතියා සාය නමින් එය හැඳින්විණි.

වනගතව සේනා සංවිධානය කළ වළගම්බා රජතුමා අවසාන දමිළ පාලකයා වූ දඨිය මරා දෙවන වරට අනුරපුර රාජ්‍ය බලය ලබාගත්තේ ය. මෙසේ දේශීය හා විදේශීය සතුරු කරදර රැසකට අභීතව මුහුණදුන් වළගම්බා රජතුමාට යළි සතුරන්ගෙන් රට ගලවා ගත හැකි විය. එතුමාගේ එම උත්සාහය බෙහෙවින් ම අගය කළ යුතුය.

### 4.3.2 වළගම්බා රජුගේ ආගමික කටයුතු

එතුමාගේ ආගමික කටයුතු අතර වඩාත් කැපී පෙනෙන්නේ අභයගිරි විහාරය ඉදි කිරීමයි. තමා වනගතව සිටි අවදියේ දී උදව් කළ තිස්ස හිමිට මෙම විහාරය පූජා කළේ ය. මෙයින් නොසතුටට පත් මහාවිහාරීය භික්ෂු සංඝයා මහා තිස්ස හිමියන් මහා විහාරයෙන් නෙරපා හරින ලදී. මෙය භික්ෂු ශාසනයේ අර්බුදයක් ඇතිවීමට මුල පිරීමක් විය.



**4.3 රූපය-වනගහණ වූ අභයගිරි දාගැබ**

මෙම විහාරය අනුක්‍රමයෙන් ඉතා ජනප්‍රිය ආයතනයක් බවට සංවර්ධනය විය. අභයගිරි යතිවරු එතෙර රටවල ද ධර්මප්‍රචාරයට වැඩම කළහ. අභයගිරි විහාරයේ ශාඛාවක් ගිනිකොණ ආසියාවේ ජාවා රටේ පිහිටුවා තිබුණු බව එම ප්‍රදේශයෙන් හමු වූ සෙල්ලිපියකින් හෙළි වේ. මෙම ජාත්‍යන්තර කීර්තිය පිළිබඳ තොරතුරු මහාවංසයෙන් හෙළි නොවේ.

**එකල ඉදි වූ වෙනත් විහාර**

| විහාරයේ නම | කරවන ලද තැනැත්තා |
|---|---|
| සෝමාරාම විහාරය | වළගම්බා රජු |
| දක්ෂිණ විහාරය | උත්තිය නමැති යෝධයා |
| සාලියාරාමය | සාලිය ඇමතිගේ යෝධයා |
| පර්වතාරාමය | පර්වත නම් ඇමතිගේ යෝධයා |
| තිස්සමහාරාමය | තිස්ස ඇමතියා |

මේවා අනුරාධපුරය ආශ්‍රිත ව පිහිටා තිබේ. මීට අමතරව මායා රට හා රුහුණේ ද විහාර ඉදි කළ බව සිතිය හැකිය.

### 4.3.3 ත්‍රිපිටකය අට්ඨකථා ග්‍රන්ථාරූඪ කිරීම

එතුමාගේ කාලය තුළ මාතලේ අළු විහාරයේ දී (ආලෝක ලෙණ) ත්‍රිපිටකය හා අට්ඨකථා ග්‍රන්ථාරූඪ කිරීම ඉතා ම වැදගත් සිදුවීමකි. මේ පිළිබඳ විස්තර මහාවංසයේ හා නිකාය සංග්‍රහයේ සඳහන් වේ. මේවා එතෙක් පවත්වාගෙන ආවේ කටපාඩමෙනි. මීට අදාළ සියලු ම සූත්‍රාදිය සංගායනා කොට පුස්කොළවල ලිවීම ලෝක සාහිත්‍යයේ සුවිශේෂ සිද්ධියකි.

**ක්‍රියාකාරකම**

1. දුටුගැමුණු රජතුමාගේ හා වළගම්බා රජතුමාගේ කාර්ය සංසිද්ධි සසඳන්න.

## 4.4 ලම්බකර්ණ වංසික වසභ රජතුමා (ක්‍රි. ව. 67 - 111)

වසභ රජතුමා ලම්බකර්ණ වංස රජ පෙළපතේ ආරම්භකයා ලෙස සැලකේ. ඔහුගේ දෙමවුපියන් පිළිබඳව මූලාශ්‍රයවල සඳහන් නොවේ. ශිලාලේඛනවල සඳහන්වන අන්දමට වසභ රජු යක්ෂයන්ගෙන් පැවත එන්නකි. මේ රජුගෙන් ආරම්භ වූ රජ පෙළපත අවුරුදු තුන්සිය හැත්තෑවකටත් වැඩි කාලයක් පැවතිණි.

වසභ අනුරපුර රජකමට පත් වූයේ සබ හෙවත් සුභ නම් දෙරටුපාල රජුගෙන් පසුව ය. මහාවංසයට අනුව වසභ අනුරාධපුරයෙන් උතුරු දිග ප්‍රදේශයට අයත් කෙනෙකි. මොහුගේ මාමා කෙනෙක් සබ රජුගේ සේනාපතිවරයෙකු ලෙස කටයුතු කර තිබේ. ඒ අනුව ලම්බකර්ණ වංශයට රජයේ ඉහළ පිළිගැනීමක් තිබුණු බව පෙනේ. අතීතයේ ලම්බකර්ණ වංසිකයෝ රාජ්‍ය ලේඛන කටයුතු භාරව කටයුතු කළහ. වසභ රජ සමය දේශපාලන, ආර්ථික හා ආගමික වශයෙන් වැදගත් වේ.

### 4.4.1 වසභ රජ සමයේ දේශපාලන වාතාවරණය

වසභ රජවීම නිසා එතෙක් පැවති දේශපාලන අස්ථිර භාවය පහ වී ගියේ ය. එම රාජ්‍ය කාලය තුළ සාමකාමී දේශපාලන වාතාවරණයක් පැවතුණි. මධ්‍යගත පාලනය ශක්තිමත් කර ගැනීමට හමුදවේ උසස් නිලධාරීන් ඇමතිවරුන් හා සිය පුතුන් අතර රාජ්‍ය බලතල බෙදා දුන්නේ ය. මේ නිසා ලක්දිව බොහෝ ප්‍රදේශවල වසභ රජුගේ දේශපාලන ආධිපත්‍යය පැතිරුණි. ඒ බව දිවයිනේ විවිධ ප්‍රදේශවලින් ලැබී ඇති සෙල්ලිපි සාක්ෂි දරයි.

එකල යාපා පටුන ''ඉසිගිර'' නම් අමාත්‍යවරයෙකු විසින් පාලනය කළ බව වඩමාරච්චි පළාතේ වල්ලිපුරම් විෂ්ණු දේවාල භූමියෙන් හමු වූ රන් සන්නසින් අනාවරණය වේ. මෙහි වසභ රජු හඳුන්වා ඇත්තේ ''වහබ මහරජ'' යනුවෙනි. ඉසිගිරි අමාත්‍යවරයා යාපන ප්‍රදේශයේ පියංගුක තිස්ස නමින් විහාරයක් ඉදි කළ බව මෙහි සඳහන් වේ. මඩකලපුවේ ''කාසි මොටෙයි'' නම් ස්ථානයෙන් සොයා ගත් කුම චෝලෙයි සෙල්ලිපියට අනුව නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය පජිනතර නම් ඇමතිවරයෙකු විසින් පාලනය කර ඇත.

හබැස්ස සෙල්ලිපියට අනුව වසභ රජතුමාට උතර නමින් හැඳින් වූ පුතෙකු සිටි බව පෙනේ. ඔහු ගැන මහාවංසයේ සඳහන් නොවේ. උතර රුහුණු ප්‍රදේශය පාලනය කරන්නට ඇතැයි සිතිය හැක. තම්මැන්නා සෙල්ලිපියේ ''දුටග'' නමින් හැඳින් වූ වසභ රජුගේ තවත් පුතෙකු ගැන සඳහන් වේ. මේ සෙල්ලිපිය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් හමු වූ එකකි. ඒ අනුව එකල මායා රට දුටග විසින් පාලනය කරන්නට ඇතැයි සිතිය හැක.

මොහුගේ නම ද මහාවංසයේ සඳහන් නොවේ. මේ අනුව වසභ රජතුමාගේ දේශපාලන ආධිපත්‍යය අනුරාධපුරයට පමණක් සීමා වී නොතිබුණු බව පැහැදිලිය.

අනුරාධපුර නගරයේ ආරක්ෂාව කෙරෙහි ද වසභ රජතුමාගේ අවධානය යොමු විය. මෙම නගරය වටා විශාල ප්‍රාකාරයක් ඉදි කර වූ බව මහාවංසයේ සඳහන් වේ. එවැනි මහ පවුරක් ඉදි කළේ දේශීය හෝ විදේශීය සතුරන්ගෙන් එල්ල විය හැකි තර්ජනවලට මුහුණදීම සඳහා ය. නගරයේ තැනින් තැන පැවති පොකුණුවලට උමං මාර්ගයෙන් ජලය සපයා ඇත. මෙසේ රන්මසු උයනේ පොකුණට උමං මාර්ගයෙන් ජලය සපයාගත් බව මහාවංසයෙන් හෙළි වේ. මෙවැනි වාරිමාර්ග තාක්ෂණයක් පිළිබඳව සඳහන් වන පළමුවෙනි අවස්ථාව ද මෙයයි. එකල පැවති තාක්ෂණික දියුණුව ද එයින් පිළිබිඹු වේ.

### 4.4.2 ආර්ථික තත්වය

මේ රාජ්‍ය කාලයේ කෘෂිකර්මාන්තයේ සීඝ්‍ර දියුණුවක් ඇති විය. ගම් වැව් තැනීමේ ව්‍යාපෘතිය විශාල වැව් තැනීම දක්වා පුළුල් කිරීමේ මුල් පියවර තැබූ පාලකයා වන්නේ ද වසභ රජතුමා ය. එතුමා මහ වැව් 11ක් හා ඇළවල් 12ක් කර වූ බව මහාවංසයේ සඳහන් වේ. අඹන් ගඟ හරස් කර බඳින ලද අලිසාර හෙවත් ඇළහැර ඇළ එතුමාගේ නිර්මාණයකි. එතුමා විසින් කරවන ලද මහවැව් අතර මහවිලච්චිය, මානාකැටිය, නොච්චිපොතාන හා හිරිවඩුන්න යන වැව් පුරාවිද්‍යාඥයන් විසින් දැනට හඳුනාගෙන තිබේ. මෙම වාරිමාර්ග ක්‍රම යටතේ විශාල ඉඩම් ප්‍රමාණයක වගා කෙරිණි. රට වැසියාගේ යහපත උදෙසා කටයුතු කිරීමේ අදහසින් රජයේ දේපල විධිමත් ව පවත්වා ගැනීමට බදු අය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දුන්නේ ය. මේ නිසා රාජ්‍ය භාණ්ඩාගාරය ශක්තිමත් විය. රාජ්‍ය ආදායම මහජන ශුභ සිද්ධිය සඳහාත් වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරගැනීම සඳහාත් යොදවා තිබේ.

### 4.4.3 ආගමික කටයුතු

ථූපාරාම දාගැබට වටදාගෙයක් ද ඉසුරුමුණි විහාරයේ පොහොය ගෙයක් ද කරවීය. සෑගිරිය, රුවන්වැලි සෑය, බෝධිය වැනි පූජනීය ස්ථානවල දහස් සංඛ්‍යාත පහන් පූජා පැවැත් වූ බව සඳහන් වේ. රුහුණේ සිතුල්පව් විහාර භූමියේ දාගැබ් සාදන ලදී. දිවයිනේ විවිධ ප්‍රදේශවල පැවති වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කර තිබේ. ඔහුගේ මෙහෙසිය වූ ''මෙත්තා'' විසින් මහ බෝ මළුවෙහි ද ගැබක් හා වටදා ගෙයක් ද කරවන ලදී.

එතුමා විසින් හඳුන්වා දෙන ලද ලම්බකර්ණ වංසය ලාංකික දේශපාලන ජන ජීවිතයට හා වාරිමාර්ග තාක්ෂණයට සපයන ලද දායකත්වය නිසා ලංකා ඉතිහාසයේ නව යුගයක් උදා කළ පාලකයෙකු ලෙස අගය කළ හැකිය.

## ක්‍රියාකාරකම

1. වසභ රජ සමයේ ඇති වැදගත්කම පහදන්න.

## 4.5 මහවැව් ඉදි කළ මහසෙන් රජතුමා (ක්‍රි. ව. 276 - 303)

### 4.5.1 මහසෙන් රජුගේ මහාවිහාර විරෝධී ප්‍රතිපත්තිය

සංඝමිත්‍ර නම් භික්ෂුව ලක්දිවට පැමිණ ගෝඨාභය රජුගේ සිත දිනා ගැනීමට සමත් විය. වැඩිමහල් පුත් දෙටුතිස් වෛතුල්‍ය දහම ඉගෙනීමට අකමැති වුව ද බාල පුත් මහසෙන් කුමරු කැමති විය. ආපසු ඉන්දියාවට ගිය සංඝමිත්‍ර භික්ෂුව නැවත ලක්දිවට පැමිණ මහසෙන් රජුගේ අනුශාසක ලෙස කටයුතු කරමින් තමන්ට රිසි ලෙස වෛතුල්‍ය දහම මේ රට තුළ සමාජ ගතකිරීමට උත්සාහ ගත්තේ ය. මහසෙන් රජතුමා සංඝමිත්‍ර භික්ෂුවගේ උපදෙස් මත මහාවිහාර භික්ෂූන්ට හිරිහැර කළේ ය. මහසෙන්ගේ මහාවිහාර විරෝධී ආකල්ප හැඩගස්වා ගැනීමට බලපෑ වෙනත් හේතු ද තිබුණි. මේ වන විට ථේරවාදී බෞද්ධ සම්ප්‍රදය ගරු කළ පංචමහා ආවාස වන මහාවිහාරය, ථූපාරාමය, ඉසුරුමුණිය, වෙස්සගිරිය, චේතියගිරිය යන විහාරවාසී භික්ෂූන් වහන්සේලාගේ ධර්ම විනය අතින් පිරිහී සිටි බව ද පෙනී යන කරුණකි. මහාවිහාර භික්ෂූන් වහන්සේලා නොයෙක් මාර්ගවලින් පව්කම් කළ බව මහසෙන් රජුගේ ජේතවනාරාම සෙල්ලිපියෙන් අනාවරණය වෙයි. මේ කාලය වන විට භික්ෂූන් වහන්සේලා රජවරුන්ගේ පරිත්‍යාග නිසා ලෞකික අංශයට වැඩි ලෙස නැඹුරු වූහ. දේපල අයිති වීම භික්ෂූන් වහන්සේලාගේ ගමන් මග වෙනස් කරලීමට බලපෑවේය. මේ නිසා උන් වහන්සේලා ධර්ම විනයෙන් පිරිහී සිටි බව පෙනී යයි. මෙසේ මහාවිහාර භික්ෂූන් වහන්සේලාගේ පිරිහීම රජුගේ සිත වෙනස් කරන්නට වඩාත් පහසු විය. මේ පසුබිම සංඝමිත්‍ර භික්ෂුවට ඉතා වාසිදයක වූ බව පෙනේ. ''**මහරජ මේ මහාවිහාරවාසී භික්ෂූහු දුශ්ශීලය, අවිනය වාදීහුය. අපි නියම විනය වාදීම්හ.**'' යන මතය ඉදිරිපත් කර මහ ාවිහාරීය භික්ෂූන්ට විරුද්ධ කරවීය. ඒ අසත්‍ය කරුණු මහසෙන් රජතුමා පිළිගෙන ''අද පටන් මහාවිහාරවාසී භික්ෂූන්ට දන මානාදිය දෙන යම් කෙනෙක් වෙත් නම් ඕ හට දහසක් දඩ ය''යි අණබෙර ගැස්වීය. මේ නිසා මහාවිහාර භික්ෂූන්ට පිණ්ඩපාතය පවා නොලැබුණි.

මහාවිහාරය අතහැර භික්ෂූන් වහන්සේලා රුහුණු මායා රටවලවලට පලා ගියහ. එතැන් පටන් වසර නවයක් තිස්සේ මහා විහාරය පාළු විය. මහාවිහාරයට අයත් ගොඩනැගිලි කඩා බිඳ දමා එම ද්‍රව්‍ය සම්පත්වලින් අභයගිරි විහාරයට අනුබද්ධව සුවිසල් මන්දිර සෑදවීය. සංඝමිත්‍ර භික්ෂුව දුෂ්ට සෝණ ඇමති ලවා මහාවිහාරය කඩා බිඳ දමා ඒ බිමේ උඳු වැපුරූ බව නිකාය සංග්‍රහයේ විස්තර කර තිබේ.



4.4 රූපය-වල්බිහි වී තිබූ ජේතවන දාගැබ

මහසෙන් රජතුමාගේ මහාවිහාර විනාශකාරී ප්‍රතිපත්තියට රට වැසියා විරුද්ධ විය. රජුගේ ප්‍රධාන අමාත්‍යවරයා වූ මේඝවණ්ණාභය මලය රටට පැන ගොස් බලසේනා සමග රජුට විරුද්ධව සටන් කිරීමට පැමිණ දූරතිස්ස වැව අසල කඳවුරු බැඳ ගත්තේ ය. මහසෙන් රජතුමා ද තම සේනාව සමඟ පැමිණ වැවේ අනෙක් පැත්තේ කඳවුරු බැඳගෙන සටනට සැරසුණි. මධ්‍යම රාත්‍රියේ දී මේඝවණ්ණාභය තම සේනාවට නොදන්වා රජු හමුවට ගොස් සුහද කථාවක යෙදුණි. තමාට මලය දේශයෙන් ලැබුණු මාංශ ආහාරය දී කා බී සතුටු විය. සටනට පැමිණීමට හේතු විමසා මහාවිහාර නාශක ප්‍රතිපත්තිය අතහැර දැමීමට පොරොන්දු වූ නිසා දෙපාර්ශ්වය සමගි සමාදන විය. එහෙත් මේ ප්‍රතිපත්තිය වැඩිකල් පැවතුණේ නැත. රජතුමා මහාවිහාර සීමාවේ ජේතවනාරාමය නමින් නව ආරාමයක් ඉදි කර දක්ඛිණ ගිරිවාසී තිස්ස හිමිට පූජා කළ නිසා යළි නොසන්සුන් වාතාවරණයක් උදා වූ බව පෙනේ.

සංඝමිත්‍ර භික්ෂුව හා සෝණ ඇමතියා ථූපාරාමය කඩා බිඳ දැමීමට සූදනම් වූ විට රජුගේ බිසවක් එක්තරා උළු වඩුවෙකු යොදවා සංඝමිත්‍ර භික්ෂුවගේ හිසට පොරෝ පහරක් දෙවා මැරවීය. එකෙණෙහි එතනට රැස් වූ නගරවාසීහු සෝණ ඇමතියා ද මරා දමූහ. මෙයින් පසුව රජතුමා යහමගට යොමු විය.

### 4.5.2 ආර්ථික කටයුතු

රට සහලින් ස්වයංපෝෂිත කිරීම රජුගේ ප්‍රධාන අරමුණක් විය. මහාවංසයට අනුව එතුමා මහ වැව් 16ක් ඉදි කරවා තිබේ. ඒ වැව් අතුරින් මින්නේරිය වැව, හුරුළු වැව, මහකනදරා වැව, මහගල් කඩවල වැව ආදී වැව් කැපී පෙනේ. මේ වැව්වලට අමතර ව පබ්බතන්ත නමින් ඇළක් තනවා තිබේ. එය සැතපුම් 20ක් පමණ දිග ය. ඔහුගේ වාරිකර්මාන්තයේ අග්‍ර ඵලය ඇළහැර-මින්නේරිය-කවුඩුලු ඒකාබද්ධ කළ ව්‍යාපෘතිය යි. රටවැසි ජනතාවට සිදු වූ එකී සේවාව නිසා එතුමා මින්නේරිය දෙවියෝ සහ සත් රජ්ජුරු බණ්ඩාර යන නම්වලින් දේවත්වයට පත් කිරීමෙන් පැහැදිලි වන්නේ රජරට ජනතාව කෘතවේදී ව මහසෙන් රජුගේ නාමයට ගරු කරන බව ය.

මහාවංස කතුවරයා පවසන්නේ මහසෙන් රජතුමා පිං පව් දෙක ම රැස් කර ගත් පාලකයෙකු ලෙස යි. මහාවිහාරය විනාශ කිරීම පව්කම් ලෙසත් කෘෂිකාර්මික සංවර්ධනයට කළ සේවය පිං ලෙසත් සැලකිය හැකිය. එතුමා නොමගට වැටුණේ පාපමිත්‍ර සේවනය නිසා බව ද පවසයි.

අපේ රටේ ජීවත් වූ මෙවැනි පාලකයන්ගෙන් සිදු වූ යහපත් සේවා අගය කළ යුතු ය.

## 4.6 මෝරිය වංශික ධාතුසේන රජතුමා (459 - 477)

ධාතුසේන රජතුමා අනුරාධපුර රාජධානියේ දෙවන මෝරිය වංසයේ ආරම්භකයා ය. එතුමාගේ පියා දැඨා නම් තැනැත්තෙකි. ධාතුසේන රජතුමා බලයට පත් වීමට පෙර දකුණු ඉන්දීය ආක්‍රමණිකයෝ මේ රට පාලනය කළෝ ය. පණ්ඩු පාරින්ද, ඛුද්ද පාරින්ද, තිරීතර, දඨිය, පීඨිය යනු ඒ ආක්‍රමණිකයන් ය. ඔවුන්ගේ අවසාන පාලකයා වූ පීඨිය මරා ධාතුසේන අනුරාධපුර රාජ්‍යය අත්පත් කර ගත්තේ ය. අනුරාධපුර රාජධානියේ සමෘද්ධිමත් ආර්ථිකයක් ගොඩනගා ගැනීමට එතුමා සමත් වූයේ ය.

එතුමාගේ කුඩා කාලය පිළිබඳ රසවත් තොරතුරු රැසක් වංසකථාවල දැක්වෙයි. දික්සඳ සෙනෙවියා පිරිවෙන්හි වැඩ විසූ මහානාම තෙරණුවෝ ඔහුගේ මයිලණු කෙනෙක් වූහ. උන්වහන්සේගේ සමීපයෙහි ධාතුසේන කුමාරයා පැවිදි වී සිටියේ ය.

පරසතුරන්ගෙන් රට ගලවා ගැනීමේ අදහස ඇතිව ඔහු උපැවිදි වී, අප්‍රකටව වෙසෙමින් සේනා සංවිධානය කළේ ය. දමිළ සතුරාගෙන් රට මුදවා ගැනීමේ උත්සාහයට රටවැසි ජනතාවගේ හා මහා සංඝයා වහන්සේගේ සහාය එතුමාට ලැබුණේ ය. මේ අනුව වසර විසි හතක් පමණ කාලයක් අනුරාධපුර රාජ්‍යයෙහි පැවති දමිළ පාලනය අවසන් කර දැමීමට ධාතුසේන රජතුමාට හැකි විය.

### 4.6.1 ආගමික කටයුතු

විජාතික පාලන සමයේ දී විනාශ වී ගිය වෙහෙර විහාර මෙතුමා විසින් ප්‍රතිසංස්කරණය කරන ලදී. තවද වෙහෙර විහාර දහ අටක් අභිනවයෙන් ඉදි කරවන ලදී. භික්ෂූන් වහන්සේලාට සිවුපසයෙන් සංග්‍රහ කිරීමට ද කටයුතු කළේ ය. අනුරපුර මහාපාළි දන සාලාව ප්‍රතිසංස්කරණය කිරීම එයට නිදසුනකි.

මිහිඳු පෙරහැර පැවැත්වීම ද එකල සිදු වූ ඉතා ම වැදගත් කරුණකි. මීට පෙර ලක්දිව විසූ රජවරුන් විසින් මිහිඳු පෙරහැර පැවැත් වූ බවට සාධක හමු නොවේ. මහාථූපය හෙවත් රුවන්වැලි මහාසෑය සුණු පිරියම් කරවා ඒ මුදුන්හි ඡත්‍ර නංවා අකුණු සැර නොවදින සේ වජ්‍ර චුම්බටකයක් සවි කළ බව මහාවංසයේ සඳහන් වේ.

කලාවැව සමීපයෙහි ඇති කාලවාපි විහාරය හෙවත් අවුකන විහාරය ද මෙතුමාගේ කාලයට අයත් යැයි සැලකේ. මෙම විහාර සංකීර්ණයේ වර්තමානයේ ද දක්නට ලැබෙන හිටි බුද්ධ ප්‍රතිමා වහන්සේ වංසකථාවේ සඳහන් වන්නේ ''කාලසේල සත්ථු'' (කළු ගල් බුදු පිළිමය) යන නමිනි.

### 4.6.2 කෘෂි ආර්ථික කටයුතු

ධාතුසේන මහරජතුමා ජනතාවගේ සුභ සිද්ධිය සඳහා මහවැව් දහ අටක් සහ කුඩා වැව් දහ අටක් කර වූ බව මහාවංසයේ සඳහන් වෙයි. මේවා අතුරින් කලාවැව ප්‍රධාන වේ. මෙම වැව කලා ඔය හා බළලු වැව ඒකාබද්ධ කොට සාදන ලද මහ වැවකි. මෙහි භූමි ප්‍රමාණය අක්කර 6380ක් පමණ වේ. මෙතුමා කර වූ වැව් පහළවක නම් පූජාවලියේ සඳහන් කර තිබේ.

කලා වැවේ සිට අනුරාධපුරයේ තිසාවැව දක්වා ඉදි කර තිබෙන යෝධ ඇළ ද මෙතුමා කරවන ලද්දකි. එහි දිග සැතපුම් 54කි. එහි දිය බැස්ම සැතපුමකට අඟලකි. මේ වැව ජය ගඟ නමින් ද හැඳින්වෙයි.

මෙතුමාගේ රාජ්‍ය කාලය වසර දහඅටකි. එතුමාට කාශ්‍යප හා මුගලන් නමින් පුතුන් දෙදෙනෙක් ද එක් දියණියක් ද සිටියහ. ධාතුසේන මහරජතුමා පරසතුරන්ගෙන් රට නිදහස් කරගෙන ජනතාවටත් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාත් කළ උදර සේවය අප විසින් සැමදා අගය කළ යුතු ය.

**ක්‍රියාකාරකම**

''ධාතුසේන රජතුමා අපේ කීර්තිමත් පාලකයෙකි''. යන තේමාව යටතේ පිරිවෙන් සඟරාවකට ලිපියක් සකස් කරන්න.

## 4.7 කලා රසිකයකු වූ පළමුවන කාශ්‍යප රජතුමා (479-497)

ලංකාවේ සංස්කෘතික ඉතිහාසයේ අග්‍රගණ්‍ය ඵලයක් වූ සීගිරියේ නිර්මාතෘවරයා වූයේ පළමුවන කාශ්‍යප මහරජතුමා ය. ඔහු අනුරාධපුර සිහසුනට පත් වන්නේ ධාතුසේන රජතුමාගෙන් පසුව ය. සිහසුනට නියම උරුමකාරයා මුගලන් ය. එහෙත් රජ පවුලේ ඇති වූ අභ්‍යන්තර අර්බුදයක් නිසා ඔහුට රජකම අහිමි විය.

වැඩිමහල් පුතා කාශ්‍යප කුමරු වුව ද ඔහු භින්නමාතක හෙවත් අන්‍ය දේවියකගේ පුතෙකි. එකල පිළිගත් රාජ්‍ය සම්ප්‍රදයට අනුව රජකම උරුම විය යුත්තේ මුගලන් කුමාරයාට ය. ඔහු ධාතුසේන රජුගේ අගබිසොවගේ කුසින් උපන් පුතා ය.

ධාතුසේන රජතුමාගේ දියණිය සරණ පාවා දුන්නේ මිගාර සේනාපතිවරයාට ය. මේ සෙන්පතිවරයා ඔහුගේ බිරිඳට (ධාතුසේන රජුගේ දියණිය) නිතර කරදර හිරිහැර කළ නිසා ධාතුසේන රජු සෙන්පති සමඟ උරණ විය. කාශ්‍යප කුමාරයාට එකතු වී රජකම ලබා ගැනීමට ඔහු පෙළඹවීය.



**4.5 රූපය-කලාවැව**

මුගලන් කුමරුට දීමට වස්තුව සඟවාගෙන ඇතැයි සිතූ කාශ්‍යප කුමරු සිය පියා ඝාතනය කළේ ය. බියට පත් මුගලන් කුමරු ඉන්දියාවට පලා ගියේ ය. ඉන්දියාවට පැන ගිය සිය සහෝදරයාගෙන් අනාගතයේ කෙදිනක හෝ තර්ජන එල්ල වේ යැයි සිතා අනුරපුරය අතහැර දුෂ්කර ගිරි දුර්ගයක් වූ සීගිරිය තම පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගත්තේ ය.

### 4.7.1 සීගිරි රජදහන

අනුරාධපුරයේ සිට සැතපුම් 40ක් පමණ දුරින් පිහිටි සීගිරිය අඩි 600ක් පමණ උසැති පර්වතයකි. එම පර්වත මුදුන අක්කර තුනකින් පමණ සමන්විත ය. මෙහි ආරක්ෂිත බලකොටුවක් ඉදිකළේ මුගලන් කුමරුට බියෙන් බව මහාවංසයේ 39 වන පරිච්ඡේදයේ 19 වන ගාථාවේ දැක්වේ.

පිය මහරජතුමා මැරූ නිසා පරලොව බිය ඇති වූ බවත් දකුණු ඉන්දියාවට පැන ගිය මුගලන් කුමරු බලසේනා සමග ආපසු පැමිණේ යැයි සිතා මුගලන් කුමරුට බිය වූ බවත් සිතිය හැකි ය. එහෙත් එතුමා කුවේරයාගේ ආලකමන්දව බඳු රජ මැදුරක් තනා කුවේර ලීලාවෙන් සීගිරි රජ දහනේ ජීවත් වූ බව පෙනේ. මෙහි දක්නට ලැබෙන විනෝද උයන්, නැටුම් මඩු, ජලස්නාන පොකුණු, සීගිරි චිත්‍ර, රාජ සභා මණ්ඩපය, ගීත හා ගිම්හාන මාලිගා වැනි අංග විමසා බලන විට සීගිරිය හුදෙක් යුද කාර්යයක් සඳහා ම ගොඩනගන ලද මධ්‍යස්ථානයක් දැයි විමසා බැලිය යුතු ය. සීගිරියේ දක්නට ලැබෙන නෂ්ටාවශේෂ හේතු කරගෙන මේ යුගය රටේ සංස්කෘතික ඉතිහාසයේ ඉතා වැදගත් තැනක් ගනී. ඒ පිළිබඳ විස්තරාත්මක තොරතුරු අපේ පැරණි තාක්ෂණය පාඩමේ දී විස්තර වේ.



**4.6 රූපය-සීගිරිය**


### 4.7.2 ආගමික කටයුතු

සිය පියා මැරීමේ පාප කර්මයෙන් මිදීම පිණිස ඔහු බොහෝ පිංකම් කළ බව මහාවංසයේ සඳහන් වේ. ඉසුරුමුණි විහාරය ප්‍රතිසංස්කරණය කරවා එම විහාරයට තම දියණිවරුන් වූ බෝධි, උත්පලවණ්ණා යන දෙදෙනාගේ ද තමාගේ ද නම් එක් කොට ''බෝ උපුල් කසුප්ගිරි වෙහෙර'' යන නම තබා මහා සංඝ රත්නයට පූජා කරන්නට සූදානම් විය. එතුමා පිතෘ ඝාතක අකුශල කර්මය කළ නිසා උන්වහන්සේලා එම ආරාමය පිළිගැනීම ප්‍රතික්ෂේප කළහ. රජතුමා එම විහාරය එහි මහ බුදුපිළිමයට පූජා කළේ ය. වෙනත් විහාරයක් ඉදි කර ධර්මරුචික නිකායේ භික්ෂූන්ට පූජා කළේ ය. රසවත් ආහාර වර්ග දන්දීම, අඹ උයන් ඉදි කිරීම, පෙහෙවස් සමාදන් වීම වැනි පිංකම් කළ බව ද සඳහන් වේ.

### 4.7.3 ආර්ථික තොරතුරු

කාශ්‍යප රජතුමාගේ රාජ්‍ය කාලය ආර්ථික වශයෙන් ද වැදගත් වේ. මේ රජ සමයේ දී ලංකාව හා රෝමය සමඟ වෙළඳ සබඳතා පැවතුණි. සීගිරිය අවටින් රෝම කාසි විශාල ප්‍රමාණයක් සොයා ගැනීමෙන් ඒ අදහස සනාථ වෙයි. ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා පවත්වාගෙන යාම සඳහා කාශ්‍යප රජතුමා කාසි නිකුත් කළ බව ද සඳහන් වේ සීගිරිය කලා මධ්‍යස්ථානයක් වශයෙන් ගොඩනගා ගැනීමට හැකි වූයේ එම යුගයේ ආර්ථික වශයෙන් විශාල දියුණුවක් තිබුණු නිසා ය.

කාශ්‍යප රජතුමා වසර දහඅටක් රජකම් කළේ ය. දකුණු ඉන්දියාවට පැන ගිය මුගලන් කුමරු ආපසු විශාල බලසේනා සමඟ ලක්දිවට පැමිණියේ ය. කාශ්‍යප රජුට විරුද්ධව සටන් කිරීමට සීගිරිය බලා පිටත් විය. කාශ්‍යප රජු ද සටනට සූදානම් වුව ද ඔහුගේ ඇතු මඩ වගුරක් අසල දී ආපසු හැරුණේ ය; සේනාව දුව ගියහ; රජු අසරණ විය; සියතින් ගෙල සිඳ ගත්තේ ය. මුගලන් සිය සොහොයුරාගේ අවසන් කටයුතු කර අනුරාධපුරයට ගොස් රජ විය.



**4.7 රූපය-සීගිරි ළඳුන්**

**ක්‍රියාකාරකම**

සීගිරිය පිළිබඳ තොරතුරු රැස් කර කුඩා පොතක් සකස් කරන්න.

මීළඟට අපි අනුරාධපුර දෙවන භාගයේ විසූ කීර්තිමත් රජවරු කිහිප දෙනෙක් හඳුනා ගනිමු.

## 4.8 උගතුන්ට අනුග්‍රහ දැක්වූ පළමුවන අග්බෝ රජතුමා (571 - 604)

මහානාග රජුගේ ඇවෑමෙන් පසුව ඔහුගේ බෑණා කෙනෙකු වූ අග්ගබෝධි අනුරපුර රජ විය. මේ නමින් රජ වූ ප්‍රථමයා නිසා ඔහු පළමුවන අග්ගබෝධි නමින් හැඳින්විණි. ඔහුගේ රාජ්‍ය කාලය වසර තිස් හතරකි. මේ කාලය ඉතා ම සාමකාමී විය. එසේ ම සමෘද්ධිමත් යුගයකි. ගුණ නුවණින් මෙන් ම සැදැහැබර, ජනහිතකාමී මෙතුමා උසස් ගුණාංග දහතුනකින් සමන්විත වූ බව මහාවංසයේ විස්තර කර තිබේ.

### 4.8.1 ආගමික කටයුතු

- කුරුන්දි නමින් විහාරයක් කරවා එහි නඩත්තු කටයුතුවලට කුරුන්දි වැව පූජා කිරීම සහ එයට කුඹුරු යායක් සහ තුන් යොදුන් පොල් උයනක් පූජා කිරීම.
- ඇඹුලපස නම් ගමේ විහාරයක් කරවා එම ගම එම විහාරයට පූජා කිරීම.
- උණුවෙල් වෙහෙර නමින් විහාරයක් කරවීම
- ලෝහාමහාපාය පිළිසකර කර තිස් දහසක් භික්ෂූන්ට තුන් සිවුරු පූජා කිරීම
- මහාවිහාරය, අභයගිරිය, ජේතවනය යන විහාරවල මහා පිංකම් කිරීමට අනුග්‍රහ දැක්වීම
- දළදා වහන්සේට මහාප්‍රාසාදයක් කරවා එයට රන් කරඬුවක් පූජා කිරීම
- මහාපාලි දන ශාලාවට ලෝහමය බත් ඔරුවක් කරවීම
- මෙකල වෛතුල්‍යවාදය පැතිරෙමින් තිබුණු අවධියකි. මහාවිහාර පාර්ශ්වය වෙනුවෙන් ජෝතිපාල නම් භික්ෂුව වෛතුල්‍යවාදීන් සමඟ වාද කර ඔවුන් පරාජයට පත් කළේ ය. මෙයට රජුගේ අනුග්‍රහය ලැබුණි

### 4.8.2 කෘෂිකාර්මික කටයුතු

- » ගිරිතට වාපි හෙවත් ගිරිතලේ වැව කරවීම
- » මහින්දතට වාපි නම් වැව කරවීම
- » කුරුණෑගල අසල වඩ්ඩමානක වැව කරවීම
- » මණිමේඛලා හෙවත් මිණිපේ අමුණ කරවා ජලය මහවැලි ගං නිම්නයේ පිහිටි කුඹුරුවලට ගෙනයාම
- » මුලතිව් අසල කුරුඳු වැව කරවීම
- » වව්නියාව අසල මාමඩුව වැව කරවීම

මේ අනුව එතුමාගෙන් රජරට කෘෂි ආර්ථිකයේ විශාල දියුණුවක් ඇති වූ බව පෙනේ.

### 4.8.3 ශාස්ත්‍රීය කටයුතු

එකල ශාස්ත්‍රීය කටයුතුවල යෙදුණු උගතුන්ට රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් පාලකයෙකි. පූජාවලිය හා නිකාය සංග්‍රහය අනුව හෙළබසින් පෙළ බසින්, සකු බසින් බොහෝ කාව්‍ය ග්‍රන්ථ මෙකල විසූ දෙළොස් මහාකවීන් විසින් ලියන ලදී. මෙකල සාමකාමී වාතාවරණයක් තිබුණු නිසා සාහිත්‍ය ක්ෂේත්‍රයේ ද විශාල දියුණුවක් ඇති විය.

❖ **එකල විසූ දෙළොස් මහාකවියෝ**

| | |
|---|---|
| සක් ද මලය | දළගොත් කුමරු ය |
| අසක් ද මලය | දළසල කුමරු ය |
| දමීය | කිත්සිරි කුමරු ය |
| බැබිරිය | පරවඩු කුමරු ය |
| දළ බිසෝකුමරු ය | සූරියබාහු ය |
| අනුරුත් කුමරු ය | කසුප්තොට ඇපා ය |

සමස්තයක් වශයෙන් සලකා බලන විට පළමුවන අග්බෝ රජ සමය සාමකාමී විය. කෘෂිආර්ථිකයේ හා ආගමික අංශයේ සංවර්ධනයක් සිදු විය. සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ ද දීප්තියක් උදා වූ කාලවකවානුවකි.

**ක්‍රියාකාරකම**

පළමුවන අග්බෝ මහ රජතුමාගෙන් සිදු වූ සේවය අගය කරන්න.

## 4.9 අධිෂ්ඨානශීලි මානවම්ම රජතුමා (684 - 718)

මානවම්ම රජතුමා දෙවන කස්සප රජුගේ පුතා ය. ඔහු අධිෂ්ඨානශීලීව හා ඉවසිලිවන්තව සතුරු කරදරවලට මුහුණ දී අනුරාධපුර රජ වූ කෙනෙකි. ඔහුගෙන් ආරම්භ වූ රජ පෙළපත මානවම්ම රජ පෙළපත නමින් හැඳින්වෙයි. රජු ලම්බකර්ණ පෙළපතට අයත් ය. මෙතුමාගෙන් ඇරඹි රජ පෙළපත අනුරාධපුර රාජධානියේ අවසානය දක්වා පාලනය ගෙන ගියේ ය. මේ රටේ දිගු කලක් පැවති වියවුල් දුරුකොට සාමය පවත්වා ගැනීමට මෙතුමා සමත් විය. ඔහු රාජ්‍යයට පත් වූ ආකාරය පිළිබඳව විස්තරයක් මහාවංසයේ දැක්වෙයි.

එම විස්තරයට අනුව මෞර්ය හා ලම්බකර්ණ රාජවංස දෙක අතර අරගල පැවතුණි. මේ රාජවංස දෙක අතර පැවති දේශපාලන ගැටුම් නිසා රටේ සාමකාමී වාතාවරණයක් නොවීය. මේ නිසා රටේ සම්පත් විනාශ වීමෙන් ආර්ථිකයේ පරිහානියක් ද ඇති විය. මේ දේශපාලන ගැටුම් නිසා මානවම්ම කුමරු අප්‍රසිද්ධියේ ජීවත් වෙමින් තම පියාගෙන් පසු තම පරම්පරාවට අහිමි වුණු අනුරාධපුර රාජ්‍යය නැවත ලබා ගැනීම සඳහා සූදානම් වූයේ ය. එවකට පාලකයා වූ දෙවන දඨෝපතිස්ස මේ කුමරු ගැන සෙවිල්ලෙන් පසු වූ හෙයින් මානවම්ම කුමරු දකුණු ඉන්දියාවට පලා ගියේ ය.

### 4.9.1 පල්ලව රාජ්‍යයේ සහාය ලබා ගැනීම

මේ කාලයේ පල්ලව රාජධානියේ පාලකයා වූයේ පළමුවන නරසිංහවර්මන් ය. නරසිංහවර්මන්ට බටහිර චාලුක්‍යයන් සමඟ කළ සටන්වල දී මානවම්ම සහාය දුන්නේ ය. ඒ නිසා නරසිංහවර්මන් මානවම්ම ගැන පැහැදුන්නේ ය. තමාට කළ උදව්වලට කෘතගුණ සැලකීමක් වශයෙන් මානවම්මට ලක්දිව රාජ්‍ය බලය ලබා ගැනීමට උදව් විය. පල්ලව හමුදාව සමඟ ලක්දිවට පැමිණි මානවම්ම එකල අනුරාධ පාලකයා වූ දෙවන දඨෝපතිස්ස සමඟ සටන් කළේ ය. සටන් කරගෙන යද්දී නරසිංහවර්මන් අසනීප වූ නිසා පල්ලව හමුදාව ආපසු ඉන්දියාවට ගියේ ය. සටන අතරමග නතර කරන්නට සිදු විය. මානවම්ම කුමරු ආපසු ඉන්දියාවට ගියේ ය. මානවම්ම කුමරු තව කලක් පල්ලව රජුට සේවය කළේ ය. වසර විස්සකට පසුව දෙවන නරසිංහවර්මන් රජතුමාගේ සහායෙන් පල්ලව හමුදාවක් සමඟ ආපසු ලක්දිවට පැමිණියේ ය. මේ කාලයේ දී අනුරපුර පාලකයා වූයේ හත්ථදාඨ රජු ය. මානවම්ම ඔහු සමඟ සටන් කර ක්‍රි. ව. 684 දී පමණ රජකම ලබා ගත්තේ ය. අධිෂ්ඨානශීලීව ඉවසිලිවන්තව කටයුතු කිරීම නිසා මානවම්ම කුමරුට තම අරමුණ ඉටු කර ගැනීමට හැකි විය.

### 4.9.2 මානවම්ම රජතුමාගේ කටයුතු

මහාවංසය හා පූජාවලිය ඔහුගෙන් සිදු වූ සේවා ගැන සඳහන් කර තිබේ. උතුරු මුල, වාදු මුල, අළගිරි පිරිවෙණ, කපුගම් පිරිවෙණ, දෙමටමල් පිරිවෙණ, සත්වැලිය පිරිවෙණ වැනි පිරිවෙන් කරවීමෙන් මේ රටේ පිරිවෙන් අධ්‍යාපනයට කළ සේවය විශේෂයෙන් ම අගය කළ යුතු ය. ථූපාරාමය හා ලෝහමහාපාය ද මෙතුමා විසින් පිළිසකර කර වූ බව සඳහන් වේ. එසේම එතුමා වැව් අටක් ඉදි කරවා ආර්ථිකය සංවර්ධනය කිරීමට ද අවධානය යොමු කළ පාලකයෙකි. වසර තිස් පහක් අනුරපුර රාජධානිය සාමයෙන් පවත්වා ගැනීමට ඔහු සමත් විය.

**ක්‍රියාකාරකම්**

මේ පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න

1. මානවම්ම රජතුමාගේ පියා ..................................ය.
2. අනුරාධපුර රාජධානි සමයේ තිබුණු ප්‍රධාන රාජවංස දෙක නම්................හා...........ය.
3. මේ රජතුමාට සහාය දුන් පල්ලව රජවරුන් දෙදෙනා නම් ..................හා.................ය.
4. මානවම්ම රජතුමාගෙන් ගත හැකි ආදර්ශ මොනවාද?
5. මානවම්ම රජතුමා කර වූ පිරිවෙන් තුනක් නම්කරන්න.

## 4.10 අනුරාධපුර රාජධානියේ අවසාන ශ්‍රේෂ්ඨ පාලක සිව්වන මිහිඳු රජතුමා (956-972)

සිවුවන මිහිඳු රජතුමා අනුරාධපුර රාජධානියේ අවසාන භාගයේ විසූ ශ්‍රේෂ්ඨතම පාලකයා ය. එතුමා අවුරුදු තිහක පමණ කාලයක් ප්‍රථමයෙන් රුහුණ පාලනය කළේ ය. ඉන් අනතුරුව ඔහු අනුරාධපුරයෙහි පාලකයා බවට පත් විය.

මොහුට දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ගෙන් නිතර කරදර එල්ල විය. කලිඟු රටින් කුමාරිකාවක් ගෙන්වා අග මෙහෙසිය කර ගැනීමෙන් රාජවංසය ස්ථාවර කර ගත් බව මහාවංසයේ විස්තර වේ.

එම කරදර අතර, වල්ලභ රාජ නම් ආක්‍රමණිකයෙක් බල සේනාවක් සමඟ නාගදීපයට ගොඩ බැසීම එකක් වේ. කෙසේ වුවත් මෙය මැඩපැවැත්වීමට රජු සමත් විය.

මෙම රජතුමාගේ රාජ්‍ය කාලය වසර දසයකි. ඒ කාලය තුළ සිදු කළ ආගමික සේවා ද වංසකථාවල විස්තර වෙයි. එම සේවාවලට කීර්ති නම් බිසොව, ඇමතිවරු සහ පුත්තු දායක වූහ.

මෙතුමා පිහිටුවන ලද සෙල්ලිපි රාශියක් හමු වී ඇත. එතුමාගේ සෙල්ලිපි,

- ❖ ජේතවනාරාම පුවරු ලිපිය
- ❖ වෙස්සගිරි පුවරු ලිපිය
- ❖ මිහින්තලා පුවරු ලිපි දෙක
- ❖ වේවැල් කැටිය සෙල්ලිපිය

**ක්‍රියාකාරකම්**

මෙතෙක් ඔබ ඉගෙනගත් රජවරුන්ගෙන් ලබා ගත හැකි ආදර්ශ මෙම වගුව සම්පූර්ණ කරමින් පෙන්වා දෙන්න.

| රජතුමා | ලබා ගත හැකි ආදර්ශ |
|---|---|
| | |

## 4.11 අනුරාධපුර යුගයේ පැවති රාජ්‍ය පාලන සංවිධානය

අනුරාධපුර යුගයේ මේ රටේ පැවති පාලන ක්‍රමය පිළිබඳ තොරතුරු වංසකතා හා සෙල්ලිපි මගින් අපට ලබා ගත හැකි ය. ඒ තොරතුරු අනුව එකල පැවති පරිපාලන සංවිධානය ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය.

- ❖ මධ්‍ය පාලනය
- ❖ ප්‍රාදේශීය පාලනය
- ❖ ගම් පාලනය යනුවෙනි.

### ❖ මධ්‍ය පාලනය

ඇමතිවරුන් හා රාජ්‍ය නිලධාරීන් සහභාගි කරවා ගෙන රට පුරා බල පැවැත්වෙන පරිදි රජතුමා පවත්වාගෙන ගිය පාලන රටාව මධ්‍ය පාලනය ලෙස හැඳින්විය හැක. මෙහි පාලන ලක්ෂණය වූයේ රජතුමා පාලනයේ දී ප්‍රධානියා වීමයි. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන අංශ තුන ම ඔහු සතු විය. මේ අනුව පාලන ක්‍රමයේ කේන්ද්‍රය රජු වූ නිසා

පැරණි ලංකාවේ පැවතුණේ රාජාණ්ඩු ක්‍රමයකි. එසේ වුව ද මහ ඇමති, භික්ෂූන් වහන්සේ යන අයගේ උපදෙස්වලට රජුට සවන් දීමට සිදු වූ හෙයින් රජුගේ අසීමිත බලය පාලනය වූ අවස්ථා ඉතිහාසයෙන් හෙළිවෙයි. මහසෙන් රජතුමාගෙන් පසුව ඔහුගේ දෙවන පුත් ජෙට්ඨතිස්ස කුමරුට මහා සංඝයාගේ කැමැත්ත පරිදි රජකම පැවරීම, වැනි නිදසුන්වලින් පැහැදිලි වන්නේ පැරණි ලාංකීය සමාජය තුළ රාජ්‍ය පාලකයාට අත්තනෝමතිකව පාලනය කිරීමට ඉඩ නොලැබුණ බවය. සද්ධාතිස්ස රජතුමා ගෙනගිය මහාවිහාරය විනාශ කිරීමේ ප්‍රතිපත්තියට විරුද්ධ වීම වැනි නිදසුන් ය.

## ❖ රාජ්‍යත්වයේ ප්‍රභවය

ලක්දිවට ඉන්දියාවෙන් පැමිණි සංක්‍රමණිකයන් ගම් පිහිටුවාගත් අතර එම ගමෙහි ප්‍රධානියා ගාමිණී යනුවෙන් හඳුන්වා ඇත. ගාමිණිවරුන්ගෙන් කෙනෙකු රාජ්‍ය පාලනය සඳහා නිල වශයෙන් තෝරා ගත් විට අභිෂේකයක් ද කරන ලදී. මෙම අභිෂේකය නම්, යෂ්ටියක් දැරීම බව මූලාශ්‍රයවල සඳහන් වේ. උදාහරණ වශයෙන්,

දෙවන පෑතිස් රජතුමා,

- ❖ ලතා යෂ්ටි
- ❖ කුසුම යෂ්ටි
- ❖ සකුණ යෂ්ටි

යන යෂ්ටි තුන දැරීමෙන් අභිෂේක ලැබීම සඳහන් කළ හැකිය. එතුමා ඉන්දියාවේ පැවති අභිෂේක ක්‍රමයට අනුව දෙවනවරට අභිෂේකය ලැබීය. මෙයින් පසු දේශීය වශයෙන් පැවති අභිෂේක ක්‍රමය අභාවයට ගොස් ඉන්දීය අභිෂේකය ස්ථාපිත විය.

ලක්දිව පාලකයන් භාවිත කළ විරුද

- ❖ දෙවනපිය
- ❖ බුදදස (බුද්ධදස)
- ❖ සිරිසඟබොයි (සිරිසංඝබෝධි)
- ❖ සලමෙවන් (සලාමේඝවණ්ණ)

## ❖ අභිෂේක උත්සවය

රාජ්‍යත්වයට පත්වීම සඳහා අභිෂේක උත්සවයක් පැවැත්විය යුතු ය. අභිෂේක උත්සවය පැවැත්වීමට සමකුල බිසවක් තෝරාගෙන තිබේ. පඬුවස්දෙව් රජතුමා සමකුල සුදුසු බිසොවක් ලැබෙන තුරු අභිෂේක උත්සවය පමා කර තිබේ. අග බිසොව (අග්ගමහේසි) වශයෙන් හඳුන්වා ඇත්තේ සමකුල කුමරියක් ම ය. දේශීය සම්ප්‍රදායට අනුව ප්‍රථමයෙන්

අභිෂේකය ලැබූ තිස්ස රජතුමා දෙවන වරට අභිෂේක විය. දේශීය අභිෂේකය යනුවෙන් හඳුන්වනු ලබන්නේ ඉහත සඳහන් වූ පරිදි නව යෂ්ටියක් දැරීමයි. දේවානම්පිය විරුදය භාවිත කළේ මෙම අභිෂේකයෙන් පසුව ය. මෙම අභිෂේක උත්සවය පැවැත්වීමට අවශ්‍ය කරන අභිෂේක උපකරණ සියල්ල අශෝක අධිරාජයා විසින් එවා තිබුණි. දේවානම්පියතිස්ස රජතුමාගේ මෙම පුනරාභිෂේක උත්සවය පිළිබඳ දීර්ඝ විස්තරයක් මහාවංස ටීකාවේ සඳහන් වේ.

## ❖ රාජ්‍ය උරුමය

අනුරාධපුර යුගයේ දී රජකම උරුම වීමේ ක්‍රම තුනක් තිබුණි.

- ❖ **පියාගෙන් පසුව පුතාට**
- ❖ **වැඩිමහල් සහෝදරයාගෙන් පසුව බාල සහෝදරයාට රජකම උරුම වීම**
- ❖ **බාල සහෝදරයාගෙන් පසුව වැඩිමහල් සහෝදරයාගේ පුතාට**

මේ ක්‍රම අනුගමනය නොකළ අවස්ථා ද දක්නට ලැබේ. උදාහරණයක් ලෙස ධාතුසේන රජතුමාගෙන් පසුව කාශ්‍යප රජකම පැහැර ගැනීම සඳහන් කළ හැකිය.

## ❖ රාජ්‍ය නිලධාරීන්

අනුරාධපුර රජ සමයේ දී රාජ්‍ය පාලනයට සහාය වූ නිලධාරීන් රැසක් සිටි බව සාහිත්‍ය හා ශිලාලේඛන මගින් අනාවරණය වේ. ඔවුන් අතරින්,

සෙන්පති (සේනාපති)
මහමත (ප්‍රධාන පුරෝහිත)
බඩගරික (භාණ්ඩාගාරික)
ගණක (ගණකාධිකාරි)
දෙවාරික (දොරටුපාලක)
නගර ගුත්තික ( නගරාධිපති)
ජත්තගාහක (ඡත්‍රය දරන්නා)
අසිග්ගාහක (කඩු දරන්නා)
මහලේනා (ප්‍රධාන ලේකම්)
අස අදෙක (අශ්ව පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා)
අති අදෙක (ඇතුන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා) යන අය ප්‍රධාන වේ.

### ❖ රජුගේ ප්‍රධාන වගකීම්

රාජ්‍ය ප්‍රතිපත්ති සකස් වී තිබුණේ බුදුදහමේ නිර්දිෂ්ට දස රාජධර්මය, සතර සංග්‍රහ වස්තු වෙනි ධර්ම සංකල්ප වලට අනුකූලව ය. ඒ අනුව පාලකයාගේ වගකීම් වූයේ, ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ කටයුතු මැනවින් පවත්වාගෙන යාම. එහිදී පහත සඳහන් අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

- ❖ රටේ සාමය පවත්වා ගැනීම
- ❖ විදේශ සතුරු තර්ජනවලින් රටවැසියා ආරක්ෂා කර ගැනීම
- ❖ ආර්ථික ශුභ සිද්ධිය ඇති කිරීම
- ❖ ශාසනික අභිවෘද්ධියට කටයුතු කිරීම
- ❖ සමාජ ශුභ සාධනය සඳහා කටයුතු කිරීම

වැනි කරුණු ය.

මෙම යුතුකම් හා වගකීම් පැරණි ලක්දිව රජවරුන්ගෙන් ඉටු වූ බව අප ඉහතින් සඳහන් කළ පාලකයින්ගේ කටයුතුවලින් සඳහන් වේ.

### ❖ අධිකරණය හා නීති

අනුරපුර යුගයේ දී රට තුළ හොඳ නීති පද්ධතියක් ක්‍රියාත්මක විය. ශිලාලිපිවලින් හෙළි වන තොරතුරුවලට අනුව,

- ❖ රාජ්‍ය අනුප්‍රාප්තිය හා පරිපාලනය පිළිබඳ නීති
- ❖ ආගමික ආයතන පරිපාලනය පිළිබඳ නීති
- ❖ ඉඩම් භුක්තිය පිළිබඳ නීති
- ❖ වෙළඳාම පිළිබඳ නීති
- ❖ කෘෂිකර්මය හා බදු සම්බන්ධ නීති
- ❖ සමාජ සුභ සාධක නීති
- ❖ අපරාධ නීති

වශයෙන් නීති වර්ග රැසක් මෙන්ම ක්‍රි. ව. 10 සියවසට අයත් වේවැල් කැටිය ශිලා ලිපිය, සිව්වන උදය රජුගේ බදුලු ටැම් ලිපිය, සිව්වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපිය වැනි ශිලා ලේඛනවලින් ඉහත නීති වර්ග හඳුනා ගත හැකි ය.

## ❖ රජයේ ආදායම් මාර්ග

එකල ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ බදු ය. බදු වර්ග කීපයක් පිළිබඳ ව තොරතුරු ශිලා ලේඛනවලින් හෙළි වේ.

- ❖ දකපති (ජල බද්ද)
- ❖ භොජක පති (ඉඩම් බද්ද)
- ❖ හති පති (ඇතුන් ඇල්ලීමෙන් ලැබෙන බද්ද)
- ❖ වරාය බදු

අනුරපුර යුගයේ දී රාජ්‍ය භාණ්ඩාගාරය සමෘද්ධිමත් ව තිබුණි. සුවිසල් වෙහෙර විහාර, ගොඩනැගිලි, වැව් අමුණු සෑදීමටත් අධ්‍යාපනය, සමාජ සුබ සාධනය වැනි කටයුතු වලටත් විශාල ධනයක් වැය කිරීමට හැකි වූයේ එබැවිනි.

## ❖ ප්‍රාදේශීය පාලනය

රජුගේ ප්‍රධාන්වයෙන් පැවති මධ්‍යගත පාලනයට අමතර ව ප්‍රාදේශීය පාලනයට ද නිලධාරීන් පත් කර තිබුණි. බොහෝ විට පැවතුණේ පහත සඳහන් ප්‍රාදේශීය පාලන ඒකක හතර යි.

- ❖ උත්තර පස්ස
- ❖ දක්ඛිණ පස්ස
- ❖ පාචීන පස්ස
- ❖ පශ්චිම පස්ස යනු ඒ පාලන ඒකකයන් ය.

අනුරපුර අවසාන භාගය වන විට රජරට, රුහුණු රට, මලය රට හා දක්ඛිණ දේශය යන පාලන ඒකක දක්නට ලැබුණි. වසභ රජ සමයේ දී උතුරු ප්‍රදේශය, නැගෙනහිර ප්‍රදේශය පාලනය කළ ප්‍රාදේශීය පාලකයන් පිළිබඳව පෙර පාඩමේ දී පෙන්වා දී ඇත. ශිලා ලිපිවල රටික, රටිය, රට් ලද්දන් යනුවෙන් සඳහන් වන්නේ දිවයිනේ විවිධ ප්‍රදේශ පාලනය කළ පරිපාලන නිලධාරීන් ය.

## ❖ ගම් පාලනය

කුඩා ම පරිපාලන ඒකකය ගම විය. ගම් පාලනය කළ පිරිස ගමික නමින් හඳුන්වා ඇත. පැරණි යුගයේ ශිලා ලිපි විශාල සංඛ්‍යාවක ගමික යන තනතුරු නාමය සඳහන් වේ. අනුරපුර අවසාන භාගය වනවිට ගම් පාලනය කළ අය ගම් ලද්දන් ලෙස හඳුන්වා තිබේ.

එකල ගම්කවරුන්ට පැවරුණු කාර්යය,

- ❖ ගමේ සාමය හා විනය පවත්වා ගැනීම
- ❖ ගැමියන්ගේ සිරිත් විරිත් හා සම්ප්‍රදායන් අනුව කටයුතු කිරීම.
- ❖ ගමේ ආදායම් එකතු කර රාජ්‍ය භාණ්ඩාගාරයට පැවරීම
- ❖ ගමේ පොදු වැඩ කිරීම
- ❖ යුක්තිය පසිඳලීම

වර්තමානයට ද ආදර්ශ ලබා ගත හැකි ආකාරයට එකල ගම් පාලනය තිබුණි. විවිධ රාජ්‍ය සේවා කළ අයට රජතුමා විසින් ගම්බිම් ප්‍රදානය කළ අතර ආරාම නඩත්තුවට ගම් බිම් පූජා කර ඇත.

## 4.12 අනුරාධපුර යුගයේ පැවති ආර්ථික හා සමාජ හා සංස්කෘතික තොරතුරු

### ❖ ආර්ථික තත්වය

අනුරාධපුර යුගයේ පැවති ආර්ථික තත්වය පිළිබඳ තොරතුරු වංසකථා සහ ශිලා ලේඛන මගින් හෙළි වේ. එම තොරතුරුවලට අනුව එකල කෘෂි කර්මාන්තය, සත්ත්ව පාලනය, වෙළඳාම සහ කර්මාන්ත යන ක්ෂේත්‍ර යටතේ ආර්ථික රටාව සැකසී තිබුණු බව පෙනේ.

### ❖ කෘෂිකර්මාන්තය

ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ මුල් ම ස්ථානය හිමි වූයේ කෘෂිකර්මාන්තයට ය. අනුරාධ, උපතිස්ස, උරුවේල ආදී වශයෙන් හැඳින්වෙන ජනාවාස ගොඩනගා ඇත්තේ ගංගා ආශ්‍රිතව ය. එකල ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂිකර්මාන්තයට ජලය සපයා ගැනීමේ පහසුව හා දෛනික අවශ්‍යතාවන් ඉටු කර ගැනීමේ පහසුව මත ගංගා ආශ්‍රිතව ජනපද පිහිටුවා ගත්හ. අනතුරුව එම ජනපදවල වැව් ඉදි කර කෘෂිකාර්මික කටයුතුවලට ජලය සපයාගෙන තිබේ. නොබෝ කලකින් ම මේ රටේ කෘෂිකර්මාන්තය, කුඹුරු වගාව හෙවත් මඩ ගොවිතැන, ගොඩ ගොවිතැන හෙවත් හේන් වගාව යන අංශ දෙකෙන් ම ශීඝ්‍ර දියුණුවකට පත් විය. ශ්‍රීමේඝවර්ණ රජුගේ කාලයට අයත් තෝනිගල සෙල්ලිපියේ අවුරුද්දේ කන්න තුනක් වගා කළ බව සඳහන් වෙයි. පිටදඬහස, මදෙහස හා අකලහස යනු එම කන්න තුන යි. පසු කාලය වන විට ගංගා හරස්කර අමුණු බැඳ කෘෂිකර්මාන්තය සඳහා ජලය ලබා ගත් බව ඇළහැර ඇළ, මිනිපේ වේල්ල, හත්තොට අමුණ වැනි ඉදි කිරීම්වලින් ප්‍රකට වේ.

එකල වැසියා වී ගොවිතැන් කටයුතු හා සම්බන්ධ විවිධ කාර්යයන්හි නිරත විය. කුඹුරු සකස් කර ගැනීම, සී සෑම, වැපිරීම, ගොයම් කැපීම වැනි වැඩ කරගෙන තිබෙන්නේ අත්තම් ක්‍රමයට හා කුලී ගෙවීමේ ක්‍රමයට ය.

❖ **හේන් වගාව**

ජල පහසුකම් අඩු ගොඩ ඉඩම් හේන් වගාව සඳහා තෝරාගෙන තිබේ. හේන් වගාව කරන ලද්දේ වැසි ජලයෙනි. එදිනෙද ජීවිතයට අවශ්‍ය කරන ධාන්‍ය වර්ග, අල වර්ග, එළවළු වැනි දෑ හේන්වල වගා කෙරිණ. මහාවංසටීකාව හා සීහලවත්ථුපකරණයට අනුව අනුරපුර මුල් භාගයේ දී ලක් දිව බොහෝ ප්‍රදේශවල ඇල් වී වගා කළ හේන් තිබුණු බව සඳහන් වේ. අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයේ ශිලාලේඛන උඳු, මුං, තල ගැන සඳහන් ව තිබීමෙන් හෙළි වන්නේ ඒ කාලය වන විට ද හේන් වගාව පැවති බවයි.

❖ **සත්ත්ව පාලනය**

සත්ත්ව පාලනය එකල ජීවන වෘත්තියක් විය. මස්, කිරි, බිත්තර ආදිය ලබා ගැනීම සඳහා මෙන් ම කෘෂිකර්මාන්ත කටයුතුවලට හා ප්‍රවාහනය සඳහාත් සතුන් ඇති කළ බව පෙනේ. ගවයන්, එළුවන්, ඌරන්, කුකුළන් වැනි සතුන් එකල නිවෙස්වල ඇති කළේ ය. කිරි, දී කිරි, මෝරු, ගිතෙල්, වෙඬරු ගවයාගෙන් ලබා ගෙන ඇත. මේවා පස්ගෝ රස නමින් හැඳින්වේ. ගවයා කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගත් බැවින් ගව මස් ආහාරයට ගැනීම ප්‍රචලිතව නොතිබුණි. සෑම ගමක ම ගවයන්ට මුඩු බිමක් වෙන් කර තිබුණු අතර ගවයන් රැක බලා ගන්නා ගොපල්ලා නමින් හැඳින්විය. පණ්ඩුකාභය රජතුමා කුඩා කාලයේ දෙරමඬලාව නම් ගොපලු ගමේ විසූ බව මහාවංසයේ සඳහන් වෙයි.

භාණ්ඩ ප්‍රවාහනය සඳහා ද ගවයා යොදා ගත්තේ ය. සෙල්ලිපිවල ගැල් ගොන් ගැල් මීවුන් යනුවෙන් සඳහන් ව තිබෙන්නේ ප්‍රවාහන කටයුතු සඳහා ගවයන් බැඳි ගැල් යොදගෙන තිබෙන බව ය. රට අභ්‍යයන්තරයේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා ගවයන් බැඳි ගැල් යොදා ගෙන තිබුණු බව සාහිත්‍ය මූලාශ්‍රයෙන් ද අනාවරණය වේ.

❖ **වෙළඳාම**

අනුරාධපුර යුගයේ වෙළෙඳම ඉතා දියුණු මට්ටමක පැවති බව පෙනේ. වෙළඳාම දෙයාකාර විය.

අභ්‍යන්තර වෙළඳාම
බාහිර වෙළඳාම
යනුවෙනි.

❖ අභ්‍යන්තර වෙළඳාම

අභ්‍යන්තර වෙළදම දේශීය වෙළඳාම නමින් ද ව්‍යවහාර වේ. මෙහි දී බහුල වශයෙන් භාවිත වූයේ භාණ්ඩ හුවමාරු ක්‍රමය යි. දේශීය වෙළෙඳමේ දී කාසි භාවිතය ද පැවතිණි. කහවනුව මින් එක් වර්ගයකි. මස්ස හෙවත් මසුරන් ගැන ද සඳහන් වේ. මෙම දේශීය වෙළඳාමේ දී පොලී ක්‍රමය ද පැවතුණි. හතරවන සියවසේ කිත්සිරිමෙවන් රජුගේ තෝනිගල ශිලා ලිපියෙහි කලහුමනක නියමතන වෙළෙඳ ශ්‍රේණියේ වී, උඳු, මුං ආදී ධාන්‍ය වර්ග තැන්පත් කර වාර්ෂිකව ලැබෙන පොලිය පමණක් ප්‍රයෝජනයට ගන්නා ලෙස උප දෙස් දී තිබේ.

වෙළඳාම දියුණු වී යාමත් සමඟ වෙළඳ ශ්‍රේණි බිහි විය. ඒ සමඟම වෙළඳ නගර ඇති වූ බව පෙනේ. මේ වෙළෙඳ නගර නිගම යනුවෙන් හැඳින්විණි. වෙළෙඳමෙන් ධනවත් වූ වෙළෙන්දෝ නගරවල ජීවත් වූහ. වාණිජ සමාජය විවිධ ශ්‍රේණි පිහිටුවාගෙන වෙළඳාම කළහ. මේ වෙළඳ සංවිධාන ''පුග'' යනුවෙන් හඳුන්වා තිබේ. වෙළෙඳ සංගම් තිබුණු බව බඹරගස්තලාව සෙල්ලිපියේ සඳහන් ව තිබේ.

හතරවන උදය රජතුමාගේ (946-954) රාජ්‍ය කාලයට අයත් හෝපිටිගමුව හෙවත් බදුලු ටැම් ලිපිය අනුරාධපුර යුගයේ දේශීය වෙළඳාම පිළිබඳව තොරතුරු දක්වෙන ශිලා ලේඛනයකි. එතුමා මහියංගණ විහාරයට පැමිණි අවස්ථාවක දී සොරබොර ප්‍රදේශයේ හෝපිටිගමුව වෙළඳපොලෙහි සිදුවන අකටයුතු පිළිබඳ ව ප්‍රදේශවාසීහු පැමිණිලි කළහ. එම අකටයුතු මගහරවා ගැනීම සඳහා එතුමාගේ අවධානය යොමු විය. මෙහි වෙළඳපොල හඳුන්වා තිබෙන්නේ ''පදිය'' යන නමිනි. වෙළඳපොල පාලකයන් පදි ලද්දන් නමින් හඳුන්වා තිබේ.

**මෙහි දක්වෙන වෙළඳපොලට අදාළ නීති කිහිපයක් හඳුනා ගනිමු**

- ❖ වෙළඳපොලට ගෙන එන බඩු පෙරමගට ගොස් නොගත යුතුය.
- ❖ බුලත් පුවක් ඊට අදාළ ස්ථානවල තබා විකිණිය යුතුය.
- ❖ අනුමත නොකළ තරාදි භාවිත නොකළ යුතු ය.

වෙළඳපොල සම්බන්ධව රජතුමා පනවා තිබුණු මෙම නීති වර්තමාන සමාජයට වුවද පූර්වාදර්ශ කර ගත හැකි ය.

❖ බාහිර වෙළෙඳාම


ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටි නිසා පෙර අපර දෙදිග රටවල් සමඟ වෙළඳ සබඳතා පවත්වා ඇත. ජම්බුකෝල තිත්ථ, ගෝකණ්ණ තිත්ථ, සූකර තිත්ථ මහාතිත්ථ වැනි වරායවලින් ඉන්දියාව, චීනය, අරාබිය, රෝමය. පර්සියාව, වැනි රටවල්

සමග වාණිජ සම්බන්ධතා පවත්වා ඇත. වරාය ආශ්‍රිතව වෙළෙඳ මධ්‍යස්ථාන තිබුණි. මේවා පටුන් ගම් නමින් හැඳින්විණි.

අතීතයේ මෙරටට ආනයනය කළ විදේශීය භාණ්ඩවල කොටස්, පුරාවිද්‍යා කැණීම්වලින් විදේශීය කාසි වර්ග සොයාගෙන ඇත. රෝම කාසි, ඉන්දු රෝම කාසි, චීන කාසි මේ අතර ඇත. භාතිකාභය රජතුමා රෝම දේශයෙන් පබළු වර්ගයක් ගෙන්වාගෙන රුවන්වැලි මහාසෑය අලංකාර කළ බව මහාවංස ටීකාවේ සඳහන් වේ. එකල ලක්දිවට ආනයනය කළ හා ලක්දිවෙන් අපනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය කිහිපයක් පහත දැක් වේ.

| ආනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය | අපනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය |
|---|---|
| රන්, රිදී, තඹ, ලෝකඩ | ඇත් දත්, අලි ඇතුන් |
| වීදුරු, පබලු, පිඟන් භාණ්ඩ | මුතු-මැණික්, කැස්බෑ ලෙලි |
| උසස් වර්ගයේ රෙදි පිළි | කපු පිළි |
| සුවඳ විලවුන් | කුළු බඩු වර්ග |
| සින්ධු දේශයේ අශ්වයන් | |

ඉහත සඳහන් තොරතුරුවලින් අනාවරණය වන්නේ අනුරාධපුර යුගයේ දී විදේශීය වෙළඳාම ඉතාම දියුණු ව පැවති බව ය.




4.2 සිතියම-රෝපය හා ආසියාව අතර වෙළෙඳ සම්බන්ධතා පැවැත් වූ පැරණි වෙළෙඳ මාර්ග



4.8 රූපය-ශ්‍රී ලංකාවෙන් හමු වූ
චීන මැටි බඳුන් හා චීන කාසි කිහිපයක්

## ❖ කර්මාන්ත

කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ වූ උදලු, නගුල් , දෑකැති ආදී උපකරණ, එදිනෙද ගෙදරදෙරේ පරිහරණයේ දී අවශ්‍ය පිහි කැති ආදී උපකරණ, හමුදවට අවශ්‍ය කළ දුණු ඊතල ආදී අවි ආයුධ, කාන්තාවන් පාවිච්චි කළ මාල, වළලු ආදී අලංකරණ භාණ්ඩ ආදිය දේශීය වැසියා විසින් ම නිපදවාගෙන තිබේ. මහාවංසය, අට්ඨකථා වැනි දේශීය සාහිත්‍ය මූලාශ්‍රය මේ පිළිබඳ ව තොරතුරු සපයයි.

ඒ ඒ කර්මාන්තවලට අදළ ශිල්පීහු ඔවුන්ට ම වෙන් කළ ගම්බිම්වල ජීවත් වූහ. එවැනි ගම් බිම් කිහිපයක් පහත දක් වේ.

| ගම | කර්මාන්තය |
|---|---|
| කුම්භකාරගාම | කුඹල් කර්මාන්තය |
| වඩ්ඪකි ගාම | වඩු කර්මාන්තය |
| මණිකර ගාම | මැණික් කර්මාන්තය |
| පේසකාර ගාම | රෙදි නිෂ්පාදනය |

ඉහත සඳහන් කළ කර්මාන්ත හැර උක් වගාව ආශ්‍රිතව හකුරු නිපදවීම හා ඊට අදළ යන්ත්‍ර, ඇත් දත්, කැටයම් වැනි කර්මාන්ත ගැන ද වංසකථා සාහිත්‍යයෙන් තොරතුරු ලැබේ. මෙම කර්මාන්ත ශිල්ප ශ්‍රේණි අනුව සංවිධානය වී තිබුණි. උසස් කාර්මික ශිල්පීන් රජතුමාගේ ඇගයීමට ලක් විය. ඔවුන්ට රජතුමා විසින් තාන්න මාන්න පිරිනැමුණි. මේ කර්මාන්තකරුවන්ගෙන් වැඩි දෙනෙක් බෝධිය සමග ලංකාවට පැමිණි බව බෝධිවංසය ආදියෙන් හෙළි වේ.

## ❖ පැරණි ශ්‍රී ලාංකික සමාජය

ලක්දිව ජනාවාස ආරම්භ වීමට පෙර යක්ෂ, නාග වැනි ජන කොටස් විසූ බව වසංකතාවලින් හෙළිදරව් වේ. මෙම ස්වදේශීය ජනතාවගේ සමාජ ජීවිතය පිළිබඳ ව හඳුනා ගැනීමට තරම් ප්‍රමාණවත් විස්තර වාර්තා වංසකථාවලින් හමු නොවන බැවින් මෙරට සමාජ සංස්ථාවන්ගේ විකාශනය හා සමාජ සිරිත් විරිත් සම්බන්ධ කරුණු ගොනු කළ හැකි වන්නේ විජයාගමනයෙන් පසුව ය.

ලක්දිව සමාජය හැඩගැස්වීමෙහි ලා ඉන්දියානු සමාජ රටාව බලපැවත් මේ රටේ බුද්ධාගම ප්‍රතිෂ්ඨාපිත වූවායින් පසුව වර්ණාශ්‍රම ධර්ම මත හැඩ ගැසී තිබුණු සමාජ රටාව ලිහිල් විය. ඉන්දියාවේ තිබුණු සමාජ සංස්ථා හා සමාජ සිරිත් විරිත් මේ රටට ගැළපෙන ආකාරයට හැඩ ගැසෙමින් විකාශනය විය.

ඉන්දීය සමාජයේ මෙන් ම ශ්‍රී ලංකා සමාජයේ ද ක්ෂත්‍රීය, බ්‍රාහ්මණ, වෛශ්‍ය කණ්ඩායම් මුල් කාලයේ දී සිට ම විසූ බව සාහිත්‍ය මූලාශ්‍රය මගින් හෙළිවෙයි. ශුද්‍ර නමින් සමාජ කණ්ඩායමක් ලක්දිව විසූ බව සඳහන් නොවුව ද චණ්ඩාල නමින් හැඳින් වූ පිරිසක් විසූහ. කැළි කසළ ඉවත් කිරීම, මළමිනී ඉවත් කිරීම වැනි කාර්යයන් ඔවුන්ට පවරා තිබුණු බව පණ්ඩුකාභය පුරා වෘත්තයෙන් අනාවරණය වෙයි. ඉන්දියානු සමාජයේ ශුද්‍රයන්ට ද පැවරී තිබුණේ මෙවැනි කාර්යයන් ය.

විජය ඇතුළු පිරිසට භාර්යාවරුන් ගෙන්වා ගත් අවස්ථාවේ දී ශ්‍රේණි දහ අටකට අයත් පිරිසක් ද සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය ගෙන ආ අවස්ථාවේ දී විවිධ කුලවලට අයත් ජනයා මෙරටට පැමිණි බව වාර්තා වෙයි. මෙහි කුල යන වචනයෙන් සඳහන් කර තිබෙන්නේ ඉන්දියාවේ දී මෙන් කුලයක් හැඳින්වීම සඳහා නොව පවුලක් හැඳින්වීමට ය. මෙයින් අපට පැහැදිලි වන්නේ ලක්දිව සමාජය සංවිධානය වූයේ සෑම ජන කොටසක් ම එක හා සමාන ලෙසින් සැලකෙන සාමාකාමී සහජීවනය අගය කළ ජන සමාජයක් වශයෙනි.

මෙම සමාජ ක්‍රමය යටතේ කාන්තාවට ද සමාජයේ සම අයිතිවාසිකම් හිමි විය. විහාරමහා දේවිය, සෝමා දේවි වැනි කාන්තා චරිත සමාජයේ සම්භාවනා ලැබීය. භික්ෂුණී ශාසනයට ඇතුළු වීමට කිසිදු බාධාවක් නොවීය. අනුලා, සීවලී වැනි කාන්තාවෝ පැරණි ලක්දිව රජකම් කළාහුය. සීගිරි ගී රචනා කළ අය අතර කිවිඳියෝ ගණනාවක් වූහ. පළමුවන අග්බෝ රජ සමයේ විසූ දොළොස් මහාකවීන් අතර ද කිවිඳියෝ වූහ.

ලක්දිව ජන සමාජයේ දාසයන් විසූ බව ද වංසකථාවල සඳහන් වේ. සිලාමේඝ රජතුමා යුද්ධයේ දී අල්ලා ගත්තවුන් විහාරාරාමවලට දාසයන් ලෙස පූජා කර තිබේ. පළමුවන අග්බෝ පොත්ථකුට්ඨ වැනි පාලකයෝ විහාරාරාමවලට දාසියන් වශයෙන් පුද්ගලයන් පූජා කළහ. විහාරස්ථානයේ දාසියන් සිටි බව හතරවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ සඳහන් වේ.

## ❖ සංස්කෘතික රටාව

සංස්කෘතිය යනුවෙන් අදහස් කෙරෙන්නේ කිසියම් සමාජයක ජීවත්වන මිනිසුන්ගේ ඇදහිලි, විශ්වාස, ඇඳුම්, පැළඳුම්, සිතුම්, පැතුම්, රසවින්දනය වැනි සියලු අංශයන්ගේ එකතුවකි.

අපේ රටේ විවිධ ජන කොටස්වලට අයිති සංස්කෘතික ලක්ෂණ විද්‍යමාන වෙයි. මේ සංස්කෘතික ලක්ෂණ අතරින් අනුරාධපුර රජ සමයේ වඩාත් කැපී පෙනෙන්නේ සිංහල බෞද්ධ සංස්කෘතික ලක්ෂණ යි. එකල ජන සමාජය තුළ දක්නට ලැබුණු උදාර ගුණාංග කිහිපයක් පහත සඳහන් වේ.

- ❖ ගොවිතැන් කටයුතුවල දී එකිනෙකාගේ වැඩවලට සහය දීමේ අත්තම් ක්‍රමය
- ❖ විවාහයේ දී තම පවුලට ගැළපෙන චරිතවත් දූ පුතුන් සම්බන්ධ කර ගැනීම
- ❖ දියණිවරුන්ට ගෙදරදොර ඉවුම් පිහුම්, මැහුම් ගෙතුම්, ගෙදර දොර අලංකාර කර ගැනීම වැනි හොඳ පුරුදු දෙමාපියන් ඇසුරින් ලැබීම
- ❖ උපතේ සිට මරණය දක්වා ඉපදීම, ඉඳුල් කට ගෑම, නම් තැබීම අකුරු ශාස්ත්‍රයට අතපොත් තැබීම වැනි සියලු මංගල සම්මත අවස්ථා ආගමානුකූලව පැවැත්වීම
- ❖ ආගන්තුක සත්කාරය විපතේ දී පිහිටවීම
- ❖ දෙමාපිය දූ-දරු යහපත් සම්බන්ධතා පවත්වාගෙන යෑම

මෙකල කැපී පෙනුන තවත් සංස්කෘතික ලක්ෂණයක් වූයේ භික්ෂූන් වහන්සේ හා පන්සල අනුරපුර ජන සමාජයේ කේන්ද්‍රීය සංස්කෘතික ලක්ෂණය බවට පත්ව තිබීම යි. ජාතික, ආගමික, සමාජීය උත්සවවල දී ප්‍රමුඛත්වය ලැබුණේ භික්ෂූන් වහන්සේලාට ය. එකල ජන සමාජයේ මවුපියන්ට සැලකීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුවිණි. රජවරුන් පවා මවුපිය උපස්ථානයට නැඹුරු වූ බව වංසකතාවලින් හෙළිදරව් වේ. අටවන අග්බෝ රජතුමා එවැනි පාලකයෙකි.

මේ අනුව පැරණි ලංකාවේ සංකීර්ණ සංස්කෘතික රටාවක් තිබුණත් එය සකස් වී තිබුණේ බෞද්ධ සමාජ දර්ශනය අනුව බව පැහැදිලිව පෙනේ.

**ක්‍රියාකාරකම**

"පැරණි ලංකාවේ පැවති විදේශීය වෙළෙඳාම" යන මැයෙන් රචනයක් ලියන්න.

## 4.13 අනුරාධපුර පාලන සමයේ විදේශ සම්බන්ධතා

ලංකාවේ භූගෝලීය පිහිටීම නිසා පෙර අපර දෙදිග රටවල් සමග පැරණි යුගයේ සිට ම දේශපාලනික, ආර්ථික, ආගමික හා සංස්කෘතික සම්බන්ධතා පවත්වා තිබේ.

### ❖ දේශපාලන සබඳතා

ලංකාව ඉන්දියාවට ආසන්නයෙන් පිහිටා තිබීම නිසා ඉන්දියාවේ දේශපාලන තත්ත්වය මේ රටේ දේශපාලන කටයුතු කෙරෙහි බලපෑවේය. එම බලපෑම සංක්‍රමණ හා ආක්‍රමණ වශයෙන් ද රාජ්‍යත්වය සඳහා ලබා ගත් සහාය හා විවාහ සබඳතා අනුව ද විස්තර කළ හැකි ය.


ඉන්දියාවේ සිට වරින් වර සංක්‍රමණය වූ ජන කණ්ඩායම් මගින් මේ රටේ මුල් ජනාවාස ආරම්භ වී ව්‍යාප්ත වූ ආකාරය ඔබ ඉගෙන ගෙන තිබේ. එවැනි සංක්‍රමණික පිරිස් කිහිපයක් ගැන මෙහිදී මතක් කරදීම ඔබට ප්‍රයෝජනවත් වේ.

- » විජය ඇතුළු පිරිස
- » විජය කුමරුගේ මෙහෙසිය කර ගැනීම සඳහා මධුරාපුරයෙන් ගෙන්වා ගත් කුමරිය ඇතුලු පිරිස
- » පඬුවස්දෙව් ඇතුලු පිරිස
- » භද්දකච්චානා කුමරිය ඇතුලු ඇගේ සහෝදර පිරිස
- » මිහිඳු මාහිමි ඇතුලු ධර්මදූත කණ්ඩායම
- » සඟමිත් තෙරණිය සමඟ පැමිණි ශිල්ප ශ්‍රේණි

මුල් කාලයේ දී අපේ රටට ආක්‍රමණ එල්ල වූයේ දකුණු ඉන්දියාවෙනි. මේ කාලය වන විට දකුණු ඉන්දියාවේ ප්‍රබල රාජධානි තුනක් තිබුණි.

- » පල්ලව රාජ්‍ය
- » පාණ්ඩ්‍ය රාජ්‍ය
- » චෝල රාජ්‍ය යනු එම රාජ්‍ය තුන යි. මේ රාජ්‍ය ලක්දිව දේශපාලන ක්ෂේත්‍රයට සෘජු ලෙස බලපෑවේ ය.

පල්ලව රාජ්‍ය දකුණු ඉන්දියාවේ චෝළ රාජ්‍යයට උතුරින් පිහිටා තිබුණි. මෙහි අගනුවර වූයේ කාංචිපුරය යි. දකුණු ඉන්දියාවේ පළමුවරට විශාල අධිරාජ්‍යයක් ගොඩනගා ගන්නා ලද්දේ පල්ලවයන් විසිනි. ක්‍රි. ව. 7 වන සියවසේ සිට ක්‍රි. ව. 9 වන සියවස දක්වා මේ රාජ්‍ය පැවතුණි.




4.3 සිතියම-ශ්‍රී ලංකාවට ආසන්න දකුණු ඉන්දියානු රාජ්‍ය

ලංකාවට ඉතා ආසන්නව දකුණු ඉන්දියාවේ නැගෙනහිර වෙරළ ආසන්නයේ පාණ්ඩ්‍ය රාජ්‍ය පිහිටා තිබුණි. මෙහි අගනුවර වූයේ මධුරාපුරය යි. ක්‍රි. ව. හයවන සියවස වන විට මෙම රාජ්‍ය බලවත්ව පැවතුණි.

පාණ්ඩ්‍ය රාජ්‍යයට උතුරින් චෝල රාජ්‍යය පිහිටා තිබුණි. මෙහි අගනුවර තන්ජෝරය යි. ක්‍රි. ව. 9-10 සියවස්වල චෝළයෝ දකුණු ඉන්දියාවේ විශාල අධිරාජ්‍යයක් ගොඩනගා ගත්හ.

මෙහි රාජ රාජ හා රාජේන්ද්‍ර චෝල රජවරු ඉතා බල සම්පන්න වූහ. දකුණු ඉන්දියාවේ රාෂ්ට්‍රකූට රාජ්‍ය සමග ලක්දිව පාලකයෝ සමගියෙන් කටයුතු කිරීමට උත්සාහ ගත්හ.

දකුණු ඉන්දීය පාලකයින් ලක්දිව සිහසුන පැහැරගත් අවස්ථා කිහිපයක් ගැන වාර්තා වේ.

- ❖ සූරතිස්ස රජ සමයේ සේන ගුත්තික අශ්ව වෙළඳුන් දෙදෙනා රාජ්‍යය පැහැරගෙන අවුරුදු 22ක් පාලනය ගෙන යෑම.
- ❖ අසේල රජුගේ කාලයේ දී එළාර සොලී ආක්‍රමණය එළාර ධාර්මික පාලකයෙකු ලෙස මහාවංසයේ දැක්වේ. ඔහු අවුරුදු 44ක් මේ රට පාලනය කළේ ය.
- ❖ වළගම්බා රජ සමයේ පුලහත්ථ ඇතුලු කණ්ඩායමේ ආක්‍රමණය
- ❖ වංකනාසිකතිස්ස රජ සමයේ එල්ල වූ කරිකාල නම් චෝල රජුගේ ආක්‍රමණය
- ❖ මිත්තසේන (මිත්සෙන්) රජ සමයේ එල්ල වූ පණ්ඩු ඇතුලු දමිළ සත් දෙනාගේ ආක්‍රමණය

❖ පළමුවන සේන රජු දවස ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාණ්ඩ්‍ය රජුගේ ආක්‍රමණය

❖ පස්වන මිහිඳු රජ සමයේ එල්ල වූ රාජ රාජ නම් සොළී අධිරාජයාගේ ආක්‍රමණය. මේ ආක්‍රමණය නිසා ක්‍රි. ව. 1017 දී අනුරාධපුර රාජධානිය බිඳ වැටුණි.

**ලාංකික රජවරු දකුණු ඉන්දියාව සමඟ පැවැත් වූ සම්බන්ධතා**

❖ මේ රටේ රජවරු සිහසුන සම්බන්ධ ව ආරවුල් ඇති වූ අවස්ථාවල දී තම දේශපාලන බලය තහවුරු කර ගැනීමට දකුණු ඉන්දියානු රජවරුන්ගේ සහාය පැතුහ.

❖ ක්‍රි. ව. තුන්වන සියවසේ දී අභයනාග රජතුමා දමිළ පාලකයන්ගේ උදව් ලබා ගැනීම

❖ පළවෙනි මුගලන් කුමරු කාශ්‍යප සමඟ සටන් කිරීමට දකුණු ඉන්දීය සහාය ලබා ගැනීම

❖ සිරිනාග රජතුමා දමිළ පාලකයන්ගේ සහාය ලබා ගැනීම

❖ තුන්වන අග්බෝ රජු දමිළ පාලකයන්ගේ සහාය ලබා ගැනීම

❖ 684 දී මානවම්ම පල්ලව රාජ්‍යයේ උදව් ලබා ගැනීම

### ❖ විවාහ සම්බන්ධතා

අපේ රජවරු අසල්වැසි ඉන්දියාව සමඟ විවාහ සබඳතා පැවැත් වූහ.

» විජය රජතුමා මධුරාපුරයේ කුමාරිකාවක ගෙන්වා තම බිසොව කර ගැනීම.

» පඬුවස් දෙව් ශාක්‍ය වංශික භද්දකච්චායනා කුමරිය ගෙන්වාගෙන විවාහ කර ගැනීම.

» සිවුවන මිහිඳු රජතුමා කලිඟු කුමාරියක සමඟ විවාහ වීම.

මේ ආකාරයට පොළොන්නරුවේ පාලකයෝ ද ඉන්දියාව සමඟ අවාහ විවාහ සම්බන්ධතා පැවැත්වූහ. ඉන්දියාව සමඟ ඇති කරගත් ආගමික හා සංස්කෘතික සම්බන්ධතා පිළිබඳව තොරතුරු අපි ඊළඟට හඳුනා ගනිමු.

### ❖ ආගමික සම්බන්ධතා

තිස්ස රජතුමා අශෝක අධිරාජයා සමඟ පවත්වන ලද සම්බන්ධතා සුප්‍රකට කරුණක් වේ. එය ආගමික, දේශපාලන හා සංස්කෘතික යන සියලු අංශ හා සම්බන්ධ වේ. මේවා සම්බන්ධ විස්තර මහාවංසයේ හා අභිලේඛනවල අන්තර්ගත වේ.

දෙවෙනි තුන්වෙනි සියවස්වල දී දකුණු ඉන්දියාවේ නාගර්ජුනකොණ්ඩ නම් බෞද්ධ මධ්‍යස්ථානය සමග ලංකාව ඇති කරගෙන තිබුණු ආගමික සම්බන්ධතා ගැන තොරතුරු හමු වේ.

එම මධ්‍යස්ථානයේ ඇති විහාරයක් නොයෙක් රටවල බුදු සසුන පිහිට වූ ලාංකික භික්ෂු සංඝයාට පූජා කරන ලද්දක් බව එහි සෙල්ලිපියකින් කිය වේ.

කිත්සිරි මෙවන් රජතුමා (301 - 328) ඉන්දියාවේ සමුද්‍රගුප්ත රජතුමා සමඟ සම්බන්ධතා පැවැත් විය. ලාංකික වන්දනාකරුවන්ට බුද්ධගයාවේ විශ්‍රාම ශාලාවක් කිත්සිරිමෙවන් රජතුමා විසින් ඉදි කරන ලදී. ලක්දිවට දළදා වහන්සේ වැඩම කර වූයේ ද මේ රජතුමාගේ කාලයේදී ය.

ක්‍රි. ව. හත්වන හා අටවන සියවස් තුළ විවිධ මහායාන ආචාර්යවරු ලක්දිවට පැමිණියහ. උන්වහන්සේලා මහායාන දර්ශනවාද ලක්දිවට ගෙන ආහ. වාජිරියවාදය නීලපට දර්ශනය වැනි දර්ශනවාද මේ රටේ ඇති විය. මහායාන බෝධිසත්ව වන්දනාව ප්‍රචලිත විය. ලංකාවේ විවිධ ප්‍රදේශවල මහායාන මධ්‍යස්ථානවලින් බෝධි සත්ත්ව ප්‍රතිමා රාශියක් සොයාගෙන තිබේ. මෙම සම්බන්ධතා පැවැත්වීමේදී අභයගිරිය මූලිකව ම ක්‍රියා කළ බව පෙනේ.

## ❖ සංස්කෘතික සම්බන්ධතා

අපේ අක්ෂර කලාව, භාෂාව, සාහිත්‍ය හා කලා ශිල්පවල දියුණුවට ඉන්දියාව සමග පැවති සම්බන්ධතා බෙහෙවින් ම ඉවහල් වූ බව පෙනේ.

- ක්‍රි. ව. පළමුවන සියවසින් පසුව සාතවාහන කලා සම්ප්‍රදායේ බලපෑම ඇති වීම.
- ක්‍රි. ව. හත්වන සියවසේ සිට ක්‍රි. ව. එකොළොස්වන සියවස අතර කාලයේ දී ලක්දිව පල්ලව කලා සම්ප්‍රදය බලපෑම. මේ බලපෑම්වලට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

  - ❖ මාතලේ නාලන්ද ගෙඩිගෙය කාංචිපුරයේ ඉදි කර තිබෙන අනන්තශයන දේවාලයට බෙහෙවින් සමාන වීම.
  - ❖ ඉසුරුමුණියේ දක්නට ලැබෙන අශ්වහිස හා මිනිස් රූපය, මෙහි දිය ක්‍රීඩා කරන හස්ති රූප දකුණු ඉන්දියාවේ මහබලිපුරම් හස්ති රූපවලට සමාන වීම

❖ පල්ලව රාජ සභා කවියකු වූ දණ්ඩීන් රචනා කළ කාව්‍යාදර්ශය පළමුවන සේන රජතුමා සියබස්ලකර නමින් සිය බසට නගා තිබීම. වැනි තොරතුරුවලින් ශ්‍රී ලංකාව ඉන්දියාව සමග පවත්වාගෙන ගිය සම්බන්ධතාවේ බලපෑම් මේ රටේ සංස්කෘතිය කෙරෙහි ද දක්නට ලැබෙන බව පෙනේ.

**ක්‍රියාකාරකම**

අනුරාධපුර යුගයේ ලක්දිවට එල්ල වූ දක්ෂිණ භාරතීය ආක්‍රමණ පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න

## 4.14 පැරණි ලංකාවේ තාක්ෂණය


පුරාවිද්‍යා කැණීම්වලින් ලැබී තිබෙන සාධක සහ වංසකථාවලින් හෙළිවන තොරතුරුවලට අනුව පැරණි ලංකාවේ තාක්ෂණය සම්බන්ධව තොරතුරු මෙම පාඩම් ඒකකයෙන් හඳුනා ගත හැකි ය.

ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු ඔබට තුන්වන ශ්‍රේණියේ දී හා මෙම පොතේ දෙවන පරිච්ඡේදය යටතේ දී ඔබ ඉගෙන ගෙන ඇත. ඒ අනුව පදියගම්පල, බටදොඹලෙන, පාහියන්ගල බෙලිලෙන, ගුරුගල්හින්න ආදී ස්ථානවල කරන ලද පුරාවිද්‍යා කැණීම්වලින් ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ තොරතුරු ඔබ ඉගෙනගෙන ඇත. එකල මානවයා එදිනෙද කටයුතුවල දී ගල් ආයුධ හා සරල මෙවලම් භාවිත කළ බව පෙනේ.

මෙම ගල් ආයුධ කිසියම් ජ්‍යාමිතික හැඩයකට නිර්මාණය කර තිබේ. විවිධ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ප්‍රයෝජනයට ගත් ගල් මෙවලම් ද සොයා ගෙන ඇත. ආදි මානවයා ලබා තිබුණු මේ තාක්ෂණික දැනුම ඔවුන්ගේ මූලික අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීමට උපකාරී වන්නට ඇතැයි සිතිය හැකි ය.

### 4.14.1 වැව් හා වාරි මාර්ග තාක්ෂණය

අනුරාධපුර යුගයේ විසූ කීර්තිමත් රජවරු යන පාඩම් ඒකකයෙන්, පණ්ඩුකාභය රජතුමාගේ සිට සිව්වන මිහිඳු දක්වා රජවරුන්ගේ සේවා විස්තර කිරීමේ දී අනුරාධපුර රාජ සමයේ වාරි කර්මාන්තයේ සංවර්ධනය ගැන සාකච්ඡා කර තිබේ. මෙහි දී විස්තර කෙරෙන්නේ අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තයේ තාක්ෂණිකාංග පිළිබඳව ය.




4.9 රූපය-වැවක ප්‍රධාන අංග

වාරි මාර්ග තාක්ෂණය පිළිබඳ අපේ මුතුන් මිත්තන්ට තිබුණු ශිල්පීය ඥානය වැවක කොටස් අධ්‍යයනයෙන් හඳුනා ගැනීමට පුළුවනි.

❖ වැව් බැම්ම

එකිනෙකට ළංව පිහිටි කඳු දෙකක් සම්බන්ධ කර වැව් බැම්ම නිර්මාණය කර තිබේ. වැව් බැම්මේ නිර්මාණය ඉතා ම වැදගත් ය.

» සමෝච්ච රේඛා විහිදීම මත වැව් බැම්ම නිර්මාණය විය
» කඳු රහිත ප්‍රදේශවල භූමියේ පිහිටීම මත වැව් බැමි නිර්මාණය විය.

❖ (ස)රළපනාව

වැව් බැමමේ ඇතුළ් පැත්තේ පාදමේ සිට ඉහළ ජල මට්ටම දක්වා කළු ගල් පුවරු අතුරා මෙම සළපනාව සාදා තිබේ. රළපනාව, රළ පැන්නුම යන නම්වලින් ද හැඳින්වේ.

❖ සොරොව්ව

වැව් ජලය කෙත්බිම්වලට මුදා හරින්නේ සොරොව්ව මගිනි. වැවක ජලය කාන්දු නොවන ආකාරයට සොරොව්ව නිර්මාණය කෙරිණි. ඒ සඳහා කළු ගල් යොදාගෙන තිබේ.

ගොඩ සොරොව්ව හා මඩ සොරොව්ව නමින් සොරොව් දෙකක් ඇත. වැවේ ජලය ඉහළ මට්ටමේ තිබෙන විට ගොඩ සොරොව්වෙන් ජලය මුදා හරී.

වැව් බැම්මේ පහළ මට්ටමින් මඩ සොරොව්ව සාදා තිබේ. වැවේ රොන්මඩ ඉවත් කෙරෙන්නේ මේ මඩ සොරොව්වෙනි.

❖ බිසෝකොටුව

වැවේ ජලය සොරොව්වකින් පිටතට මුදා හැරීමේ දී වැව් බැම්මට වන හානිය වලක්වා ගන්නේ මෙම බිසෝකොටුවෙනි. හතරැස් ළිඳක හැඩයට මෙය නිර්මාණය කර තිබේ. එය වාරි කර්මාන්තයේ විශිෂ්ටතම නිර්මාණයකි. ජලය නිකුත් කිරීම සඳහා මෙහි විශේෂ ජල පාලන උපකරණයක් සවි කර ඇත. එය මොහොල යන නමින් හඳුන්වයි.

❖ පිටවාන

වැවේ අතිරික්ත ජලය මෙමගින් පිට කෙරේ. පිටවාන ගල් පුවරු යොදා සකස් කර තිබේ.

❖ ඇතුළුවාන

වැවකට බාහිර ජල සැපයුමක් කෙරෙන විට ඇතුළුවාන යොදා ගනී. බාහිර ජලය සමග ගලා එන රොන්මඩ වැවට ගලා යාම මෙමගින් වැලකෙයි.

ඇළ මාර්ග වැව හා බැඳුණු තවත් ශිල්පීය අංගයකි. ඇළ මාර්ග නිර්මාණයේ දී පැරණි වාරි ශිල්පීන්ගේ තාක්ෂණික දැනුම පිළිබිඹු වේ.

» බෑවුම් ප්‍රදේශවලින් ඇළ මාර්ග දිගේ ජලය ගලාගෙන යාමේ දී වේගය පාලනය කර ගැනීමට ගල් අත්තිවාරම් සහ ඇළ වේල්ලේ ඇතුල් පැත්තේ තැනින් තැන ගල් කණු සවි කිරීම
» ඇළ මාර්ග ජලය පිරුණුවිට අතිරික්ත ජලය පිට කිරීම කළු ගලින් නිම කළ වාන් සකස් කිරීම
» උමං මාර්ගයෙන් නළ මගින් පොකුණුවලට ජලය සැපයීම

උමං මගින් පොකුණකට ජලය සැපයීමේ දී අවධානය යොමු කළ කරුණක් වූයේ අවසාදිතවලින් තොර ජලය පමණක් පොකුණට ගලා යාමට සැලැස්වීම යි. එහිදී අනුගමනය කළ තාක්ෂණය වූයේ නල මගින් ප්‍රවාහනය කරනු ලබන ජලය කුටියකට රැස් කොට ජලයේ ඇති අවසාදිත කුටියේ රැස්වෙන්නට ඉඩ හැර පිරිසිඳු ජලය පමණක් පොකුණට ගලා යාමට සැලැස්වීම යි. මේ පිළිබඳ වැදගත් ම සාධක දෙක නම් කුට්ටම් පොකුණ හා ඇත් පොකුණ යි.

පොකුණු හා නල මාර්ග නිර්මාණය කිරීමේදී තිරස් ප්‍රසාරණය හා සිරස් ප්‍රසාරණය යන තාක්ෂණික ක්‍රම දෙක භාවිත කොට තිබේ.

තිරස් ප්‍රසාරණය යනු ජලය හරස් අතට ප්‍රසාරණය වීමට හෙවත් ව්‍යාප්ත වීමට ඉඩ සැලැස්වීම යි. රන්මසු උයනේ නල මාර්ගවලින් ද මේ බව ඔබට වටහාගත හැකිය.

සිරස් ප්‍රසාරණය යනු පොකුණක පතුලේ සිට ඉහළට ජලය ප්‍රසාරණය වීමට හෝ විහිදී යෑමට හැකි අයුරින් පොකුණ නිර්මාණය කිරීමේ තාක්ෂණය යි. බොහෝ විට පුනීලයක ආධාරයෙන් එම නිර්මාණය සිදු කරනු ලැබේ.

- » සුළු බෑස්මක් ඔස්සේ විශාල දුරකට ජලය ගෙන යෑම
- » (යෝධ ඇල)
- » ඇළ මාර්ග තැනීමේ දී භූමියේ පිහිටීම කෙරෙහි දැඩි සැලකිල්ලක් දැක්වීම
- » සමස්ත වියළි කලාපය ම ආවරණය වන ආකාරයට ඇළ මාර්ග නිර්මාණය කිරීම වැනි ලක්ෂණ තුළින් ද පැරණි ශ්‍රී ලංකාවේ වාරිමාර්ග තාක්ෂණයේ විශිෂ්ටත්වය පිළිබිඹු වෙයි.

**4.14.2 ගෘහ නිර්මාණ හා කලා ශිල්ප**

පැරණි ලංකාවේ වාස්තු විද්‍යාවේ හා කලා නිර්මාණ පිළිබඳ අගනා සාධක රැසක් ඉතිරි වී තිබේ.

අනුරාධපුර යුගයට අයත් ලෞකික ගෘහ නිර්මාණ පිළිබඳ සාධක සීගිරියෙන් හමුවේ. සීගිරි පර්වතය මුදුනේ රජ මාලිගය ඇතුලු ගොඩනැගිලි ගණනාවක නටබුන් දැකිය හැක. පර්වතය බෑවුමේ බස්නාහිර ප්‍රදේශයේ රාජසභා මණ්ඩපය, සීත හා ගිම්හාන මාලිගා, ජලස්නාන පොකුණු, විනෝද උයන්වල නටඹුන් දැකිය හැකි ය.

මෙහි ගොඩනැගිලි හා පොකුණුවලට ජල මාතිකා මගින් ජලය සපයා ඇත. එම ජල මාතිකා ජල මල්වලින් අලංකාර කර ඇත. සීගිරි බල කොටුවේ කළුගලට ගඩොල් සම්බන්ධ කර නිමවා ඇති සුවිශේෂ ආරුක්කු සිංහල වාස්තු විද්‍යාඥයන්ගේ විශිෂ්ට නිර්මාණය ලෙසින් සැලකිය හැක. සීගිරියේ කැටපත් පවුර ද උසස් නිර්මාණයකි. සීගිරි පර්වත මුදුනට නැගීම සඳහා තනා ඇති සිංහ මුඛය සහිත පියගැට පේළිය ද උසස් නිර්මාණයකි.

බටහිර බැවුමේ ඇති චිත්‍ර ලෝක ප්‍රකට නිර්මාණ ලෙස සැලකේ. සීගිරි චිත්‍ර නමින් සුප්‍රකට මෙම චිත්‍රවලට අජන්තා බිතු සිතුවම්වල ආභාසය ලැබී ඇතැයි ඇතමෙක් පවසති.

මෙම සාධක වලින් ආගමික හා ලෞකික ගෘහ නිර්මාණ කෙබඳු අන්දමක පැවතියේ දැයි පැහැදිලි කරගත හැකිය.



4.10 රූපය-කුට්ටම් පොකුණ

අනුරාධපුරයේ කුට්ටම් පොකුණ ද වාස්තු විද්‍යාවේ විශිෂ්ට නිර්මාණයකි. ඔප මට්ටම් කළ කළුගල් භාවිත කොට පොකුණු යුගලක් ලෙස ඉදි කර ඇති මේ පොකුණ පළමුවන අග්බෝ රජ සමයේ නිර්මාණයක් සේ සැලකේ.

අනුරාධපුර යුගයට අයත් තිසාවැව අසල පිහිටි රන්මසු උයන හෙවත් මගුල් උයන ද විශිෂ්ට නිර්මාණයකි. මෙහි එළිමහන් ගෙවල් මණ්ඩප, නාන ගෙවල් දක්නට ලැබේ. මේ පොකුණට උමං මගින් ජලය සපයා ගෙන තිබේ.
ආගමික ගෘහ නිර්මාණ අතර චෛත්‍ය නිර්මාණ සුවිශේෂී වේ. චෛත්‍ය නිර්මාණයේ දී පහත සඳහන් අංග කෙරෙහි සැලකිල්ල දක්වා ඇත.

1. අත්තිවාරම (පාදම)
2. ගර්භය
3. හතරැස් කොටුව
4. දේවතා කොටුව
5. කොත් කැරැල්ල
6. චූඩා මාණික්‍ය

චෛත්‍යයේ උපාංග හැටියට පේසා වලලු, වාහල්කඩ, මලසුන් ආදිය වේ. යුපස්තම්භය ධාතු ගර්භය මුදුනට ගෙන යාම සඳහා අනුගමනය කළ තාක්ෂණය සුවිශේෂී ලක්ෂණ පිළිබිඹු කරයි.

උපෝසථඝර, පධානඝර, දානශාලා, චංකමණපථ, ජන්තාඝර, ආසනඝර, බෝධිඝර, රෝහල් ආදියෙහි පංචකාවාසවල නටබුන් ද හමු වේ. පංචකාවාස යනුවෙන් අදහස් කරන්නේ ඒකක පහකින් යුත් ආවාස සංකීර්ණයකි.

අනුරාධපුර යුගයේදී විශාල චෛත්‍ය නිර්මාණය විය. රුවන්වැලිසෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය වැනි ස්තූප ඒ සඳහා නිදසුන් කිහිපයකි. චෛත්‍ය නිර්මාණයේ දී භාවිත කළ තාක්ෂණික ඥනය පිළිබඳ සොයා බැලීමේ දී ලක්ෂණ කිහිපයක් හඳුනා ගැනීමට පුළුවනි.

» චෛත්‍යයේ විශාලත්වයට සරිලන පරිදි චෛත්‍යයේ අත්තිවාරම නිර්මාණය කිරීම.

» චෛත්‍යයේ හැඩය ආරක්ෂා කර ගැනීම

» ධාතු ගර්භය විවිධ හැඩතලවලට නිර්මාණය කිරීම

උදාහරණ බුබ්බුලාකාර
ඝණ්ටාකාර
ධාන්‍යාකාර ආදී වශයෙනි.

කලා ශිල්ප අතර බුදු පිළිමවලට හිමි වන්නේ සුවිශේෂී තැනකි. බුදුපිළිම හුණු ගලෙන් හා කළු ගල්වලින් නෙලා තිබේ. අනුරාධපුර බුදුපිළිම අතර මහමෙවුනාවේ සමාධි පිළිමය ලෝක ප්‍රකට වූවකි. බුදුරජුන්ගේ කරුණාව, ප්‍රඥාව, මෛත්‍රිය මෙම පිළිමයෙන් විදහා දක්වා ඇති ආකාරය අග්‍රගණ්‍යය. මීට සමාන පිළිම තොලුවිලින් හා වෙනත් තැන්වලින් ද ලැබී ඇත. අනුරාධපුරයෙන් පිට ප්‍රදේශවල දක්නට ලැබෙන බුදුපිළිම අතර අවුකන, සැස්සේරුව, මාලිගාවිල, අනුරපුර හා තොලුවිල සමාධි පිළිම අමතක කළ නොහැකිය.



4.11 රූපය-තොලුවිල සමාධි පිළිමය
මෙය කොළඹ ජාතික කෞතුකාගාරයේ
තැන්පත් කර තිබේ



4.12 රූපය-අවුකන පිළිමය



4.13 රූපය-මහමෙවුනාවේ සමාධි පිළිමය

බුදුපිළිමය භාවිතයට ඒමට පෙර බුදුන් වහන්සේ නිරූපණය කරන ලද්දේ ආසනයෙන් හා සිරිපතුලෙනි. අභයගිරියේ ආසනඝරය නම් ගොඩනැගිල්ලෙන් මේ පිළිබඳ සාධක හමුවේ.

ශෛලමය ප්‍රතිමා, බුද්ධ ප්‍රතිමාවලට අමතරව ලෝහමය බුද්ධ ප්‍රතිමා රාශියක් ද හමුවී ඇත.

එකල කැටයම් කලාව ද දියුණු මට්ටමක පැවති බවට සාධක තිබේ. ඒ අතර සත්ත්ව රූප හා සඳකඩ පහණ, දෙරටුපාල රූප ආදිය දක්නට ලැබේ.

ඉසුරුමුණියේ පෙම් යුවල - අභයගිරියේ මහසෙන් මාලිගය හා බිසෝමාලිගය යනුවෙන් හඳුන්වන ස්ථානවල ඇති සඳකඩ පහන් දෙක රත්නප්‍රාසාදයේ මුරගල අද්විතීය කලා කෘති වේ.

අනුරාධපුර යුගයේ චිත්‍ර කලාව බෙහෙවින් දියුණු වී තිබුණ බවට සීගිරි චිත්‍ර සාක්ෂි දරයි. දුටුගැමුණු රජතුමා රුවන්වැලි මහාසෑයේ ධාතු ගර්භයේ බුද්ධ චරිතයේ විවිධ අවස්ථා චිත්‍ර ගත කර වූ බව මහාවංසයේ සඳහන් වේ. පේරාදෙණිය අසල හිඳගල විහාරයේ ලෙනක දක්නට ලැබෙන චිත්‍ර සීගිරි චිත්‍රවලට ආසන්න කාලයට අයත් යැයි සැලකේ. මහියංගණ චෛත්‍ය ගර්භයෙන් ද අනුරාධපුර යුගයට අයත් චිත්‍ර හමු වී ඇත.

සමස්තයක් වශයෙන් සලකා බලන විට ලක්දිව කලාශිල්පවලට උතුරු හා දකුණු ඉන්දීය ආභාසය ලැබී තිබුණත් හෙළ කලාකරුවෝ දේශීය ලක්ෂණවලට ආවේණික වූ කලා සම්ප්‍රදයක් ගොඩනගා ගැනීමට සමත් වූහ.



4.14 රූපය-මුරගල

## 4.14.3 වෛද්‍ය ක්ෂේත්‍රය

පැරණි යුගයේ වෛද්‍ය ක්ෂේත්‍රය ද රාජානුග්‍රහය ලබා වැඩි දියුණුව පැවති බව සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යා කැණීම්වලින් ලැබී ඇති සාධකවලින් අනාවරණය වේ.

මහාවංසයේ විස්තර වන ආකාරයට බුද්ධදාස රජතුමා ප්‍රසිද්ධ වෛද්‍යවරයෙකි. තුඹසක් අසල රෝගීව සිටි නාගයෙකු සුවපත් කළ බව ද දැක්වෙයි. එතුමා සාරාර්ථ සංග්‍රහය නම් වූ වෛද්‍ය සංග්‍රහය රචනා කළේය. මහාවංසයේ සඳහන් වන අන්දමට එතුමා විසින් ශල්‍යකර්මයක මාර්ගයෙන් දරු ප්‍රසූතියක් සිදු කොට ඇති අතර මව සහ දරුවා යන දෙදෙනාගේ ම ජීවිත ආරක්ෂා කර ඇත. සතුන්ට පවා වෙදකම් කළ එතුමා නාග රාජයෙකු සුවපත් කළ බව ද සඳහන් වේ.



4. 15 රූපය-පැරණි බෙහෙත් ඔරුවක්

කැණීම්වලින් බෙහෙත් ඔරු සොයාගෙන ඇත. විෂ හරණය කිරීම සඳහා හා වාපිත් සෙම් සමනය කිරීම සඳහා බෙහෙත් පුරවන ලද මෙම ඔරුවෙහි රෝගීන් සතපා ප්‍රතිකාර කරන්නට ඇතැයි විශ්වාස කරනු ලැබේ.

එකල රජවරුන් වෛද්‍ය ශාස්ත්‍රයට දැක්වූ අනුග්‍රහයට නිදසුන් පහත දැක්වේ.

- » භික්ෂූන් වහන්සේලා හා මහජනයා සඳහා වෛද්‍යවරු පත් කිරීම
- » රෝහල් හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ඇති කිරීම
- » පළමුවන අග්බෝ, පළමුවන සේන, දෙවන සේන, පස්වන කාශ්‍යප වැනි රජවරුන් රෝහල් පිහිටුවා ඒවා නඩත්තු කරවීම
- » වෛද්‍යවරුන් පුහුණු කිරීම
- » වෙද පොත් ලියා වෛද්‍යවරුන් අතට පත් කිරීම
- » වෛද්‍යවරුන්ගේ නඩත්තුවට ගම්බිම් වෙන් කිරීම
- » ඔසු උයන් කරවීම

සෙල්ලිපිවල සඳහන් වන වෙදනා, මහ වෙදනා, වෙද්සම්දරුවන් වැනි වචන එකල විසූ රජයේ වෛද්‍යවරුන් ලෙස සැලකේ. මිහින්තලයෙන් රෝහලක නටඹුන් සොයාගෙන තිබේ.

### 4.14.4 ශිල්පීය කර්මාන්ත

අනුරාධපුර යුගයේ තාක්ෂණික දැනුම පිළිබිඹු කෙරෙන විවිධ කර්මාන්ත පැවති බවට සාධක රැසක් අභයගිරි භූමියේ කැණීම්වලින් හමු වී ඇත. ලෝකුරු කම්හලක නටබුන් සොයාගෙන තිබේ. වෙහෙරගල අවලෝකිතේශ්වර බෝසත් පිළිමය, වටිනා ලෝහ මැණික් පාෂාණ වර්ග, පබළු හා ආභරණ ලෝහ උඳුන වර්ණ ගල්වන ලද උළු වැනි සාධක කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළ අගයක් පිළිඹිබු කරන නිදසුන් ය. මේ හැර එකල ඇත් දත් කැටයම් ශිල්පය ද පැවති බව මහාවංසයේ සඳහන් වේ. අනුරාධපුර නගරයේ මෙම කැටයම් ශිල්පීන්ට දන්තකාර වීථි නමින් හඳුන්වන ලද වෙන් වූ ස්ථානයක් ද තිබුණි. විවිධ ශිල්ප ශ්‍රේණි ගම් වශයෙන් සංවිධානය වී තිබූ බවට ඇති සෙල්ලිපි සාධක අනුරාධපුරයේ ආර්ථිකය පිළිබඳ සාකච්ඡාවේ දී සඳහන් කර ඇත.



4.16 රූපය-අවලෝකිතේශ්වර ලෝකඩ ප්‍රතිමාව

### 4.14.5 නගර නිර්මාණ ශිල්පය

ලක්දිව නගර නිර්මාණය පිළිබඳ ඉපැරණිතම විස්තරය දක්නට ලැබෙන්නේ පණ්ඩුකාභය රජුගේ අනුරාධපුර නගර නිර්මාණය සම්බන්ධයෙනි. එම නගර නිර්මාණය දෙවනපෑතිස් රජතුමා බුදුදහම හා සම්බන්ධ කරමින් තවදුරටත් විධිමත් කළ බව මහාවංසයෙන් හෙළිවේ. ක්‍රි.පූ යුගයේ දී ම අනුරාධපුර නගරය අංග සම්පූර්ණ පාලන මධ්‍යස්ථානයක් වශයෙන් හා ආගමික කේන්ද්‍රස්ථානයක් වශයෙන් සංවර්ධනය වී තිබුණි. ඒ අනුව පස්වන සියවසේ ලක්දිවට පැමිණි පාහියන් භික්ෂුව ඒ වන විට අනුරාධපුර නගරයේ පැවති ස්වභාවය පිළිබඳ විස්තරයක් සිය දේශාටන වාර්තාවේ සඳහන් කර තිබේ. කෙසේ වුවත් මෙම නගර නිර්මාණය වරින් වර අභියෝගයට ලක් වූ බව පෙනේ. උදාහරණයක් වශයෙන් පළමුවන සේන රජතුමාගේ කාලයේ දී ලක්දිව ආක්‍රමණය කළ ශ්‍රී මාර ශ්‍රී වල්ලභ පාණ්ඩ්‍ය ආක්‍රමණිකයා රාජ්‍ය සම්පත් කොල්ලකා අනුරාධපුර නගරය විනාශ කර දැමූ බව මහාවංසයේ දැක්වෙයි.

අනුරාධපුරයට අමතරව සීගිරිය බිහි වූ ආකාරය ද සැලකිල්ලට ගත යුතුය. මෙය බලකොටු නගරයකි. බලකොටු නගරයක ආවේණික ලක්ෂණයක් වන්නේ ගිරිදුර්ග, ජල දුර්ග හා පංකදුර්ග යන ඒවායෙන් මෙම නගරය සමන්විත විය.

මේ හැර තවද වරාය ආශ්‍රිත කර ගනිමින් ඉදි කරන ලද නගර නිර්මාණ කිහිපයක් ද විය. මෙයින් වැදගත් ම වරාය නගරය වූයේ මහාතිත්ථය හෙවත් මාතොට යි. මෙහි වරින් වර කරන ලද කැනීම්වලට අනුව සුවිශේෂී සැලැස්මක් යටතේ නිර්මාණ කටයුතු සිදු කර තිබූ බවට සාධක ලැබේ. ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථවල උගන්වන ආකාරයට වරාය නගරයට හෙවත් පට්ටන ග්‍රාමයක ලක්ෂණ වන්නේ නොයෙක් කඩපිල්වලින් සමන්විත වීම, සාගරයෙන් වට වීම, දේශීය හා විදේශීය වෙළඳුන්ගෙන් ගහණ වී පැවතීම යි.

දෙවෙනි වරාය නගර නිර්මාණය ගෝකණ්ණ හෙවත් ත්‍රිකුණාමලයට අයත් වේ.

### ❖ මහාමාර්ග හා ප්‍රවාහනය

මේ පිළිබඳ ව තොරතුරු සපයා ගැනීමට පාළි වංසකථා ඇතුළු දේශීය සාහිත්‍ය මූලාශ්‍රය බෙහෙවින් ම උපකාරී කර ගැනීමට පුළුවනි. අනුරාධපුර යුගයේ දී මෙන් ම ඉන් පසු රාජ්‍ය අවධිවල දීත් අනුරාධපුර නගරය කේන්ද්‍ර කරගෙන දිවයිනේ විවිධ ප්‍රදේශ සමඟ සබඳතා පවත්වා ගැනීමට ඉවහල් වූ මහාමාර්ග තුනක් පැවතිණි. මේ මාර්ග ප්‍රධාන වරාය සමග ප්‍රාදේශීය පළාත් මධ්‍යස්ථාන සමග හා පාලන ඒකක සමඟ සම්බන්ධතා පැවැත්වීමට යොදා ගෙන තිබේ. එනම්,

1. අනුරාධපුරය හා මහාතිත්ථ වරාය දක්වා සම්බන්ධ වූ මහාමාර්ගය
2. උතුරේ ජම්බුකෝල පට්ටන වරායේ සිට අනුරාධපුරය දක්වා වැටී තිබුණු මාවත
3. රජරට සිට රුහුණු ජනපදය තෙක් වැටී තිබුණු මාවත

අනුරාධපුර නගරය ඇතුළත තිබූ මාර්ග පද්ධතිය පිළිබඳව විස්තර වංශකතාවල හා ශිලා ලේඛනවල ද සඳහන් වේ. එහි තිබූ ප්‍රධාන මාර්ගය මහවෙය (මහා වීථි) යනුවෙන් සඳහන් වේ.

- ❖ යුදමය අවශ්‍යතා (හමුද ගමන් සඳහා)
- ❖ ආර්ථිකමය අවශ්‍යතා (වරාය සමඟ)
- ❖ සාමාන්‍ය ජනතාවගේ දෛනික අවශ්‍යතා සඳහා මෙම මාර්ග යොදා ගත් බව පෙනේ.

මේ ප්‍රධාන මාර්ගවලට අමතර ව රට අභ්‍යන්තරයේ මාර්ග තිබුණි. මේ මාර්ග රට අභ්‍යන්තරයේ වෙළෙඳ කටයුතුවල දී ප්‍රයෝජනයට ගෙන තිබේ. විශාල වැව්වල හා ඇළවල් වල වැ කණ්ඩි හා ඉවුරු ද මංමාවත් හෝ අඩි පාරවල් ලෙස එකල භාවිත විය.

මේ මාර්ග ඉදි කිරීමේ දී අපේ වාරි ඉංජිනේරු ශිල්පීන්ට මනා තාක්ෂණික දැනුමක් තිබුණු බව සී. ඩබ්. නිකොලස් මහතා පවසයි.

මේ මාර්ග ගංගා සහ දිය දහරවල් මතින් යන ස්ථානවල දී ලී සහ ගල් පාලම් යොදා ගත් බව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් සාක්ෂි ලැබී තිබේ. අනුරාධපුරයේ සිට ජම්බුකෝල පට්ටනය තෙක් විහිදුණු මාර්ගය මල්වතු ඔය හරහා දිවෙන ස්ථානයේ ගල් පාලම් දෙකක් තිබුණි. අනුරාධපුරයේ සිට ගෝකණ්ණ දක්වා වැටී තිබුණු මාවතේ කණදරා ඔය හරහා ද ගල් පාලමක් තිබුණි. මේ පාලමේ දිග අඩි 80 කි. පළල අඩි අටකි.

ප්‍රවාහන කටයුතු සඳහා රථ හා සත්ත්වයන් යොදා ගත් බව වංසකතාවලින් හෙළි වේ. උදාහරණයක් වශයෙන් දෙවනපෑතිස් රජතුමා අනුරාධපුරයට වැඩීම සඳහා මිහින්තලයට රථයක් යවා තිබේ. එළාර රජතුමා ද රථයෙන් ගමන් කළ බව මහාවංසයේ සඳහන් වේ. අසුන්පිට ගමන් කිරීම පිළිබඳ සාධක බහුල ලෙස තිබේ. සහස්සවත්ථුපකරණයේ සඳහන් වන අන්දමට ශ්‍රිව නම් පඬිවරයා මහා තිත්ථයේ ගමන් කළේ අසුපිටෙනි.

භාණ්ඩ ප්‍රවාහනය සඳහා ගවයින් බැඳි කරත්ත හා තවලම් භාවිත කළ බවට ද සාධක තිබේ.

**ක්‍රියාකාරකම**

අපේ පැරණි ශ්‍රී ලංකාවේ තාක්ෂණික ශිල්පක්‍රම යන මාතෘකාව යටතේ ඓතිහාසික කරුණු ඇතුළත් කරමින් ලිපියක් සකස් කරන්න.

## 4.15 අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම

විවිධ හේතු නිසා මේ රාජධානියේ පරිහානිය ක්‍රි. ව. හත්වන සියවස පමණ සිට ආරම්භ වී ක්‍රි. ව. 1017 දී බිඳ වැටුණි. එකී හේතු සාධක මොනවාදැයි විමසා බලමු. ඒවා ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් යටතේ සාකච්ඡා කළ හැකිය. එනම්,

» දේශපාලන හේතු
» ආර්ථික හේතු

යනුවෙනි.

## ❖ දේශපාලන හේතු

ක්‍රි. ව. හත්වන සියවසින් පසුව රාජ්‍ය බලය දුර්වල විය. රාජාණ්ඩු පාලන ක්‍රමයක පවතින රටක රජුගේ පෞරුෂත්වය මත රාජ්‍ය පාලනය ශක්තිමත් ව පවතී. මේ සිද්ධාන්තය අනුරාධපුර රාජධානියට ද ගැළපෙන බව පෙනේ. සිව්වන මිහිඳු රජුගෙන් පසුව, අනුරපුර රාජ්‍ය පාලකයා වූ පස්වන සේන රජු ඉතාම දුර්වල පාලකයෙකු විය. ඔහුගේ රාජ්‍ය කාලයේ පාලන තන්ත්‍රයෙහි ප්‍රධානියා ලෙස කටයුතු කළේ සේන නම් වූ සෙන්පතිවරයා ය.

ඔහුගේ ක්‍රියා කලාපය රාජ්‍යයේ පරිහානියට හේතු විය. රජු බෙහෙවින් ම දුර්වලයෙකු වූ නිසා තම රාජ්‍ය බලය තහවුරු කර ගැනීමට බලවත් උත්සහයක් දැරීමට සිදු විය. රජු බෙහෙවින් ම මත්පැන්වලට ඇබ්බැහි වූ කෙනෙකි. ඔහුගේ රාජ්‍ය කාලය වසර දහයකට සීමා විය. ඔහුගෙන් පසුව රජ වූයේ තම බාල සොහොයුරු පස්වන මිහිඳු ය. මොහු ද බාල වියේ පසු වූ දුර්වල පාලකයෙකි. මොහුට ද සේන සෙනෙවියාගේ බලපෑම්වලට මුහුණ දීමට සිදු විය. රාජ්‍ය නීතිවලට පිටුපා ක්‍රියාකළ පාලකයෙකි. එබැවින් රටවැසියා බදු ගෙවීම පවා ප්‍රතික්ෂේප කළේ ය. මේ නිසා හමුදවට වැටුප් ගෙවීමට පවා නොහැකි වූ බව පෙනේ. මේ ආකාරයට මධ්‍ය පාලන තන්ත්‍රය දුර්වල වනවිට රුහුණු රට, මලය රට පාලකයෝ ස්වාධීන වීමට උත්සාහ කළහ. අනුරාධපුර රාජ්‍යයෙහි ඇති වූ මෙම දුර්වල පසුබිම නිසා අනුරපුර අවසාන භාගයේ පාලකයන්ට රට එක්සත්ව තබා ගැනීම බෙහෙවින් ම අසීරු විය.

පස්වන සියවසින් පසුව දකුණු ඉන්දියාවේ ඇති වූ දේශපාලන වෙනස්වීම් ලංකාව කෙරෙහි ඍජු වශයෙන් ම බලපෑවේය. මේ රටේ දේශපාලන ප්‍රශ්න විසඳා ගැනීමට හත්වන සියවසේ පමණ සිට ශ්‍රී ලාංකික පාලකයින් ඉන්දියානු කුලී හමුදවල සහාය ලබා ගැනීමේ ප්‍රතිඵලය වූයේ ලක්දිව උතුරු ප්‍රදේශයේ දමිළ ජන කොටස් වර්ධන වී යාමයි. මෙසේ දමිළ ජනගහනය වර්ධන වීම අනුරපුර රාජධානියේ ස්ථාවරත්වයට ප්‍රබල තර්ජනයක් බවට පත් විය. රාජ්‍ය බලය දුර්වල වන විට ඇතැම් දමිළ ප්‍රධානීන් රාජ්‍ය බලය මෙහෙයවීමට පවා ඉදිරිපත් වූ අවස්ථා දක්නට ලැබේ. එසේ ම දකුණු ඉන්දියාවෙන් ලක්දිවට ආක්‍රමණ එල්ල වූ අවස්ථාවල දී ලක්දිව උතුරු ප්‍රදේශයේ සිටි දමිළ ජනතාව ආක්‍රමණිකයන්ට සහය දුන්හ.

පාණ්ඩ්‍ය වංශික ශ්‍රී මාර ශ්‍රී වල්ලභ දකුණු ඉන්දියාවේ පල්ලව රාජ්‍යය ජයගෙන ලංකාවට ද ආක්‍රමණයක් එල්ල කළේ ය. එය ඉතා දරුණු ආක්‍රමණයකි. විශාල හමුදවක් සමග ලක්දිව මහාතිත්ථ වරායෙන් ගොඩබට පාණ්ඩ්‍ය හමුදව මුළු උතුරු ප්‍රදේශය ම අල්ලා ගත්තේ ය. මෙරට විසූ දමිළයෝ ආක්‍රමණික හමුද සමග එක් වූහ. සිංහල හමුදව පරාජයට පත් විය. මේ නිසා පළමුවන සේන රජතුමා සිහසුන අතහැර මලය රටට පැන ගියේ ය.

පාණ්ඩයෝ අනුරාධපුරය අල්ලා ගත්හ. ඔවුහු රිසිසේ රාජ්‍ය සම්පත් කොල්ල කා විනාශ කළහ. සිත්කළු වූ අනුරපුරය විනාශකර දැමූ බව මහාවංස කතෘවරයා පවසයි. මේ විනාශයෙන් යළි අගනුවර ගොඩනගා ගැනීමට නොහැකි විය. එසේ ම ලක්දිව පාලකයන් දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීමට සූදනම් වූ අවස්ථාවල දී ලංකාවේ විසූ දමිළයෝ ඊට විරුද්ධ වූහ. දෙවන දප්පුල රජතුමා පල්ලව වංශික මාරවර්මන් රාජසිංහට උදව් කිරීමට උත්සාහ කළ අවස්ථාවේ දී මෙරට විසූ දමිළයන් ඊට විරුද්ධ වූ නිසා එම උත්සාහය අතහැර දැමීමට සිදු විය. මෙසේ අනුරපුර අවසාන භාගය වන මෙරට විසූ දමිළ නායකයන් හා දකුණු ඉන්දීය කුලී හමුදාව අනුරපුර රාජධානියේ ස්ථාවරත්වය ආරක්ෂා කර ගැනීමට බලවත් තර්ජනයක් බවට පත්ව තිබුණි.

## ❖ ආර්ථික හේතු සාධක

මධ්‍ය ආණ්ඩුවේ දේශපාලන බලය දුර්වල වන විට රජරට ප්‍රධාන ජීවනෝපාය ලෙස පැවැති කෘෂිආර්ථික රටාව දැඩි ලෙස බලපෑවේ ය. මධ්‍ය, පාලනය දුර්වල වීම රාජවංශ අතර රාජ්‍ය සඳහා අරගල ඇති වීම, නිසා වාරි සංවර්ධන ව්‍යාපාරය අඩපණ විය. අනුරාධපුර අවසාන සියවස් වල දී රජවරුන්ට වාරි සංවර්ධන කටයුතුවලට අවධානය යොමු කිරීමට නොහැකි විය. වාරි මාර්ග පද්ධතිය මත රාජ්‍ය භාණ්ඩාගාරයට ලැබෙමින් තිබුණු දකපති, බොජකපති වැනි බදු නොලැබී යාමෙන් රාජ්‍ය භාණ්ඩාගාරය දුර්වල විය. රාජ්‍ය ආදායම බිඳ වැටීම අනුරපුර රාජධානියේ ආර්ථික පරිහානියටත් රාජ්‍යයේ ස්ථාවරත්වයටත් ප්‍රබල තර්ජනයක් විය.

අටවන සියවසෙන් පසුව චෝළ අධිරාජ්‍යවාදය වර්ධනය වීම නිසා දකුණු හා ගිනිකොණ ආසියාවේ වෙළඳාමේ ආධිපත්‍යය හිමි කර ගත්තේ චෝළයන් ය. නානාදේශී ව්‍යාපාරය නමින් හැඳින් වූ ව්‍යාපාරයක් යටතේ සොළීන් නිකොබා දූපත්, අන්දමන් දූපත්, මලයාසියාව, ජාවා වැනි රටවල වෙළඳ ආධිපත්‍ය නතු කර ගැනීම නිසා ඔවුන්ගේ ආර්ථිකය සවිමත් විය. අපේ රටේ පාලකයන්ට විදේශ වෙළඳාමෙන් ලැබුණු ආදායම මේ නිසා අහිමි විය. රාජ්‍ය භාණ්ඩාගාරය දුර්වල විය. පස්වන මිහිඳු රජතුමාට අගම්පඩි (කුලී හමුදාව) හමුදාවට වැටුප් ගෙවීමට පවා නොහැකි වූ බව වංසකථාවේ දැක් වේ. වැටුප් ගෙවා ගත නොහැකි වූ රජතුමා රහස් උමගකින් රුහුණට පලා ගියේ ය.

## ❖ රාජධානියේ බිඳ වැටීම

විවිධ හේතු සාධක මත දුර්වල වෙමින් පැවති අනුරාධපුර රාජධානිය බිඳ වැටෙන්නේ දකුණු ඉන්දියානු සොළී ආක්‍රමණ නිසා ය. මේ කාලය වන විට දකුණු ඉන්දියාවේ ප්‍රබල අධිරාජ්‍යයක් ගොඩනගාගෙන සිටියේ සොළීන් ය. මහාවංසයේ දැක්වෙන අන්දමට පළමුවෙනි රාජේන්ද්‍ර චෝළ රජු යටතේ විශාල හමුදාවක් ලක්දිවට ගොඩබැස

රුහුණ දක්වා ගමන් කර පස්වන මිහිඳු රජතුමා අල්ලා ගත්තේ ය. ඔහු දේශපාලන සිරකරුවෙකු ලෙස චෝළ දේශයට ගෙන ගිය බව මහාවංසයේ දක්වේ.

මේ ආකාරයට වසර දහසකට වැඩි කාලයක් තිස්සේ පැවති අනුරපුර රාජධානිය 1017 දී බිඳ වැටුණි. ලංකාව සොළීන්ගේ යටත්විජිතයක් බවට පත් විය. සොළීන්ගේ ග්‍රහණයෙන් රට මුදා ගෙන පොළොන්නරු රාජධානිය අපේ රටේ පොළොන්නරුව රාජධානිය බවට පත් කර ගත්තේ පළමුවන මහ විජයබාහු රජතුමා ය. මේ පිළිබඳ තොරතුරු ඔබට ඊළඟ පාඩමේ දී ඉගෙන ගැනීමට පුළුවනි.

## ක්‍රියාකාරකම්

1. අනුරාධපුර රාජධානියේ පරිහානියට හා බිඳ වැටීමට බලපෑ දේශීය හා විදේශීය සාධක වගුගත කරන්න.
2. අනුරාධපුර යුගයේ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික තොරතුරු ඇසුරින් කෙටි ප්‍රශ්න විසිපහක් සකස් කරන්න. ඔබ සකස් කළ කෙටි ප්‍රශ්නවලට පිළිතුරු ද ලියන්න

# 05

# පොළොන්නරු රාජධානියේ ආරම්භය විකාශනය හා පරිහානිය



## හැඳින්වීම

අනුරාධපුර රාජධානිය ලෙස වර්ධනය වූ ආකාරය, එම රාජධානියේ වැදගත් පාලකයින්ගේ දේශපාලන, ආර්ථික, සමාජ හා ආගමික කාර්යයන් පිළිබඳවත් හතරවන ශ්‍රේණියේ දී ඔබට ඉගෙනීමට ලැබුණි. අනුරාධපුරයට පසුව පොළොන්නරුව අගනුවර වශයෙන් තෝරා ගැනීමට මෙරට පාලකයෝ තීරණය කළහ. මෙම පාඩමේ විස්තර කරන්නේ එම රාජධානි සමයේ පැවති දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික තොරතුරු ය.

## 5.1 පොළොන්නරු රාජධානියේ ප්‍රභවයට තුඩු දුන් දේශපාලන තත්වය

ක්‍රි. ව. දහවන සියවස අවසාන වන විට පස්වන මිහිඳු රජු අනුරාධපුරය ඇතුලු රජරට ප්‍රදේශය පාලනය කළ අතර දකුණු ඉන්දියාවේ බලවත් රාජ්‍යයක් ගොඩනගා ගෙන සිටි චෝළයෝ සිය අධිරාජ්‍යය අවට රටවලට ව්‍යාප්ත කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටියහ. අනුරාධපුරයට වරින්වර දකුණු ඉන්දියාවෙන් පැමිණ සිටි කුලී හමුදාව කැරලි ගැසීමත් සිංහල ප්‍රභූවරුන්ගේ සහයෝගය නොලැබීමත් නිසා පස්වන මිහිඳු රජුට පාලනය ගෙන ගිය නොහැකි විය. මෙකී අස්ථාවරත්වයෙන් ප්‍රයෝජන ගෙන පළමුවන රාජරාජ අනුරාධපුරය ආක්‍රමණය කළේ ය. (992-993) මෙහි ප්‍රතිඵලයක් ලෙස පස්වන මිහිඳු රුහුණට පලා ගියේ ය. පළමුවන රාජරාජගෙන් පසු බලයට පත් වූ පළමුවන රාජේන්ද්‍ර රජු 1017 දී නව හමුදාවක් එවීය. මෙහි නායකයා සාම ගිවිසුමක මුවාවෙන් පස්වන මිහිඳු ගෙන්වා සිරකරුවෙකු ලෙස ඉන්දියාවට ගෙන ගියේ ය. මේ සමග ආරක්ෂාවට මෙරට තබා තිබූ පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ හා ලාංකීය රාජ කකුධ භාණ්ඩ ද රැගෙන ගිය බව මහාවංසයේ සඳහන් වේ. රජරට යටත් කළ චෝළ සෙන්පතියා පොළොන්නරුව නව මධ්‍යස්ථානය කරගත් නිසා අවුරුදු 1300ක් පමණ රටේ අගනුවරව පැවති අනුරාධපුරය වෙනුවට පොළොන්නරුව රටේ පාලන මධ්‍යස්ථානය බවට පත් විය.

### 5.1.1 පොළොන්නරුව අගනුවර වශයෙන් තෝරා ගැනීමට හේතු

පැරණි ලංකාවේ රෝහණයත් රජරටත් වෙන් කරන මායිම වූ මහවැලි ගඟ අසබඩ පිහිටි පොළොන්නරුව රුහුණේ සිට පැරණි රජරට දක්වා වැටී තිබූ මාර්ගයේ සන්ධිස්ථානයක් විය. චෝළයන්ට රජරට පාලනය කිරීමේ දී රුහුණෙන් හා මායා රටින් පැමිණිය හැකි බලවේග මර්ධනය කිරීමට පොළොන්නරුව වැදගත් මධ්‍යස්ථානයක් විය. පහත සඳහන් හේතු නිසා සිංහල පාලකයන්ට ද එය වැදගත් විය. එහි වැදගත්කම හේතු කීපයක් මත පැවතුනි.

- ❖ චෝළ ආක්‍රමණ නිසා අනුරාධපුර නගරය නටබුන් ව පැවතීම හා අනුරාධපුරය ආර්ථික අතින් පිරිහීමට පත්වීම නිසා සිංහල පාලකයෝ අගනුවර ලෙස අනුරාධපුරය තෝරා නොගත්හ. පොළොන්නරුව ම තම අගනුවර හැටියට තෝරා ගත්හ. ඒ සඳහා ඔවුන්ට බලපෑ විශේෂ හේතු කිහිපයක් තිබුණි. ඒවා අතර පහත සඳහන් හේතු වැදගත් වේ.
- ❖ අනුරපුර අවසාන භාගයේ සිට ම යුද්ධ හා ආර්ථික මධ්‍යස්ථානයක් බවට පොළොන්නරුව පත් ව තිබීම. (කඳවුරු නුවර, කඳවුරු පිටිය)
- ❖ මහවැලි නිම්නය ආශ්‍රිත වැඩි දියුණු වෙමින් පැවති මින්නේරි, ඇලහැර, කවුඩුලු, ගිරිතලේ, කන්තලේ වැව් සම්බන්ධ කරමින් ජලප්‍රවාහන පද්ධතියක් මගින් මෙම භූමිය පෝෂණය වීම.

- ක්‍රි. ව. නවවන සියවසේ සිට අනුරපුර පාලකයන් උප නගරයක් වශයෙන් පොළොන්නරුව භාවිත කිරීම නිසා පරිපාලන මධ්‍යස්ථානයකට සුදුසු වාතාවරණයක් පැවතීම.

### 5.1.2 චෝළ බලය පොළොන්නරුවේ පිහිටුවීම

1017 දී පළමුවන රාජේන්ද්‍ර විසින් පස්වන මිහිඳු සිරකරුවෙකු බවට පත් කර ගන්නා ලදී. ඉන් අනතුරුව රජරට මුම්මුඩි සෝල මණ්ඩලම් යනුවෙන් හඳුන්වන ලදී. එහි ගෙනගිය පාලනය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රය විරලය.

චෝළයෝ සිය යටත් විජිත පාලනය අධිරාජ්‍යයට සම්බන්ධ කුමාරයෙකු හෝ හමුදා නිලධාරියෙක් යටතේ සිදු කර ඇත. මෙරට පාලනය ද ඒ ආකාරයෙන් සිදු විය. මෙරටින් ලබා ගත් ආදායම චෝළ දේශයේ කෝවිල්වල නඩත්තුවට යොදා තිබූ බව පළමුවන රාජේන්ද්‍ර රජුගේ ශිව දේවාල ලිපියේ සඳහන්ව ඇත.

### 5.1.3 ලක්දිවට එල්ල වූ බලපෑම්

මේ අවධියේ චෝළයෝ පොළොන්නරුව හා ඒ අවට ප්‍රදේශවල කෝවිල් ඉදි කළහ. පොළොන්නරු පූජා භූමියේ දැනට හඳුනාගෙන ඇති අංක 2 ශිව දේවාලය අංක 01 ශිව දේවාලය උදාහරණ වේ.



5.1 රූපය-අංක 01 ශිව දේවාලය



5.2 රූපය-අංක 02 ශිව දේවාලය

චෝළයන්ගෙන් ලක්දිවට එල්ල වූ ප්‍රධාන බලපෑම දක්නට ලැබෙන්නේ දේශපාලන ක්ෂේත්‍රයේ ය. එය ඉහත විස්තර විය. මීට අමතරව ආගමික හා සංස්කෘතික ක්ෂේත්‍රයේ ඔවුන්ගේ විවිධ බලපෑම් දක්නට ලැබේ. ඉන් ප්‍රධාන වන්නේ ශිව දේවාල දිවයිනේ නොයෙක් ප්‍රදේශවල ඉදිවීම යි. මෙම දේවාල අතර පොළොන්නරුවේ අංක 2 ශිව දේවාල ය අද ද බෙහෙවින් ආරක්ෂිතව පවතී. අංක 01 ශිව දේවාලයේ නටබුන් ද පොළොන්නරුවෙන් ඔබට දැක බලා ගත හැක.

මහාතිත්ථ වරාය අසල ඇති රාජ රාජේශ්වරම් කෝවිලත් කන්තලේ ප්‍රදේශයෙන් හමුව ඇති කෝවිල් ද මේ අවධියට අයත් බව පිළිගෙන ඇත. මෙම දේවාලවලින් පිළිබිඹු වන්නේ ශිව ආගම පමණක් නොව ද්‍රවිඩ ගෘහ නිර්මාණ ශිල්පය ද වේ. මේ දේවාල ආශ්‍රය කර ගනිමින් හින්දු ආගමිකයින් වාසය කිරීම වැදගත් ලක්ෂණයක් වේ. මෙම ජනතාවගෙන් කොටසක් චෝළ ආක්‍රමණවලට පෙර පටන් ම දිවයිනේ සිටි නමුත් චෝළයන් නිසා වැඩි පිරිසක් දිවයිනට සංක්‍රමණය වූ බව කිව හැකිය. හින්දු ආගම ආශ්‍රය කර ගනිමින් චාරිත්‍ර-වාරිත්‍ර හා අභිචාර විධි සමාජ ගත වූ බව ද සැලකිය යුතු කරුණක් වේ. චෝළ ගෘහ නිර්මාණ ශිල්පයට සුවිශේෂ වූ ලක්ෂණ පොළොන්නරුවේ පිහිටි ශිව දේවාලවලින් පිළිඹිබු වේ.

## 5.2 චෝළ විරෝධී ව්‍යාපාර හා පළමුවන විජයබාහුගේ පහළ වීම

චෝළ ආධිපත්‍යයට නතු වී පැවැති ප්‍රදේශවලින් පලාගිය සිංහල කුමාරවරුන් හා රාජ්‍ය ප්‍රධානින් වාසස්ථාන කර ගත්තේ මලය කඳුකරය හා රුහුණු රටය. මෙම ප්‍රදේශවල සිටි ජනතාව තුළ චෝළයන්ගෙන් නිදහස් වීමේ අභිලාෂ මතු වුවත් පස්වන මිහිඳු රජු චෝළ සිරකරුවෙකු බවට පත් වී සිටි නිසා ඔහුගේ ආරක්ෂාව වෙනුවෙන් එම අදහස් යටපත් විය. 1029 පස්වන මිහිඳු රජු මිය යෑමත් සමග එම අදහස් නැවත ඉස්මතු විය.

ඒ වන විට පස්වන මිහිඳු රජුගේ පුත් කස්සප කුමරු රුහුණ මුල් කොටගෙන චෝළ විරෝධි සටන් ව්‍යාපාරයේ නායකත්වය ගත්තේ ය. ඔහුට තිබූ රාජ්‍ය උරුමය නිසා ජනතාව ඔහු වටා ඒකරාශී කරවූහ. මේ තත්වය මර්ධනය කිරීමට චෝළ ප්‍රතිරාජයා රුහුණ ආක්‍රමණය කළේ ය. එයට සාර්ථකව මුහුණ දුන් කස්සප කුමරු චෝළයන් පොළොන්නරුව දක්වා පසු බැස්සවීය. එහෙත් කස්සප කුමරුගේ හදිසි වියෝව චෝළ විරෝධී සටන් ව්‍යාපාරය අඩපණ කළේ ය.

ඒ වන විට කස්සප කුමරු හෙවත් වික්‍රමබාහු මරණයෙන් පසු රුහුණු හා අවට ප්‍රදේශ මුල් කොටගෙන විදේශීය හා දේශීය නායකයන් කිහිප දෙනෙක් වශයෙන් චෝළ විරෝධී බලවේග ගොඩනැගීමට උත්සහ කළෝය. එහෙත් ඔවුන් අතර පැවැති බල තරගය නිසා ඒ සියල්ල අඩපණ විය. කිත්ති සෙනවි, මහලාන කිත්ති, වික්‍රම පාණ්ඩ්‍ය, ජගතිපාල පරාක්‍රම පාණ්ඩ්‍ය වැනි නායකයෝ ඒ අතර වෙති. එසේම චෝළ සේනාව වරින් වර රුහුණට කඩා පැන ගොඩනැගෙන සංවිධාන විනාශ කිරීම නිසා ද ශක්තිමත් වූ චෝළ

විරෝධී බලවේගයක් බිහි නොවීය. මේ අතරතුර ලෝක හෙවත් ලෝකේශ්වර නමැති සෙන්පතියෙක් කතරගම මූලස්ථානය කොට ගෙන 1050 පමණ රුහුණේ බලයට පත් වූ බව පෙනේ. මෙසේ 1040 තරමේ සිදු වූ වික්‍රමබාහු කුමාරයාගේ මරණයේ සිට ගත වූ වසර 10 තුළ අස්ථාවර භාවයට පත් වූ රුහුණේ දේශපාලන තත්වය 1050 පසු වෙනත් මගකට හැරෙණු දක්නට ලැබිණ. එයට ප්‍රධාන හේතුව වූයේ, අනුරාධපුර රාජ පරම්පරාවට කිසියම් ඥාති සම්බන්ධයක් තිබූ අයෙකු ලෙස දැක්වෙන කිත්ති කුමරු (පළමුවන විජයබාහු) රුහුණේ දේශපාලන ක්ෂේත්‍රයට පිවිසීමය.

**ක්‍රියාකාරකම**

පළමුවන විජයබාහුට පෙර චෝළ විරෝධි ව්‍යාපාර මෙහෙය වූ නායකයන්ගේ ලැයිස්තුවක් පෙළගස්වන්න.

### 5.2.1 මහා විජයබාහු රජතුමා (1055 - 1110)

මහා විජයබාහු හෙවත් පළමුවන විජයබාහු රජතුමා ලංකා ඉතිහාසයේ එන ශ්‍රේෂ්ඨ පාලකයෙකි. එතුමා කුඩා අවදියේ දී කිත්ති යන නමින් හැඳින්විණි. ඔහුගේ පියා මානවම්ම රජ පරපුරෙන් පැවතෙන මොග්ගල්ලාන (මුගලන්) මහාසාමිය. මව දාඨෝපතිස්ස රජ පරපුරෙන් අඛණ්ඩ ව පැවතෙන ලෝකිතා දේවිය යි. මෙතුමා ගැන හැදෑරීමේ දී වැදගත්වන මූලාශ්‍රය කිහිපයක් පහත දැක්වේ.

- මහාවංසය
- පනාකඩුව තඹ සන්නස
- අඹගමුව ශිලා ලිපිය
- වේලෙක්කාර සන්නස

**පනාකඩුව තඹ සන්නස**

මේ සන්නස දකුණු පළාතේ මොරවක් කෝරලයේ පනාකඩුව නම් ගමේ කුඹුරක තිබී හමු විය. රජතුමාගේ ළමා කාලයේ සිට ම තොරතුරු මෙහි සඳහන් ව ඇත. ළමා කාලයේ දී මෙතුමාට අපමණ දුක් ගැහැට විඳීමට සිදු වූ බව මෙම සන්නසේ සඳහන් වෙයි. ආහාරපාන පවා නොමැතිව බොහෝ දුක් ගැහැට මැද වාසය කර තිබේ. එහි දී කුමරු ඇතුලු දෙමාපියන්ට රැකවරණය සලසා ඇත්තේ බුද්ධරාජ හෙවත් සිත්නරු බිම් බුදල්නා නම් සෙන්පතියෙකි. මොහු එකල රුහුණේ සිටි ජන ප්‍රධානියෙකි. බුදල්නා වෙත ලබා දුන් වරප්‍රසාද රැසක් ගැන මේ සන්නසේ සඳහන් වේ.



**5.3 රූපය-පනාකඩුව තඹ සන්නස**

### 5.2.2 විජයබාහු කුමරු රුහුණේ පාලකයා වීම

මහා විජයබාහු රජුට ඔහුගේ ළමා කාලයේ සිට ම උපකාර කළ ප්‍රභූවරයෙක් සිටියේ ය. රුහුණේ ලෝකේශ්වර නම් පාලකයාට කලක් සේවය කළ සිත්නරුබිම් බුදල්නා හෙවත් බුද්ධරාජ යනු ඔහුගේ නම බව මහාවංසයේ සේ ම පනාකඩුව තඹ සන්නසේ ද සඳහන් කර ඇත. කිත්ති කුමරු ඇතුළු රජ පවුලට බුද්ධරාජ ආරක්ෂාව සපයමින් සතුරන්ට එරෙහිව සටන් මෙහෙයවමින් කුමරුට රුහුණේ බලය ලබා ගැනීමට උපකාර කළේය.

එම ආධාර යටතේ රුහුණේ රජකම ලබා ගැනීම සඳහා කිත්ති කුමරු සටන් කළේ ය. රුහුණේ සමකාලීන පාලකයා වූ කේශධාතු කාශ්‍යප සමග ඇති වූ ගැටුමේ දී දේවමල්ල නම් තවත් සෙන්පතියකු ඇතුළු පිරිස කුමරුට බොහෝ උපකාර කර තිබේ. මෙම සටන්වලින් කේශධාතු කාශ්‍යප පරාජය වූ බැවින් කිත්ති කුමරු 1055 දී කතරගම පාලන මධ්‍යස්ථානය කර ගනිමින් පළමු විජයබාහු නමින් රජ විය. ඒ වනවිට ඔහු දහහත්වන වියේ පසු වූ බව මහාවංසයේ සඳහන් වේ.

### 5.2.3 ලංකාව චෝළ ආධිපත්‍යයෙන් නිදහස් කර ගැනීම

පළමුවන විජයබාහු රුහුණේ බලයට පත් වී වැඩි කාලයක් යාමට පෙර චෝළයෝ රුහුණ ආක්‍රමණය කළෝ ය. බලය ස්ථාවර කර ගැනීමට පෙර රජුගේ හමුදාව විනාශ කර දැමීම චෝළයන්ගේ අරමුණ විය. එහෙත් විජයබාහු මේ බව දැන ගෙන කඳුකර ප්‍රදේශයට (මලය) පලා ගියේ ය. ඉන්පසු මහානාගහුලයට පෙරළා පැමිණි රජතුමා ස්වකිය දේශපාලන බලය ගොඩනගමින් අනාගත සටනට අවශ්‍ය විදේශ ආධාර ලබා ගැනීමට බුරුමය සමග මිත්‍ර සබඳතා ගොඩනගා ගත්තේ ය. මේ වකවානුවේ වෙළඳ ද්‍රව්‍ය රැගත් නැව් බුරුම දේශයේ සිට රුහුණේ නැව් තොටවලට පැමිණි බව මහාවංසයේ සඳහන් වෙයි.

විජයබාහු රජු යටතේ රුහුණේ දේශප්‍රේමී සටනක් පිළියෙල වන බව ආරංචි වූ රජරට වැසියන් චෝළයන්ට බදු ගෙවීම නවතා ඔවුන්ට එරෙහිව කැරලි ගැසූ බව සඳහන් වේ.

සිය පාලනයට එරෙහිව ලාංකිකයන් සංවිධානය වන බව ඇසූ චෝළ අධිරාජයා වූ වීර රාජේන්ද්‍ර චෝළ ප්‍රතිරාජයාට ආධාර පිණිස හමුදා කණ්ඩායමක් එවීය. මහාතිත්ථයට (මාතොට) ගොඩබට එම සේනාව රජරට කැරළි දරුණු ලෙස මර්දනය කොට රුහුණ ද ආක්‍රමණය කර ඇත. මේ අවධියේ දී විජයබාහු රජුගේ ප්‍රබල සෙනවියන් දෙදෙනෙකු වූ රවිදේව හා චල ස්වකිය පියවර සමග චෝළයන්ට එක් වූ අතර විජයබාහු පලුට්ඨගිරියට (පලටුපානට) පසු බැස්සේ ය. එතැන සිට හමුදාව මෙහෙය වූ විජයබාහු චෝළ සෙන්පතියා ද මරාදමා එම සේනාව පරදා අනතුරු ව පොළොන්නරුව තෙක් හමුදාව මෙහෙයවා එය යටත් කර ගත්ත ද එය තාවකාලික ජයග්‍රහණයක් විය. එවක චෝළ අධිරාජ්‍යයා ලංකාවට එවූ හමුදාව අතින් බරපතල ලෙස පරාජයට පත් වූ විජයබාහු රජු කෑගලු දිස්ත්‍රිකයේ වාකිරිගල (වාතගිරි) දුර්ගයට පසු බැස්සේ ය.

මේ අතර තමා විසින් ඝාතනය කරන ලද කේශධාතු කාශ්‍යපගේ සහෝදරයා රුහුණේ බුත්තල ප්‍රදේශයේ ඇති කළ කැරැල්ලක් මැඩ පැවැත්වීම සඳහා සිය සේනාව සමග ගොස් මහානාග හුල (මානාවුළු නුවර) මධ්‍යස්ථානය කොට ගත් විජයබාහු රජු චෝළ විරෝධී සටනකට කටයුතු සංවිධානය කළේ ය.

තත්කාලින සමය වන විට බටහිර චාලුක්‍යයන් සමග ගෙනගිය බල අරගලයේ තීරණාත්මක අවස්ථාවකට මුහුණදුන් චෝළයන්ට ඒ සඳහා මුළු හමුදා ශක්තිය යෙදවීමට සිදු විය. අවස්ථාවෙන් ප්‍රයොජන ගැනීමට උපක්‍රමශිලිව කටයුතු කළ විජයබාහු රජතුමා ක්‍රමානුකූලව සැලසුම්කොට පොළොන්නරුව ආක්‍රමණය කිරීමට සූදානම් විය. ඔහුගේ යුධ සැලැස්ම වූයේ පොළොන්නරුවට දෙපැත්තකින් පහර දෙමින් ගමන් කර අවසානයේ එක්වීමය. ඒ අනුව එක් සේනාවක් දක්ඛිණ දේශය හරහා (බටහිර වෙරළ තීරයට) සමාන්තරව පිටත් කෙරිණි. එම සේනාව අනුරාධපුරය හා මහාතිත්ථ වරායන් යටත් කරගත්තේ ය. මේ නිසා චෝළයන්ට මහාතිත්ථයෙන් ආධාර ලබා ගැනීමට තිබූ අවස්ථාව ද, පසු බැසීමට තිබූ මග ද ඇහිරී ගියේ ය. නැගෙනහිර වෙරළ ඔස්සේ ගමන් කළ සේනාව විවිධ ස්ථාන අල්ලා ගනිමින් පොළොන්නරුව වටලා ගත්හ. අනතුරුව මහානාගහුල සිටි රජු කතරගම බුත්තල හරහා මහියංගණය තෙක් පැමිණ එහි ටික කලක් කඳවුරු බැඳ සිට පොළොන්නරුව සමීපයට පැමිණ කඳවුරු බැඳගත්තේ ය. මහ සටනකට සූදානම්ව සිටි චෝළයන් ද කඳවුරුවලින් පැමිණ විජයබාහු සමග සටන් වැදුණි. මාස 1 1/2 පැවති සටනින් විජයබාහු ජය ලැබීම නිසා සොළී හමුදාව රජුට යටත් විය. මේ අවසාන සටනේ දී රවිදේව හා චල රජුගේ පක්ෂයේ සිට සටන් කළ බව මහාවංසයේ සඳහන් වේ.

මෙසේ අඩසියවසකට අධික කාලයක් ලංකාවේ උතුර දිග තැනිතලාවේ ආධිපත්‍යය පිහිටුවා ගෙන සිටි චෝළයන්ගෙන් විජයබාහු රජු රට නිදහස් කරගත්තේ ය. ඉන් වසර 3 කට පසු අනුරාධපුරයේ දී අභිෂේක වූ රජු පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගත්තේ ය.




සිතියම 5.1

උපුටා ගැනීම: කුඩාවැල්ලේ කල්‍යාණවංශ ධීරානන්ද හිමි, ශ්‍රී ලංකාවේ ඓතිහාසික භූමි සිතුවම්.

### 5.2.4 විජයබාහු රජුගේ පරිපාලන කටයුතු

පළමුවන විජයබාහු රජතුමා 1070 සිට 1110 දක්වා වසර 40ක් පමණ ලංකාව පාලනය කළේ ය. මේ කාලයේ දී පොළොන්නරුව අගනුවර කොට ගනිමින් නැවත වරක් එක්සත් හා සාමකාමී ලංකාවක් ගොඩනැංවීය. මේ නිසා පොළොන්නරු යුගයේ මුල්ම පාලකයා විජයබාහු රජතුමා වේ. ඊට අමතරව එතුමාගෙන් සිදු වූ වැදගත් සේවාවන් කිහිපයකි. ඒ අතර පහත සඳහන් කරුණු වලට ප්‍රමුඛතාව හිමි වේ.

ඈපා, මාපා තනතුරු ඇති කොට සාම්ප්‍රදායික පරිපාලන රටාව නැවත පිහිටු වීම. ඒ අනුව ජ්‍යෝෂ්ඨ සොයුරු වීරබාහුට මහාදිපාද තනතුර පිරිනමා දක්ඛිණ දේශයේ පාලනය ද දෙවැන්නා වූ ජයබාහු කුමාරයා ආදිපාද පදවියට පත්කොට රුහුණේ පාලකයා ලෙස පත් කළේ ය. අවුල් වියවුල්ව තිබූ අය බදු ක්‍රමය ප්‍රතිසංවිධානය කළ එතුමා නීතිය ද යළි පිහිටු විය.

මේ කටයුතුවල නිරත වී සිටි මුල් යුගයේ දී ඡත්තගගාහකනාථ, ධම්මගේහනාථ සහ සෙට්ඨිනාථ යන රජයේ උගත් තනතුරු දරූ සහෝදරයන් තිදෙනෙකු ඉන්දියාවට ගොස් කලක් එහි වාසය කොට නැවත පැමිණ 1074 දී පමණ රුහුණේ හා දක්ඛිණ දේශයේ කැරැල්ලක් ඇති කළ ද රජුගේ හමුදා ඒවා මර්දනය කළහ.



5.4 රූපය-විජයබාහු රජු අනුරාධපුරයේ ඉදි කළ මාලිගාවේ නටබුන්

### 5.2.5 වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කොට ආර්ථික සමෘද්ධිය ඇති කිරීම

චෝළ ආක්‍රමණවල දී ඇති වූ විනාශයත් ප්‍රමාණවත් ලෙස නඩත්තු නොකිරීමත් නිසා මේ වන විට රටේ වාරි කර්මාන්ත රාශියක් නටබුන්ව පැවතුණි. විජයබාහු රජුට සිදු වුයේ ඒවා ප්‍රතිසංස්කරණය කොට ප්‍රයෝජනයට ගැනීම ය. ඔහු යටතේ ප්‍රතිසංස්කරණය වූ වැව් අතර කිහිපයක් ලෙස පඬුවස්නුවර වැව (පණ්ඩවාපී) නාච්චදූව වැව (පත්තපාසාණ) මහකනදරා වැව (කාණවාපි) ඉනාමළුව වැව යන වැව් දැක්විය හැකිය.

ඇළහැර ඇළ ප්‍රතිසංස්කරණය කොට මින්නේරිය, කවුඩුළු වැව හා කන්තලේ සම්බන්ධ කළ පැරණි වාරි ජාලයට පණ පෙවීය. ඌවේ ගිනිකොණ නටබුන්ව පිහිටි බුදුගුණ වැව මොහු දවස ඉදි වූ නව වාරිකාර්මාන්තයක් වශයෙන් සෙනරත් පරණවිතාන මහතා හඳුන්වා දී ඇත. රජුට වැඩි කාලයක් වැව් ප්‍රතිසංස්කරණය කිරීමට සිදු වීම නිසා විශාල ආර්ථික දියුණුවක් ඇති කිරීමට නොහැකි විය.

### 5.2.6 විජයබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය

අනාගතයේ එල්ල විය හැකි චෝළ ආක්‍රමණයක් වලක්වා ගැනීම හා අවට රටවල් සමග වෙළඳ සබඳතා ගොඩනගා ගැනීම රජුගේ විදේශීය ප්‍රතිපත්තියේ කැපි පෙනෙන ලක්ෂණ වේ. අනාගතයේ චෝළ ආක්‍රමණයක් වැලැක්වීමට එතුමා ඉන්දියාවේ චෝළයන්ට විරුද්ධ වෙනත් රාජ්‍ය සමග මූලික විවාහ සබඳතා ඇති කරගත්තේ ය. රජුගේ සහෝදරිය වූ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමාරයෙකුට විවාහ කර දී එම රාජ්‍ය සමග මිතුරු සබඳතා තහවුරු කර ගත්තේ ය. රජුගේ අගමෙහෙසිය වුයේ රුහුණේ ප්‍රාදේශීය අධිපතියෙකු වූ ජගතිපාල දියණියක් වූ ලීලාවති කුමරිය යි. දෙවන බිසව වුයේ කාලිංග දේශයෙන් ගෙන්වාගත් තිලෝකසුන්දරී කුමරිය යි.

තවද එම රජතුමා විවිධ රාජ්‍ය සමග තානාපති සබඳතා පැවැත්වීය. ඉන් එක් රාජ්‍යයක් වූයේ බටහිර චාලුක්‍ය හෙවත් කර්ණාටක රාජ්‍යය යි. කර්ණාටක රාජ්‍යයෙන් පැමිණි දූතයන්ට රජු තෑගි බෝග පිරිනමා ඒ සමග සිංහල දූත පිරිසක් ද ආපසු යවන ලදහ. කුලෝත්තුංග නැමැති චෝළ රජුගේ මෙහෙය වීමෙන් එසේ චෝළ රාජ්‍යය හරහා ගමන් ගත් මෙම සිංහල දූතයන්ගේ කන්, නාස කපා දමා වධ හිංසා පමුණුවන ලද හෙයින් චෝළයන්ට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීමට විජයබාහු රජතුමාට සිදු විය. මේ අවස්ථාවේ මෙරට සිටි රජුගේ වේලෛක්කාර හමුදා කැරළි ඇති කොට, පොළොන්නරුවේ රජ මාලිගාව පවා ගිනි තැබූ නමුත් රජු වාකිරිගලට පැන ගොස් නැවත කැරැල්ල මර්ධනය කර ගිවිසුමක් ඇති කර ගෙන ඇත. පොළොන්නරුවේ වේල්ලක්කාර සන්නසෙහි ඇති මේ ගිවිසුම අනුව දළඳා මැදුර ආරක්ෂා කිරීමේ භාරදූර කාර්යය වේලක්කාර හමුදාවට පවරා දෙන ලදී.

බුරුමය, විජයබාහු රජතුමා ප්‍රධාන වශයෙන් වෙළඳ සහ සංස්කෘතික සබඳතා පැවැත්වූ රටකි. බුරුමයේ (පහළ බුරුමය) රජු රුහුණේ චෝළ විරෝධී සටන් සංවිධානය කළ අවදියේ දී පටන් ම ඒ සබඳතා ගොඩනැගී තිබුණු බව මහාවංසයේ සඳහන් වේ. චෝළ ආක්‍රමණ සමයේ දී ත්‍රිපිටක පොත් ද රැගෙන විදේශගත වූ ලංකාවේ මහතෙරවරුන් කොටසක් රාමඤ්ඤ දේශයේ රජුගේ පිළිසරණ ලැබූහ. විජයබාහු රජු සමයේ මෙරට නැවත උපසම්පදා කර්මය සිදු කිරීම සඳහා රාමඤ්ඤ දේශයෙන් ගෙන් වූ භික්ෂූන් වහන්සේ මෙම මහතෙරවරුන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට අයත්වන බව සෙනරත් පරණවිතාන මහතා පෙන්වා දී ඇත.

### 5.2.7 විජයබාහු රජුගේ ආගමික කටයුතු

- ❖ බුරුම රටින් භික්ෂූන් වැඩමවා උපසම්පදාව යළි පිහිටුවීම
- ❖ පොළොන්නරුවේ තෙමහල් දළදා මන්දිරයක් ගොඩනැගීම
- ❖ ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය ප්‍රතිසංස්කරණය කරවා එම ස්ථානයට ගම්බිම් පිදීම
- ❖ දළඳා පූජාව පැවැත්වීම අනුරාධපුරයේ සහ රුහුණේ වෙහෙර හා විහාර ප්‍රතිසංස්කරණය කිරීම

අනුරාධපුර අවසාන සමයේ හටගත් අභ්‍යන්තර දේශපාලන අරගල හා විදේශීය ආක්‍රමණ හේතුවෙන් බුද්ධ ශාසනය පරිහානියට පත් ව තිබිණි. විජයබාහු රජතුමාගේ සමයේ දී උපසම්පදා කර්මයට අවශ්‍ය ගණපූරක භික්ෂූන් සංඛ්‍යාවක් නොවූයෙන් රාමඤ්ඤ දේශයෙන් උපසම්පන්න භික්ෂූන් වහන්සේ මෙරටට වැඩම කරවා ගෙන පොළොන්නරුවේ දහස්තොට දී උපසම්පදා කර්මය නැවත පිහිටුවීමට සිදු විය.

- ❖ තුන්නිකායික භික්ෂූන් වහන්සේලා උදෙසා ද අෂ්ටායතන ඉදි කිරීම
- ❖ උතුරේ ජම්බුකෝල විහාරය, දඹුල්ල ලෙන් විහාරය, මැදිරිගිරිය විහාර, අනුරාධපුර ශ්‍රී මහා බෝධිය වැනි ජරාවාසව පැවති වෙහෙර විහාර රැසක් ප්‍රතිසංස්කරණය කරවීම.
- ❖ රුහුණේ තම දෙමාපියන් ආදාහනය කර වූ සංඝාරාම පහක් ගොඩනැංවීම.
- ❖ ශ්‍රී පාදස්ථානයට යාම සඳහා තිබූ පැරණි මාර්ග තුනම අලුත්වැඩියා කිරීම, විශ්‍රාමශාලා හා දන්සැල් ද ඉදි කරවීම.
- ❖ නගරයේ තිබූ හින්දු ආගමික ගොඩනැගිලි ආරක්ෂා කොට අගනුවර අසල සිටි හින්දු බැතිමතුනට ද අනුග්‍රහය දැක්වීම.

මහා විජයබාහු රජතුමා යනු ළමා කාලයේ සිට ම අභියෝග රැසක් ජය ගනිමින් රටට විශාල සේවයක් කළ ආදර්ශවත් රජ කෙනෙකි. කුඩා කාලයේ දී තමා සොයා පැමිණි සතුරන්ගෙන් මිදී වනගතව කටුක ආහාරවලින් යැපෙමින් ඔහු ළමා කාලය ගත කළ

ආකාරය පනාකඩුව තඹ සන්නසෙහි සඳහන් කොට තිබේ. රජකමට පත් වීමෙන් පසුව ද කුඩා කාලයේ තමා දුක් විඳි ආකාරය ස්වකීය වචනයෙන් ම කියා තිබීම එතුමාගේ අවංකකම කියා පාන්නකි. කුඩා කාලයේ තමාට උදව් කළ බුද්ධරාජට රජවූ පසු වරප්‍රසාද ලබා දීමෙන් එතුමා තුළ තිබූ කෘතගුණ සැලකීමේ ගුණය පැහැදිලි වේ. චෝළයන් සමඟ සටන් කිරීමේ දී යම් යම් අවස්ථාවල පරාජය ලැබීමට මෙතුමාට සිදු විය. එහෙත් ඒ පරාජයන් හමුවේ නොසැලී රජු නැවතත් ස්වකීය දුර්වලතා හඳුනාගෙන සටන් කළේ ය. රජු තුළ පැවති නොපසුබස්නා උත්සාහය නැමති ගුණය වර්තමාන සමාජයට වුව ද හොඳ ආදර්ශයකි. මව්බිම රැක ගැනීම ගැන එතුමා තුළ ලොකු හැඟීමක් තිබුණු බව පෙනේ. බලයට පත් වීමෙන් පසුව ද විදේශ ආක්‍රමණ වළක්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේය.

## ක්‍රියාකාරකම්

1. පළමුවන විජයබාහු රජතුමාගේ චරිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ මැයෙන් රචනාවක් ලියන්න.
2. විජයබාහු රජු පිළිබඳ පාඩම ඇසුරින් පහත සඳහන් ජර්නලය සම්පූර්ණ කරන්න.

| මුහුණ දුන් අභියෝග | එම අභියෝග ජය ගත් ආකාරය |
|---|---|
| 1. ළමා කාලයේ පැවති දුෂ්කරතා | |
| 2. රුහුණේ බලය ලබා ගැනීම | |
| 3.පොළොන්නරු නගරය නව නගරයක් ලෙස ගොඩ නැගීම | |

## 5.3 පළමු විජයබාහු රජුගේ මරණයත් සමග මතු වූ දේශපාලන ව්‍යාකූලතාවය

පළමුවන විජයබාහු රජතුමා ගොඩනැගූ දේශපාලන එක්සත්කම එතුමාගේ මරණින් පසුව බිඳ වැටුණි. ඊට හේතුව එතුමාගේ අභාවයෙන් පසුව මෙරට සිටි කාලිංග වංශයට හිතවත් පිරිස හා පාණ්ඩ්‍ය වංශිකයන්ට හිතවත් අය අතර රාජ්‍ය උරුමය පිළිබඳ ගැටුමක් ඇතිවීම ය.

මේ අතර මාණාභරණ පුංඛගාමය (දැදිගම) මධ්‍යස්ථානය කොටගෙන දක්ඛිණ දේශය ද කිත්සිරිමෙවන් මහානාගහුල මුල් කරගෙන දොළොස්දහස් රට ද සිරි වල්ලභ උඳුන්දොර මධ්‍යස්ථානය කොටගෙන අටදහස් රට ද පාලනය කළේ ය.

මේ පසුබිම යටතේ දිවයිනේ දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික සියලු අංශ පරිහානිය කරා ගමන් කළේය.

### 5.3.1 මහා පරාක්‍රමබාහු රජතුමාගේ නැගීම (1153 - 1186)

මහා පරාක්‍රමබාහු රජතුමා යනු බෙදී තිබුණු ලංකාව එක්සේසත් කරමින් රටේ දියුණුවට සුවිශාල මෙහෙවරක් ඉටු කිරීමට සමත් වූ රජ කෙනෙකි.

### පරාක්‍රමබාහු කුමරුගේ ළමා කාලය



5.5 රූපය-ඇත් පහන

පරාක්‍රමබාහු මානාභරණගේ සහ රත්නාවලී කුමරියගේ පුත් කුමාරයා විය. ඔහුගේ උපන්ගම ලෙස මහාවංසයෙහි සඳහන් කර තිබෙනුයේ දක්ඛිණ දේශයේ පුංඛගාමය වේ. වර්තමාන කෑගලු දිස්ත්‍රික්කයේ දැදිගම වශයෙන් එම ස්ථානය හඳුනාගෙන තිබේ. දැදිගම කොටවෙහෙර කැනීමේ දී පරාක්‍රමබාහු කුමාරයා උපන් තැන ගොඩනගන ලදැයි සැලකෙන සූතිඝර නම් කුඩා චෛත්‍යය හමු වී තිබේ. එම ස්තූපයේ තිබී හමු වී දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ඇත් පහන සුවිශේෂ වූ ලෝකඩ කලා නිපැයුමකි.

පරාක්‍රමබාහුගේ කුඩා අවධියේ ම පියා මරණයට පත් විය. අනතුරුව ඔහු සිය වැඩිමහල් සහෝදරියන් වූ මිත්තා, ප්‍රභාවතී හා භද්දවතී යන තිදෙනාත් මෑණියනුත් සමග අටදහස් රට වාසය කළ සිරිවල්ලභ කණිටු සුළු පියාණන් සමීපයේ ටික කාලයක් වාසය කළ බව මහාවංසයෙහි සඳහන් කොට ඇත.

වැඩි කලක් යාමට මත්තෙන් දක්ඛිණ දේශයේ විසූ දෙවු සුළුපියා වූ කිත්සිරිමේඝ වෙතට ගියේ ය. පරාක්‍රමබාහු කුමාරයා තමාගෙන් පසු දක්ඛිණ දේශයට උරුමකම් ඇති කුමාරයා හැටියට පුත්‍ර ස්ථානයෙහිලා කිත්සිරිමෙවන් විසින් ඇති දැඩි කළ බව මහාවංසයේ විස්තර වේ.

මේ වන විට දෙවන ගජබාහු පොළොන්නරුවේ රජ වී සිටියේ ය. ලංකාව එක්සේසත් කිරීමේ අරමුණ ඇතිව සිටි පරාක්‍රමබාහු කුමාරයා රජරට ආරක්ෂා සංවිධානය පිළිබඳ තොරතුරු සොයා බලනු සඳහා සිය අනුගාමිකයන් සමඟ රහසිගතව රජරට ප්‍රදේශයට පැමිණි බව දැක්වේ. රජරට සීමාවට ඇතුළු වූ පරාක්‍රමබාහු ගජබාහු රජුගේ ආරාධනාවෙන් එතුමාගේ ආගන්තුකයෙකු ලෙස කලක් පොළොන්නරුවේ වාසය කළේ ය. එම කාලය තුළ දී රජරට දේශපාලන, ආර්ථික හා සංග්‍රාමික තොරතුරු සොයා බලා වාර්තා කරනු පිණිස වෙස්වලාගත් චරපුරුෂයන් විවිධ ප්‍රදේශවලට යැවූ බව කියැවේ. අනතුරුව සිය මෑණියන්ට පණිවුඩ යවා භද්දවතී නමැති සිය බාල නැගණියන් ගෙන්වා ගජබාහු රජුට සරණපාවා දී රජුගේ විශ්වාසය දිනා ගැනීමට ද වෑයම් කළේ ය. එහෙත් වැඩි කාලයක් යාමට මත්තෙන් තමාගේ ක්‍රියා කලාපය පිළිබඳ ගජබාහු රජු සැක කරන බව දැනගත් පරාක්‍රමබාහු රහසිගතවම දක්ඛිණ දේශයට නැවත පැමිණ ඇත. ඉන් දින කිහිපයකට පසු කිත්සිරිමේඝ රජු අභාවප්‍රාප්ත වූයෙන් පරාක්‍රමබාහු කුමාරයා දක්ඛිණ දේශයේ පාලකයා බවට පත් විය.

### 5.3.2 මහා පරාක්‍රමබාහු දක්ඛිණ දේශයේ පාලනය ගෙන යාම

දිවයින එක්සේසත් කිරීම පිළිබඳව පරාක්‍රමබාහු කුමරා ගෙන ගිය ක්‍රියා මාර්ගයට පදනම සකස් වූයේ ඔහු දක්ඛිණ දේශයේ පාලකයා ලෙස කටයුතු කරමින් සිටිය දී ය. වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල පඩුවස් නුවර පරාක්‍රමපුරය ලෙස නම් කොට ඔහු අගනුවර කර ගත්තේ ය. ආරක්ෂක පවුරු පදනම් හා අලංකාර මාලිගාවකින් එය ගොඩනගා තිබූ බව එහි ඇති නටබුන් මගින් හඳුනාගෙන තිබේ. දිවයින එක්සේසත් කරනු සඳහා අනාගතයේ දී කළ යුතුව තිබූ ආයුධ සන්නද්ධ යුද්ධයකට සූදානම් වීම දක්ඛිණ දේශය ධන ධාන්‍ය සම්පත්වලින් ආඪ්‍ය කිරීම අත්‍යාවශ්‍යයෙන් කළ යුතු කාර්යයක් ලෙස පරාක්‍රමබාහු කුමරා සලකා ඇති බව පෙනේ. මේ අරමුණ ඇති ව දක්ඛිණ දේශයේ කෘෂි කර්මයට ජලය සපයනු සඳහා දැදුරු ඔය (ජජ්ජර නදිය) තුන් පොළකින් හරස් කර අමුණු බැඳ ඇළ මාර්ගවලින් ගංගා නිම්නය අවට පහත් බිම් ප්‍රදේශයට ජලය සැපයීමේ ව්‍යාපාරයක් ඇරඹීය. කොට්ඨබද්ද, සූකරනිජ්ජර සහ දෝරදත්තික යන මේ තුන්පොළ හරස්වන සේ අමුණු බැඳ රැස් වූ ජලය රිදී බැඳි ඇල මගින් පහත් තැනිතලාවලට ගෙ ගියේ ය. අගනුවර තිබූ පණ්ඩාවැව විශාල කොට බැණ සමුද්‍රය ලෙස නම් කරනු ලැබීය. දක්ඛිණ දේශයේ ප්‍රතිසංස්කරණය හා විශාල කරන ලද වැව් සංඛ්‍යාව 58ක් ලෙස දක්වන වංසකථාව ඉන් 37ක් නම් ද සඳහන් කොට තිබේ. මීට අතිරේකව පංචයෝජන රටේ හෙවත් පස්යොදුන් කෝරළේ වගුරු බිම් කෘෂිකර්මයට සුදුසු වන සේ සංවර්ධනය කොට සරුසාර ගොඩබිමක් බවට පත් කිරීම වැදගත් වේ.

දක්ඛිණ දේශයේ ආර්ථිකය ශක්තිමත් කිරීමෙන් පසු දිවයින එක්සත් කිරීම සඳහා හමුදා සංවිධානයෙහි නියුක්ත විය. එකී හමුදාව දේශීය මෙන් ම කේරළ ඇතුළු විදේශීය

සෙබළුන්ගෙන් ද සමන්විත වූ බව කියැවේ. ඔවුන්ට ක්‍රමානුකූල අවි පුහුණුව හා යුද්ධ පුහුණුවක් ලබා දී ඔවුන් මෙහෙයවනු සඳහා සේනාපතිවරු ද පත් කරන ලදහ. සුවිශාල යුද්ධ හමුදාවක් සංවිධානය වූ පසු පරාක්‍රමබාහු කුමරු රජරට ජය ගැනීමට හමුදා මෙහෙය විය.

**ක්‍රියාකාරකම**

පරාක්‍රමබාහු රජතුමා දක්ඛිණ දේශයේ සංවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග මොනවාද?

### 5.3.3 රජරට යටත් කිරීම හා ලක්දිව එක්සේසත් කිරීම

පරාක්‍රමබාහු රජරට යටත් කිරීමේ දී මුලින් ම අවධානය යොමු කළේ ඉහළ මලය ප්‍රදේශයට ය.

- » ගජබාහුගේ අනුගාමිකයන් එය අභයස්ථානයක් කර ගැනීමෙන් වලකාලීම ඊට ප්‍රධාන හේතු විය
- » දෙවැන්න තම හමුදාවට රජරටට ගමන් කිරීම පහසු වීමයි.

ඉහළ මලය ප්‍රදේශය භාරව සිටි රක්ඛ දණ්ඩනායක ගජබාහුගේ ප්‍රධාන අනුගාමිකයෙකි. උපක්‍රමික පරාක්‍රමබාහු ඔහු තමා පැත්තට හරවා ගත්තේ ය. අනතුරුව ගජබාහුගේ තවත් අනුගාමිකයෙකු වූ සමනමල්ලක නිලධාරියා ද සිය අනුගාමිකයෙකු බවට පත් කර ගෙන ඇත. මොවුන් දෙදෙනා ලබා දුන් සහයෝග ඉහළ මලය සම්පූර්ණයෙන් ම අල්ලා ගැනීමට ඉතා වැදගත් වී යැයි මහාවංසයේ සඳහන් වේ.

පරාක්‍රමබාහු මීළඟට රජරට අල්ලා ගැනීමට හමුදා මෙහෙය වීය. එම මෙහෙයුමේ දී පරාක්‍රමබාහු කුමරු ගජබාහු සතුව තිබූ වයඹ දිග මුහුදුබඩ ප්‍රදේශයේ බලය ද තහවුරු කරගත්තේ ය. නගරගිරි මහින්ද නම් සේනාපතියා රජරට අභ්‍යන්තරයේ පිහිටි ගජබාහු රජුගේ මාලවල්ලිය බලකොටුව ද අල්ලා ගත්තේ ය.

මේ අතර මොරවාපි (මොරවැව) ප්‍රදේශයේ කඳවුරු බැඳගත් පරාක්‍රමබාහු කලාවැව ප්‍රදේශය ද අල්ලා ගත්තේ ය.

ඉක්බිති නාලන්දා මූලස්ථානය කොට ගෙන පොළොන්නරුව දෙසට සේනා මෙහෙයවා ඇළහැර ප්‍රදේශය අල්ලා ගත්තේ ය. මේ වන විට එකල රුහුණු රට පාලනය

කරමින් සිටි දෙවන මානාභරණ සහ ගජබාහු රජු අතර මිත්‍ර ගිවිසුමක් පැවතිණ. ඒ අනුව පරාක්‍රමබාහු කුමරු සමග ඇති වූ සටන් කීපයක දීම දෙවන මානාභරණ රජුගේ සහාය ගජබාහු රජුට ලැබිණ. මේ අතර පරාක්‍රමබාහු කුමරු දෙවන මානාභරණ රජු උපායෙන් තමාට පක්ෂ කර ගැනීම නිසා ගජබාහු රජු අසීරුවට පත් විය. පරාක්‍රමබාහු කුමරුගේ සේනා බටහිර දෙසින් පොළොන්නරුවට ළංවූ අතර මහියංගණය අසල සොරබොර කඳවුරු බැඳගෙන සිටි දෙවන මානාභරණ දකුණු දෙසින් පොළොන්නරුවට සේනා මෙහෙය වීය. දෙපැත්තකින් සේනා මෙහෙයවන ලදුව ගජබාහු රජු ඔහුගේ මාලිගයේ ම සිරභාරයට පත් විය.

මේ අතර පරාක්‍රමබාහු නොහික්මුණු සේනා මෙල්ල කිරීම සඳහා දේව සෙනෙවියා පොළොන්නරුවට යැවීය. උදාවී පැවති අවස්ථාවෙන් ප්‍රයෝජනගත් මානාභරණ ගජබාහු රජුට හා එහි වැසියන්ට උදව් කරන මුවාවෙන් පොළොන්නරුව ආක්‍රමණය කොට දේව සෙනෙවියා ද අල්ලා ගත්තේ ය.

මුල දී ගජබාහු රජුට ඉතා ගෞරවයෙන් සංග්‍රහ කළ මානාභරණ උපායශීලීව ගජබාහු සිරකොට ධනය ද පැහැර ගෙන පොළොන්නරුවේ අභිෂේක කිරීමේ අපේක්ෂාවෙන් ඒ වන විට රුහුණේ රැකවරණයේ පැවති දන්ත ධාතුන් හා පාත්‍ර ධාතුව ද පොළොන්නරුවට ගෙන්වා ගත්තේ ය. මේ අතර ගජබාහු රජු තමා ගලවාගන්නා ලෙස ඉල්ලා පරාක්‍රමබාහු කුමරු වෙත රහසින් හසුන්පත් යැවීය. පරාක්‍රමබාහු කුමරු වහාම පොළොන්නරුවට හමුදාව මෙහෙයවා රජු නගරය තුළට කොටු කරලීමට සමත් විය. මානාභරණ තමා රුහුණෙන් ගෙන්වා ගත් සියලු ම වස්තූන් ද රැගෙන රුහුණට පලා ගියේ ය.

නගරයට කඩා වැදුණු පරාක්‍රමබාහු සේනා විසින් මුදවා ගනු ලැබූ ගජබාහු රජ කොඩ්ඩියාරමට (කොට්ඨසාර) පැන ගියේ ය. අනතුරුව නැවත වරක් පරාක්‍රමබාහු ගජබාහු රජු සමග සටනක් කිරීමට සිදු වූ බව මහාවංසයෙහි දැක්වේ. එහෙත් එම සටනින් ගජබාහු පරාජයට පත් විය. මේ අවස්ථාවේ තුන් නිකායේ මහතෙරවරු (මහාවිහාර ජේතවන, අභයගිරි) ඉදිරිපත් ව දෙදෙනා අතර ගිවිසුමක් මගින් සමගි සන්ධානයක් ඇති කළහ. එම සාම ගිවිසුමේ ප්‍රධාන කොන්දේසිය වූයේ තමන් දෙසුහුරුබඩුනුවන් නිසා එකිනෙකාට සතුරු නොවීම, එක් අයෙකුගේ සතුරා දෙදෙනාගේ ම සතුරෙකු ලෙස සැලකීම, පළමුව මිය යන තැනැත්තාගේ රාජ්‍ය අනික් තැනැත්තාට හිමි වීම යන මේවා ය. මෙකී ගිවිසුම මණ්ඩලගිරි විහාරයේ (මැදිරිගිරිය විහාරයේ) ගලක කෙට වූ බව මහාවංසයහි දක්වා ඇතත් එය මෙතෙක් තහවුරු වී නැත එහි පිටපතක් කුරුණෑගල සංගමු විහාරයේ තිබී සොයාගෙන තිබේ.

ඉහත කී ගිවිසුමට එළඹි සමයේ ගජබාහු මහලුවියේ සිටි බැවින් ඇති කර ගත් කොන්දේසි තරුණ වියේ සිටි පරාක්‍රමබාහු කුමරුට වාසි සහගත වූ බව පෙනේ.

නොබෝ කලකින් ගජබාහු රජු මරණයට පත් විය. රජුගේ ඇමතිවරු ඉහත කී ගිවිසුම නොතකා රජරටට පැමිණ රජකම භාර ගන්නා ලෙස දෙවන මානාභරණගෙන් ඉල්ලා සිටි හෙයින් රුහුණේ සිට සේනා සමග පැමිණි මානාභරණ කොටුසර ප්‍රදේශයේ කඳවුරු බැඳගත්තේ ය. එහෙත් ඒ වන විට රජරට බලය තහවුරු කරගෙන සිටි පරාක්‍රමබාහු කුමරුගේ සේනා ස්ථාන කීපයක දී කළ සටන්වලින් පසු අවසානයේ ජයගත්හ. මෙසේ රජරට ජයග්‍රහණය ස්ථිර කරගත් පරාක්‍රමබාහු 1153 දී මුළු දිවයිනේ ම රජු වශයෙන් අභිෂේක ලැබීය.

**ක්‍රියාකාරකම**

පරාක්‍රමබාහු රජතුමා දක්ඛිණ දේශයේ සංවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග මොනවාද?

### 5.3.4 පරාක්‍රමබාහු රජතුමා රුහුණේ කැරලි මැඩලීම

අභිෂේක ලැබූ පරාක්‍රමබාහු රජතුමාට රාජ්‍ය උරුමය තහවුරු කෙරෙන අනිවාර්ය සාම්ප්‍රදායික අංග වූ දන්ත ධාතුන් හා පාත්‍රා ධාතුන් වහන්සේ තමන්ගේ භාර කාරත්වයට ගෙන රජකම පිළිබඳ අයිතිය සම්පූර්ණ කර ගැනීමේ අවශ්‍යතාව පැන නැගී තිබිණ. ඒ වන විට දෙවන මානාභරණ විසින් පොළොන්නරුවෙන් ගෙන යන ලද එම පූජ්‍ය වස්තු දෙක පැවතියේ ඔහුගේ මෑණියන් වූ සුගල බිසව සතුව ය. සුගලා බිසව වටා රොක් වූ බොහෝ පිරිස් රජුට එරෙහිව කැරලි ගැසුව ද රක්ඛ සේනාපතියා යටතේ බල සම්පන්න සේනාවක් රුහුණු රටට යවා ඒ කැරලි මර්දනය කිරීමට රජුට හැකි විය.

පරාක්‍රමබාහු රජු සුගලා ඇති කළ කැරලි මැඩලීම සඳහා රක්ඛ සෙනෙවියාගේ සහායට සංග්‍රාමෝපායෙහි අති දක්ෂයකු වූ භූත අධිකාරි ද යවනු ලැබීය. මෙම දෙදෙනා සේනා මෙහෙයවමින් බිබිලේ මැදගම ඇති වූ සටන්වලින් පසුව උදුන්දොරට පැමිණියහ.

එහි සිටි සුගලා දේවිය ධාතුන් වහන්සේලා රැගෙන උරුවේලාවට (ඇතිමලේට) පැනගියාය. සුගලා දේවිය පූජ්‍ය වස්තු රැගෙන විදේශීය රටකට පැනයාමට සූදානමක් ඇති බව දැනගත් පරාක්‍රමබාහු රජු උරුවේලාව වටකොට එම වස්තු ලබා ගත්තේය. සුගලා දේවිය බේරී පලා යාමට සමත් වූවාය.

මේ අතර පොළොන්නරුවේ සිරකර සිටි දෙවන මානාභරණ රජුගේ සෙනෙවියෙකු වූ සූකරභාතුදේව සිර මැදිරියෙන් මිදී රුහුණට පලා ගොස් කැරැල්ලට නායකත්වය දුන්නේ ය.

ඒ අනුව රුහුණු රට කැරැල්ල නැවත පණගැන්වුණු අතර පරාක්‍රමබාහුගේ සේනාව මහාගාම වැනි ස්ථානවල දී දරුණු ප්‍රහාරවලට ලක් වූ බව මහාවංසයෙහි දැක්වේ. කෙසේ වෙතත් පරාක්‍රමබාහුගේ සේනාව දිගාමඩුල්ල මහානාගහුල ආදී ස්ථානවල දී කැරලි කරුවන් සමග සටන් කොට ඔවුන් පරාජය කර සුගලා ජීවග්‍රහයෙන් ගත්හ. සුබරහාතුදේව ද මරා දමණු ලැබීය. මින් පසුව ද යලිත් රුහුණේ කැරලි ඇති වුව ද ඒවා පහසුවෙන් මර්දනය කිරීමට රජුට හැකි විය. මෙම කැරැල්ලේ දී රුහුණේ බොහෝ ප්‍රදේශ නායකයන් දරුණු දඬුවම්වලට ගොදුරු වූහ.

### 5.3.5 පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තිය

(පළමුවන පරාක්‍රමබාහු රජතුමා) බුරුමය හා දකුණු ඉන්දියාව සමඟ කටයුතු කළ ආකාරය මෙහිදී ඔබ අධ්‍යයනය කළ යුතුය.

#### බුරුමය රාමඤ්ඤ දේශය ජය ගැනීම

ලංකා-බුරුම වෙළඳ හා ආගමික සම්බන්ධතා පළමුවන විජයබාහු රජතුමාගේ කාලයේ සිට ම පැවතිණ. එහෙත් පරාක්‍රමබාහු රජුගේ කාලයේ සිට බුරුම පාලකයා වූ අලංසිතු හෙවත් භුවනාදිත්‍ය රජු ලංකාවට විරුද්ධ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා එම සම්බන්ධතා මෙකල පලුදු විය. එයට බලපෑ හේතු කිහිපයක් වේ.

- ❖ රාමඤ්ඤ දේශය ලංකාවට ආනයනය කරන ලද ඇත් වෙළඳාමට අවහිර කරමින් එය බුවනාදිත්‍ය රජුගේ ඒකාධිකාරයක් කිරීම
- ❖ බුරුම ඇතුන් සඳහා ඉහල මිලක් නියම කිරීම. රාමඤ්ඤ රජු වෙත ගෙන යන තෑගි භෝග සඳහා නැවකට ඇතෙකු බැගින් තෑගි දීමේ පුරාණ චාරිත්‍රය කඩ කිරීම
- ❖ ලංකාවෙන් බුරුමයට ගිය දූත පිරිසකට බොරු චෝදනා නගා ඔවුන් සතු ධනය උදුරාගෙන ඔවුන් සිර කොට ලංකාවෙන් බුරුමයට නැව් පැමිණීම තහනම් කොට එම පිරිස හිල් වූ නැවකට නංවා පිටත් කර හැරීම
- ❖ ලංකාවෙන් බුරුමයට ගියදූත පිරිසට නිගරු ලෙස සැලකීම
- ❖ දූතයන් සිරකොට අමානුෂික වදහිංසා පැමිණවීම
- ❖ ලංකාවේ රජු විසින් රාමඤ්ඤ දේශය හරහා කාම්බෝජයට යවන ලද රාජ කන්‍යාවක් සහිත දූත පිරිසක් රාමඤ්ඤ දේශ සීමාවේ දී සිරභාරයට ගැනීම.

මෙම සිදුවීම් වලින් අසතුටට පත් පරාක්‍රමබාහු රජතුමා 1164 දී බුරුමය ආක්‍රමණය කළේ ය. ඒ සඳහා නගරගිරි කිත්ති (කිත්නුවරගල්) සහ දෙමළාධිකාරී ආදිත්‍ය යන සෙන්පතීන් යටතේ නාවික හමුදාවක් යැවී ය. එම හමුදාව ත්‍රිකුණාමලයට උතුරින් පිහිටි පල්ලවංක තොටින් ගමන් ආරම්භ කළ බව මහාවංසයෙහි සඳහන් වේ. එකී සේනාව රාමඤ්ඤ

දේශයේ කුසුමියතොට හා අනතුරුව පප්ඵලම් තොටට ද ගොඩබෑස බිහිසුණු යුද්ධයකින් අනතුරුව උක්කමපුරය අල්ලා ගත්හ. ඒ අවස්ථාවේ දෙරට භික්ෂු සංඝයා වහන්සේගේ මැදිහත් වීමෙන් යුද්ධය සමථයකට පත් වූ බවත් පෙර කාලයේ දී සිංහල දූතයන්ට හා වෙළඳුන්ට රාමඤ්ඤ දේශයේ හිමි වී තිබූ වරප්‍රසාද හා පහසුකම් යළි හිමි වූ බවත් සඳහන් වේ. රාමඤ්ඤ දේශය සාර්ථක ලෙස ජය ගැනීමට සැලකීමක් ලෙස කිත්නුවරගල් සෙනෙවියාට ගම්වරයක් ප්‍රදානය කළ බව පරාක්‍රමබාහු රජතුමාගේ දොළොස්වන රාජ වර්ෂයේ (1165 පිහිටුවන ලද කෑගලු දිස්ත්‍රික්කයේ දෙවනගල සෙල්ලිපියේ සඳහන් වේ.

**පාණ්ඩ්‍ය දේශය ජය ගැනීම**

ඉන්දියාවේ පාණ්ඩ්‍ය රාජ්‍යයේ රජකම සම්බන්ධව ඇති වූ අරගලයකට පරාක්‍රමබාහු රජු මැදිහත් වූයේ ය. රජුගේ දහසය වන රාජ්‍ය වර්ෂය තරමේ දී සිදු වූ ආක්‍රමණයක් ලෙස මෙය සලකා ඇත. එකල මධුරාපුරයේ පාලකයා වූයේ පරාක්‍රම පාණ්ඩ්‍ය නමැති කුමරෙකි. පාණ්ඩ්‍ය සිහසුනට උරුමකම් කී කුලශේඛර නමැති කුමරෙක් චෝළ රජුගේ ද උදව් ඇතිව මධුරාපුරය ආක්‍රමණය කළේ ය. එම අවස්ථාවේ පරාක්‍රම පාණ්ඩ්‍ය කුමාරයා ලක්දිව රජුගෙන් යුද්ධාදාර ඉල්ලා දූතයන් එවීය. දිගු කලක සිට පාණ්ඩ්‍ය දේශය හා ලංකාව අතර පැවැති සබඳතා සිහිපත් කළ පරාක්‍රමබාහු රජතුමා යුද්ධාධාර යැවීම සඳහා ලංකාපුර ජගත් විජය යන සෙනෙවියන් දෙදෙනා යටතේ සේනාවක් මාතොටින් (මහාතිත්ථ) යැවීමට සූදානම් කළේ ය. ඒ අතර කුලශේඛර පාණ්ඩ්‍ය මධුරාපුරය ආක්‍රමණය කොට පරාක්‍රම පාණ්ඩ්‍ය කුමරු මරා දැමූ බව ආරංචි වූ හෙයින් ආක්‍රමණයක් කොට කුලශේඛර රජු නෙරපා පරාක්‍රම පාණ්ඩ්‍ය කුමරුගේ පරපුරෙන් පැවතෙන්නෙකු සිහසුනට පත් කරන ලෙස තම සේනාවට නියෝග කොට එහි පිටත් කර හැරි බව මහාවංසයෙහි සඳහන් වේ.

පාණ්ඩ්‍ය දේශයට ගිය සිංහල සේනා ජයග්‍රහණය කළෝය. සටන්වල දී අල්ලාගත් සිරකරුවන් ලංකාවට ගෙන්වාගත් පරාක්‍රමබාහු චෝළයන් විසින් විනාශ කර තිබූ රුවන්වැලිසෑ ප්‍රතිසංස්කරණයට ඔවුන් යෙදවූ බව මහාවංසයෙහි දැක් වේ.

පාණ්ඩ්‍ය කුමරු ලංකාවේ රජුගේ නියෝජිතයා ලෙස පාණ්ඩ්‍ය සිංහාසනයේ තැබූහ.

මුල දී මෙසේ සිංහල සේනා පාණ්ඩ්‍ය සටන්වලින් ජය ලැබුව ද ලංකාපුර හා ජගත් විජය කුලශේඛර රජුට ආධාරයට පැමිණි චෝළ හමුදා අතින් මරණයට පත් වූ බවත් ඒ දෙදෙනාගේ හිස් මධුරාපුර දොරටුවට තබා ඇණ ගැසූ බවත් ආර්පාක්කම්, ආදී දකුණු ඉන්දීය සෙල්ලිපිවලින් අනාවරණය වේ.

### 5.3.6 පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ ආගමික කටයුතු

මහා පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරුවේ රජ වූ කාලය වන විට මහාවිහාර, අභයගිරි, ජේතවනය යන ත්‍රෛනිකායික භික්ෂූහු විනයෙන් ද පිරිහී සිටියහ. එබැවින් ශාසන ශෝධනයක් කොට තුන් නිකාය එක් නිකායක් කිරීම සඳහා කටයුතු කරන ලදී. එහිදී ප්‍රධානත්වය ගන්නා ලද භික්ෂූන් වහන්සේ වූයේ කාශ්‍යප මහතෙරුන් ය.

මෙම ශාසනික කටයුත්ත පොළොන්නරු කතිකාවතේ සඳහන්වන අතර එය ගල්විහාරයේ පර්වත බිත්තියේ කොටා ඇත. එය ගල්විහාර ලිපිය නමින් ද හැඳින්වේ.



**5.6 රූපය-මහා පරාක්‍රමබාහු රජ මාලිගාව**

දිඹුලාගල මහා කාශ්‍යප මහ තෙරුන් වහන්සේගේ මූලිකත්වයෙන් සිදු වූ සංඝ සංශෝධනයේ දී රජතුමාගේ අපේක්ෂාව වී තිබුණේ මුළු රටේ ම සංඝ සාමග්‍රියක් ඇති කිරීම ය. එකී සංඝ සාමග්‍රිය නිසා වළගම්බා රජු සමයේ සිට පැවැති මහාවිහාර අභයගිරි, ජේතවන තුන් නිකාය භේදය කෙළවර විය.

එතුමාගේ අනෙක් ආගමික කටයුතු අතර පහත සඳහන් ඒවා වේ.

1. පොළොන්නරුවේ ජේතවන විහාරය ඉදි කිරීම.
2. එතුමා අෂ්ට මූලායතන අධිපතීන් සඳහා ප්‍රසාද කරවීම.
3. ආළාහණ (අදාහණ) පිරිවෙණ ඉදි කිරීම. (ස්තූප දෙකකින් ද පස් මහල් ලංකාතිලක පිළිම ගෙය, බද්ධ සීමා උපෝසථඝරයකින් ද සුවිසාල ආරෝග්‍ය ශාලා) වැනි අංග රාශියකින් සමන්විතව ඇත.



5.7 රූපය-පළමුවන පරාක්‍රමබාහු රජුගේ රාජසභාව

එතුමා අගනුවර තුළ කරවූ වර්තමාන ගල් විහාරය නමින් හඳුන්වන උත්තරාරාමයෙහි සුවිශාල සැතපෙන පිළිමයක්, ත්‍රිභංග හිටි පිළිමයක් හා හිඳි පිළිම දෙකක් ද ඇත. ඉන් එක් පිළිමයක් ඇත්තේ පර්වතය හාරා සකස් කරන ලද විද්‍යාධර ගුහා නමින් හැඳින්වෙන ලෙනෙහි ය. ගල් විහාරයට උතුරින් පිහිටි දෙමළ මහාසෑය නමින් හැඳින්වෙන ස්තූපය පාණ්ඩ්‍ය ආක්‍රමණයේ දී අල්ලා ගත් සිරකරුවන් ලවා කරවන ලද්දක් වන හෙයින් එම නම ලැබුණු බව පෙනේ.

රජතුමා චෝළ ආක්‍රමණවල දී විනාශ වූ අනුරාධපුරයේ රුවන්වැලිය, අභයගිරිය, ජේතවනය හා මිරිසවැටිය යන චෛත්‍ය ප්‍රතිසංස්කරණය කර වූ බව සඳහන් වේ. ඒ හැරුණු විට ලෝහාමහාපාය, ථූපාරාමය, මිහින්තලේ ස්තූප හා විහාරාරාම ද ප්‍රතිසංස්කරණය කළ බව වාර්තා වේ.

මේ අයුරින් ඇති කරවන ලද සාසනික අභිවෘද්ධියත් භික්ෂු සංඝයාගේ හා ධර්ම ශාස්ත්‍රීය අංශයේ උන්නතියත් හේතු කොට ගෙන අග්නිදිග ආසියාවේ බෞද්ධ රටවල භික්ෂූන් වහන්සේ පොළොන්නරුවට පැමිණ මෙරට ථෙරවාදී ධර්ම ශාස්ත්‍ර හා වත්පිළිවෙත් පුහුණු වී ආපසු තම රටවලට ගොස් ලක්දිව සිංහල ශාසනික සම්ප්‍රදායක් පිහිටුවීමට ක්‍රියා කළ බවට සාක්ෂි ලැබේ.

## 5.4 නිශ්ශංකමල්ල රජතුමා (ක්‍රි. ව. 1187 - 1196)



5.8 රූපය-ගල්පොත ශිලා ලේඛනය

මහා පරාක්‍රමබාහු රජතුමාගෙන් අනතුරුව පොළොන්නරුවේ රජකම දැරූ පාලකයන් අතුරින් කැපී පෙනෙන පාලකයෙකු වූයේ නිශ්ශංකමල්ල රජතුමා ය. පරාක්‍රමබාහුගෙන් පසුව බලයට පත් වූයේ දෙවන විජයබාහු නමැත්තෙකි.

ඔහු සමයේ උපරාජ පදවිය නිශ්ශංකමල්ල විසින් දරණ ලදි. දෙවන විජයබාහුට රජකම දැරිය හැකි වූයේ වසරක පමණ කාලයක් පමණි. එතුමා ජීවිතක්ෂයට පත් කොට මහින්ද නමැත්තෙක් රජ වී ඇත. එහෙත් දින පහක් තුළ ඔහු නෙරපා දමා යුවරජ නිශ්ශංකමල්ල රජ විය. මේ අනුව නිශ්ශංකමල්ගේ රජවීම සිදු වූයේ අවුල් සහගත දේශපාලන පසුබිමක් තුළ ය.

පොළොන්නරුවේ සිටි අවසාන ශ්‍රේෂ්ඨ පාලකයා ලෙස සැලකිය හැකි නිශ්ශංකමල්ල රජු ලංකාවේ එක් රජෙකු විසින් පිහිටුවන ලද වැඩිම සෙල්ලිපි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මේ රජුගේ කාලයේ ය. ප්‍රමාණයෙන් එය 70 කට වැඩි වේ.



5.9 රූපය

නිශ්ශංකමල්ල රාජසභා මණ්ඩපයේ ගල්කණුවල නිලධාරීන්ගේ නම සඳහන් කරමින් ආසන පනවා තිබූ අයුරු (රජු) **සිංහාසනයේ වැඩ හුන් කල සෙනෙවිරදුන්ට ස්ථානයයි** යනුවෙන් මෙම ගල් කණුවේ ලියා ඇත.

එසේම ලංකාවේ ලියන ලද දීර්ඝතම සෙල්ලිපියවන ගල්පොත ශිලා ලේඛනයේ හිමිකාරයා වන්නේ ද නිශ්ශංකමල්ල රජුය. මූලාශ්‍රය මාර්ගයක් ලෙස සෙල්ලිපි වැදගත් වුවද මේ සෙල්ලිපිවල අන්තර්ගතය ප්‍රශස්ති ස්වරූපයක් ගන්නා බැවින් ඓතිහාසික තොරතුරු පරීක්ෂාකාරීව තෝරා ගත යුතුව ඇත.

නිශ්ශංකමල්ලගේ ජන්ම භූමිය වූයේ කාලිංගයේ සිංහපුරය යි. රජතුමාගේ සෙල්ලිපිවල එතුමාගේ පියා ශ්‍රී ජයගෝප මහාරාජා ලෙස ද මව පාර්වතී මහාදේවිය ලෙස ද හඳුන්වා දී ඇත. මහා පරාක්‍රමබාහු රජතුමා කාලිංග දේශයට හසුන්පත් යවා තමා මෙරටට ගෙන්වා යුද ශිල්පය හා ශාස්ත්‍ර නිපුණ කරවා සිය දියණිය වූ සුභද්‍රා කුමරිය සරණපාවා දී පරාක්‍රමබාහු යන නමද තමාට පැවරූ බව ගල්පොත සෙල්ලිපියේ සඳහන් කරන රජු තමා ඇපා මාපා තනතුරු පිළිවෙලින් ඉසුලූ බව ද පවසා ඇත.

### 5.4.1 නිශ්ශංකමල්ල රජු මුහුණ දුන් අභියෝග

- ❖ විදේශයක උපන් කාලිංග වංශිකයෙකු වීම
- ❖ මහා පරාක්‍රම රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය
- ❖ පරාක්‍රමබාහු රජුගේ දක්ෂ සේනාපතියන්ගේ විරෝධතා
- ❖ පාණ්ඩ්‍ය වංශිකයන් බලවත්වීම
- ❖ රෝහණයෙන් එල්ල වූ තර්ජන

ඉහත කී අභියෝග ජයග්‍රහණය කිරීම සඳහා ඔහු තම සෙල්ලිපි මගින් සංවිධානාත්මක ප්‍රචාරක ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලද බව පෙනේ. විදේශීය රටකින් පැමිණිය ද තමා බෝසතුන් උපදින දඹදිව සිංහපුරයෙන් පැමිණි බව ද කාලිංගය උරුමයක් ඇති විජයරාජ පරපුරින් පැවත එන තමාට ලක්දිව සිහසුනට උරුමයක් තිබෙන බව පුන පුනා ප්‍රකාශ කළේ ය. තම උපන් බිම කාලිංග යන්න ජනතාවගේ සිත්තුළ තහවුරු කිරීමට කාලිංග ලංකේශ්වර නාමයත් පුලස්තිපුරය කාලිංගපුරය නමින් හඳුන්වා කාලිංග ලංකේශ්වර නමින් කාසි ද නිකුත් කර තිබේ.

නිශ්ශංකමල්ල තම ආධිපත්‍යය තහවුරු කරමින් රටේ විවිධ ප්‍රදේශවල සංචාරය කොට සෙල්ලිපි සහිත ගල් කණු පිහිටුවා ඇත. ඒවා ගාවුත කණු ලෙස හඳුන්වයි. එවැනි කණු වැලිගත්ත, යුදගනාව, කටුගහගල්ගේ, සෙල්ලකතරගම, කොස්ලන්ද දෙවුන්දර වැනි ස්ථානවලින් හමු වී ඇත. ඔහු තමාගේ එවැනි ලිපිවල රුහුණේ වැසියාට කරන ලද අවවාද මෙන් ම පරාක්‍රමබාහුගේ දක්ෂ සේනාපතීන්ට පනවන ලද නියෝග ඇතුළත් වේ.

පරාක්‍රමබාහුගේ වීර ක්‍රියා තමන්ගේ ක්‍රියා බව ඒත්තු ගැන්වීමට වෑයම් කළ නිශ්ශංකමල්ල රජතුමා පාණ්ඩ්‍ය රාජ්‍යය දෙවරක් ආක්‍රමණය කර එරටින් පුද පඬුරු ලබා ගත් බව සෙල්ලිපිවල දක්වයි. පරාක්‍රමබාහු රටවැසියන්ගෙන් අධිකව බදු අය කළ බවට

චෝදනා කරන නිශ්ශංකමල්ල තමා ඔවුන්ට සහන ලබා දීමට ජල බද්ද, හේන්වලින් අය කළ කැති අඩ හා ජලාශවල මසුන් අල්ලන්නන්ගෙන් අය කළ පිසඹුරුවත වැනි බදු අහෝසි කළ බව සෙල්ලිපිවල දක්වයි. දුගීන්ට නොයෙක් භව භෝග ප්‍රදානය කිරීම, විශිෂ්ට දස්කම් දැක්වූ හෝ සේවා කළ අයට ඒ වෙනුවෙන් පමුණුගම් දීම ආදිය ප්‍රදානය කළ බව ද සඳහන් කරයි. වසරක් පාසා තුලාභාර නැගෙමින් ඒවායේ අඩංගු වස්තුව දුගී මගී යාචකාදීන්ට බෙදා දුන් බව ද සඳහන් වේ.

හැටදාගෙය නමින් අද හඳුන්වනු ලබන දළදා මන්දිරය කර වූ හෙතෙම දඹුලු විහාරය ප්‍රතිසංස්කරණය කොට එහි බුදුපිළිම හැත්තෑ තුනක රන් ආලේප කරවා එම ලෙන් විහාරය සුවණ්ණගිරි ගුහා යනුවෙන් නම් කොට ශිලා ලිපියක් ද පිහිටුවා ඇත. තවද රන්කොත්වෙහෙර, වටදාගෙය කර වූ රජතුමා කැලණිය, මාගම, මහියංගණය, සමනොළ ආදී සිද්ධස්ථාන වැඳපුදා ගැනීමට ගිය බව සඳහන් වේ.

ඉහත සඳහන් කළ කරුණු අනුව නිශ්ශංකමල්ල මහා පරාක්‍රමබාහු රජුගේ කටයුතු අභිබවා යාමට උත්සාහයක් ගත්ත ද ඔහුට හිමි වන්නේ පොළොන්නරු රාජධානියේ පසු පිටුවයි.

**ක්‍රියාකාරකම**

නිශ්ශංකමල්ල රජතුමා මුහුණදුන් අභියෝග හා ඒවා ජයගත් ආකාරය කෙටියෙන් ලියන්න.

## 5.5 පොළොන්නරු රාජධානියේ පරිහානිය හා එහි බිඳ වැටීම

පොළොන්නරු රාජධානිය ක්‍රමයෙන් පරිහානිය කරා යාමට හා අවසානයේ එය බිඳ වැටීමට තුඩු දුන් හේතු කීපයක් තිබේ.

**දුර්වල පාලකයන් බලයට පත් වීම**

පළමුවන පරාක්‍රමබාහු රජුගේ අභාවය සිදු වූ වර්ෂ 1186 සිට පොළොන්නරු රාජධානිය බිඳ වැටුණු වර්ෂ 1215 දක්වා වසර 29 කාලය තුළ පාලකයන් 12 දෙනෙකු පමණ වරින් වර බලයට පත් ව ඇත. මේ අතරින් නිශ්ශංකමල්ල රජුගේ වසර 9 ක පාලන කාලය හැරුණු විට සෙසු සියලු දෙනාගේ රාජ්‍ය කාලය ඉතා කෙටි විය. මෙයින් පෙනීයන්නේ දේශපාලන ස්ථාවරත්වයක් නොතිබූ බවයි.

**කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය**

මෙරට සිටි කාලිංග වංශිකයන් හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය පළමුවන පරාක්‍රමබාහුගෙන් පසුව උත්සන්න විය. පරාක්‍රමබාහුගෙන් පසුව කාලිංග වංශිකයෝ තමන්ට හිතවතුන් බලයට පත් කිරීමට අරගල කළහ. කල්‍යාණවතී හා ලීලාවතී සුළු කාලයක් තුළ කීපවරක් බලයට පත්වූයේ මේ නිසාය. කල්‍යාණවතී කාලිංග වංශික වන අතර ලීලාවතී පාණ්ඩ්‍ය වංශික වේ.

**පළමුවන පරාක්‍රමබාහු රජුගේ සේනාපතීන්ගේ ක්‍රියා කලාපය**

මෙම අර්බුද උග්‍ර වීමට සෙනෙවියන්ගේ මැදිහත් වීම බෙහෙවින් බලපෑවේය. පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ දී සේනාපතිවරුන් ප්‍රමාණයෙන් මෙන් ම ද උසස් මට්ටමකට පැමිණ සිටියෝ ය. එයට බලපෑවේ එම රජතුමා විසින් දේශීය හා විදේශීය යුද්ධ සඳහා විශාල යුද සේනාවක් ගොඩනැගීම යි. පරාක්‍රමබාහුට මේ සෙනෙවියන් පාලනය කළ හැකි වුව ද ඔහුගෙන් පසුව පත් වූ පාලකයන්ට එම ශක්තිය නොතිබූ බව පෙනෙයි. තමන්ට අභිමත කුමාරවරුන් සිංහාසනයට පත් කිරීමටත් සිත් සේ ඔවුන් නෙරපා හැරීමටත් මේ සෙනෙවියන්ට හැකි විය.

**ආර්ථික පරිහානිය**

නිශ්ශංකමල්ල රජුගේ අභාවයෙන් පසුව දුර්වල පාලකයන් බලයට පත් වීම නිසා එකල පැවැති වැව් අමුණු පද්ධතිය නඩත්තු නොවූ බව පෙනේ. මෙම කාල පරිච්ඡේදයේ දී ප්‍රාදේශීය පාලනය ද දුර්වල වන්නට ඇත. එම නිසා වෙළඳාම අඩපණ වී ආර්ථිකය පිරිහෙන්නට පටන් ගත්තේය.

**කාලිංග මාඝගේ ආක්‍රමණය**

පරිහානියට පත් ව තිබූ පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට ආසන්නතම හේතු වූයේ කාලිංග මාඝගේ ආක්‍රමණයයි. මාඝ විශාල හමුදාවක් (විසිහතර දහසක්) සහිතව වර්ෂ 1215 දී මෙරට ආක්‍රමණය කරන විට රටේ පැවැති දුර්වල දේශපාලන වාතාවරණය නිසා ආකමණික හමුදාවට මුහුණ දීමේ හැකියාවක් ලාංකිකයන්ට නොතිබුණි. එහි ප්‍රතිඵල වශයෙන් පොළොන්නරු නගරය හා රජරට ප්‍රදේශ රැසක් මාඝ යටතට පත් විය. එය පොළොන්නරු අගනුවර කෙරෙහි පමණක් නොව වසර එක්දහස් පන්සීයකට නො අඩු කාලයක් පුරා පැවති සමස්ත රජරට ශිෂ්ටාචාරය කෙරෙහි ම බලපෑමක් ඇති කළේය.

මේ තත්වය මහාවංස කතුතුමා මෙසේ පැහැදිලි කරයි.

''(ආක්‍රමණිකයෝ) මිනිසුන් බැඳ දමා වධ කොට ධනය පැහැර ගෙන දිළින්දන් කළහ. ප්‍රතිමා බිඳ හෙලූහ; චෛත්‍ය විනාශ කළහ; විහාර කොල්ලකෑහ; උපාසකයන්ට පහර දුන්හ; දරුවන්ට තැලූහ.'' එම පාඨයෙන් මාඝගේ ක්‍රියාකලාපයෙහි පහත සඳහන් කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් ද වටහා ගත හැකිය.

❖ මෙයින් පැහැදිලි වන පරිදි දැඩි බෞද්ධ විරෝධි ප්‍රතිපත්තියක් ගෙන ගිය මාඝ බෞද්ධ පොත්පත් රාශියක් ද විනාශ කළේ ය. එපමණක් නොව බෞද්ධයින් අබෞද්ධයින් කිරීමේ උත්සාහයක ඔහු නිරත විය. මේ නිසා මාඝ සෙසු ආගම් නොඉවසූ ආගමික අන්තවාදියෙකු ලෙස සැලකේ.

එපමණකින් නොනැවතුණ මෙම දරුණු ආක්‍රමණිකයා රජරට ප්‍රභූ ජනයා පීඩාවට පත් කළේ ය.

මෙම ප්‍රභූ ජනයා අතරට රාජ්‍ය පාලනයේ ඉහල තනතුරු දැරූ නිලධාරීන් හා සමාජයේ උසස් යැයි සම්මත ජනයා ද ඇතුළත් බව පෙනේ. තවද චිරාගත කුල සිරිත් බිඳ දැමීමට කටයුතු කළ මොහු දිවයිනේ සමාජ ව්‍යුහය හා එහි ක්‍රියාකාරිත්වය විනාශ කිරීම සඳහා කටයුතු කළේ ය.

මේ පසුබිම තුළ උද්ගත වූ ප්‍රතිඵලය වූයේ පීඩාවට පත් භික්ෂූන් වහන්සේලා ඇතුළු සෙසු ජනතාව ආරක්ෂාව පතා රුහුණ හා මලය ආදී ප්‍රදේශවලට (කඳුකරයට) පලා යාම යි. මේ නිසා රජරට බොහෝ ප්‍රදේශ ජනශුන්‍ය විය. මධ්‍ය පාලනයෙන් ගිලිහුණු ඇතැම් පෙදෙස් වන්නි ප්‍රදේශ බවට පත් විය. රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනය වැනි සිද්ධස්ථාන ක්‍රමයෙන් වල් බිහි විය.

**පොළොන්නරු යුගයේ සාමාජික තත්වය**

සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රයවලින් හෙළිවන තොරතුරු අනුව එකල රජ, බමුණු, වෙළඳ, ගොවි යනුවෙන් ද උත්තම, අධම, මහාකුල, හීනකුල යනුවෙන් ද සමාජ කොටස් පැවතුණි. මීට අමතරව කුඹල්, ලෝහ, පේෂ කර්මාන්තය වැනි වෘත්තිකයෝ ද වූහ. පහලම ශ්‍රේණිය යැයි හැඳින්විය හැකි දැසිදස්සන් වැනි නම්වලින් හැඳින්වූ පිරිසක් මෙකල සිටි බවට සාක්ෂි ලැබෙන අතර ඔවුහු රජ පවුල් ප්‍රභූ පවුල්, පන්සල් හා විහාර ගම් ආදියෙහි විවිධ සේවාවන්හි නියුක්ත වෙමින් තම ස්වාමියන්ට තේවා සැපයූහ. නිශ්ශංකමල්ල රජු විහාරස්ථානවලට දැසි දසුන් දුන් බව සිය සෙල්ලිපිවල සටහන් කොට තිබේ. මෙකී සමාජ හැඩගැස්ම සඳහා දිවයිනේ පාලකයන් ගෙන්වාගත් දකුණු ඉන්දීය කුලී හමුදා සහ විවිධ ආක්‍රමණ හමුදා බලපාන්නට ඇතැයි විශ්වාස කළ හැකිය.

පොළොන්නරු යුගයේ කාලිංග හා පාණ්ඩ්‍ය යනුවෙන් හැඳින්වුණු රාජවංශ දෙකක් ගැන තොරතුරු කියවේ. හතරවන මහින්ද හා පළමුවන විජයබාහු යන රජවරු කාලිංග රජ පවුලෙන් කරගත් විවාහ හේතුකොටගෙන කාලිංග වංශය ඇති වූ අතර දෙවන සේන රජු කාලයේ සිට පාණ්ඩ්‍ය සිහසුන සඳහා ලංකාවට තිබූ අයිතිය හා විවාහ සබඳතා නිසා පාණ්ඩ්‍ය වංශය ඇති විය.

මෙකළ ද පිළිගත් සම්ප්‍රදාය වූයේ සම කුල විවාහය යි. එසේම ඒකභාර්යා විවාහ ක්‍රමය සාමාන්‍ය සිරිත වූ නමුත් බහුභාර්යා සේවනය ද ප්‍රභූන් අතර පැවතුණි. සති පූජා, ළදරු විවාහ, බහුපුරුෂ විවාහ මෙකල පැවතුණ බවට සාධක නැත. නැවත විවාහ වීම තහනම් වූවක් නොවේ.

මෙකල පැවතියේ පිතෘ මූලික සමාජයකි. දේපල බෙදීයාම වැළැක්වීම සඳහා විවාහක දරුවන් ද මව්පියන් ආශ්‍රයේ ජීවත් වූ අවස්ථා ද තිබේ.

මෙරට පැවති බෞද්ධ සමාජ ක්‍රමය අනුව පුරුෂයන්ට මෙන් ම ස්ත්‍රීන්ට ද සමාජයේ සම තත්ත්වයෙහිලා සැලකූහ. ලීලාවතී හා කල්‍යාණවතී වැනි කතුන් සිහසුනට පත්වීම කාන්තාව හිමිකර ගත් උසස් තත්වයන්ට නිදසුන් වේ.

**රජතුමාගේ සමාජ සුභසාධන සේවාව**

සමාජ සුභසාධනය සැලසීම රජුගේ යුතුකමක් ලෙස දැඩිව පිළිගෙන තිබේ. ගිලානෝපස්ථානය සඳහා මහා පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරු නගරයේ රෝහලක් ඉදි කරන ලද බව මහාවංසය වාර්තා කරයි. එහි මිනිසුන්ට පමණක් නොව සතුන්ට ද ප්‍රතිකාර කරන ලද බව තවදුරටත් සඳහන් වේ.

දුප්පතුන්ට, අසරණයන්ට හා මගීන්ට ආහාරපාන, දන්දීම හා විවේකස්ථාන තනාදීම හා මග දෙපස සෙවනට ගස් සිටුවීම ආදිය රජුගේ යුතුකම් හා වගකීම් සේ පැවතුණි. පළමුවන විජයබාහු හා මහා පරාක්‍රමබාහු මෙබඳු දේ කළ රජවරුන් ය. තවද නගරයේ මෙන් ම පිට පළාත්වල ද නිශ්ශංකමල්ල දානශාලා විශාල සංඛ්‍යාවක් කර වූ බව එතුමාගේ සෙල්ලිපිවල සඳහන් වේ. ලීලාවතී රැජිණ අනුරාධපුර දානශාලාවක් සකසා එහි දන්දීමට අවශ්‍ය කුළු බඩු ආදිය ගැනීම සඳහා විදේශීය වෙළඳුන්ගෙන් බද්දක් අය කළ බව පුලියන් කුලම සෙල්ලිපියේ සඳහන් වේ.

**සාමාන්‍ය ජනයාගේ ජීවනෝපාය**

ජනතාවගේ ප්‍රධාන ආහාරය බත් විය. එබැවින් වී වගාවට ප්‍රමුඛ තැන හිමි විය. එහෙත් හේන් ගොවිතැන ද පැතිරුණු බව පෙනේ. එසේම ආහාරයට ගන්නා ලද නිවුඩු සහල් බත්, පැසි සහල් බත්, ඇල් හාල් ගැන මෙන් ම උඳු, මුං, තල, මෙනේරි, කුරක්කන් ආදී ධාන්‍ය වර්ග ද, කැකිරි, බටු, ලබු, පුහුල්, තියඹරා වැනි එළවළු ගැන ද සඳහන් ය. තම්පලා වැනි පලා වර්ග ගැන ද කරුණු ඇත. උක් වගාව ගැන ද නිතර සඳහන් වේ. ආහාර පිස ගැනීමට තල තෙල්, මී තෙල් හා පහන් දැල්වීමට මී තෙල් ද භාවිතයට ගෙන තිබේ. කෙසෙල්, අඹ ආදී පළතුරු ද ප්‍රචලිතව පැවතුණි.

එකල ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේ ම ඇඳුම වූයේ සළු නමින් හැඳින්වූ රෙදි කඩකි. උඩුකය හා යටිකය වැසීමට භාවිත කළ රෙදිකඩ දෙකක් ද උතුරු සළුව හා තනපට ගැන ද සඳහන් වේ. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම ආභරණ පැළඳි බවට සාධක තිබේ. රජවරු අභිෂේක වැනි උත්සවවල දී සූසැට ආභරණ පැළඳූහ. කුණ්ඩලාභරණ පා සලඹ, මිණි මෙවුල, නූපුර ආදී ආභරණ ගැන වංසකථාවල සඳහන් වෙයි.

සමාජයේ පැවති සිරිත්-විරිත් ගැන ද සමකාලීන සාහිත්‍යයෙන් තොරතුරු ලැබේ. ගැබ් පෙරහැර, රන් කිරි කටගෑම, ඉඳුල් කටගෑම, කන් විදීම වැනි සමාජ සිරිත් ගැන සඳහන් වේ. රන්කිරි කටගෑම, කන් විදීම වැනි සාමාන්‍ය ජනතාව අතර පැවති සිරිත්වලදී මෙම චාරිත්‍ර පවත්වන අවස්ථාවල දී භික්ෂූන් වහන්සේ කෙනෙකු වඩමවා සෙත් පිරිත් කියවීමේ සිරිතක් ද පැවති බව පෙනේ. අවමංගල්‍ය කටයුතු, භූමිදාන හා ආදාහන යන ක්‍රම දෙක යටතේ සිදු වුවත් පොදු චාරිත්‍රය වූයේ භූමිදාන කිරීම ය.

සමකාලීන මූලාශ්‍රය ඇති කරුණු අනුව එකල පැවති කෙලි සෙල්ලම් අතර පන්දු කෙළිය, දිය කෙළිය, ඔංචිලි පැදීම, බඹර කර කැවීම වැදගත් තැනක් ගත් බව පෙනේ. වයස් භේදයකින් තොරව පන්දු කෙලියේ යෙදීම විශේෂ ලක්ෂණයකි. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම සහභාගී වූ ජනප්‍රිය විනෝද ක්‍රීඩාවක් වූයේ දිය කෙළිය යි. උත්සව අවස්ථා අතර බෞද්ධ වෙසක් උත්සවය, පොසොන් උත්සවය, දළදා පෙරහැර ශ්‍රී පාද වන්දනාව වැනි ඒවා දැක්විය හැකි ය. හින්දු ආගමිකයන් සෑහෙන ප්‍රමාණයක් සිටි අතර උත්සව ආදිය ද පැවැත් වූ බව සිතිය හැක.

පොළොන්නරු යුගයේ අධ්‍යාපන කටයුතු ශිල්ප, ශාස්ත්‍ර වශයෙන් කොටස් දෙකකට බෙදී පැවතුණි. ගණිතය, මිණිතය හා අකුරු ඉගෙනීම ශාස්ත්‍ර විය. දුණු, කඩු ආදී හරඹවල යෙදීම ශිල්ප ලෙස සැලකිණ. ළමා වියේ දී අකුරු කියවා ගුරුවරයා වෙත හෝ විද්‍යාස්ථානයක් වෙත හෝ යැවීමෙන් දරුවෙකුගේ අධ්‍යාපනය ආරම්භ විය. මූලික අධ්‍යාපනයෙහි ප්‍රධාන කාර්යය වූයේ අසා දැන ගැනීම යි. භාෂා ශාස්ත්‍ර හා සංගීතය, නාට්‍ය, වෛද්‍ය විද්‍යාව වැනි විවිධ විෂයන් ඇතුළත්ව තිබුණු බව පෙනේ. ප්‍රමුඛ අධ්‍යාපන ආයතනය පිරිවෙණ ය. සමකාලීන පිරිවෙණ විද්‍යාස්ථාන ලෙස වර්ධනය වී තිබුණු බව පෙනේ. එකල පැවති ආලාහණ පිරිවෙණ ප්‍රකට පිරිවෙණකි.

**පොළොන්නරු යුගයේ ආර්ථික කටයුතු**

පොළොන්නරු යුගයේ ආර්ථිකයේ වැදගත් ම අංශය වූයේ ගොවිතැන යි. එය ගොඩ හා මඩ යනුවෙන් දෙයාකාර විය. මඩ ගොවිතැන වශයෙන් හැඳින්වුණු වී වගාව අනුරාධපුර යුගයේ දී මෙන් ම යල, මැද, මහ යනුවෙන් කන්න තුනක් ද සිදු විය. මෙය මෙසේ කළහැකි වූයේ මහා විජයබාහු රජතුමා විසින් වාරි පද්ධතිය නැවත ප්‍රතිසංස්කරණය කිරීමත් මහා පරාක්‍රමබාහු රජතුමාගේ දැවැන්ත වාරි ව්‍යාපෘතියත් නිසාය. සීසෑම සඳහා මී ගවයන් මෙන් ම එළ ගවයන් ද යොදා ගැනිණ. අඳ ක්‍රමයට ගොවිතැන් කිරීමේ ක්‍රමය ද එකල පැවතිණ.

වී වගාවට අමතරව හේන් ගොවිතැන ද පැවතිණ. හේන්වල උඳු, මුං, මෑ, කුරක්කන් එළවළු වැනි දෑ මෙන් ම පේෂ කර්මාන්තයට භාවිතා කළ කපු ද බහුලව වගාකොට ඇත. නිශ්ශංකමල්ල සෙල්ලිපිවල හේන්වලින් අයකළ කැති අඩ නැමැති බද්ද එතුමා අහෝසි කරන ලද බව සඳහන් කර ඇත. එයින් පෙනී යන්නේ බදු පැනවීමට තරම් ආර්ථිකයේ වැදගත්කමක් හේන් ගොවිතැනට තිබුණ බවයි.

මහා විජයබාහු රජතුමා චෝළ පාලන සමයේ අභාවයට ගොස් පැවති වාරි පද්ධතිය නැවත ප්‍රතිසංස්කරණය කර වූ බව මහාවංසයෙහි සඳහන් වේ. ඒවා අතර ඉතා වැදගත් වන්නේ මින්නේරි, කවුඩුලු හා කන්තලේ එකිනෙකට සම්බන්ධ කළ ඇලහැර ව්‍යාපාරය නැවත පනගැන්වීම ය. මහකණදරා, නාච්චදූව, මහගල්කඩවල, ඉණාමළුව වැනි වැව් රැසක් ද එතුමා විසින් ප්‍රතිසංස්කරණය කරවා ඇත.

මේ රජුගේ ඇවෑමෙන් පසු රාජ්‍ය උරුමය පිළිබඳව ඇති වූ සිවිල් අර්බුද නිසා විනාශයට පත් වූ වාරි පද්ධතිය නැවත දියුණු කොට එය උච්චතම අවස්ථාවට පත් කරණු ලැබුවේ මහා පරාක්‍රමබාහු රජතුමා ය. එහි දී එතුමා විසින් කරන ලද '' අහසින් වැටෙන එක දිය බිඳුවක් වත් ලෝකයාගේ උපකාරය පිණිස ප්‍රයෝජනයට නොගෙන මහමුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතුය.'' යන ප්‍රකාශය අනුව එතුමා ක්‍රියා කළ බව පැහැදිලි වේ. එතුමා දක්ඛිණ දේශයේ පාලකයා වශයෙන් කටයුතු කළ අවධියේ සකස් කරවූ දැදුරු ඔය සංවර්ධන ව්‍යාපාරය, පඬා වැව විශාල කරවීම හා පස්දුන් කොරළේ වගාබිම් සකස් කරවීම වැදගත් තැනක් ගනු ලැබේ.

මහා පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරුවේ පාලකයා වීමෙන් පසු කාලය තුළ දී වාරි කර්මාන්තය දියුණු කිරීමට අමුණු 165 ඇළවල් 3910ක් මහවැව් 163ක් කුඩා වැව් 2376ක් හා ගල් සොරොව් 341 කරවන ලදැයි මහාවංසයෙහි සඳහන් වේ. ඒවා සමහරක් ප්‍රතිසංස්කරණය කරන ලද ඒවා ද තවත් සමහරක් සාදන ලද ඒවාද වියහැකිය. එතුමාගේ වැදගත් ම වාරි කර්මාන්තය වූයේ පරාක්‍රම සමුද්‍රය යි. තෝපා, දුඹුටුලු, හා එරමුදු යන වැව් තුන ඒකාබද්ධ කොට තනවා ඇති පරාක්‍රම සමුද්‍රයට ජලය සැපයුණේ අඹන් ගඟෙන් පටන් ගන්නා ඇළකින් හා ගිරිතලේ වැවෙන් පටන් ගන්නා අංගමැඩිල්ල නැමැති ස්ථානයේ බඳින

ලද අමුණකින් හරවන ලද ජලය මගිනි. අඹන් ගඟෙන් පටන් ගන්නා ඇළ අංගමැඩිල්ල (ආකාශ ගංගාව) ලෙස හැඳින්වේ. මෙම දැවැන්ත පරාක්‍රම සමුද්‍රය නිසා අක්කර 18200 පමණ ප්‍රදේශයකට ජලය සපයා තිබේ.



5.9 රූපය-පරාක්‍රම සමුද්‍රය

පරාක්‍රම සමුද්‍රයට අමතරව පරාක්‍රම තටාක, මහින්ද තටාක ආදී වැව් ද අභිනවයෙන් එතුමා විසින් කරවන ලද බව සඳහන් වේ. අලුත් වැඩියා කර වූ වැව් අතර මින්නේරි වැව, කවුඩුලු වැව, කලා වැව, මහකනදරා වැව, පදවිය වැව, යෝධ වැව, ආදී වැව් රාශියක් ම වේ. කලාවැවේ සිට අනුරාධපුරයේ තිසා වැවට ජලය ගෙන ගිය කි. මී. 86 දිග ජය ගඟ ද (යෝධ ඇල) මේ රජතුමා විසින් අලුත්වැඩියා කරවනු ලැබීය. මේ රජතුමාගේ කාලයේ ප්‍රධාන ගංගා වලින් හරවන ලද ලොකු ඇළවල මුළු දිග ප්‍රමාණය කි.මී 960 පමණ වූ බව වංසකතාවල දැක්වේ. මෙකී වාරිපද්ධතිය නිසා කෘෂිකර්මාන්තයේ විශිෂ්ඨ සංවර්ධනයක් ඇති වූ අතර දිවයින පෙරදිග ධාන්‍යාගාරය බවට පත් වූහ.

පොළොන්නරු යුගයේ විදේශීය වෙළෙඳාම ද වැදගත් තැනක් ගත්තේය. අභ්‍යන්තර වෙළඳාම යටතේ කුළුබඩු, ලුණු, රෙදිපිළි, ආභරණ හා සුවඳවිලවුන් වර්ග අභ්‍යන්තර වෙළඳපොලේ අලෙවිය විය. ගැල්වල බඩු පටවා ගත් වෙළඳ කණ්ඩායම් මාතොට, දඹකොළ පටුන, ගෝකණ්ණ වැනි වරායවල සිට අගනුවරට ගමන් කළ බව වාර්තාවේ. මෙම වෙළඳාමේ බද්දක් අය කොට තිබේ. පිටිසර වෙළඳුන් ගමින් ගමට පැමිණ සිදු කළ කත් වෙළඳාම ද පැවතුණි. වෙළඳාමේ දී භාණ්ඩ හුවමාරුව හා කාසි භාවිතය යන අංශ දෙක ම පැවතුණ බවට සාධක ඇත. අනුරාධපුර යුගයේ මෙන් ම මෙකල ද ඉන්දියාව, අරාබිය, චීනය ආදී විදේශ රටවල වෙළෙන්දෝ ලංකාවට පැමිණ විවිධ ස්ථානයන්හි වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවා ගත්හ.

ලීලාවතී රැජින සමයේ පොළොන්නරුවේ පැවති පලබල මේධාවී නම් එවැනි වෙළඳ මධ්‍යස්ථානයන් ගැන සඳහන් වේ. විජයබාහු රජු රාමඤ්ඤ දේශය සමග පවත්වාගෙන යනු ලැබූ විදේශීය වෙළඳාමක් ගැන තොරතුරු දක්වන මහාවංසය මහා පරාක්‍රමබාහු රජු දවස එකී වෙළඳාම පවත්වාගෙන යාමට අන්තරංගධුර නැමැති දෙපාර්තමේන්තුවක් පිහිටුවා තිබූ බව සඳහන් කරයි. මුතු, මැණික් හා ඇතුන් අපනයන වෙළඳාම තුළ ප්‍රධාන වූ අතර එය රජුගේ ඒකාධිකාරයක් විය. අන්තර් ජාතික වෙළඳ කටයුතුවල දී ඇතුන් සුවිශේෂී වෙළඳ භාණ්ඩයක් විය. මහා පරාක්‍රමබාහු රාමඤ්ඤ දේශය ආක්‍රමණය කිරීමට ප්‍රධාන හේතුව බවට පත් වූයේ ද එකී වෙළඳාමට බාධා කිරීම ය.

විදේශ වෙළඳාමේ දී ආනයනික භාණ්ඩ අතර චීන පටපිලි කාශ්මීර සළු හා බරණැස් සළු ප්‍රධාන තැනක් ගත්තේය. රජවරුන්ගේ හා සේනාවල පරිහරණයට ඉන්දියාවේ සින්ධ් ප්‍රදේශයේ අශ්වයන්, චීන පිඟන් භාණ්ඩ මැද පෙරදිග රටවලින් කපුරු, සඳුන් වැනි සුවඳ ද්‍රව්‍ය හා මිදි යුෂ ද ආනයනය කර ඇත.

මෙකල රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ ඉඩම් බද්ද ය. ඉඩම්වල අස්වැන්නෙන් හයෙන් එකක් රජයට ගෙවීමට ගොවීන්ට නියමිත ව තිබිණ. මෙකී බද්ද කලින් කලට වෙනස් වී තිබීම විශේෂ ලක්ෂණයකි. කුඹුරුවලින් රජයට ගෙවීමට නියමිත බද්ද රන් කාසිවලින් ගෙවීමට නියමකොට නිශ්ශංකමල්ල රජු ව්‍යවස්ථාවක් පැනවූ බව එතුමාගේ සෙල්ලිපිවල සඳහන් වේ. කැති අඩ, පිසඹුරුවන්, කොලවෙල් අය, ආදී බදු වර්ග ද එකල තිබූ බව නිශ්ශංක මල්ල රජුගේ සෙල්ලිපිවලින් පෙනී යයි.

**පොළොන්නරු යුගයේ ආගම**

චෝළයෝ බෞද්ධ වෙහෙර විහාර විනාශ කළහ. එපමණක් නොව ඔවුහු මෙරට ශිව දේවාල ඉදි කළහ. පොළොන්නරුව අංක 1 හා 2 දරන ශිව දේවාල වේ. තවදුරටත් ඉදිරියට යමින් බෞද්ධ විහාරස්ථානවලට හින්දු නම් දීමෙන් ශාසන ඉතිහාසයේ වෙනස්කම් කළහ. ඊට එක් උදාහරණයක් නම් ත්‍රිකුණාමලයේ වෙල්ගම් විහාරය පිළිසකර කොට එය රාජ රාජ පෙරුම්පල්ලි යනුවෙන් හැඳින්විණ.

පළමුවන විජයබාහු රජතුමා ආගමික අංශයේ දී මුහුණ පෑ බරපතල ම දුෂ්කරතාවය වූයේ මෙරට සංඝ ශාසනය පුනරුත්ථාපනය කිරීමේ දී උපසම්පදා විනය කර්මයට අවශ්‍ය අවම ගණපූරණය වූ උපසම්පන්න භික්ෂූන් පස් නමක්වත් මෙරටින් සොයාගත නොහැකි වීමයි.

චෝළ දේශයේ ථේරවාදී භික්ෂූන් වහන්සේලා සිටි නමුදු දෙරට අතර පැවති දේශපාලන විරුද්ධවාදීකම් නිසා උපසම්පන්න භික්ෂූන් හා ත්‍රිපිටක ග්‍රන්ථ සොයා යාමේ දී රජුගේ අවධානය යොමු වූයේ රාමඤ්ඤ දේශය කෙරෙහි ය. චෝළ පාලන සමයේ විදේශ ගත වූ මෙරට භික්ෂූන් වහන්සේලාගෙන් කොටසක් රාමඤ්ඤ දේශයට වැඩම කළ බව වංශකථාවන් හි සඳහන්ව ඇති බැවින් උන්වහන්සේලා වෙතින් පැවිද්ද හා උපසම්පදාව ලැබූ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවක් එහි වැඩ සිටින්නට ඇත. ඒ අනුව I විජයබාහු රජුගේ අයදුම පිළිගත් රාමඤ්ඤ රටේ අනුරුද්ධ (අනවරථ) රජතුමා උපසම්පදා භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටක ධර්ම ග්‍රන්ථ ද සහිතව මෙරටට එවී ය. මෙසේ පැමිණි තෙරවරු පැවිද්ද හා උපසම්පදාව පිහිටුවා මෙරට සංඝ ශාසනය නැවත පිහිට වූහ.

මහාවිහාර, අභයගිරි, හා ජේතවන යන නිකාය තුනේ ම භික්ෂූන් රාමඤ්ඤ ප්‍රදේශයේ සිට වැඩම කළ මහා තෙරවරුන්ගෙන් උපසම්පදාව ලබා ස්වකීය සම්ප්‍රදාය වෙන් වෙන්ව පවත්වාගෙන ගොස් ඇත. විජයබාහු රජතුමා මෙම නිකාය තුනට ම තුලාභාර තුනක් දුන්බව පොළොන්නරුවේ වේලක්කාර සෙල්ලිපියේ සඳහන් වීමෙන් පෙනී යන්නේ

රජතුමා නිකාය තුනට ම සමාන අනුග්‍රහයක් දැක්වූ බව ය.

මෙම රජතුමා බුරුමය හැරුණු විට වෙනත් ථේරවාදී බුදුසසුන ව්‍යාප්තව තිබූ රටවල් සමග සම්බන්ධතා ගොඩනගා ගනු ලැබී ය. බුද්ධගයාවේ මහාවිහාරයට කීපවරක් පූජා භාණ්ඩ යැවීම එක් නිදසුනකි. ලංකාවේ ආනන්ද නම් මහා ස්ථවිරයන් වහන්සේ මලය අර්ධද්වීපයේ ලිගෝරයට වැඩම කොට ධර්ම ප්‍රචාරය කළ බවත් එය විජයබාහු රජුගේ අවසාන පාලන සමයේ දී සිදුව ඇති බවත් පිළිගෙන ඇත.

උතුරේ ජම්බුකෝල පට්ටන විහාරය, දඹුලු විහාරය, මහියංගණය, අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධිය ඇතුළු රටේ වෙහෙර විහාර රැසක් මෙතුමා ප්‍රතිසංස්කරණය කරවීය. නව නිර්මාණ ඉදිකිරීමට වඩා ප්‍රතිසංස්කරණයට ප්‍රමුඛත්වය ලබාදුන්න ද රජු තම මාලිගය ආසන්නයේ දළදා මැදුරක් තනවා එහි දළදා වහන්සේ තැන්පත් කරවා පූජා පැවැත්වූ බව දැක්වෙන හෙයින් එය ඔහුගේ නව නිර්මාණයක් විය හැකි ය. මේ රජු ශ්‍රී පාදයට ගමන් ගන්නා වූ මාර්ග තුනෙහි ම දන්සැල පැවැත්වූ බවත් ශ්‍රී පාදයට ගම්බිම් පූජා කළ බවත් අඹගමුව සෙල්ලිපියේ දැක්වේ.

මහා පරාක්‍රමබාහු රජතුමා රට එක්සේසත් කොට රාජ්‍යය කළ අවුරුදු 33ක කාලය මෙරට බුද්ධ ශාසනයේ අතිශයින් දීප්තිමත් යුගයකි. එම වකවානුව තුළ ගන්නා ලද වැදගත් තීරණ මෙරට ශාසන ඉතිහාසයේ විශේෂ ලක්ෂණයක් ලෙස දැක්විය හැකි ය. ඉන් පළමුවැන්න වන්නේ රජුගේ ප්‍රධාන අනුශාසකවරයා වූ දිඹුලාගල මහා කාශ්‍යප මහා ස්ථවිරයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණු සාසන ශෝධනය යි.

සංඝ සංශෝධනයෙන් පසුව ඇති කර ගන්නා ලද කතිකාවත දෙවන වැදගත් ලක්ෂණය වේ. එම කතිකාවත අඩංගු වන ගල්විහාර ලිපිය අනුව සංඝ සාමග්‍රිය ඇති වූයේ මහා පරාක්‍රමබාහු රජුගේ දොළොස් වන රාජ්‍ය වර්ෂයේදී ය. එකී කතිකාවත ලංකාවේ සියලුම භික්ෂූන් වහන්සේලාට අදාළ ප්‍රථම කතිකාවත වශයෙන් හැඳින්විය හැකි ය. මහා සාමි, මාහිමි, සංඝරාජ වැනි නම්වලින් හඳුන්වා ඇති සංඝ සමාජයේ නායක තනතුර ඇරඹුනේ මෙම සංඝ සාමග්‍රියෙන් පසුව බවත් ප්‍රථම මහාසාමි තනතුර ශාරිපුත්‍ර මහ ස්ථවිරයන් වහන්සේ විසින් ඉසිලූ බවත් උගතුන්ගේ පිළිගැනීම යි.

පොළොන්නරුවේ දැනට ශේෂව ඇති ආගමික ගොඩනැගිලිවලින් විශාල ප්‍රමාණයක් මහා පරාක්‍රමබාහු රාජ්‍ය යුගයේ දී ඉදි කෙරුණු ඒවා ය.

ආගමික කටයුතු සම්බන්ධයෙන් නිශ්ශංකමල්ල රජුගේ පාලන කාලය ද තවත් කැපී පෙනෙන යුගයකි. වසර නමයක කාලය තුළ එතුමා රටේ විවිධ ප්‍රදේශවලට සංචාර කොට වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරවීය. දඹුලු විහාරයේ පිළිම 72ක රන් ආලේප කරවා එයට එතුමා ස්වර්ණගිරි ගුහා යන නම තබන ලදී. ශ්‍රී පාදස්ථානයට පැමිණ වන්දනා

කළ එතුමා රත්නපුර පාරේ (රජ මාවත) පිහිටි භගවාලෙන නම් ස්ථානයේ රජු වන්දනා කරන ආකාරයේ චිත්‍රයක් අන්දවා නිශ්ශංකමල්ල ශ්‍රී පාදය වැන්දේ මෙසේ ය යන අදහස දෙන ලිපියක් ද කෙටවී ය. අනුරපුර රුවන්වැලි සෑයට ගිය මෙතුමා එම සෑයට අසදෘශ පූජාවක් පැවැත්වී ය. පොළොන්නරුවේ ඇති මහා පරාක්‍රමබාහු ආගමික ගොඩනැගිලි හැරුණු විට අන් සියලුම කැපී පෙනෙන ඒවා මේ රජුගේ කෘතීන් ලෙස සැලකේ.

බුදුදහමට අතිරේකව හින්දු ආගමට සම්බන්ධ විවිධ ඇදහිලි සමකාලීන අවදියේ පැවති බව අනාවරණය වේ. මහාතිත්ථ, කන්තලේ වැනි ස්ථානවලින් හමු වූ ශිව, පාර්වතී, කාර්තිකේය, ගණනාථ, කාලි, ලක්ෂ්මී ආදී හින්දු දෙවි දේවතාවියන්ගේ ප්‍රතිමාවලින් හා ශිව ලිංගවලින් පැහැදිලි වේ. මේ හැර විවිධ රජවරුන් බ්‍රාහ්මණයන්ට කළ ආහාරපාන දීම වැනි කටයුතු ගැන වංශකථාවල හා සෙල්ලිපිවල දැක්වේ.

**ක්‍රියාකාරකම**

මහා පරාක්‍රමබාහු රජු සමයේ ඇති වූ ශාසනික ප්‍රබෝධය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න.

## පොළොන්නරු සමයේ භාෂා සාහිත්‍යය

මහා විජයබාහු රජතුමා ප්‍රවීණ උගතකු වූ බව මහා කවි ලෙස මහාවංසයේ හඳුන්වා තිබීමෙන් පැහැදිලිය. මෙතුමා නොයෙක් කවීන්ට ප්‍රවේණිගම් හා අනල්ප ධනය දුන් බව ද සඳහන් වෙයි. සමකාලීන තොරතුරු හෙළි වන පනාකඩුව තඹ සන්නස හා අඹගමු සෙල්ලිපිය අනුව ද විවිධ අභියෝග මැද මෙරට භාෂා සාහිත්‍යය විනාශ නොවී පැවති බව කිවහැකි ය.

ලීලාවතී රැජිණ පළමුවරට රජකම් කළ කාලයේ ලියවුණු සසදාවත මේ යුගයට නිශ්චිතව අයත් වූ බව පිළිගෙන ඇත. ගී දෙසිය අසූතුනකින් යුත් මෙය පොළොන්නරු යුගයට අයත් කළ හැකි එකම සිංහල කාව්‍යය වේ. මඛාදේව ජාතකය මුල්කරගෙන රචිතව ඇති මුවදෙව්දාවත ද මේ යුගයට අයත් බව සැලකේ. සසදාවතෙහි මෙන් ම මුවදෙව්දාවතෙහි ද කතුවරු අවිනිශ්චිතය.

අත්ථදස්සි නම් හිමි නමක් ලියූ නිමි ජාතකය ද ගුරුළුගෝමීන් ලියන ලද ධර්මප්‍රදීපිකාව සහ අමාවතුර ද මේ යුගයට අයත් වේ. සරල සුගම හෙළ බස් වහර අමාවතුර කෘතියෙන් උගත හැකිවීම විශේෂ ලක්ෂණයකි.

පොළොන්නරු යුගයේ ජනප්‍රිය සාහිත්‍යාංගයක් ලෙස සැලකෙන සන්න කෘති කීපයක් හඳුනා ගෙන තිබේ. අභිධම්මත්ථ සංග්‍රහ සන්නස, විනය සන්නය, මේඝදූත සන්නය, ජානකීහරණ සන්නය, එවැනි කෘති කීපයකි.

පාලි හා සංස්කෘත ග්‍රන්ථවල වචනයක් පාසා අර්ථ සිංහලෙන් ලිවීම සන්න යනුවෙන් අදහස් වේ.

පොළොන්නරු යුගයේ රජවරුන්ගේ ශිලා ලිපි, විශේෂයෙන් පරාක්‍රමබාහුගේ ගල් විහාර කතිකාවත හා නිශ්ශංක මල්ල රජුගේ ගල්පොත ආදිය සමකාලීනව භාෂා සාහිත්‍යය හා අධ්‍යාපනය ලබා තිබූ ප්‍රගතිය පිළිබඳ ජීවමාන සාධක ය. පොළොන්නරු යුගයේ දී ඇති වූ බෞද්ධ ප්‍රබෝධ හා අග්නිදිග ආසියානු රටවල් සමග පැවති සංස්කෘතික සබඳතා පාලි භාෂාවේ ඇති වූ ප්‍රගතියට ප්‍රධාන හේතු සාධක විය. සමකාලීනව වැඩ වාසය කොට ඇති සාරිපුත්ත හිමි පාලිඅට්ඨකථා රචනයෙහි වියතෙකු විය. විනය සංග්‍රහය සාරත්ථදීපනී, සාරත්ථමංජුසා වැනි කෘතීන් උන්වහන්සේ විසින් රචිත බව පිළිගෙන ඇත.

සාරිපුත්ත හිමියන්ගේ ශිෂ්‍යයකු වූ වාචිස්සර හිමි විවිධ විෂයයන් අළලා කෘති රචිත උගතුන් අතර ප්‍රමුඛ විය. වංශකතා ලිවීම ද පොළොන්නරු යුගයේ දී දියුණු තත්ත්වයක පැවතුණි. ලීලාවතී රැජිණගේ අගමැතිවරයා වූ පරාක්‍රම සෙනෙවියාගේ අනුග්‍රහය ලබා ධම්මකිත්ති හිමියන් විසින් රචිත දාඨාවංශය ඉතා සුවිශේෂී වූ පාලි පද්‍ය ග්‍රන්ථයකි.

පොලොන්නරු යුගයේ දී පාලි භාෂාවට මෙන් ම සංස්කෘත භාෂා අධ්‍යයනයට දැඩි උනන්දුවක් පැවති බව කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය මනුස්මෘතිය වැනි කෘති ගැන මහාවංසයේ හා නිශ්ශංකමල්ල වැනි රජවරුන්ගේ සෙල්ලිපිවල සඳහන් වීමෙන් පෙනේ. මේ යුගයේ ඇතැම් සෙල්ලිපි ආරම්භ වී තිබෙනුයේ සංස්කෘත ශ්ලෝකවලිනි. උදුම්බරගිරිවාසී මහා කාශ්‍යප හිමියන්ගේ බාලාවබෝධන කෘතිය, අනුරුද්ධ නම් මහතෙර නමක් විසින් ලියන ලද අනුරුද්ධ ශතකය වැනි කෘති සංස්කෘත සාහිත්‍යයේ සුවිශේෂ කෘතීන් වේ.

ගැට පද ලිවීම මෙකල ප්‍රචලිත සාහිත්‍යාංගයක් විය. බෝධිවංස ගැටපදය, ජාතකට්ඨ කථා ගැටපදය එවැනි ගැටපද දෙකක් විය.

ඉහත සඳහන් කළ කරුණු අනුව සමකාලීන යුගයේ දී සිංහල, පාලි හා සංස්කෘත සාහිත්‍යය ග්‍රන්ථ රාශියක් රචනා වී තිබුණු බව පැහැදිලි ය.

### ක්‍රියාකාරකම

පොළොන්නරු අවදියේ විවිධ භාෂා උපයෝගී කොට ගෙන රචනා කොට ඇති පොත්පත් හා ඒවායේ කතුවරු වගුගත කරන්න.

## පොළොන්නරු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය හා කලාව

චෝළ පාලනය පැවති අඩසියවසක පමණ වකවානුව ලංකාවේ කලාව හා ගෘහ නිර්මාණයේ අඳුරු කාල පරිච්ඡේදයකි. අනුරාධපුරයේ හා ඉන් උතුරේ වූ බොහෝ ආගමික ගොඩනැගිලි චෝළයන්ගේ පාලන කාලයේ රැක බලා ගැනීමක් සිදු නොවීම නිසාත් පිළිසකර නොවූ නිසාත් විනාශ වී යන්නට ඇත. බොහෝ ගොඩනැගිලි චෝළයන්ගේ දරුණු විනාශයට ගොදුරු වන්නට ඇත.

චෝළ පාලන සමයේ ඉදි වූ ගොඩනැගිල්ලක් ලෙස නිශ්චිතව හඳුනාගෙන ඇත්තේ ශිව දේවාලය අංක 02 නමින් හඳුන්වන කුඩා ශෛලමය ගොඩනැගිල්ල ය. එහි බිත්තියේ කොටා ඇති පළමුවන රාජේන්ද්‍ර චෝළ රජුගේ ලිපිය අනුව මෙම ශිව දේවාලයේ නම වානමන් මාදේවි ඊශ්වරම් ය. මෙය  පළමුවන රාජ රාජ රජුගේ අග මෙහෙසියගේ නමය. පොළොන්නරු නගරයේ හා අවට පිහිටි හින්දු ආගමික ගොඩනැගිලි චෝළ පාලන කාලයේ ගොඩනැගූ බවට නිශ්චිත සාධක නැත.

මෙම ශිව දේවාලය චෝළ වාස්තු විද්‍යා ශෛලිය අනුව නිමවන ලද්දකි. එනිසා දේවාලවලට ආවේණික ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ එහි දක්නට ලැබේ. සමචතුරස්‍රාකාර ගර්භ ගෘහය හා ආයත චතුරස්‍රාකාර අන්තරාලය එහි ප්‍රධාන කොටස් වේ. මුළු ගොඩනැගිල්ල ම අලංකෘත පාදමක් මත නැගී සිටියි. ගර්භගෘහ කොටසට අණ්ඩාකාර වහලක් ඇත. ගොඩනැගිල්ලේ සියලුම කොටස් කළු ගලින් නිමවා ඇත. පිටතට පැන්නූ කුළුණුවලින් බිත්ති අලංකෘතය. මේ බිත්ති මතුයෙහි පිරමීඩාකාර මහල් තුනක් සහිත අෂ්ටාංග ශිඛර ගෝලාර්ධයක හැඩයගත් විමානයක් ඉදිකොට ඇත. මෙය සමකාලීන ද්‍රවිඩ ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටාංග පිළිබිඹු කරයි.

පොළොන්නරුව අගනුවර කරගත් පළමු විජයබාහු රජතුමාගේ පටන් කාලිංග මාඝ ආක්‍රමණය එල්ල වනතෙක් කාලය තුළ ඉදි වූ ගෘහ නිර්මාණ ලෞකික ගොඩනැගිලි සහ ආගමික ගොඩනැගිලි වශයෙන් කොටස් දෙකකට බෙදනු ලැබේ.

## ලෞකික ගෘහ නිර්මාණ

එකොළොස්වන හා දොළොස්වන ශතවර්ෂවලට අයත් මාලිගා හයක නටබුන් සොයාගෙන තිබේ. විජයබාහු මාලිගාව ඉන් එකකි. මහාවංසය අනුව පළමුවන විජයබාහු රජු අභිෂේක උත්සවය පැවැත්වූයේ මේ මාලිගාවේදී ය. අනුරාධපුර ඇතුල්නුවර පිහිටි මෙම ගොඩනැගිල්ල තනවා ඇත්තේ පැරණි ගොඩනැගිලි වලින් එකතු කරගත් ද්‍රව්‍යවලින් බව පෙනේ.

පඬුවස් නුවර ඇති රජමාලිගයේ නටබුන් පළමුවන පරාක්‍රමබාහු රජුගේ කාලයට අයත්, රජු දක්ඛිණදේශයේ පාලකයා වශයෙන් සිටියදී වාසය කළ මෙම මාලිගය ඉතා ක්‍රමානුකූල සැලැස්මක් අනුව තනවන ලද එකකැයි මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් ප්‍රකාශ කර ඇත. මාලිගා අතර ඉතා රමණීය යැයි කිවහැකි ගොඩනැගිල්ල වන්නේ පොළොන්නරුවේ ඇතුළු නුවර පිහිටි මාලිගාව වේ. එය මහා පරාක්‍රමබාහු රජු විසින් තනවන ලදැයි සැලකෙන වෛජයන්ත ප්‍රාසාදය බව හඳුනාගෙන ඇත. මෙම මාලිගාවේ ප්‍රධාන ශාලාව හැර අනික් කාමර වටා පේළි දෙකකට හෝ තුනකට සාදා තිබුණ කුඩා කුටි පනහකට වැඩි ගණනක් දක්නට ඇත. මැද ගර්භ ගෘහ බිත්තිවල ගණකම අඩි දහයක් පමණ වීමෙන් පෙනී යන්නේ මෙය සැබවින් ම තට්ටු ගණනාවකින් යුත් ගොඩනැගිල්ලක් වූ බව ය. ප්‍රධාන ප්‍රාසාදයට නැගෙනහිරින් පිහිටි රාජවේශ්‍යාභුජංග මණ්ඩපය රජු ජනතාව මුණ ගැසීමට භාවිත කළ වැටුම් මඩුවකි. පරාක්‍රම සමුද්‍රයේ දූපතක ඇති නටබුන් මාලිගය සීතමාලිගාව යැයි හඳුනාගෙන ඇත. නිශ්ශංකමල්ල රජුගේ මාලිගාවේ නටබුන් පරාක්‍රම සමුද්‍රයේ නැගෙනහිර ඉවුරේ දක්නට ලැබේ. රෝහණයේ රජ පෙළපතට අයත් ලෙස සැලකෙන මාලිගාවක නටබුන් උඳුන්දොර හෙවත් වර්තමාන ඌව පළාතේ ගල බැද්දෙන් සොයාගෙන ඇත.



5.10 රූපය-නිශ්ශංකමල්ල රාජ සභා මණ්ඩපය

මේ මාලිගා නිර්මාණයේ දී උපයෝගී කරගත් ප්‍රධාන ද්‍රව්‍ය වූයේ ගඩොල් ය. එය පොළොන්නරු යුගයේ නිර්මාණ ශිල්පයේ විශේෂත්වයක් වශයෙන් දැක්විය හැකිය. මේ ගොඩනැගිලිවල උපරිභාගය සහ වහල සඳහා ලී උපයෝගී කරගන්නට ඇත. වහල උළු සෙවිලි කරන ලද්දකි.



5.11 රූපය-පොළොන්නරුවේ කුමාර පොකුණ

මෙම ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාසය නිශ්ශංකමල්ල රජුගේ රාජ සභා මණ්ඩපයට ලැබී තිබේ. මෙම යුගයේ රාජසභාවක ලක්ෂණ හඳුනා ගැනීමට ඇති හොඳම නිදර්ශනය නිශ්ශංකමල්ල රාජසභා මණ්ඩපයයි.

මෙහි දකුණු කෙලවරේ මැද රජතුමාගේ සිංහාසනය තිබූ අතර එයට මුහුණ දී සමාන්තරව විහිදුණු කුලුණු පේලි දෙකක් දක්නට ලැබේ. එම කුලුණුවල අභියස ඒ ඒ නිලධාරීන්ගේ අසුන් පනවා තිබූ බව කුලුණුවල කොටා ඇති සෙල්ලිපිවල සඳහන් වේ. ඔවුන් දැරූ තනතුරු ද ඒවායේ සඳහන් වේ.

අනුරාධපුර යුගයේදී ම මෙන් ම මේ යුගයේ ද වාස්තු විද්‍යාවේ කැපී පෙනෙන අංගයක් වූයේ පොකුණු නිර්මාණය යි. මහා පරාක්‍රමබාහු රජුගේ මගුල් උයනෙහි ඇති ශිලාපොක්ඛරණී හෙවත් කුමාර පොකුණ වැදගත් නිර්මාණයකි. ඇතුළු නුවරට පිටතින් ඇති මෙයට බැසීමට සෙල්මුවා හිණිපෙළක් විය. ආයත චතුරස්‍රාකාර මේ ගල් පොකුණ උඩ සිට පහලට ක්‍රමයෙන් කුඩා වන අයුරු තනා ඇත. සෙල්මුවා සිංහ රූප, මකර රූප ස්වරූපය ගත් ගල් පිහිලි ද පියගැටපෙළ ද මේ පොකුණේ ඇත. පොකුණු අසල මණ්ඩපයක නටබුන් තිබෙන නිසා එහි රජ පවුලේ අය ඇඳුම් මාරු කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.

## ආගමික ගොඩනැගිලි

පොළොන්නරු යුගය ආගමික ගොඩනැගිලි නිර්මාණය අතින් විවිධත්වයක් පෙන්නුම් කරයි. මහා විජයබාහු රජු මේ වකවානුවේ තැන වූ බව වංශකතාවේ දැක්වෙන එකම ආගමික ගොඩනැගිල්ල දළදා මාලිගය යි. පොළොන්නරු දළදා මළුව නමින් හැඳින්වෙන චතුරස්‍ර භූමියේ ඇති අටදාගෙය නම් වූ ගොඩනැගිල්ල මෙය විය හැකි බව පිළිගෙන ඇත. අනුරාධපුර ගෘහ නිර්මාණ සැලැස්ම උපයෝගී කොටගෙන ඇති මෙහි ගර්භ ගෘහයක් හා අන්තරාලයක් ද වේ. මහා පරාක්‍රමබාහු සමය ආගමික ගොඩනැගිලි තැනීම අතින් දියුණු වකවානුවකි. පළමු විජයබාහු රජුගේ මරණයෙන් පසු ඇති වූ අවුල් වියවුල් නිසා අභාවයට ගොස් පැවති නිර්මාණකරණයට අවශ්‍ය ශිල්පින් හිඟ වූ බවත් එම නිසා දකුණු ඉන්දීය ශිල්පීන් ද පරාක්‍රමබාහු තම නිර්මාණකරණයට ගෙන්වා ගත් බවත් වංශකථාවේ දැක්වේ.



5.12 රූපය-තිවංක පිළිමගෙය

පොළොන්නරු යුගයේ සිංහල වාස්තු විද්‍යාඥයින් තැන වූ ඉතා උසස් නිර්මාණ වන්නේ ගඩොල්මුවා බොකු වහල සහිත පිළිම ගෙවල් බව පරණවිතාන මහතාගේ මතය යි. මෙවැනි විහාර මන්දිර තුනක් පොළොන්නරුවේ ඇත. එය දැනට හොඳින් ආරක්ෂා වී පවතින ගොඩනැගිල්ල ථූපාරාමය යි. මහා පරාක්‍රමබාහු රජුගේ මහින්ද ඇමතියා විසින් තැනවූවකි. මෙම නිර්මාණ වර්ගයේ වැදගත්ම නිර්මාණය ලංකාතිලකය වේ. එය මහා පරාක්‍රමබාහු රජු තැනවූවකි. ජේතවන විහාර සංකීර්ණයේ පිහිටි තිවංක පටිමාඝරය හෙවත් තිවංක පිළිමගෙය අනෙක් නිර්මාණය වේ. ථූපාරාමයෙහි හිඳි පිළිමයක් හා අනෙක් විහාර දෙකෙහි හිටි පිළිම ද දක්නට ලැබේ.



5.13 රූපය-ලංකාතිලක පිළිමගෙය

මෙම පිළිම ගෙවල් තුනට ම පොදු බිම් සැලසුම්වල ප්‍රධාන අංග තුනක් ඇත.

- ගොඩනැගිල්ලට පිවිසෙන ස්ථානයේ ඇති ද්වාර මණ්ඩපය
- අන්තරාලය
- අභ්‍යන්තරයේ ඇති ගර්භගෘහය, එම අංග තුන වේ.

මෙකී බිම් සැලසුම් අනුරාධපුර යුගයේ ප්‍රතිමාගෘහවල ඇති බිම් සැලැස්මට බෙහෙවින් ම සමාන බව පුරාවිද්‍යාඥයෝ පෙන්වා දෙති.



**5.14 රූපය-පොළන්නේනරුව හැටදාගෙය**

මෙම ප්‍රතිමා ගෘහවල බිත්ති ඉතා ඝනව තනා තිබෙන නිසා විහාර මන්දිරය තුළ ඇති ඉඩකඩ සීමිතය. මේවාහි බුදු පිළිම තැන්පත් කර ඇති ගර්භ ගෘහයට ආලෝක ලබා ගැනීමට පොලු සහිත පටු කවුළු තබා ඇත.

පොළොන්නරුවේ ඇති හැටදාගෙය විශේෂ ලක්ෂණ සහිත ගොඩනැගිල්ලකි. නිශ්ශංක මල්ලගේ ගොඩනැගිල්ලක් ලෙස හැඳින්වෙන මෙය ආයත චතුරස්‍රාකාර ගල් වැටක් සහිත කොටුවක් තුළ තනා ඇති ගර්භගෘහයකින් හා ද්වාර මණ්ඩපයකින් යුක්ත ය.

ගර්භගෘහය ප්‍රතිමා තැන්පත් කිරීම සඳහා ය. අන්තරාලයේ වම් කොණේ සිට පියගැට නවයකින් යුත් උඩුමහලකි. මීට ඉහළින් දැවමුවා මණ්ඩපයක් තිබුණු බවට පෙනේ. එහි දළඳා වහන්සේ තැන්පත් කර තිබෙන්නට ඇත.

නිශ්ශංක ලතා මණ්ඩපය පිරිත් ඇසීමට සහ දළදා වහන්සේට වැඳුම් පිදුම් කිරීම සඳහා රජතුමා භාවිත කරන ලද්දකි.

ජේතවන විහාර භූමිය ලෙස සැලකෙන විහාර භූමියෙහි පිහිටි බද්ධ සීමාපාසාදය නම් ගොඩනැගිල්ල උපෝසථ ඝරයකි. මහල් නමයක ගොඩනැගිල්ලක් ලෙස වංශකථාවල දක්වා ඇති මෙහි ගල් කණු අනුව එහි මහල් නමයක් තිබෙන්නට ඇතැයි විශ්වාස කිරීම අසීරු නොවේ.



5.15 රූපය-පොත් ගුල් විහාරය

පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්ම කෙළවර පිහිටා ඇති පොත්ගුල් විහාරය නමැති ගොඩනැගිල්ල ද මේ යුගයේ විශේෂ නිර්මාණයකි. අඩි 157 ක වට ප්‍රමාණයක් ඇති වෘත්තාකාර පාදමක් මත සම උසට නංවන ලද බිත්ති මත රැඳ වූ ලී වහලක් මෙහි තිබෙන්නට ඇත. මෙය පරාක්‍රමබාහු රජුගේ දෙවන බිසව වූ චන්ද්‍රාවතී විසින් කරවන ලද බව එම ස්ථානයෙන් ලැබුණු සෙල්ලිපියක සඳහන් වන බව ඉතිහාසඥයෝ පෙන්වා දෙති.

තිවංක පිළිමගෙයට දකුණු පැත්තෙන් පිහිටි නාන පොකුණ සාම්ප්‍රදායික අටපෙති නෙළුම් මලක හැඩයට සාදන ලද්දකි. වැදගත් නිර්මාණයක් වන මෙය පළමු පරාක්‍රමබාහු රජු විසින් ගොඩනගන ලද බව විශ්වාස කෙරේ.

ස්තූප නිර්මාණ කලාව ද පොළොන්නරු යුගයේ ප්‍රචලිතව පැවතුණි. ස්තූප තැනීමේදී ඇත අනුරාධපුර යුගයේ ස්තූප සැලැස්ම අනුගමනය කළ පොළොන්නරු යුගයේ ශිල්පීහු පේසා වළලු සහිත වේදිකාවක් මත සුවිශාල ගර්භගෘහයක් සහිත ස්තූප තැනූහ.



5.16 රූපය-රන්කොත් වෙහෙර



5.17 රූපය-නෙළුම් පොකුණ



5.18 රූපය-සත්මහල් ප්‍රාසාදය

ආළාහන පිරිවෙන් භූමියේ පිහිටි කිරිවෙහෙර පොළොන්නරු යුගයේ සුවිශාල ස්තූප අතර ඉතා වැදගත් ය.

නිශ්ශංකමල්ල රජු තැන වූ වර්තමාන රන්කොත් වෙහෙර නමින් හඳුන්වනු ලබන දාගැබ ආළාහණ පිරිවෙණට දකුණින් පිහිටියකි.

අඩක් නිම වූ නිර්මාණයක් ලෙස පිළිගැනෙන මහා පරාක්‍රමබාහු රජුගේ දෙමළ මහා සෑය දකුණු ඉන්දියාවෙන් රැගෙන එන ලද සිරකරුවන් යොදවා සකස් කළ බව සඳහන් වේ.

සත්මහල් ප්‍රාසාදය පොළොන්නරු යුගයේ තවත් විශේෂ ස්ථූපයකි. මෙය ක්‍රමයෙන් එකිනෙකට කුඩා වෙමින් ඉහළට නැගෙන මහල් හයකින් යුත් පිරමීඩයකට සමාන ගොඩනැගිල්ලකි. මුලදී අටපට්ටම්ව පැවති මෙය පසුව සතරැස් හැඩයට සාදවා ඇත. සෑම මහලක ම බිත්ති සහිත ආරුක්කු සහිත කුහර ඇතුළත දේවතා රූප ඇත. මෙම චෛත්‍ය ක්‍රමය තායිලන්තය ඇතුළු අග්නිදිග ආසියා රටවල දක්නට ලැබේ. සමකාලීනව අග්නිදිග ආසියාව සමග පැවති සම්බන්ධතාවල ප්‍රතිඵලයක් ලෙස එම රටවල නිර්මාණ ශිල්පීන්ගේ උපදෙස් ලබා ඉදිවන්නට ඇතැයි පිළිගනී. නිශ්ශංකමල්ල රජුගේ නිර්මාණයක් ලෙස සැලකේ.

අනුරාධපුර යුගයේ දී මෙන් ම මේ යුගයේ දී ද විශාල ස්තූප සිව් දිසාවෙහි වාහල්කඩ ඉදිකිරීම දක්නට ලැබේ. කිරි වෙහෙරේ හා රන්කොත් වෙහෙරේ ඇති වාහල්කඩ අනුරාධපුර යුගයේ වාහල්කඩ සැලැස්මට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් වේ. මේවා මුළුමනින් තනා තිබෙන්නේ ගඩොලිනි.

මේ කරුණු අනුව පොලොන්නරු යුගයේ ගෘහ නිර්මාණ දේශීය ස්වරූප අනුව හැඩගැසී ඇතත් ඇතැම් තැනක විදේශීය ලක්ෂණ ඉස්මතු වේ. මතු සඳහන් කළ පරිදි දේශීය නිර්මාණ ශිල්පීන්ගේ හිඟය මේ සඳහා බලපාන්නට ඇතැයි සිතිය හැකිය.

**ක්‍රියාකාරකම**

පොළොන්නරු යුගයේ ඉදි කොට තිබූ ගෘහ නිර්මාණවල ඇති විශේෂ ලක්ෂණ මැයෙන් පුවත්පතකට ලිපියක් සකස් කරන්න.



5.19 රූපය-ගල් විහාරයේ හිටි පිළිමය

## මූර්ති කලාව

අනුරාධපුර යුගයේ දී මෙන් ම පොලොන්නරු යුගයේ දී ද බෙහෙවින් බිහි වූයේ ආගමික මූර්තීන් ය. ඒවා අතර බුද්ධරූප, බෝධිසත්ව රූප හා දේවතා රූප වේ.

පොළොන්නරු යුගයට අයත් යැයි පැහැදිලිව කිවහැකි ප්‍රතිමා දක්නට ලැබෙන්නේ පොළොන්නරුවේ ගල්විහාරයේ ය. පොළොන්නරු වටදාගෙයි ඇති බුදුපිළිම හතර ද මේ යුගයට අයත් ය.

පොළොන්නරු යුගයේ මූර්ති ශිල්පීන්ට වඩා රුචිකර වී තිබුණේ විහාර දොරටුවල පියගැට අලංකාර කැටයමින් සැරසීමට ය. මකර හැඩයගත් කොරවක් ගල් මිනිස් වෙස් ගත් නාග රූප, මුරගල් හා සඳකඩපහණ යන මේවා පියගැට පෙළ සැරසීම සඳහා තෝරාගත් වස්තු විෂයයන් විය.

පොළොන්නරු යුගයේ සඳකඩපහණ නිර්මාණය අතින් පරිහානියක් පෙන්නුම් කරන බව විචාරකයෝ පෙන්වා දෙති. මේ යුගයට අයත් එකම කලාත්මක සඳකඩපහණ

ලෙස හඳුනාගෙන තිබෙනුයේ වටදාගෙයි උතුරු දොරටුවේ ඇති සඳකඩපහණ පමණි. අනුරාධපුර යුගයේ සඳකඩපහනවල නෙළා ඇති ඇතා, සිංහයා, අශ්වයා සහ ගවයා යන සතුන් හතරදෙනා එකිනෙකා පිටුපස දිව යන ආකාරය දැක්වෙන තනි පේළිය වෙනුවට මේ යුගයේ නිර්මාණවල ගවයා හැර අනිත් සතුන් තුන්දෙනා එක් එක් පේළිය බැගින් වෙන වෙනම දක්වා ඇත්තේ ය. ගවයා ඇතුළත් නොකිරීම පිළිබඳව මත දෙකක් පවතී. එක් මතයකින් කියවෙන්නේ ශිව ආගමික අදහස් මගින් ඉවත් වූ බව ය. දෙවැන්න අනුව මේ යුගයේ වඩුවන් බොහොමයක් දකුණු ඉන්දියානුවන් වීම එයට හේතු බව ය.

පොළොන්නරු යුගයට අයත් ලෝකඩ නිර්මාණ කීපයක් ලැබී ඇත. අංක 02 ශිව දේවාල භූමියෙන් සොයාගෙන ඇති ශිව රූප සමූහය හා එම භූමියෙන් සොයාගෙන දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති නටරාජ රූප විශිෂ්ට නිර්මාණ ලෙස සැලකේ. පොළොන්නරුව කෞතුකාගාරයේ ද මෙවැනි ශිව ආගමික ලෝකඩ නිර්මාණ කීපයක් වේ. මේ සියල්ල ම චෝළ පාලකයන් විසින් දකුණු ඉන්දියාවෙන් ගෙන එන්නට ඇතැයි විශ්වාස කරනු ලැබේ.

**චිත්‍ර කලාව**

පොළොන්නරු යුගයේ දියුණු චිත්‍ර කලාවක් පැවති බවට සාහිත්‍ය මූලාශ්‍රවලින් විස්තර කරන සියලු තොරතුරු තහවුරු කිරීමේ පුරාවිද්‍යාත්මක සාධක අද දක්නට නැත.

මහියංගණ චෛත්‍යයේ ධාතු ගර්භයේ තිබී සොයාගනු ලැබූ සිතුවම් කැබලි පොළොන්නරු යුගයට අයත් බව පැවසේ. පළමුවන විජයබාහු කාලයට අයත් ලෙස සැලකෙන එකී සිතුවම් බුදුරජාණන් වහන්සේ මාරසේනා ජය ගැනීම දක්වන අතර එහි බුදුන් වහන්සේ දෙව් බඹුන් පිරිවරා බෝරුකක් මුල වැඩ සිටින අයුරු පෙන්වා ඇත. මෙහි විෂ්ණු හා ශිව දෙවියන් පැහැදිලිව හඳුනා ගතහැකි බව විචාරකයෝ පෙන්වා දෙති.

පොළොන්නරු යුගයට අයත් යැයි නිසැක ලෙස හඳුනාගෙන ඇති දිඹුලාගල මාර විදියේ සිතුවම් විනාශ කොට තිබීම නිසා පැහැදිලි අවබෝධයක් ලබාගත නොහැකිය. දිඹුලාගල පුල්ලිගොඩ පර්වත කුහරයක තිබෙන චිත්‍රයෙන් පෙන්නුම් කරන්නේ රැස් වළලු සහිත දෙවිවරු පස්දෙනෙක් මල් ගත් අත් ඇතිව දෙව් බඹුන් බුදුරජුන්ට වැඳුම් පිඳුම් කිරීම දක්වන සිතුවමක කොටසක් සේ මෙය සලකා ඇත.

පොළොන්නරු ගල් විහාර විද්‍යාධාර ලෙනෙහි චිත්‍ර කැබලි කීපයක් දක්නට ලැබේ. එහි පර්වත බිත්තිය මැද නෙළා තිබෙන බුද්ධ රූපය පිරිවරා ගත් දෙව් බඹුන් දක්වන සිතුවමේ දික් රැවුලක් හා අතේ මලක් ඇති උඩුකය රූපය පිළිබිඹු කරන්නේ මහා බ්‍රහ්මයා විය යුතුයැයි මහාචාර්ය පරණවිතාන මහතා විශ්වාස කරයි. ඒ හැරුණු විට ලංකාතිලක

විහාරයේ බිත්ති මුළුමනින් චිත්‍ර වලින් සරසා තිබුණු බව විශ්වාස කරන නමුත් දැනට ඉතිරිව ඇත්තේ එක් අංශයක පිහිටි දොරටුවේ ආරුක්කුවේ ඇඳ ඇති ඉතා විසිතුරු මල්කම් මෝස්තරයක් පමණි.

පොළොන්නරු යුගයට අයත් වැඩි ම චිත්‍ර සංඛ්‍යාවක් දක්නට ලැබෙන්නේ තිවංක පිළිම ගෙය නමින් හඳුන්වන විහාරයේ ය. මෙහි දැනට ඇති චිත්‍ර ඇඳ ඇත්තේ බිත්තිවල ඇතුළු පැත්තේ පසුකාලීනව කරන ලද කපරාරුවක් මතය. එහි එක් සිතුවම් තට්ටුවක් මත තවත් සිතුවම් අඳින ලද බවට සාධක තිබේ. මේ නිසා විහාරය පළමුවන පරාක්‍රමබාහු රජු සමයට අයත් වෙතත් සිතුවම් පොළොන්නරු යුගයේ අවසාන භාගයට අයත් විය හැකි බව පුරාවිද්‍යාඥයෝ පවසති.

තිවංක පිළිමගෙයි බිත්තිය ජාතක කතා පිළිබිඹු කරන චිත්‍රවලින් සරසා ඇත. සසජාතකය, මුගපක්ඛ ජාතකය හා මෛත්‍රීබල ජාතකය ලෙහෙසියෙන් හඳුනාගත හැකිව තිබේ. එහි ගර්භගෘහය හෙවත් ගන්ධකුටියේ ඇති සිතුවම් අතර බුදුන් වහන්සේ තුසිත දෙව්ලොවට වැඩම කිරීමත් විපතට පත් විශාලා මහනුවර බේරාගැනීම සඳහා ගංගා නදිය දිගේ නැවකින් වැඩම කිරීමත් පැහැදිලිව හඳුනාගත හැකිය. රේඛා ක්‍රමයට රූප නිර්මාණය කරන ලද මේ සිතුවම් සඳහා මඳ රතු, කහ සහ කොළ යන වර්ණ භාවිත කර ඇත. තිවංක පිළිමගෙයි චිත්‍ර සිංහල සිත්තරුන්ගේ දස්කම් දක්වන වැදගත් සාධක ලෙස විස්තර කළ හැකි ය.

### ක්‍රියාකාරකම

1.පහත සඳහන් නිර්මාණවලින් 03ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

පරාක්‍රමසමුද්‍රය, ආලාහන පිරිවෙණ, ගල් විහාරය, සත්මහල් ප්‍රාසාදය, තිවංක පිළිමගෙය

2. පොළොන්නරු යුගයේ පැරණි කෞතුක වස්තු 05ක පින්තූර එකතු කර ඒවා හඳුන්වා දී පොත් පිංචක් සකස් කරන්න.

# 06

# දඹදෙණි රාජධානිය ආරම්භයේ සිට කෝට්ටේ රාජධානිය බිඳවැටීම දක්වා ලංකා ඉතිහාසය



(දළ වශයෙන් 1232 සිට 1597 දක්වා කාලය මෙයට අයත් වේ)

**හැඳින්වීම**

**1215 දී කාලිංග ආක්‍රමණයෙන් පොළොන්නරුව රාජධානිය බිඳවැටිණ. ඉන් අනතුරුව ජනතාව නිරිත දිගට සංක්‍රමණය වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් දඹදෙණිය, යාපහුව, කුරුණෑගල රාජධානි බිහිවීමත් ඉන් අනතුරුව ගම්පොළ සහ කෝට්ටේ රාජධානි බිහිවීමත් සිදු විය. මෙම රාජධානිවල පැවැති දේශපාලන ආර්ථික හා ආගමික ඉතිහාසය මෙම පාඩමෙන් ඔබට ඉගෙන ගත හැකිය.**

## 6.1 නව රාජධානි බිහිවීම

පරාක්‍රම පාණ්ඩ්‍ය රජ දවස (වර්ෂ 1215) සිදු වූ කාලිංග මාඝ ආක්‍රමණයෙන් පොළොන්නරු රාජධානිය බිඳ වැටිණ. මාඝගේ කෲර පාලනයෙන් පීඩාවට පත් ජන ප්‍රධානීන්, භික්ෂූන් වහන්සේලා හා සාමාන්‍ය ජනතාව ආරක්ෂාව පතා රජරටින් බැහැර වනදුර්ග හා ගිරිදුර්ගවලින් ආරක්ෂිත ප්‍රදේශවල ජනාවාස ගොඩනගා ගත්හ. මෙලෙස ජනාවාස ගොඩනගා ගැනීමට මූලික වී ජනතාවට නායකත්වය දුන් ප්‍රභූවරු සිව් දෙනෙකු පිළිබඳ මහාවංසයේ සඳහන් කර තිබේ.

- ❖ යාපහුව පර්වතය — සුබ සෙන්පති
- ❖ ගෝවින්දමලය — බුවනෙකබාහු ආදිපාද
- ❖ දඹදෙණිය — විජයබාහු (තුන්වන විජයබාහු)
- ❖ ගංදෙනිය පර්වතය — සංඛ සෙනෙවි

## 6.2 දඹදෙණි රාජධානිය

පොළොන්නරු රාජධානිය බිඳවැටීමේ සිට වර්ෂ 1232 දී දඹදෙණි රාජධානිය පිහිටුවන තෙක් කාලපරිච්ඡේදය මෙරට ඉතිහාසයේ අවුල් වියවුල් සහිත අවධියකි. එම කාලය තුළ විජයබාහු නැමැති ප්‍රභූවරයා දඹදෙණිය මුල්කර ගනිමින් පාලන බලය ගොඩනගා ගැනීමට සමත්විය. මෙලෙස බලය ඒකරාශි කළ විජයබාහු වර්ෂ 1232 දී තුන්වන විජයබාහු නමින් දඹදෙණිය පාලන මධ්‍යස්ථානය කරගනිමින් රජ විය.


6.1 රූපය-දඹදෙණි රාජ්‍යයේ ගමන් මාර්ගය

සතුරු ආක්‍රමණ හමුවේ ගොඩනගාගත් බලය තහවුරු කර ගැනීමට දළදා වහන්සේගේ හිමිකාරිත්වය එතුමාට බලවත් ශක්තියක් විය. මාඝගේ ආක්‍රමණයෙන් පසු කොත්මලේ සඟවා ආරක්ෂා කළ දළදාව හා පාත්‍රා ධාතුව වාචිස්සර හිමියන් ඇතුළු මහතෙරවරුන් විසින් රජුට භාර දී තිබේ. එම රජතුමා කොත්මලේ සඟවා තිබූ මෙම පූජනීය වස්තූන් දඹදෙණියට වැඩමවා බෙලිගල

පර්වතය මුදුනෙහි දළදා මාළිගාවක් ඉදිකර දළදාව තැන්පත් කර තිබේ. මෙම රජතුමා වසර හතරක් රජ කර 1236 දී මරණයට පත් විය. ඔහුට පරාක්‍රමබාහු හා බුවනෛකබාහු නමින් පුතුන් දෙදෙනෙකු සිටි අතර වැඩිමහල් පුත් පරාක්‍රමබාහු එම වර්ෂයේ දී දෙවන පරාක්‍රමබාහු නමින් දඹදෙණියේ රාජ්‍යයට පත් විය.

**තුන්වන විජයබාහු රජුගේ කාර්ය සංසිද්ධිය**

- ❖ දඹදෙණි රාජධානිය ආරම්භ කිරීම.
- ❖ බෙලිගල දළදා මාළිගාව ඉදිකර වීම.
- ❖ දඹදෙණිය විජයසුන්දරාරාමය ඉදිකිරීම.
- ❖ වත්තල විජයබාහු විහාරය කරවීම.
- ❖ කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කරවීම.
- ❖ රැකවරණය පතා විදේශගත වූ භික්ෂූන් වහන්සේලා ආපසු ගෙන්වා ගැනීම.
- ❖ උපසම්පදා මංගල්‍යය යළි ආරම්භ කර සංඝ සංශෝධනයක් කිරීම.
- ❖ පැරණි පොතපත නැවත ලියවීම.



6.2 රූපය-විජය සුන්දරාරාමයෙහි තිබෙන වටදාගෙය

## දෙවන පරාක්‍රමබාහු රජතුමා (1236 - 1270)

පියරජුගේ අභාවයෙන් පසු වැඩිමහල් පුත් පරාක්‍රමබාහු රාජ්‍යයට පත්විය. එතුමා දෙවන පරාක්‍රමබාහු නමින් ප්‍රසිද්ධියට පත් විය. සංඝරක්ඛිත නාහිමි ප්‍රමුඛ මහා සංඝරත්නයෙන් අධ්‍යාපනය ලබා උගත් පඬිරුවනක් බවට පත් විය. එහෙයින් එතුමා **කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත** යන නාමයෙන් පිදුම් ලැබී ය.

**දෙවන පරාක්‍රමබාහු රජුට මුහුණ පෑමට සිදුවූ අභියෝග**

- ❖ කාලිංග මාඝගෙන් රජරට නිදහස් කරගැනීම.
- ❖ චන්ද්‍රභානුගේ ප්‍රථම සහ දෙවන ආක්‍රමණවලට මුහුණ දීම.

බෙලිගල වැඩසිටි දන්ත ධාතූන් වහන්සේ දඹදෙණියට වැඩමකරවා අති උත්කර්ෂවත් දළදා පූජාවක් පවත්වා මාඝගෙන් රට නිදහස් කරගන්නා බවට එතුමා ප්‍රතිඥා දී තිබේ. රජු කාලිංග මාඝ සමඟ සටනට සූදානම් වෙමින් සිටිය දී චන්ද්‍රභානු නම් ජාවක ආක්‍රමණිකයා විශාල හමුදාවක් සමඟ ලක්දිවට ගොඩ බැස්සේය. මලය අර්ධද්වීපයෙහි උතුරු ප්‍රදේශයේ සිට පැමිණි ඔහුගේ අරමුණ වූයේ දළදාව පැහැර ගැනීම විය හැකි ය. දෙවන පරාක්‍රමබාහු රජුගේ මෙහෙයවීම මත වීරබාහු කුමරුගේ නායකත්වයෙන් සිංහල හමුදාව චන්ද්‍රභානු පරාජය කර පළවා හරින ලදී.

දෙවන පරාක්‍රමබාහු රජුට තිබූ ප්‍රබලතම අභියෝගය වූයේ මාඝගේ පාලනයෙන් රජරට මුදවා ගැනීමයි. දකුණු ඉන්දීය දෙවන පාණ්ඩ්‍ය අධිරාජයාගේ ද සහය ලබා ගත් රජු ඉතා සැලසුම් සහගත ව නැගෙනහිරින් හා බටහිරින් පොළොන්නරුව වටකර ප්‍රබල ප්‍රහාරයක් එල්ල කළේ ය. මෙම ප්‍රහාරයෙන් මාඝගේ හමුදාව අන්ත පරාජයකට පත්විය. ඒ අනුව වසර 40ක් පුරාවට පැවති කාලිංග පාලනයෙන් 1255 දී පොළොන්නරුව නිදහස් කර ගැනීමට සමත්විය.

පරාජයට පත්ව පලාගිය චන්ද්‍රභානු ඉන්දියාවෙන් කුළී හමුදාවක් රැගෙන නැවත දඹදෙණිය ආක්‍රමණය කළේ ය. මෙහිදී පාණ්ඩ්‍ය අධිරාජයාගේ උදව් ලබාගත් දෙවන පරාක්‍රමබාහු රජු චන්ද්‍රභානු ඝාතනය කර රාජ්‍යය ආරක්ෂා කර ගැනීමට සමත් විය. මෙලෙස සතුරාගෙන් රට නිදහස් කරගත් එතුමා දේවපතිරාජ ඇමතිවරයා යොදවා ආර්ථික, ආගමික හා අධ්‍යාපනික අංශවල විශාල දියුණුවක් ඇති කර තිබේ.

**දෙවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන්**

- කාලිංග මාඝගෙන් පොළොන්නරුව නිදහස් කර ගැනීම.
- චන්ද්‍රභානුගේ ආක්‍රමණය පරාජය කිරීම.
- දඹදෙණිය දළදා මාළිගාව ඉදිකිරීම.
- භික්ෂූන්ගේ විනය නීති පිළිබඳ දඹදෙණි කතිකාවත සම්පාදනය කිරීම.
- උපසම්පදා උත්සව පැවැත්වීම.
- විදේශවලින් විනයධර ධර්මධර භික්ෂූන් වැඩමකරවීම.
- කව්සිළුමිණ හා විශුද්ධි මාර්ග සන්නස යන කෘති රචනා කිරීම.

පරාක්‍රමබාහු රජු මිය ගිය පසු ඔහු පුත් බෝසත් විජයබාහු රාජ්‍යයට පත් විය. ඔහු එනමින් සිටි හතරවැන්නා යි. ඔහුගේ රාජ්‍ය කාලය වසර දෙකකට සීමා විය. (1270 - 1272)


රජවාසලේ ඇති වූ කුමන්ත්‍රණයක දී මිත්ත සෙන්පති අතින් රජු ඝාතනයට ලක්විය. අනතුරුව රජුගේ බාල සහෝදර බුවනෙකබාහු මිත්ත සෙන්පති මරා වර්ෂ 1272 දී රාජ්‍ය බලය ලබා ගැනීමට සමත් විය. ඒ අනුව පළමුවන බුවනෙකබාහු නමින් ප්‍රසිද්ධ වූ මොහුට ගැටුම් රැසකට මුහුණ දීමට සිදුවිය. මෙම ආක්‍රමණ මැඩපැවැත්වූ රජු පසුව තම පාලන මධ්‍යස්ථානය ලෙස වඩාත් සුරක්ෂිත යාපහුව තෝරා ගත්තේ ය.

## 6.3 යාපහුව රාජධානිය

දඹදෙණියේ සිට රාජ්‍ය මෙහෙය වූ මෙම රජතුමාට ආක්‍රමණ දෙකකට මුහුණදීමට සිදුවිය. ඉන් එකක් නම් දකුණු ඉන්දියානු පාණ්ඩ්‍ය ආක්‍රමණය යි. දෙවැන්න සිංහල වන්නි ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජනය යි. විදේශ රටවල් සමඟ වෙළඳ සබඳතා ගොඩනගාගත් මොහු ආර්ථික වශයෙන් මෙන්ම ආගමික වශයෙන් ද විශාල මෙහෙවරක් ඉටුකර වර්ෂ 1284 දී මිය ගියේ ය.



6.3 රූපය-බලකොටුවට හා දළදා මළුවට පිවිසෙන පියගැට පෙළ




6.4 රූපය-යාපහුව බලකොටු නගරයේ සැලැස්ම දක්වන සටහන

බුවනෙකබාහු රජුගේ අභාවයෙන් පසු ඔහු පුත් දෙවන බුවනෙකබාහු හා හතරවන විජයබාහු රජුගේ පුත් පරාක්‍රමබාහු අතර සිංහාසනය සඳහා අරගල ඇතිවිය. මේ අවස්ථාවේ දකුණු ඉන්දියාවේ ආර්ය චක්‍රවර්තී පාණ්ඩ්‍ය හමුදාවක් සමඟ ලංකාවට පැමිණ යාපහුව බලකොටුවට පහර දී දළදා වහන්සේ රැගෙන ඉන්දියාවට ගොස් පාණ්ඩ්‍ය රජු වූ කුලසේකරට භාර දී ඇත. තුන්වන පරාක්‍රමබාහු ඉන්දියාවට ගොස් කුලසේකර රජු සමඟ සාකච්ඡා කර දළදා වහන්සේ ආපසු ලබාගෙන 1287 දී පොළොන්නරුවේ රජ විය. 1293

දී පමණ දෙවන බුවනෙකබාහු පොළොන්නරුව වටලා තුන්වන පරාක්‍රමබාහු රජු පරාජය කර දළදා වහන්සේ ලබාගෙන කුරුණෑගල රාජධානිය ආරම්භ කළේ ය.

## 6.4 කුරුණෑගල රාජධානිය

මේ අනුව කුරුණෑගල රාජධානියේ ආරම්භක පාලකයා දෙවන බුවනෙකබාහු රජු ය. එතුමාගේ අභාවයෙන් පසුව ඔහුගේ පුත් පරාක්‍රමබාහු කුරුණෑගල රාජ්‍යයට පත්විය. එතුමා එනමින් සිටි හතරවැන්නා යි.

1302 දී රාජ්‍යයට පත් එතුමා කුරුණෑගල යුගය ප්‍රභාවත් කළ ශ්‍රේෂ්ඨ නරපතියා වෙයි. බුදුදහමේ උන්නතියට මෙන් ම අධ්‍යාපනික හා ශාස්ත්‍රීය අංශයට ද විශාල සේවයක් සිදුකළ අතර එම නිසාම ඔහු පණ්ඩිත පරාක්‍රමබාහු නමින් ප්‍රසිද්ධ විය.


**හතරවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන්**

- ❖ කුරුණෑගල නගරයේ දළදා මාළිගාවක් ඉදිකර වීම.
- ❖ දළදා වහන්සේගේ ආරක්ෂාවට හා නඩත්තුවට ගම්වර පූජා කිරීම.
- ❖ දළදා සිරිත හා දළදා පූජාවලිය, සිංහල බෝධිවංසය හා අනාගත වංසය වැනි පොත් රචනා කරවීම.
- ❖ දළදා පෙරහැර නැවත ආරම්භ කිරීම
- ❖ පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීමට අනුග්‍රහය දැක්වීම.
- ❖ වීදාගම ශ්‍රී ඝණානන්ද පිරිවෙණට හා තොටගමුවේ විජයබා පිරිවෙණට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.
- ❖ මහනුවර අස්ගිරි සේනාසනය ආරම්භ කිරීම.

හතරවන පරාක්‍රමබාහු රජුගේ අවසාන රාජ්‍ය වර්ෂය 1326 ලෙස නිගමනය කර තිබේ. බෝදාමාපා නම් ප්‍රභුවරයා විසින් ඇතිකරන ලද කැරැල්ලකින් එතුමා ඝාතනයට ලක් විය. ඉන් අනතුරුව තෙවන බුවනෙකබාහු රාජ්‍යයට පත්විය. ඔහු කුරුණෑගල වැව ඉදිකරන ලදැයි ජනප්‍රවාදයේ සඳහන් වේ. ඔහුගෙන් පසුව පස්වන විජයබාහු රාජ්‍යයට පත්ව තිබේ. මෙම රජවරුන් පිළිබඳව සහ ඔවුන්ගේ රාජධානි පිළිබඳ නිශ්චිත තොරතුරු සඳහන්ව නැත.



6.5 රූපය-ඇතුගල සහ වැව




6.6 රූපය-කුරුණෑගල පැරණි නගර සැලැස්ම දක්වන සටහන

## 6.5 ගම්පොළ රාජධානිය

වර්ෂ 1341 දී හතරවන බුවනෙකබාහු රජු විසින් ගම්පොළ රාජධානිය පිහිටුවන ලදි. කුරුණෑගල අවසන් පාලකයා වූ හතරවන විජයබාහු රජුගේ පුතෙකු වන බුවනෙකබාහු ගම්පොළ සිය රාජධානිය ලෙස තෝරා ගත්තේ එය ආරක්ෂිත ස්ථානයක් වූ නිසා ය. එය කුරුණෑගල රාජධානිය බිඳවැටීමත් සමඟ ඇති වූ ව්‍යාකූල දේශපාලන පසුබිම මත බිහි වූ පාලන මධ්‍යස්ථානවලින් එකකි..

**එම පාලන මධ්‍යස්ථාන,**

- ❖ ගම්පොළ — සිව්වන බුවනෙකබාහු
- ❖ දැදිගම — පස්වන පරාක්‍රමබාහු
- ❖ යාපනය — ආර්ය චක්‍රවර්තී
- ❖ රයිගම — අලකේශ්වර පවුල

මෙම පාලන මධ්‍යස්ථාන අතුරෙන් ගම්පොල ප්‍රධාන රාජධානිය ලෙස වර්ධනය විය. එම වර්ධනයට බලපෑ ප්‍රධාන පවුල් දෙකක් තිබේ. එනම් සේනාලංකාධිකාර සෙනෙවිරත් පවුල හා අලකේශ්වර පවුල යි.

සිව්වන බුවනෙකබාහු රජුගෙන් පසුව ගම්පොල රාජ්‍යයට පත්වූයේ පස්වන පරාක්‍රමබාහු රජු ය. ඔහු ද තම අගමැතිවරයා ලෙස සේනාධිලංකාධිකාර සෙනෙවිරත්



6.7 රූපය-ඇම්බැක්කේ ලී කැටයම්

පත්කර ගත් අතර ඔහු දකුණේ ආගමික කටයුතු මෙහෙය වීය. ගම්පොළ තුන්වන වික්‍රමබාහු රජ සමයේ බලවත් වූ යාපනයේ ආර්ය චක්‍රවර්තීන් පානදුර දක්වා අයබදු ලබාගෙන තිබේ. එහි දී නිශ්ශංක අලකේශ්වර කෝට්ටේ බලකොටුවක් ඉදිකර ආර්ය චක්‍රවර්තීන් පලවා හැරීමට සමත් විය. මෙලෙස ශක්තිමත් වූ ගම්පොළ රාජ්‍ය සමය ප්‍රභූ පවුල් දෙක අතර මත භේද හේතුවෙන් දුර්වල විය.

ගම්පොළ රාජ්‍යයේ අවසාන කාලයේ දී චීන ආක්‍රමණ එල්ල විය. එනම් වර්ෂ 1405, 1409, 1411 යන වසරවල යුං ලෝ අධිරාජයාගේ (ස්)චං හ සෙනෙවියා ලංකාවට පැමිණ තිබේ. මුල් ගමනේ දී රයිගම වීර අලකේශ්වර සෙනෙවියා ඔහුව පිළිනොගැනීම හේතුවෙන් ගෙන ආ පුද පඬුරු දෙවුන්දර දේවාලයට පූජා කොට එහිදී ඔහු චීන, පර්සියානු හා දෙමළ භාෂාවලින් ගාල්ලේ ත්‍රිභාෂා ලිපිය පිහිටුවා චීනයට ගිය බව සඳහන් වේ. ඉන් අනතුරුව වර්ෂ 1411 දී විශාල හමුදාවක් සමඟ පැමිණ අලකේශ්වර හමුදාව සමඟ සටන්කර ඔවුන් සිරකරුවන් ලෙස චීනයට රැගෙන ගිය බව සඳහන් වේ. ඒ අනුව ගම්පොළ රාජධානිය බිඳවැටිණ.

## 6.6 කෝට්ටේ රාජධානිය



6.8 රූපය-ලංකාතිලක විහාරය

ගම්පොළ රජ සමයේ දී තුන්වන වික්‍රමබාහු රජුගේ අගමැතිවරයා වශයෙන් සිටි නිශ්ශංක අලකේශ්වර කෝට්ටේ බලකොටුවක් ඉදිකළ බව ඉහත සඳහන් කෙරිණි. මෙම බලකොටුව ප්‍රථමවරට රාජධානිය ලෙස ගොඩනගා කෝට්ටේ රාජධානිය ආරම්භ කරන්නේ පරාක්‍රමබාහු රජතුමා විසිනි. ඔහු හයවන පරාක්‍රමබාහු නමින් හැඳින්වේ. වීදාගම මහා ස්ථවිරයන් වහන්සේ යටතේ රැකවරණය ලැබූ පරාක්‍රම කුමරු උන්වහන්සේගේ අනුග්‍රහයෙන් වර්ෂ 1412 දී රයිගම රාජ්‍යයට පත්විය. එහි වසර තුනක් පාලන කටයුතු මෙහෙයවා වර්ෂ 1415 දී කෝට්ටේ රාජ්‍යය පිහිටුවා හයවන පරාක්‍රමබාහු නමින් අභිෂේක ලැබීය. ඔහුගේ පියා ජයමහලැන විය. මව සුනේත්‍රා දේවිය යි. වසර 1415 සිට 1467 දක්වා දීර්ඝ කාලයක් රට පාලනය කළ රජු අවසන් වරට රට එක්සේසත් කළ සිංහල රජු ලෙස සඳහන් වේ.

**හයවන පරාක්‍රමබාහු රජුගේ සමයේ වැදගත් දේශපාලන සිදුවීම්**

- ❖ වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කරගැනීම.
- ❖ සපුමල් කුමරු යටතේ හමුදාව යවා යාපනය ජය ගැනීම.
- ❖ උඩරට ජෝතිය සිටාණන් ඇති කළ කැරැල්ල අම්බුළුගල කුමරු යවා මැඩ පැවැත්වීම.
- ❖ වන්නි ප්‍රදේශවල ස්වාධීනව නැගී සිටි නායකවරු අවනත කර ගැනීම.
- ❖ රටේ අධ්‍යාපන හා ආගමික සාහිත්‍ය කටයුතුවල දියුණුවක් ඇති කිරීම.
- ❖ විජයනගර් අධිරාජ්‍යයේ තොටුපලක් ආක්‍රමණය කිරීම.
- ❖ දකුණු ඉන්දියාවේ අදිවිරරාම පටුන ආක්‍රමණය කිරීම.
- ❖ චීනය සමග සමීප සබඳතා පැවැත්වීම.

හයවන පරාක්‍රමබාහු රජුගෙන් පසු රජුගේ දියණිය වූ උලකුඩය දේවියගේ පුතා ජයබාහු නමින් රජ විය. මේ පුවත සැලවූ යාපනේ පාලක සපුමල් කුමරු සිය සේනාව සමඟ පැමිණ ජයබාහු රජු මරා කෝට්ටේ රාජ්‍යය අල්ලා ගත්තේ ය. මේ සිදුවීමෙන් කෝපයට පත් පස්දුන් කෝරලයේ කැකුලන්දල සිරිවර්ධන පතිරාජ, කුරගම හිමියාණන් වැනි ජන ප්‍රධානින්ගේ නායකත්වයෙන් බුවනෙකබාහු රජුට විරුද්ධව කැරැල්ලක් ඇති විය. ''සිංහල පෙරළිය, සිංහල සංසය" යන නමින් හඳුන්වන මෙම කැරැල්ල මර්ධනය කළ සපුමල් කුමරු හයවන බුවනෙකබාහු නමින් කෝට්ටේ රජ විය. කැරලි නායකයන් අත් අඩංගුවට ගත් රජු ඔවුන්ට අභය දානය දී දැදිගම සෙල්ලිපිය පිහිටුවා තිබේ. මේ නිසා දැදිගම සෙල්ලිපිය අභයදාන ශිලාලේඛනය ලෙස හඳුන්වයි.

හයවන බුවනෙකබාහු රජුගේ අභාවයෙන් පසු ඔහු පුත් පරාක්‍රමබාහු රාජ්‍යයට පත් විය. එතුමා එනමින් සිටි හත්වැන්නා වේ. රජුට එරෙහි වූ අම්බුලුගල කුමරු රජු බලයෙන් නෙරපා අටවන වීරපරාක්‍රමබාහු නමින් රජ විය. එතුමා රජ කරන විට වර්ෂ 1505 දී පෘතුගීසි ජාතික ලොරෙන්සෝද අල්මේදා ඇතුළු නාවික කණ්ඩායම ලංකාවට පැමිණ තිබේ. අටවන වීරපරාක්‍රමබාහු රජු මිය යාමත් සමඟ ඔහු පුත් විජයබාහු කුමරු වර්ෂ 1509 දී හයවන විජයබාහු නමින් රජ විය. වර්ෂ 1521 සිදුවූ විජයබා කොල්ලය නම් ඓතිහාසික සිදුවීමෙන් විජයබාහු රජු මිය ගියේ ය. ඉන් අනතුරුව කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදීයාමත් සමඟ කෝට්ටේ රාජ්‍යය පරිහානියට පත්විය. 1521 දී හත්වන බුවනෙකබාහු රජ විය. ඔහුගෙන් පසුව රාජ්‍ය උරුමයට පුතෙකු නොසිටි බැවින් සිංහාසනය සඳහා ගැටුම් ඇතිවිය.

ඒ අනුව පෘතුගිසීහු ද කෝට්ටේ රාජ්‍යයට සම්බන්ධ වූහ. කෝට්ටේ රාජ්‍යයේ අවසාන පාලකයා වූ ධර්මපාල රජු තමාගෙන් පසු රාජ්‍ය උරුමයට පුතෙකු නොසිටි බැවින් තෑගි ඔප්පුවක් මගින් පෘතුගීසීන්ට පවරණ ලදී.

ධර්මපාල රජු වර්ෂ 1597 දී මිය යාමත් සමග කෝට්ටේ රාජ්‍යය පරිසමාප්තාර්ථයෙන් ම පෘතුගීසීන් සතු විය.

## 6.7 යාපනය රාජ්‍යය

යාපනය රාජ්‍යය පිළිබඳ තොරතුරු අධ්‍යනය කිරීමේදී වැදගත් මූලාශ්‍රය වන්නේ යාල්පාන වෛපමාලෛ නම් ග්‍රන්ථය යි. එහෙත් එයද 18 වන සියවසේ රචනා කරන ලද්දකි. ඊට අමතරව කෛලායමාලෛ සහ ශේගරාශසේකරමාලෛ වැනි ග්‍රන්ථ ද වැදගත් වේ. මෙම ග්‍රන්ථ හැරුණු විට යාපනයේ රාජ්‍යයේ ආරම්භය හා ඉතිහාසය හැදෑරීමට වෙනත් මූලාශ්‍රය නොමැත. ක්‍රි. ව. දහතුන්වන සියවසේ රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමත් සමඟ ආරම්භ වන යාපන ප්‍රාදේශීය රාජ්‍යයේ ආරම්භක පාලකයා ලෙස විජය කුලංකෛ ආර්ය චක්‍රවර්තීන් හඳුන්වා තිබේ.

ක්‍රි. ව. දහතුන්වන සියවස තෙක් යාපනය ප්‍රදේශය අනුරාධපුර හා පොළොන්නරුව රාජ්‍ය යටතේ පාලනය වූ බව පුරාවිද්‍යා මූලාශ්‍රය හා සාහිත්‍ය මූලාශ්‍රය අනුව තහවුරු වේ. ක්‍රි. ව. පළමුවන සියවසේ වසභ රජුගේ ඉසිගිරිය ඇමතිවරයා, යාපනය පාලනය කළ බව වල්ලිපුරම් රන් සන්නසේ සඳහන් වේ. පළමුවන විජයබාහු රජු ජම්බුකෝලපට්ටන විහාරය ප්‍රතිසංස්කරණය කළ බව ද මහා පරාක්‍රමබාහු රජු රාමඤ්ඤ දේශය හා දකුණු ඉන්දියාවට විරුද්ධව සේනාව සංවිධානය කිරීමේදී උතුරු හා නැගෙනහිර තොටුපලවල්වලට සේනාව රැස්කළ බව ද සඳහන් වේ. මෙසේ දහතුන්වන සියවසේ ආරම්භ වන යාපනය රාජ්‍යය පහත දක්වෙන ආර්ය චක්‍රවර්ති රජවරු දොළොස් දෙනෙකු පාලනය කළ බව යාල්පාන වෛපමාලෛ කෘතියේ සඳහන් වේ.

| | |
|---|---|
| විජය කුලංකෛ | කණකශූරිය |
| වික්කිරම | කුලශේකර ශින්කෛ |
| මාර්තණ්ඩ | වරෝදය II |
| වරෝදය I | කුණ්පූෂණ |
| ජයවීර | පරරාජශේඛරන් |
| කුණවීර | සංකිලි |

මේ රජවරුන් රාජ්‍යයට පත්වූ අනුපිළිවෙල පැහැදිලි නැති අතර මේ පිළිබඳ තොරතුරු ලැබෙන මූලාශ්‍රය අවම වීම ද ගැටලුවකි. වරෝදය රජු අන් සියලු රජුන්ට වඩා සිංහල දෙමළ ජනතාව අතර ඉතා ජනප්‍රිය විය. ගම්පොළ රජ දවස යාපනය පාලකයෝ වඩාත් බලවත් වූහ. වර්ෂ 1344 දී ඉබ්න් බතුතා ලංකාවට පැමිණෙන විට ආර්ය චක්‍රවර්තීන්

යාපනයේ ශක්තිමත් පාලනයක් ගෙන ගිය බව සිය වාර්තාවල සඳහන් කර තිබේ. කෝට්ටේ රජ සමයේදී හයවන පාරක්‍රමබාහු රජු සපුමල් කුමාරයා යවා යාපනය ප්‍රදේශය කෝට්ටේ රාජ්‍යය යටතට පත්කර ගෙන තිබේ. හයවන පරාක්‍රමබාහු රජුගේ අභාවයෙන් පසු යාපනය නැවත ස්වාධීන විය.

පෘතුගීසී ලංකාවට පැමිණෙන විට පරරාජශේඛරන් යාපනය පාලනය කළ අතර වර්ෂ 1519 දී සංකිලි රජු යාපනයේ රජවිය. පෘතුගීසී තමන්ට ගැති පාලකයන් යාපනයේ බලයට පත්කරමින් තම අවශ්‍යතා ඉටුකර ගැනීමට සමත් වූහ. වර්ෂ 1619 දී පිලිප් ද ඔලිවේරා යටතේ පෘතුගීසීන් විසින් යාපනය යටත්කර ගන්නා ලදී.

**යාපනය රාජ්‍ය බිඳ වැටීමට බලපෑ හේතු,**

- ❖ රාජ්‍ය උරුමක්කරුවන් අතර අරගල ඇතිවීම.
- ❖ ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් නොසිටීම.
- ❖ ස්වාභාවික ආරක්ෂාව නොතිබීම.
- ❖ පෘතුගීසීන්ගේ යුධ ශක්තිය හා උපාය මාර්ග

## 6.8 දඹදෙණි යුගයේ සිට ආර්ථික ,ආගමික, සාහිත්‍ය

### 6.8.1 ආර්ථික තත්වය

අනුරාධපුර හා පොළොන්නරු රාජධානි බිඳවැටීමෙන් පසු තෙත් කලාපීය ප්‍රදේශ කරා සංක්‍රමණය වූ ජනතාවට නව භූගෝලීය පරිසරයට හැඩගැසීමට සිදුවිය. වනදුර්ග හා ගිරිදුර්ග ආශ්‍රිතව රාජධානි බිහිවීමත් අගනුවර දීර්ඝ කාලයක් එක් ස්ථානයක නොපැවතීමත් කෘෂි කාර්මික කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් අහස් දිය යොදා ගැනීමත් නිසා මහ වැව් හා වාරිමාර්ග ඉදිකිරීම අඩාල විය. ප්‍රධාන ජීවනෝපාය වී ගොවිතැන වූ අතර කඳුකර ප්‍රදේශවල හේන් ගොවිතැන ද විය. අපනයන භෝග වගාව කෙරෙහි ද වැඩි උනන්දුවක් දක්වා තිබේ.

වෙළඳාම ද ආර්ථිකයේ ප්‍රධාන අංශයක් වූ අතර රජුගේ ඒකාධිකාරිත්වයෙන් එය සිදුව තිබේ. මීට පෙර පැවතුණු ආකාරයට දේශීය වෙළඳාම මෙන් ම විදේශීය වෙළඳාම ද පැවතිණි. මීට අමතරව විවිධ කර්මාන්ත පැවති බවට සාධක ලැබේ. මේ පිළිබඳ දළ සටහනක් පහත දක් වේ.

**ලංකාවේ විදේශීය වෙළඳපොළවල්**

ඉන්දියාව, චීනය, අරාබිය, පර්සියාව, ඊජිප්තුව, බුරුමය

**අපනයනය කළ භාණ්ඩ**

කුරුඳු, එනසාල්, සාදික්කා, ගම්මිරිස්, මුතු, මැණික්, ඇත්දළ, අලි, ඇතුන්, මී ඉටි, ගොරක

**ආනයනය කළ භාණ්ඩ**

පිඟන් භාණ්ඩ, සුවඳ විලවුන්, සේද රෙදි, රත්තරං, තඹ

6.8.2 ආගමික තත්වය

මෙම රාජධානි සමයේ ද ප්‍රධාන ආගම වූයේ බුදුදහම යි. බුදුදහමට අනුග්‍රහ දැක්වීම තම කාර්ය වශයෙන් සැලකූ රජවරු දළදා මන්දිර තැනවීම හා බොහෝ වෙහෙර විහාර ඉදි කළහ. දළදාව ආරක්ෂා කර ගැනීම තම වගකීම බව රජවරු කල්පනා කළහ. එය තමා සන්තක කර ගැනීම දේශපාලන බලය තහවුරු කර ගැනීමට ද හේතු වන බව ඔවුහු දැන සිටියහ. ලංකාවේ උපසම්පදාව බිඳ වැටෙන විට විදේශ රටවලින් ආධාර ලබා උපසම්පදාව නැවත ප්‍රතිෂ්ඨාපිත කර තිබේ. මීට අමතරව මහායාන හා හින්දු විශ්වාස වර්ධනය වී තිබුණි. මේ නිසා දේව වන්දනය කෙරෙහි පාලකයන් මෙන් ම සාමාන්‍ය ජනතාව ද උනන්දුවක් දක්වා ඇත. එය විහාරස්ථාන ආශ්‍රය කර ගනිමින් හෝ එසේ නොමැතිව විවිධ දෙවියන් අරබයා දේවාල ඉදි කර ඇත්තේ එහෙයිනි. මෙම දේවාලවලින් බොහොමයක් උපුල්වන්, සමන්, විභීෂණ හා ස්කන්ධ කුමාර වෙනුවෙන් කැප කරන ලද ඒවා ය. දේව විශ්වාසය තවදුරටත් තහවුරුවීමක් සන්දේශ සාහිත්‍යයෙන් පිළිබිඹු වේ.

විදේශීය වෙළඳුන් සඳහා වූ දේවාල විශේෂයෙන් වරාය නගරවල ඉදි කර තිබූ බව පෙනේ. ගාල්ලේ ත්‍රිභාෂාමය ශිලා ලේඛනය පිළිබිඹු කරන්නේ ආගමික සහජීවනය යි. එය චීන ජාතිකයෙකු විසින් පිහිටන ලද්දක් වුවත් ලංකාවේ ස්ථාපිත කර තිබීමෙන් පෙනී යන්නේ ලංකාව තුළ ඕනෑම ආගමක් ඇදහීමට ජනතාවට අයිතිය තිබූ බව යි.

6.10 වාස්තු විද්‍යාව

දේශීය වාස්තු විද්‍යාව දකුණු ඉන්දියානු ආභාෂයෙන් පෝෂණය වී ඇති බව පෙනී යයි. සමස්තයක් වශයෙන් සලකන විට මෙකල වාස්තු විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ මෙසේ හඳුනා ගත හැකි ය.

- යාපහුවේ පියගැටපෙළට හා එහි කුළුණුවලට පාණ්ඩ්‍ය හා කාම්බෝජ ආභාසය ලැබීම.
- ගඩලාදෙණිය විහාරයේ පිළිමගෙය දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශෛලියේ ආභාසයෙන් ඉදි කර තිබීම.
- අගනා ලී කැටයමින් අලංකාර කොට ඇම්බැක්කේ දේවාලය ඉදි කිරීම.
- මහායාන අදහස් හා දේව විශ්වාස බලපෑම් මත පිළිමගෙයට සම්බන්ධකර දේවාල ඉදිකර තිබීම.

## 6.11 භාෂාව හා සාහිත්‍යය

දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජු බොහෝ සාහිත්‍ය පොත ලියා භාෂාවේ හා සාහිත්‍යයේ උන්නතියට විශාල සේවයක් කර තිබේ. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් එතුමා පිදුම් ලැබුවේ ඒ නිසා ය. කව්සිළුමිණ මහා කාව්‍යය ඔහුගේ නිර්මාණයකි. ඔහුගේ අනුග්‍රාහකත්වය ලැබූ භික්ෂූන් වහන්සේලා ද සාහිත්‍ය ග්‍රන්ථ රචනා කරමින් භාෂා හා සාහිත්‍ය වර්ධනයට ඉමහත් දායකත්වයක් සැපයූහ. ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලිය, මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන්ගේ පූජාවලිය වැනි බොහෝ පොත-පත දඹදෙණි යුගයේ රචනා වී තිබේ.

**දඹදෙණි යුගයේ රචිත ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| ❖ | කව්සිළුමිණ | පූජාවලිය |
| ❖ | සද්ධර්මරත්නාවලිය | දඹදෙණි කතිකාවත |
| ❖ | එළුසඳැස්ලකුණු | කඳවුරු සිරිත |
| ❖ | යෝගාර්ණවය | විශුද්ධිමාර්ග සන්නස |
| ❖ | සමන්තකූට වර්ණනා | රසවාහිනීය |
| ❖ | සාරසංග්‍රහය | භේසජ්ජමංජුසා |
| ❖ | හත්ථවනගල්ල විහාරවංශය | ථූපවංශය |

කුරුණෑගල හතරවන පරාක්‍රමබාහු රජතුමා ද භාෂාව හා සාහිත්‍යය නඟාසිටුවීමට අනුග්‍රහය දක්වා තිබේ.

**කුරුණෑගල යුගය**

- ❖ සිංහල පන්සිය පනස් ජාතක පොත
- ❖ දළදාසිරිත
- ❖ දළදාපූජාවලිය
- ❖ සිංහල බෝධිවංශය

ගම්පොළ යුගයේදී සන්දේශ කාව්‍ය ලිවීම ආරම්භ විය. මයුර සන්දේශය හා තිසර සන්දේශයෙන් එය පැහැදිලි වේ.

**ගම්පොළ යුගයේ රචිත ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| ❖ | මයුර සන්දේශය | තිසර සන්දේශය |
| ❖ | පාරමී ශතකය | ජිනබෝධාවලී |
| ❖ | බාලාවතාර | සද්ධර්මාලංකාරය |

සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හැඳින්විය හැකිය. හයවන පරාක්‍රමබාහු රජු ශ්‍රේෂ්ඨ නරපතියෙකුසේ ම උගත් පඬිවරයෙකු ලෙස සාහිත්‍යය දියුණු කිරීමට අනුග්‍රාහකත්වය ලබා දී තිබේ. මේ නිසා උගත් පඬිවරු රැසක් බිහිවූහ.

**කෝට්ටේ යුගයේ බිහිවූ පඬිවරු**

- ❖ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
- ❖ කැරගල වනරතන හිමි
- ❖ ඉරුගල් කුලතිලක පිරිවෙන් හිමි
- ❖ වීදාගම මෛත්‍රිය හිමි
- ❖ වෑත්තෑවේ හිමි
- ❖ ධම්මදින්න හිමි

කෝට්ටේ යුගයේ සාහිත්‍ය කෘති රැසක් බිහි විය. මෙහි ඇති විශේෂත්වය නම් සාහිත්‍යකරණය විවිධ පැතිවලට යොමු වීම යි.

**කෝට්ටේ යුගයේ සාහිත්‍යකරණයේ විවිධ පැති**

- භක්ති කාව්‍ය
- මහා කාව්‍ය
- සන්දේශ කාව්‍ය
- ප්‍රශස්ති කාව්‍ය
- උපදේශ කාව්‍ය
- කෝෂ ග්‍රන්ථ

**කෝට්ටේ යුගයේ රචිත කෘති**


- පැරකුම්බා සිරිත
- කාව්‍යශේඛරය
- බුදුගුණාලංකාරය
- ලෝවැඩ සඟරාව
- ගුත්තිල කාව්‍යය
- හංස සන්දේශය
- පරවි සංදේශය
- සැළලිහිණි සංදේශය
- ගිරා සන්දේශය
- සද්ධර්ම රත්නාකරය

කෝට්ටේ යුගයේදී බෞද්ධ අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සඳහා පිරිවෙන් රාශියක් බිහි විය.

**කෝට්ටේ යුගයේ පිරිවෙන්**

- තොටගමුවේ විජයබා පිරිවෙණ
- පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙණ
- කැරගල පද්මාවති පිරිවෙණ
- වීදාගම ඝණානන්ද පිරිවෙණ
- දෙවිනුවර ඉරුගල්කුලතිලක පිරිවෙණ

මෙසේ බිහිවූ බෞද්ධ අධ්‍යාපන ආයතන නිසා සිංහල භාෂා සාහිත්‍යයේ අභිවෘද්ධියට මහත් සේවයක් සිදු වූ බව අමුතුවෙන් කිව යුතු නැත.




**6.1 සිතියම-ලංකාවේ රාජධානිවල ව්‍යාප්තිය**
**උපුටා ගැනීම 10 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොතෙනි.**

## ක්‍රියාකාරකම්

01. පහත සඳහන් ස්ථාන ලංකා සිතියමක ලකුණු කර නම්කරන්න.

    අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, යාපනය

02. නිරිතදිග රාජධානි, පිළිබඳ කෙටි සටහන් ලියන්න.
03. හයවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන් නම්කර පැහැදිලි කරන්න.
04. දෙවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන් නම්කර පැහැදිලි කරන්න.
05. ''කෝට්ටේ යුගයේ සාහිත්‍යය'' යන මැයෙන් රචනාවක් ලියන්න.
06. ඒ ඒ යුගවල රචිත ග්‍රන්ථ සහ එහි කතුවරු පිළිබඳ පොත් පිංචක් සකස් කරන්න.
07. ගාල්ලේ ත්‍රිභාෂා ශිලා ලේඛනය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

# 07

# ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම



## හැඳින්වීම

ලංකාවට පැමිණි යුරෝපීය ජාතීන් අතරින් පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට යටත් කර ගැනීමට හැකිවූයේ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පමණි. එහෙත් 1796 දී ලන්දේසීන්ගෙන් මුහුදුබඩ ප්‍රදේශ අල්ලාගත් බ්‍රිතාන්‍යයන්ට ක්‍රි. ව. 1815 වන විට උඩරට රාජධානිය ද යටත් කරමින් මුළු ලංකාවේ ම අණසක පැතිරවීමට හැකි විය. ඉන් අනතුරුව මෙරට දේශපාලන, ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රවල වෙනස්කම් ඇති කරමින් 1948 පෙබරවාරි 4 වන දින දක්වා සියවස් එකහමාරක් පමණ කාලයක් ඔවුහු ලංකාව පාලනය කළෝ ය. ඔවුන්ගේ බලය පිහිටුවීම සහ ඔවුන්ගේ පාලනයත් ඔවුන්ගෙන් දිවයින නිදහස ලබා ගැනීමත් මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් ඉගෙනගත හැකි ය.

## 7.1 බ්‍රිතාන්‍යයන් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ ප්‍රධාන හේතු


7. 1 රූපය-ත්‍රිකුණාමල වරාය

- ලංකාව පැරණි සේද මාවතේ මධ්‍යගතව පිහිටීම
- ඉන්දියාවේ බටහිර මලබාර් වෙරළ මෙන් ම නැගෙනහිර කොරමැන්ඩල් වෙරළේ නාවික සහ වෙළඳ කටයුතු ලංකාවේ සිට මෙහෙය වීමට හැකිවීම
- ඊසාන දිග මෝසම් සුළං කාලවල දී ආරක්ෂා සහිතව නැව් විශාල ප්‍රමාණයක් නවතා තැබිය හැකි ස්වාභාවික වරායක් වූ ත්‍රිකුණාමල වරාය ශ්‍රී ලංකාවේ පිහිටා තිබීම
- ඉන්දියාවේ බලය ලබා ගැනීම සඳහා ප්‍රංශ ජාතිකයන් සමග කළ සටන්වල දී ත්‍රිකුණාමල වරායේ ඇති වැගත්කම
- කුරුඳු, ගම්මිරිස්, එනසාල්, කරාබුනැටි ආදි කුළුබඩු වර්ග ද මුතු, මැණික්, ඇත්දළ, ඇතුන් ආදී වෙළඳ භාණ්ඩ රාශියක් ද ලංකාවෙන් ලබා ගත හැකිවීම වැදගත් විය.
- යුරෝපීය වෙළඳ පොළට ගෙන යන කුරුඳු අතර ශ්‍රී ලංකාවේ කුරුඳුවලට ප්‍රමුඛස්ථානයක් හිමි වීම
- ලංකාව සමග කරන ලද වෙළඳාමෙන් පෘතුගීසීන් හා ලන්දේසීන් විශාල වශයෙන් ලාභ ලැබීම

## 7.2 බ්‍රිතාන්‍යයන් ලංකාවේ මුහුදුබඩ පළාත් යටත් කර ගැනීම

1658 සිට 1796 දක්වා ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් සතුව පැවතුණි. එම ප්‍රදේශ තමන් සතු කර ගැනීමට බ්‍රිතාන්‍යයෝ උපක්‍රමශීලීව කටයුතු කළෝ ය. යුරෝපය තුළ ඇති වූ පසුබිම ඒ සඳහා ඔවුන්ට වාසිදායක විය.



7.2 රූපය-බ්‍රිතාන්‍යයන් පෙරදිගට පැමිණීමට භාවිත කළ රුවල් නැව්

❖ 1789 ප්‍රංශ විප්ලවයෙන් පසු ප්‍රංශ ආණ්ඩුව විසින් ඕලන්දය ආක්‍රමණය කර එහි ''බතාවියානු සමූහාණ්ඩුව'' නමින් නව රජයක් පිහිටුවන ලදී.

❖ මෙම ආක්‍රමණයේදී ඕලන්දයේ පාලක වූ විලියම් කුමරු ආරක්ෂාව පතා එංගලන්තයට පලා ගියේ ය.

❖ ශ්‍රී ලංකාවේ ලන්දේසීන් සතු ප්‍රදේශ ප්‍රංශයින් විසින් අල්ලා ගැනීම වැලැක්වීම පිණිස බ්‍රිතාන්‍යයෝ එම ප්‍රදේශ තමන්ට භාර දෙන ලෙස ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාරවරයාගෙන් ලිපියක් මගින් ඉල්ලා සිටියහ. එම ලිපිය විලියම් කුමරු කිව් මාලිගයේ සිට ලියූ බැවින් "කිව් ලිපිය" ලෙස ප්‍රසිද්ධ විය.

❖ ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාරවරයා වූ ෆන්ඇංගල්බෙක් මෙයට එකඟ නොවීය. එම නිසා බ්‍රිතාන්‍යයෝ ලන්දේසී ප්‍රදේශවලට පහර දීම ආරම්භ කළේ ය. පළමුව යාපනය, මන්නාරම, කල්පිටිය, ගාල්ල යන ප්‍රදේශ පිළිවෙලින් අල්ලා ගත් අතර 1796 පෙබරවාරි මාසය වන විට ලන්දේසීන් සතුව පැවති සියළු ප්‍රදේශ අත්පත් කරගැනීමට ඉංග්‍රීසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම ප්‍රමුඛ බ්‍රිතාන්‍ය රජය සමත්විය.

**බ්‍රිතාන්‍යයන් ලංකාවේ බලය පිහිටුවා ගැනීමේ පියවර**

| | |
|---|---|
| 1796 - 1798 | මුහුදුබඩ පළාත් පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගම යටතේ පාලනය (මද්‍රාසි පාලනය) |
| 1798 - 1802 | මුහදුබඩ පළාත් බ්‍රිතාන්‍ය කිරීටය හා වෙළඳ සමාගම එක්ව පාලනය (ද්විත්ව පාලනය) |
| 1802 - 1815 | මුහුදුබඩ පළාත් බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය |
| 1815 - 1948 | දක්වා මුළු දිවයිනම බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය |

## ➢ මදුරාසි පාලනය

මුල් අවුරුදු දෙක තුළ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ වෙළඳ සමාගම මගින් පාලනය කරන ලදී. මෙය මදුරාසියේ පාලනය අනුව ගෙනගිය බැවින් මදුරාසි පාලනය නමින් හඳුන්වා ඇත. පාලනය සඳහා ලාංකික නිලධාරීන් වෙනුවට මදුරාසි නිලධාරීන් පත් කළ බැවින් අර්බුදකාරී තත්වයක් උදා විය. මෙහි ප්‍රතිඵලය වූයේ මදුරාසි පාලනය බිඳ වැටීම යි.

- ❖ 1762 දී ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමේ නියෝජිතයෙකු වූ ජෝන් පීබස් උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමු වීම.
- ❖ 1782 දී හියු බොයිඩ් රාජාධි රාජසිංහ රජු හමු වී ලන්දේසීන් ලංකාවෙන් පන්නා දැමීමට උදව් ලබා දීමට පොරොන්දු වීම.
- ❖ 1795 දී රොබට් ඇන්ඩෘස් රාජාධි රාජසිංහ රජු හමු වීම.

## ➢ ද්විත්ව පාලනය

බ්‍රිතාන්‍ය කිරීටයත් ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමත් එකට එකතු වී ගෙන ගිය පාලනය ද්විත්ව පාලනය ලෙස හැඳින්වේ. වසර හතරක කාලයක් මෙම පාලනය පැවතුන ද,

- ❖ ක්‍රි. ව. 1800 දී නෝර්ත් ආණ්ඩුකාරවරයා විසින් මැක්ඩෝවල් සහ බාබට් සෙනෙවියන් යටතේ උඩරට ආක්‍රමණය කර ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමඟ ගිවිසුමකට එළඹීමට උත්සහ ගැනීම.
- ❖ වෙළඳ සමාගමේ නිලධාරීන් හා රජයේ නිලධාරීන් අතර හොඳ සබඳතාවක් නොතිබීම.
- ❖ ආණ්ඩුකාරවරයා සමාගමට මෙන් ම කිරීටයට ද වගකීමට බැඳී සිටීම
- ❖ රජයේ නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව
- ❖ වෙළඳ සමාගමේ නිලධාරීන්ගේ වංචා, දූෂණ ආදිය නිසා ද්විත්ව පාලනය බිඳ වැටුණි.

## කිරීටය යටතේ පාලනය

ද්විත්ව පාලනය අහෝසි කොට 1802 දී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බලය සම්පූර්ණයෙන් ම කිරීටය වෙත පවරා ගන්නා ලදී. ෆෙඩ්රික් නෝර්ත් මුහුදුබඩ ප්‍රදේශවල ආණ්ඩුකාරවරයා විය.



7.3 රූපය-ෆෙඩ්රික් නෝර්ත්


**ලංකාවේ බලය තහවුරු කර ගැනීමට නෝර්ත් ගත් ක්‍රියා මාර්ග**

- ❖ රාජකාරී ක්‍රමය අවලංගු කිරීම.
- ❖ අධිකරණ ප්‍රතිසංස්කරණ සිදු කිරීම. (ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය පිහිටුවීම)
- ❖ රජයේ පාලන කටයුතු කරගෙන යෑම සඳහා මිනින්දෝරු, ප්‍රසිද්ධ වැඩ, තැපැල් ආදී දෙපාර්තමේන්තු පිහිටු වීම.
- ❖ කොළඹ සිට ගොඩබිම ඔස්සේ මහාමාර්ග ඉදිකිරීම.
- ❖ උඩරට ආක්‍රමණය (මැක්ඩෝවල් සහ බාබට් සෙනෙවිවරුන් යටතේ)

**තෝමස් මෙට්ලන්ඩ් ලංකාවේ බලය තහවුරුකර ගැනීමට ගත් ක්‍රියා මාර්ග**

- ❖ රාජකාරී ක්‍රමය නැවත ඇති කිරීම.
- ❖ දේශීය හා විදේශීය නිලධාරීන්ගේ බලතල වෙන වෙනම පැවරීම.
- ❖ බ්‍රිතාන්‍ය නිලධාරීන් විසින් සිංහල, දෙමළ, භාෂා ඉගෙන ගත යුතු යැයි උපදෙස් දීම.
- ❖ අධිකරණය හා නීති ප්‍රතිසංස්කරණ ඇති කොට ජූරිය මගින් නඩු විසඳීමේ ක්‍රමය ආරම්භ කිරීම.

1815 උඩරට ගිවිසුමෙන් උඩරට ප්‍රදේශය ද බ්‍රිතාන්‍ය කිරීටය යටතට පත්විය. එහෙයින් මුළු දිවයිනේ ම ආධිපත්‍ය බ්‍රිතාන්‍ය කිරීටය යටතට පත් විය. මේ වන විට ලංකාවේ පාලකයා වූයේ බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා ය. උඩරට පාලකයා වූයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය. ඔහු නායක්කාර පෙළපතින් පැවත එන්නෙකි.



7.4 රූපය-තෝමස් මෙට්ලන්ඩ්

## 7.3 උඩරට අල්ලා ගැනීමට ගත් ක්‍රියාමාර්ග

විශේෂයෙන් බ්‍රිතාන්‍යයන් විසින් උඩරට රාජධානිය යටත් කර ගැනීම සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් ගෙන ගිය බව පැහැදිලි වේ.

❖ රදළයින්ගේ ක්‍රියාකලාපය (ආත්මාර්ථකාමී වීම)

1. පිළිමතලාවේගේ ක්‍රියාකලාපය
2. එක්නැලිගොඩ ඉංග්‍රීසි පාර්ශ්වය ගැනීම
3. ඇහැලේපොල රජුට විරුද්ධව කැරලි ගැසීම

❖ බ්‍රිතාන්‍යයන්ගේ උපක්‍රමශීලී ක්‍රියාමාර්ග

1. තෝමස් මෙට්ලන්ඩ් සහ රොබට් බවුන්රිග් යන ආණ්ඩුකාරවරුන්ගේ මගපෙන්වීම යටතේ ජෝන් ඩොයිලි විසින් උඩරට රදළ ප්‍රධානීන් හා සියලු සමාජීය ජනතාව සමඟ සබඳතා ඇතිකර ගැනීම.

2. උඩරට තුළ බ්‍රිතාන්‍ය චරපුරුෂ සේවයක් ඇතිකොට යුධ ශක්තිය හා උඩරට මාර්ග, ආදිය පිළිබඳ වැදගත් තොරතුරු රැස් කිරීම.

3. ජෝන් ඩොයිලිගේ පෙළඹවීම මත රජු මත්පැනට ලොල්වීම.

❖ රජුගේ අදූරදර්ශී වැඩ කටයුතු

මේ සමය වන විට මත්පැන් පානයට හුරු වූ රජු විකෘති මානසිකත්වය නිසාම දරුණු ලෙස හැසිරෙන්නට විය, උඩරට සමස්ත ජනතාව රජු කෙරෙහි කලකිරුණු අතර එම අවස්ථාව ප්‍රයෝජනයට ගත් බ්‍රිතාන්‍යයන් බොරු හේතු පෙන්වා දෙමින් උඩරට ආක්‍රමණය කළේ ය.



7.5 රූපය-රොබට් බ්‍රවුන්රිග්

එම ආක්‍රමණයේ දී රජු සහ බිසෝවරු මැද මහනුවරට පලා ගියෝ ය. එහි දී රදළයින්ගේ පාවාදීම මත රජු අත්අඩංගුවට ගෙන කොළඹ කොටුවට ගෙනවිත් ඉන්දියාවේ වෙල්ලෝරයට පිටුවහල් කරන ලදී. ඉන් අනතුරුව 1815 මාර්තු මස 02 වන දින මහනුවර මගුල් මඩුවට රැස් වූ රොබට් බ්‍රවුන්රිග් සහ උඩරට රදල ප්‍රධානීන් ඇති කර ගත් ගිවිසුමෙන් උඩරට පාලන බලය බ්‍රිතාන්‍යයන්ට පවරා එම ගිවිසුම උඩරට ගිවිසුම නමින් ප්‍රසිද්ධ විය. මෙලෙස ලංකාව බ්‍රිතාන්‍යය යටත් විජිතයක් බවට පත් විය.

## 7.4 බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව පැනනැගුණු ස්වදේශීය විරෝධතා

➢ **1797 විරෝධතා අරගලය**

1796 - 1798 සමයේ ලංකාවේ පැවති මදුරාසි පාලනයේදී අනුගමනය කළ,

❖ අවුමිල්දාර්වරුන්ගේ පීඩාකාරී බදු එකතු කිරීමේ ප්‍රතිපත්තිය,

❖ මාළු, ලුණු, දුම්කොළ, රා, පොල්ගස් වැනි නව බදු වර්ග හඳුන්වා දීම,

❖ භාණ්ඩවලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීමට නියෝග කිරීම නිසා අසාධාරණයට ලක් වූ මුහුදුබඩ ප්‍රදේශයේ ජනතාව කොළඹ දිසාවනියේ හේවාගම් හා සල්පිටකෝරළයේ සිඤ්ඤෝ අප්පුගේ නායකත්වයෙන් යුතුව ඊට විරුද්ධව අරගලය සංවිධානය කර ඇත.

මෙම කැරැල්ල මර්දනය කිරීමෙන් පසු විරෝධතා අරගලයට හේතු වූ කරුණු සොයා බැලීම සඳහා කර්නල් මියුරන්, සෙන්පති ඇග්නිව්, රොබට් ඇන්ඩෘ යන ත්‍රිපුද්ගල කමිටුව පත්කළ අතර එය මියුරන් කොමිසම ලෙස හැඳින්විය.

**මියුරන් කොමිසමේ යෝජනා**


❖ අලුතින් පැනවූ බදු අහෝසි කිරීම හා ඇතැම් ඒවා සංශෝධනය කිරීම

❖ අවුමිල්දාර්වරු වෙනුවට දේශීය නිලධාරීන් බදු එකතු කිරීමට පත් කිරීම

❖ භාණ්ඩවලින් බදු ගෙවීමට අවසර ලබා දීම.

➢ **1818 ප්‍රථම නිදහස් සටන**

ක්‍රි. ව. 1815 උඩරට ගිවිසුමෙන් පසු ජෝන් ඩොයිලිගේ ප්‍රධානත්වයෙන් යුත් කොමසාරිස් මණ්ඩලයක අධීක්ෂණය යටතේ උඩරට පැරණි පාලනය ක්‍රියාත්මක විය. උඩරට බ්‍රිතාන්‍ය පාලනය ආරම්භ වී වැඩිකල් යාමට පෙර නව පාලනය කෙරෙහි රටවැසියා තුළ අප්‍රසාදයක් ඇති විය. මෙය බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව විමුක්ති ව්‍යාපාරයක් ආරම්භ වීමට පදනම සකස් කළේ ය.



**7.6 රූපය-වාරියපොල ශ්‍රී සුමංගල හිමි**

**1818 නිදහස් සටනට පසුබිම් වූ හේතු**

- බ්‍රිතාන්‍ය පාලකයන් උඩරට ගිවිසුමේ කොන්දේසිවලට අනුව ක්‍රියා නොකිරීම
- රදළ ප්‍රධානීන්ට වරප්‍රසාද හා ආදායම් මාර්ග අහිමි වීම
- භික්ෂූන් වහන්සේලා නොසලකා හැරීම සහ පොරොන්දු වූ පරිදි බුදු දහමට ගරු සැලකිලි නොදැක්වීම
- ස්වභාෂා හා සිරිත් විරිත් පිළිබඳ දැනුමක් නැති, බ්‍රිතාන්‍යයන් විසින් පාලන කටයුතු ගෙනයාම නිසා උඩරට ප්‍රදේශවල ව්‍යාකූල බවක් ඇති වීම
- උඩරට පැවති සාම්ප්‍රදායික ක්‍රමවේදයට පටහැනිව යමින් හජ්ජි මරික්කාර් නම් මුස්ලිම් ජාතිකයෙකු වෙල්ලස්ස ප්‍රදේශයේ මුහන්දිරම් තනතුරට පත්කිරීම
- උඩරට රාජ්‍යයට උරුමකම් කියමින් දොරේසාමි නම් පුද්ගලයෙකු ඌව ප්‍රදේශයෙන් බිහි වීම (කතරගම දෙවියන් විසින් තමන් රජකමට පත් කරන ලද බව ප්‍රකාශ කිරීම)

**අරගලයේ ආරම්භය සහ ව්‍යාප්තිය**

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ඥාතියෙකු ලෙස පෙනී සිටිමින් උඩරට සිහසුනට උරුමයක් ඇති බව පැවසූ දොරේසාමි වෙත ඌව වෙල්ලස්ස ජනතාව ඒකරාශී වන්නට වූහ. මෙම තත්වය පාලනය කොට දොරේසාමිව අත්අඩංගුවට ගැනීමට ගිය සිල්වෙස්ටර් විල්සන් හා හජ්ජි මරික්කාර් සිංහලයන් අතින් මරණයට පත්වූහ.

සටන මර්ධනය කිරීමට ගිය ඌවේ දිසාව භාරව සිටි මොණරවිල කැප්පෙටිපොල කැරලිකරුවන් හා එක්විය. ඉන්පසු පළමු නිදහස් සටනේ නායකත්වය කැප්පෙටිපොල නිලමේවරයාට හිමි වූ අතර ක්‍රමයෙන් සටන දුම්බර, හේවාහැට, හාරිස්පත්තුව, මාතලේ ආදී ප්‍රදේශවලට පැතිර ගියේ ය.

**පළමු නිදහස් සටනේ නායකයෝ**

- මොණරවිල කැප්පෙටිපොල දිසාවේ
- මඩුගල්ලේ දිසාවේ
- පිළිමතලව්වේ දෙවන අධිකාරම්
- හුටැවේ රටේ රාල
- කොහුකුඹුරේ රටේ රාල
- දිඹුලාන දිසාව
- දඹවින්න දිසාව

- කිව්ලේගෙදර මොහොට්ටාල
- ගොඩගෙදර අධිකාරම්
- ගලගෙදර මොහොට්ටාල
- ඉහගම රතනපාල හිමි
- වාරියපොළ සුමංගල හිමි

සටන මර්දනය කිරීමේ අපේක්ෂාවෙන් සටන පැතිරීගිය ප්‍රදේශවල "මාර්ෂල් ලෝ" හෙවත් යුද නීතිය පැනවූහ. ඒ හරහා සටන්කරුවන් දුර්වල කර කැරලි නායකයින් අත්අඩංගුවට ගෙන කැප්පෙටිපොල නිලමේ සහ මඩුගල්ලේ දිසාවේගේ හිස ගසා දැමූහ. පිළිමතලව්වේ අධිකාරම්වරයා සහ ඉහගම රතනපාල හිමි ඇතුළු 25 දෙනෙකු මුරුසියට පිටුවහල් කළ අතර ඔවුන්ගේ දේපල රාජසන්තක කරන ලදී.

**පළමු නිදහස් සටන අසාර්ථක වීමට හේතු**

- සටන අසංවිධාත්මක වීම
- දොරේසාමි රාජවංශිකයෙකු නොව විල්බාවේ නැමති සාමාන්‍ය වැසියෙකු බව හෙළි වීම
- බිම්පාලු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
- මාර්ෂල් ලෝ නීතිය ක්‍රියාත්මක කිරීම
- මොල්ලිගොඩ සහ එක්නැලිගොඩ අධිකාරම්වරු ඉංග්‍රීසීන්ට පක්ෂව කටයුතු කිරීම
- දළදා වහන්සේ නැවත බ්‍රිතාන්‍යයන්ට අයත් වීම
- මුස්ලිම් ජනයා බ්‍රිතාන්‍යය පක්ෂය ගැනීම

- **1848 දෙවන නිදහස් අරගලය**

කෝල්බෘක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵල දෙවන නිදහස් අරගලයට පසුබිම සැකසීය. මෙය 1848 දෙවන නිදහස් සටන ලෙස හැඳින්වේ.


**නිදහස් සටනට පසුබිම් වූ හේතු**

- රාජකාරී ක්‍රමය අවලංගු කිරීම නිසා ජනතාව අපහසුතාවට පත්වීම
- වතුවගාව සඳහා මුඩුබිම් පනත යොදාගෙන ඉඩම් බලහත්කාරයෙන් ලබා ගැනීම
- බුදුදහම නොසලකා හැරීම සුරා සැල් විවෘත කිරීම හා දුරාචාරය පැතිරීම
- අධිකරණ ප්‍රතිසංස්කරණ නිසා ජනතාව අපහසුතාවට පත්වීම
- ටොරින්ටන් සාමි විසින් ක්‍රියාත්මක කළ බදු ප්‍රතිපත්තිය

| | | | |
|---|---|---|---|
| කඩ සාප්පු බද්ද | කරත්ත බද්ද | තොටුපල බද්ද | ඇඟ බද්ද |
| තුවක්කු බද්ද | සුනඛ බද්ද | ඔරු බද්ද | මුද්දර බද්ද |

**දෙවන නිදහස් සටනේ නායකයෝ**

- ❖ වීර පුරන්අප්පු
- ❖ ගොංගාලේගොඩ බණ්ඩා
- ❖ කඩහපොල හිමි
- ❖ හඟුරන්කෙත ඩිංගිරාල
- ❖ පදියපැල්ලේ බණ්ඩා



වීර පුරන්අප්පු



ගොන්ගාලේගොඩ බණ්ඩා

**දෙවන නිදහස් සටන ව්‍යාප්ත වීම**

සටන්කාමීහු රජයේ ගොඩනැගිලි කාර්යාල කඩා බිඳ දමමින් බ්‍රිතාන්‍යය විරෝධී සටන මාතලේ, දඹුල්ල, කුරුණෑගල ආදී ප්‍රදේශවල දියත් කළෝ ය.

**සටන මර්ධනය කිරීම**

ටොරින්ටන් ආණ්ඩුකාරවරයා යුධ නීතිය පනවා සටන දරුණු ලෙස මර්ධනය කළේය. සටනේ නායකයින් අත්අඩංගුවට ගෙන හමුදා අධිකරණය ඉදිරියට පමුණුවා කඩහපොල හිමි, ඩිංගිරාල, පුරන්අප්පු යන නායකයින්ට මරණ දණ්ඩනය නියම කළේ ය. ගොංගාලේගොඩ බණ්ඩාට කසපහර සියයක් ද දී රටින් පිටුවහල් කරන ලදී.

**1848 දෙවන නිදහස් සටන අසාර්ථක වීමට හේතු**

- ❖ සටන මනාව සංවිධානය වී නොතිබීම
- ❖ සිංහලයන්ට නවීන අවි ආයුධ සහ පුහුණු හමුදාවක් නොතිබීම
- ❖ බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය අවස්ථාවලදී අතිරේක සේනා ලැබීම
- ❖ උඩරට ප්‍රදේශවල ගමනාගමන පහසුකම් ව්‍යාප්තව තිබීම නිසා පහසුවෙන් සටන මර්ධනය කළ හැකි වීම

**දෙවන නිදහස් සටනේ ප්‍රතිඵල**

- ❖ ටොරින්ටන් ආණ්ඩුකාරවරයා හා යටත් විජිත ලේකම් එමර්සන් ටෙනන්ට් තනතුරු අහෝසිකොට නැවත එංගලන්තයට කැඳවීම හා ඔවුන්ගේ දේපල රාජසන්තක කිරීම.
- ❖ ජනතා විරෝධයට ලක් වූ සමහර බදු වර්ග (කඩ සාප්පු , සුනඛ බද්ද) අවලංගු කිරීම.
- ❖ මුද්දර බද්ද, තුවක්කු බද්ද, කරත්ත බද්ද, ඔරු හා ඇඟ බද්ද සංශෝධනය කිරීම
- ❖ දළදා වහන්සේගේ භාරකාරත්වය නැවත බ්‍රිතාන්‍යයන් ලබා ගැනීම
- ❖ වාරිකර්මාන්ත ප්‍රතිසංස්කරණය තුළින් කෘෂිකර්මාන්තය දියුණු කිරීමට කටයුතු කිරීම

මච්චිමේ නිදහස සඳහා ඇති වූ සියළු අරගල බ්‍රිතාන්‍යයන්ට ජය අත්කර දෙමින් අවසන් විය. විදේශීය පාලනයට විරුද්ධව සිදු වූ අවසාන නිදහස් සටන මෙය විය. ඉන් අනතුරුව බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව නිදහස් සටනක් මෙම ලක්දිව තුළ සිදු නොවී ය.

## 7.5 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනය

1815 දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යය යටත් විජිතයක් බවට පත් විය. ඉන් අනතුරුව වසර 133ක් පුරා සමස්ත දිවයින ම බ්‍රිතාන්‍යය පාලනය යටතේ විවිධ දේශපාලන ප්‍රතිසංස්කරණයන්ට නතු විය. ආණ්ඩුක්‍රම විකාශනය ලෙස හඳුන්වන්නේ එම දේශපාලන ප්‍රතිසංස්කරණයන් ය.

| | | |
|---|---|---|
| 1. | කෝල්බෲක් ආණ්ඩුක්‍රමය | 1833 |
| 2. | කෲ මැකලම් ආණ්ඩුක්‍රමය | 1910 |
| 3. | මැනිං ආණ්ඩුක්‍රමය | 1921 |
| 4. | මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමය | 1924 |
| 5. | ඩොනමෝර් ආණ්ඩුක්‍රමය | 1931 |
| 6. | සෝල්බරි ආණ්ඩුක්‍රමය | 1947 |

### 7.5.1 කෝල්බෲක් ආණ්ඩුක්‍රමය 1833

1815 ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට නතුවීමෙන් පසු අධිරාජ්‍යවාදීන්ට පෙනීගිය කරුණක් වූයේ ලංකාව පාලනය කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සිදු වන බව යි. මෙම තත්වය වෙනස්කොට ලැබෙන ආදායම වැඩිකරගැනීම සඳහා අවශ්‍ය යෝජනා ගෙන ඒමට කෝල්බෲක් කොමිසම (විලියම් කෝල්බෲක්, සී. එච් කැමරන්) ලංකාවට පැමිණි අතර ඔවුන් ගෙන ආ යෝජනා ඇතුළත් ආණ්ඩු ක්‍රමය කෝල්බෲක් ආණ්ඩුක්‍රමය ලෙස හැඳින්වේ.

**කෝල්බෲක් ආණ්ඩුක්‍රමයේ යෝජනා**

- i රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
- ii ඉංග්‍රීසි අධ්‍යාපනය ආරම්භ කිරීම
- iii පළාත් සංඛ්‍යාව අඩු කිරීම
- iv රාජ්‍ය වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම
- v සිවිල් සේවකයින්ගේ වැටුප් අඩු කිරීම
- vi ව්‍යවස්ථාදායක සහ විධායක සභාවක් පිහිටු වීම
- vii එකම අධිකරණ පද්ධතියක් පිහිටුවීම

මෙම යෝජනා අතර දැකිය හැකි ප්‍රගතිශීලී යෝජනාව වන්නේ ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම යි. අනිකුත් යෝජනා ඔස්සේ පරිපාලන වියදම අවමකර ගැනීමට උත්සාහ දරා ඇත.

කෝල්බෲක් කැමරන් ආණ්ඩු ක්‍රමයේ ව්‍යවස්ථාදයක සභාව (1833)

සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව 15

- රජයේ උසස් නිලධාරීන් 09
- රජයේ උසස් නිලයක් නොදරන සම්භාවනීය පුරවැසියන් 06
  - යුරෝපීය 03
  - සිංහල 01
  - දෙමළ 01
  - බර්ගර් 01

**7.5.2 කෲ මැකලම් ආණ්ඩුක්‍රමය 1910**

නව ආණ්ඩුක්‍රමයක් ඉල්ලා කරන ලද උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් ලෙස කෲ මැකලම් ආණ්ඩුක්‍රමය ඉදිරිපත් කළේය. විශේෂයෙන් මෙම ආණ්ඩුක්‍රමය හරහා ව්‍යවස්ථාදායක සංයුතියේ වෙනසක් සිදුකිරීමට යෝජනා කර ඇත. ඒ වාගේම සීමිත ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක විය.

### කෲ මැකලම් ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථාදායක සභාව

සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව 21

- රජයේ උසස් නිලධාරීන් 11
- රජයේ උසස් නිලයක් නොදරන සම්භාවනීය පුරවැසියන් 10
  - ආණ්ඩුකාරවරයා විසින් නම් කිරීමෙන් 06
  - සීමිත ඡනදයෙන් පත් වූ සාමාජිකයින් 04

| | |
|---|---|
| පහතරට සිංහලයන් | 02 |
| දමිළ | 02 |
| උඩරට සිංහල | 01 |
| මුස්ලිම් | 01 |

| | |
|---|---|
| යුරෝපීයයන් | 02 |
| බර්ගර් | 01 |
| උගත් ලාංකික | 01 |

මෙම ආණ්ඩුක්‍රමය යටතේ විධායක සභාව උපදේශක සභාවක් විය. රජයේ උසස් නිලධාරීන් එහි කටයුතු කළ අතර මුලසුන දරණ ලද්දේ ආණ්ඩුකාරවරයා ය.

**7.5.3 මැනිං ආණ්ඩුක්‍රමය 1921**

මැනිං ආණ්ඩු ක්‍රමයේ ව්‍යවස්ථාදායක සභාව (1921)

සම්පූර්ණ සාමාජිකයින් 37

15

රජයේ උසස් නිලධාරීන් 14

රජයේ උසස් නිලයක් නොදරන සම්භාවනීය පුරවැසියන් 23

ආණ්ඩුකාරවරයා විසින් නම් කිරීමෙන් 07

| | |
|---|---|
| උඩරට සිංහල | 02 |
| ඉන්දියන් දෙමළ | 01 |
| මුස්ලිම් | 01 |

සීමිත ඡන්දයෙන් පත් වූ සාමාජිකයින් 16

පළාත්බද කොට්ඨාස තුළින් පත් වූ සාමාජිකයින් 11

| | |
|---|---|
| බස්නාහිර පළාත | 03 |
| අනික් පළාත්වලට (1 බැගින්) | 08 |

ජනවර්ග අනුව පත් වූ සාමාජිකයින් 03

| | |
|---|---|
| යුරෝපීයන් | 02 |
| බර්ගර් | 01 |


වෘත්තීමය සංගම්වලින් පත් වූ සාමාජිකයින් 02

| | |
|---|---|
| පහතරට වැවිලිකරුවන්ගේ සංගමය | 01 |
| වාණිජ මණ්ඩලය | 01 |

මෙම ආණ්ඩුක්‍රමයේ දී ප්‍රථමවරට විධායක සභාවට නිලනොලත් සාමාජිකයින් තිදෙනෙකු ඇතුල්වීම දැකිය හැකි ය. තවදුරටත් සීමිත ඡන්ද ක්‍රමය හා වාර්ගික නියෝජනය ද ක්‍රියාත්මක වනු දැකිය හැකි ය.

පවතින ආණ්ඩුක්‍රමය පිළිබද සෑහීමකට පත් නොවූ ලංකා ජාතික සංගමයේ නියෝජිතයෝ නව ආණ්ඩුක්‍රමයක් ඉල්ලා උද්ඝෝෂණය කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක විය.

### 7.5.4 මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමය 1924




මෙම ආණ්ඩුක්‍රමයේ දැකිය හැකි සුවිශේෂතා අතර නිල නොලත් මන්ත්‍රී සංඛ්‍යාවේ වැඩිවීමක් දැකිය හැකි ය. එසේම තව දුරටත් වාර්ගික නියෝජනය මෙන් ම සීමිත ඡන්ද ක්‍රමය ද ක්‍රියාත්මක විය.

7.5.5 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය 1931

පවතින ආණ්ඩුක්‍රමයට එරෙහිව නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ඉල්ලා කරන ලද උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් ලෙස ඩොනමෝර් කොමිසම ලංකාවට පැමිණ ඇත.

ඩොනමෝර් කොමිසම විසින් දෙවන මැනිං ආණ්ඩුක්‍රමයේ දුර්වලතා මෙලෙස හඳුනාගෙන ඇත.

- ❖ බලය සහ වගකීම දෙතැනකට පැවරීම
- ❖ සීමිත පිරිසකට පමණක් ඡන්ද බලය හිමි කර තිබීම
- ❖ වාර්ගික නියෝජන ක්‍රමය ක්‍රියාත්මක වීම
- ❖ විධායක අංශය ලාංකිකයන් සතු නොවීම

බ්‍රිතාන්‍යය තුළ මේ අවධිය වනවිට ආණ්ඩු බලය දිනාගෙන සිටියේ කම්කරු පක්ෂය යි. එමනිසා යටත් විජිතවලට නිදහස ලබාදිය යුතුයි යන මතය ගොඩනැගුණි. මේ පසුබිම තුළ ලාංකිකයන්ට වැඩි බලතල සහිත ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ලංකාවට ලබා දී ඇත.

**ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වාදුන් යෝජනා**

1. රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
2. සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම
3. ජනවාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම සහ පළාත්බද නියෝජන ක්‍රමය පුළුල් කිරීම
4. විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම
5. රාජ්‍ය මන්ත්‍රණ සභාවට රාජ්‍ය නිලධාරීන් තිදෙනෙක් ඇතුලත් කිරිම
6. ආණ්ඩුකාරවරයාගේ බලතල සංශෝධනය කිරීම
7. ඇමති මණ්ඩලයක් ස්ථාපිත කිරීම

ලාංකික ඉතිහාසයේ ඉතා වැදගත් ආණ්ඩු ක්‍රමයක් ලෙස ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හැඳින්විය හැකිය. විශේෂයෙන් සර්වජන ඡන්ද බලය, විධායක කාරක සභා ක්‍රමය වැනි යෝජනා හරහා ලාංකික ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ ප්‍රගතියක් දැකිය හැකි විය.

රාජ්‍ය මන්ත්‍රණ සභාව

සම්පූර්ණ සාමාජිකයින් 61

පළාත්බද ඡන්ද කොට්ඨාශ වලින් 50

රාජ්‍ය නිලධාරීන් 03
රාජ්‍ය ලේකම්
මුදල් ලේකම්
නීති ලේකම්

ආණ්ඩුකාරවරයා විසින් නම් කිරීමෙන් 08

**7.5.6 සෝල්බරි ආණ්ඩුක්‍රමය 1947**

ලංකා ජාතික සංගමය හා ලංකා දෙමළ සංගමය වැනි සංගම් එක්ව කරන උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් ලෙස සෝල්බරි ආණ්ඩුක්‍රමය ද ලංකාවට හිමි විය.

**සෝල්බරි ආණ්ඩුක්‍රමයේ යෝජනා**

1. උත්තර මන්ත්‍රී මණ්ඩලය, මහජන මන්ත්‍රී මණ්ඩලය සහ එංගලන්තයේ රජු හෝ රැජිනගෙන් සමන්විත පාර්ලිමේන්තුවක් පිහිටු වීම.
2. අග්‍රාණ්ඩුකාරවරයා තවදුරටත් කිරීටයේ නියෝජිතයා ලෙස කටයුතු කිරීම
3. අගමැතිගේ ප්‍රධානත්වයෙන් යුතුව කැබිනට් මණ්ඩලයක් පත් කිරීම.
4. මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන් බහුතරයක පක්ෂපාතීත්වය ලබා ගත හැකි මන්ත්‍රීවරයා අගමැතිවරයා ලෙස පත් කිරීම.
5. සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුතු රාජ්‍ය සේවා කොමිසමක් පත් කිරීම.
6. අග්‍රවිනිශ්චයකරුගේ නායකත්වයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවක් පත් කිරීම.
7. විදේශ කටයුතු, රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ බලය තවදුරටත් බ්‍රිතාන්‍යය රජය සතු විය යුතු බව නියම කිරීම.
8. සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට විශේෂ විධිවිධාන යෙදීම.

## සෝල්බරි ආණ්ඩුක්‍රමය 1947

සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථාදායක සභාව සම්පූර්ණ සාමාජිකයින්
(ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව) 131

- මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලය 101
  - සර්වජන ඡන්ද බලයෙන් දේශපාලන පක්ෂ පදනම් කොට ඡන්ද කොට්ඨාශවලින් පත් වූ සාමාජිකයින් 95
  - සුළු ජනවර්ග ආගම් වෙනුවෙන් අග්‍රාණ්ඩුකාරවරයා විසින් නම් කළ සාමාජිකයින් 06
- උත්තර මන්ත්‍රී මණ්ඩලය 30
  - අගමැතිවරයාගේ නිර්දේශ මත අග්‍රාණ්ඩුකාරවරයා පත් කරන සාමාජිකයින් 15
  - මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් පත් කරන සාමාජිකයින් 15

ලංකා ඉතිහාසයේ ප්‍රථම ද්විමණ්ඩල ව්‍යවස්ථාදායකය සෝල්බරි ආණ්ඩුක්‍රම යටතේ ක්‍රියාත්මක විය. මෙම ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමත් සමඟ ලංකාවට ඩොමීනියන් තත්ත්වයේ නිදහසක් හිමිවිය.

## 7.6 ලංකාවේ ජාතික පුනරුදය

ලංකාවේ දිගු කාලයක් තිස්සේ වර්ධනය වෙමින් පැවති දේශීය සංස්කෘතිය පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන අපරදිග ජාතීන්ගේ බලපෑම මත විවිධ වෙනස්කම් වලට භාජනය විය. බ්‍රිතාන්‍යයෝ දේශීය ජනතාව සතු දේශපාලන සහ ආගමික අයිතිවාසිකම් අහිමි කළහ. නැතිවී ගිය අයිතිවාසිකම් නැවත ලබා ගැනීම සඳහා ගත් උත්සාහය ජාතික පුනරුදය ලෙස හැඳින්විය හැකි ය.

**ලංකාවේ ජාතික ව්‍යාපාරයේ ප්‍රධාන කණ්ඩායම්**

1. ආගමික පුනර්ජීවන ව්‍යාපාරය
2. බ්‍රිතාන්‍යයන්ගෙන් දේශපාලන බලය ගැනීමට උත්සහ කළ දේශපාලන ව්‍යාපාරය

**ආගමික හා සාමාජීය පුනර්ජීවනය ඇති වීමට බලපෑ හේතු**

❖ මිෂනාරි අධ්‍යාපනය සඳහා රජය දැඩි ලෙස මැදිහත් වීම
❖ මිෂනාරි සංවිධාන අතර පැවති තරගය නිසා මිෂනාරි පාසල් සීග්‍රයෙන් ව්‍යාප්ත වීම
❖ ක්‍රිස්තියානි ආගම සීඝ්‍රයෙන් පැතිර යෑම
❖ බෞද්ධ අධ්‍යාපනයට රාජ්‍ය අනුග්‍රහය ලබා නොදීම
❖ ලාංකික ජනතාව දේශීය සංස්කෘතිය අමතක කොට බටහිර සංස්කෘතියට නැඹුරු වීම

**මිෂනාරි සංවිධාන හා ඒවායේ කටයුතු**

19 වන සියවසේ මුල් කාලයේදී ලංකාවට පැමිණි මිෂනාරි සංවිධාන රාජ්‍ය අනුග්‍රහය ලබමින් ලංකාව පුරා තම ආගම ව්‍යාප්ත කළේය. ඒ සඳහා ප්‍රචාරණ මාධ්‍ය ලෙස, අධ්‍යාපනය, ලේඛනය, දේශනය, සමාජ සේවා කටයුතු ආදිය යොදා ගත්හ.

**ලංකාවේ ක්‍රියාත්මක මිෂනාරි සංවිධාන**

❖ ලන්ඩන් මිෂනාරි සමාගම
❖ බැප්ටිස්ට් මිෂනාරි සමාගම
❖ වෙස්ලියන් මිෂනාරි සමාගම
❖ ඇමරිකන් මිෂනාරි සමාගම
❖ චර්ච් මිෂනාරි සමාගම

මෙම සංවිධාන සීග්‍ර ලෙස සිදු කළ ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය හේතුවෙන් බොහෝ ප්‍රදේශවලට ව්‍යාප්තව ගියේය. එය දේශීය ආගම්වලට තදින් බලපෑවේ ය.



### 7.6.1 බෞද්ධාගමික පුනර්ජීවනය

බෞද්ධාගමික පුනර්ජීවනය තුළ භික්ෂූන් වහන්සේලා මෙන් ම ගිහි උගත්තු ද පෙරමුණ ගෙන ඇත. ඒ අතර,

- වලානේ සිද්ධාර්ථ හිමි
- පූජ්‍ය හික්කඩුවේ සුමංගල හිමි
- රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි
- එස්. මහින්ද හිමි
- මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
- වස්කඩුවේ සුභූති හිමි
- බුලත්ගම ධම්මාලංකාර සිරිසුමනතිස්ස හිමි
- අනගාරික ධර්මපාලතුමා
- හෙන්රිස්ටීල් ඕල්කට්තුමා
- පියදාස සිරිසේන මහතා
- වලිසිංහ හරිස්චන්ද්‍රතුමා
- ඩබ්ලිව්. ඒ. සිල්වා මහතා ආදීන් පෙරමුණ ගෙන ඇත.





බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ

❖ පිරිවෙන් පිහිටුවීම

| පිරිවෙන් පිහිටුවීමට මූලික වූ භික්ෂූන් වහන්සේ | ආරම්භ කළ පිරිවෙණ |
|---|---|
| 1. පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමි | රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙණ |
| 2. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි | මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණ |
| 3. පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමි | පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ |

❖ මුද්‍රණාල පිහිටුවීම හා මුද්‍රිත මාධ්‍ය යොදා ගැනීම (බෞද්ධයන් පිහිට වූ මුද්‍රණාල)

» 1862 ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවීම
(බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි)
» ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය
» කවට කතික මුද්‍රණාලය
» සුදර්ශන මුද්‍රණාලය
» සරසවි සඳරැස මුද්‍රණාලය

❖ බෞද්ධ ප්‍රකාශන

» ලක්මිණි පහන
» ලංකාලෝකය
» සරසවි සඳරැස
» සිංහල ජාතිය
» සිංහල බෞද්ධයා

❖ ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම
(පංචමහාවාද)

» 1865 බද්දේගම වාදය
» 1865 වරාගොඩ වාදය
» 1866 උදන්විට වාදය
» 1871 ගම්පොළ වාදය
» 1873 පානදුරා වාදය

මෙම විවිධ වාද අතුරින් පානදුරාවාදයට ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබුණි. එම ලේඛන කියවීමෙන් පැහැදීමට පත් වූ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සහ හෙලේනා බ්ලැවිට්ස්කි මැතිණිය ලංකාවට පැමිණ ඇත. ඕල්කට්තුමා මෙරටට පැමිණීමෙන් පසු බුදුදහම වැළඳගෙන බෞද්ධ පාසල් පිහිටුවීමට පෙරමුණ ගෙන කටයුතු කළේ ය.

» කොළඹ ආනන්ද විද්‍යාලය
» මහනුවර ධර්මරාජ විද්‍යාලය
» ගාල්ලේ මහින්ද විද්‍යාලය
» මාතලේ විජය විද්‍යාලය
» ගම්පොළ ජිනරාජ විද්‍යාලය
» නාවලපිටියේ අනුරුද්ධ විද්‍යාලය ඒ අතර විය.

### 7.6.2 හින්දු ආගමික පුනර්ජීවනය




මිෂනාරී සංවිධානවල ක්‍රියාකාරකම් හේතුවෙන් හින්දු ආගමිකයන්ට ද අභියෝග එල්ල විය. එම හේතුවෙන් හින්දු ආගමිකයන් අතර ආගමික හා සංස්කෘතික පිබිදීමක් ඇති විය. එයට නායකත්වය සැපයූවේ ''ආරුමුග නාවලර්''තුමා විසිනි.

**ආරුමුග නාවලර්තුමාගෙන් සිදු වූ සේවය**

- ❖ ශ්‍රී ලංකාවේ හින්දු ආගමික පුනරුදයට නායකත්වය සැපයීම
- ❖ හින්දු පාසල් පිහිටුවීමට පුරෝගාමීවීම. (වන්නාර්පන්නෛයි ''ශෛව ප්‍රකාශ'' විද්‍යාලය)
- ❖ හින්දු භාෂාව, සාහිත්‍ය හා සංස්කෘතිය රැක ගැනීමට ක්‍රියා කිරීම. (උදයභාණු නමින් පුවත්පතක් ප්‍රකාශ කිරීම)
- ❖ බාල පාඨම් නම් පෙළපොත් රචනය සහ ස්කන්ද පුරාණම්, පෙරිය පුරාණම් වැනි ග්‍රන්ථ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.

ආරුමුග නාවලර්තුමාගේ අභාවයෙන් පසුව පොන්නම්බලම් අරුණාචලම් සහ පොන්නම්බලම් රාමනාදන් වැනි නායකයෝ මෙම ව්‍යාපාරය ඉදිරියට මෙහෙය වූහ.

**7.6.3 ඉස්ලාම් පුනර්ජීවන ව්‍යාපාරය**



ශ්‍රී ලංකාවේ බෞද්ධ හා හින්දු පුනරුදයට සමකාලීනව ඉස්ලාම් ජනතාව අතර ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇති විය. ඉස්ලාම් පුනරුදයට නායකත්වය සපයන ලද්දේ නීතිඥයෙක් වූ ඇම්. සී. සිද්ධි ලෙබ්බේ මහතා විසිනි. 1883 වර්ෂයේ ඊජිප්තුවෙන් මෙරටට පැමිණි අරබි පාෂා ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයට සිද්ධි ලෙබ්බෙ මහතාට සහය ලබා දුණි.

සිද්ධි ලෙබ්බේ මහතා විසින් සිදු කළ සේවාවන් අතර,

- » මුස්ලිම් නෙයිසන් නමින් සඟරාවක් ආරම්භ කිරීම.
- » කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම වේ.

සිද්ධි ලෙබ්බෙ මහතාගෙන් පසුව ටී. බී ජයා මහතා විසින් ඉස්ලාම් ආගමික අධ්‍යාපන ක්‍රමය ඉදිරියට ගෙන යාමට ක්‍රියා කළේ ය.

## දේශපාලන පුනර්ජීවනයේ පුරෝගාමී නායකයින්

- ❖ පොන්නම්බලම් අරුණාචලම්
- ❖ පොන්නම්බලම් රාමනාදන්
- ❖ ජේම්ස් පීරිස්
- ❖ ඊ. ඩබ්ලිව්. පෙරේරා
- ❖ ඒ. ඊ ගුණසිංහ
- ❖ ඩී. බී. ජයතිලක
- ❖ ඩී. එස්. සේනානායක
- ❖ එෆ්. ආර්. සේනානායක
- ❖ සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර
- ❖ එස්. ඒ. වික්‍රමසිංහ
- ❖ ටී. බී. ජායා








## 7.7 බ්‍රිතාන්‍ය පාලන සමයේ ලංකාවේ ඇති වූ දේශපාලන, ආර්ථික, සාමාජීය, සංස්කෘතික වෙනස්කම්

අනුරාධපුර යුගය ආරම්භයේ සිට පරිපාලනය රාජාණ්ඩු ක්‍රමය මත ගොඩනැගී පැවතිණි. ක්‍රි. ව. 1815 දී බ්‍රිතාන්‍යයන් යටතේ සාම්ප්‍රදායික රාජාණ්ඩු ක්‍රමය වෙනස් කොට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් දක්වා විකාශනය විය. මේ ආකාරයට ලංකාවේ දේශපාලන ආර්ථික, සමාජීය, සංස්කෘතික ක්ෂේත්‍රයන් පුළුල් වෙනසකට භාජනය විය. එම වෙනස්කම් පිළිබඳව අධ්‍යයනය මෙම පරිච්ඡේදය තුළින් සිදු කරනු ඇත.

### දේශපාලන වෙනස්කම්

- ❖ සාම්ප්‍රදායික රාජාණ්ඩු ක්‍රමය වෙනස් කොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය ඇරඹීම
- ❖ දේශපාලන බලය ලබා ගැනීම වෙනුවෙන් ලාංකික මධ්‍යම පන්තිය බිහිවීම
- ❖ දේශපාලන පක්ෂ ක්‍රමයක් නිර්මාණය වීම
- ❖ සර්වජන ඡන්ද බලය ඔස්සේ ලාංකික ජනතාව දේශපාලනයට දායක වීම
- ❖ සමාජ සුභසාධන ක්‍රියාවලින් නිර්මාණය වීම



### ආර්ථික වෙනස්කම්

- ❖ සාම්ප්‍රදායික කෘෂි ආර්ථිකය බිඳවැටී වතුවගා ආර්ථික ක්‍රමය ගොඩනැගීම
- ❖ ප්‍රධාන අපනයන බෝග ලෙස තේ, පොල්, රබර් ආදී වගාවන් වර්ධනය වීම

### සාමාජීය වෙනස්කම්



- ❖ කම්කරු පන්තියක් බිහිවීම
- ❖ දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනතාව ලාංකික සමාජයට එකතුවීම
- ❖ සමාජය තුළ ධනපති හා කම්කරු ලෙස පන්ති දෙකක් නිර්මාණය වීම
- ❖ බර්ගර්, මැලේ ආදී ජනවර්ග ලාංකික සමාජයට එකතුවීම

**සංස්කෘතිය වෙනස්කම්**

❖ බටහිර සංස්කෘතිය ලංකාව තුළ පැතිර යාම

බටහිර ඇඳුම් පැළඳුම්

සිරිත් විරිත්

ආචාර සමාචාර විධි

බටහිර ගෘහ නිර්මාණ ශිල්පය

ආහාර පාන ඒ අතර විය.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්වීම තුළ ක්‍රමයෙන් වර්ධනය වූ දේශීය අනන්‍යතාව බිඳවැටී බටහිර ගැති සමාජ ක්‍රමයක් නිර්මාණය වීම.

**ක්‍රියාකාරකම්**

01. පහත මාතෘකා ඇසුරින් කෙටි ප්‍රශ්න පොතක් හදන්න.

බ්‍රිතාන්‍යයන් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීම

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍යය බලය පිහිටුවීම

නිදහස් සටන්

02. කෝල්බෲක් ආණ්ඩුක්‍රමයේ යෝජනා පෙළ ගස්වන්න.

03. නිදහසට තවත් පියවරක් ලෙස සෝල්බරි ආණ්ඩුක්‍රමය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

04. බෞද්ධාගමික නායකයින් ගේ සේවය පිළිබඳ පොත් පිංචක් සකසන්න.

05. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරට සංස්කෘතියට එකතු වූ නව අංග පිළිබඳ ලැයිස්තුවක් සකසන්න.